201243

සමාජ අධ්‍යයනය

7
වසර

201243

21 NOV 198

සමාජ අධ්‍යයනය

7 වසර

අලුත් නිර්දේශ මාලාව අනුව සැකසිණි

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

1 වන මුද්‍රණය 1985
2 වන මුද්‍රණය 1986
සියලු හිමිකම් ඇවිරිණි

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙනුවෙන්
අධ්‍යාපන ප්‍රකාශන කාර්යාංශයේ මුද්‍රණාලයේ මුද්‍රණය කොට
පළ කරන ලදි.

86/B/92/ (75000)

ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනි සුරුඳු අති සෝභමාන ලංකා
ධාන්‍ය ධනය බොහා මල් පලතුරු පිරී ජය භූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා ජීවනයේ ධාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා...
ඔබ වේ අප විද්‍යා
ඔබ මය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවය වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවනා දෙටනේ නිතිනා අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමිනා රැගෙන සතු මැනා ජය භූමි කරා
එනා මවහගෙ දුරු කැළඹි බැහිනා
සමු සමු වී නොපමා
ශ්‍රේෂ්ඨ වඩා යැම හේදූ දුරුර ලා නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා...

නිදහස් අධ්‍යාපනයේ නීති පල නෙලා ගැනීමට නම් පාසල් පොත් කොමිටියේ මේ දිය යුතු යැයි හනලිය් ටෙරකට පෙර, ජනාධිපති ජේ. ආර්. ජයවර්ධනා උතුමාණන් දිසින් කරන ලද යෝජනාව 1980 සිට මේ පල ගැන්වී මේ පොත ඔබට මෙසේ ලැබෙයි.

ඉගෙනුම් සපල කොට
හොඳ අයකු වනු දුක්ඛම්
පැතුමෙන් රජය ඔබ හට
දෙන්නා තිළිණයෙකි මේ පොත

මෙය හොඳින් රැකගෙන
හිසද්ා ඉගෙන මැනවින්
නැණ ගුණ දියුණු කරගෙන
වන්න හොඳ දුරවැසියන්

සිංහල ය දෙමළ ය
මුස්ලිම් ය යනු අපි ම ය
මේ හැම එක් වීමෙනි යිරි
ලඟ දුරපුරක් වන්නේ.

ලයනල් ජයතිලක
අධ්‍යාපන ලේඛා ඇමැති

ගෙපත වදනා

1985 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන සංශෝධිත විෂය මාලාවට අනුකූලව හත් වන වසර සඳහා ලියන ලද සමාජ අධ්‍යයනය පොත මෙය වේ.

නවීන ප්‍රජාතන්ත්‍රවාදී රට හා සමාජය විසිවැඳ්ම ඒනා අවබෝධයක් ලබා දීමටත්, අනාගතයේදී විහුණ පැමට සිදුවන ගැටළු හා ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට මාර්ගෝපදේශයක් වීය දීමටත් මේ පොත විශේෂයෙන් උපකාරී වේ.

මානව අයිතිවාසිකම් විෂිබඳව අවබෝධයක් ලබා දීමත්, ශ්‍රී ලංකාවේ විවෙසන විවිධ ජාතීන් අතරේ සමගිය වර්ධනය කිරීමත් මේ පොතෙන් බලාපොරොත්තු වන කාරණා වැදගත් අරමුණුකි.

ඉතා කෙටි කාලයක් තුල දී මහත් පරිශ්‍රමයෙන් යුතුව සැකසුණු මෙම පොත සඳහා මෙහෙය මගහැසී ම කටයුතු කළ සියලු ම ලේඛන ලේඛියාවන්ටත්, උපදේශකවරුන්ටත් මගේ කෘතඥතාව පුදු කරමි.

එච්. ආර්. වන්දසේකර
අධ්‍යාපන ප්‍රකාශන කොමිසාරිස්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉහලේකම් කාර්යාල සංකීර්ණය,
නැ. පෙ. 520,
කොළඹ 10.
1986 ජූනි මස 01 දින.

මෙහෙයවීම

එච්. ආර්. චන්ද්‍රසේකර මයා — අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්

උපදේශක මණ්ඩලය

ඩී. ඒ. පෙරේරා මයා — අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන උපදේශක
එච්. ආර්. චන්ද්‍රසේකර මයා — අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
ආචාර්ය ජී. ලියනගමගේ මයා — කැලණිය විශ්ව විද්‍යාලය
මහාචාර්ය නිර්මල් රංජිවැල්ල මයා — රුහුණු විශ්ව විද්‍යාලය
මහාචාර්ය සෝමානි රත්නායක මිය — රුහුණු විශ්ව විද්‍යාලය
ආචාර්ය ඉප්‍රාගී මුණසිංහ මිය — කොළඹ විශ්ව විද්‍යාලය
බර්ටෙල්ම රත්නපාල මයා — ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති
විමලා රත්නායක මිය — විදුහල්පතිනී, ප්‍රෙස්බිටේරියන් බා. ම. වි. කොළඹ.
මහාචාර්ය හෙට්ටිආරච්චි මිය — අධ්‍යාපන අමාත්‍යාංශය
ලතිකා ගුණවර්ධන මිය — වෙල්ස් කුමාර විදුහල, වොරවුව.
සරත්චන්ද්‍ර ජයවර්ධන මයා — විෂය මාලා සංවර්ධන මධ්‍යස්ථානය

ලේඛක මණ්ඩලය

හෙන්ඩ්‍රික් දහනායක මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
එම්. ඩී. ඩ සිල්වා මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
සුදර්මි එච්. පෙරේරා මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ජෝති සේනානායක මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
එච්. එස්. පතිරණ මයා — විශ්ව විද්‍යාලය පිරිවෙන, පන්නිපිටිය
එන්. ඩී. පියදාස මයා — ශාන්ත ජෝන් විදුහල, නුගේගොඩ
ඩබ්. ඒ. ආර්. සාදා මයා — සමාජ අධ්‍යයනය ගුරු උපදේශක, ගම්පහ
ප්‍රේමා වික්‍රමගේ මිය — ශ්‍රී ජයවර්ධන පුර මහා විදුහල, කෝට්ටේ
ඩබ්ලිව්. ජී. ගුණතිපාල මයා — විෂය මාලා සංවර්ධන මධ්‍යස්ථානය

සංස්කරණය

හෙන්ඩ්‍රික් දහනායක මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
සුදර්මි එච්. පෙරේරා මිය — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

චිත්‍ර

සෝමදාස චිත්‍රාන මයා — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පිටකවරය

සෝමසිරි ථේරත් — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පටුන

පරිච්ඡේදය		පිටුව
1.	ශ්‍රී ලංකාවේ පිහිටීම	1
2.	ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ	6
3.	ශ්‍රී ලංකාවේ කාලගුණය හා දේශගුණය	17
4.	පස	26
5.	ස්වාභාවික වෘක්ෂලතා	30
6.	ස්වාභාවික සම්පත් හා ප්‍රධාන නිෂ්පාදන	35
7.	ජලය	39
8.	ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත	44
9.	වවලෙඳ බෝග	50
10.	ශ්‍රී ලංකාවේ මුල් ව්‍යාපෘති	59
11.	ශ්‍රී ලංකාවේ මුල් ම රජවරු	63
12.	අනුරාධපුර රාජධානිය	68
13.	පොලොන්නරු රාජධානිය	72
14.	රජරට ප්ලාක්ෂික ශිෂ්ටාචාරය	76
15.	රජරට සභ්‍යත්වය	80
16.	ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර පැවති ආර්ථික සංස්කෘතික හා සමාජ සම්බන්ධතා	84
17.	රාජධානි මාරුවීම	88
18.	විජය සිට පරාක්‍රමබාහු දක්වා	93
19.	ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ආගම	99
20.	නිදහස් ශ්‍රී ලංකාව	104
21.	ශ්‍රී ලංකාවේ ජනාවාස රටාවේ ක්‍රමය	108
22.	අප රටේ ප්‍රධාන අපනයන හා ආනයන	112
23.	නිදහස ස්වදේශීය සම්පත්වල නැගීම	118
24.	සමෘද්ධිමත් ජනතාවක්	122
	උපහුන්වුම	129

1

ශ්‍රී ලංකාවේ පිහිටීම

පාඩමට සූදානම් වීම

මේ පාඩමෙහි ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබඳ ව කරුණු ඉදිරිපත් කර ඇත. පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1 දූපතක් හෙවත් දිවයිනක් යනු කුමක්ද?

2 මහාද්වීප යනු මොනවා ද?

3 අර්ධද්වීපයක් සහ සමුද්‍ර සන්ධියක් යනු කුමක් ද?

4 ශ්‍රී ලංකාවට ඉතාම ළංව පිහිටි රට කුමක් ද?

5 ශ්‍රී ලංකාවට ළඟින් ම පිහිටි සමුද්‍ර සන්ධිය කුමක් ද?

6 ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපයට ආසන්නව පිහිටි දූපත් මොනවා ද?

7 දකුණු ආසියාවට අයත් රටවල් මොනවා ද?

8 පුරාණ කාලයේ ශ්‍රී ලංකාව පෙර අපර දෙදිග වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වුණේ ඇයි?

වාංමාලාව

දූපත්, සාගර, මහාද්වීප, අර්ධද්වීප, සමුද්‍ර සන්ධි, මහාද්වීප කට්ටල

1.1 ශ්‍රී ලංකාවේ පිහිටීම ආශ්‍රිත ඇතැම් ලක්ෂණ

අප වාසය කරන ශ්‍රී ලංකාව දූපතකි. දූපතක් හෙවත් දිවයිනක් යනුවෙන් හැඳින් වෙන්නේ සෑම අතින්ම ජලයෙන් වට වූ ගොඩබිමක් ය. ශ්‍රී ලංකාව වටා ඇති විහිදුද ඉන්දියන් සාගරයයි. ලෝකයේ ඇති ඉතා විශාල මුහුදු සාගර නමින් හැඳින් වේ. ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකා දූපත පිහිටා ඇති අන්දම 1.1 රූපයෙන් බලන්න.



ශ්‍රී ලංකාවේ පිහිටීම
1.1 රූපය

ඉතා විශාල ගොඩබිම් ද ලෝකයේ ඇත. විශාල ගොඩබිම් මහාද්වීප නමුවෙන් හැඳින් වේ. ශ්‍රී ලංකාව ආසියා මහාද්වීපයට අයත් රටකි. ආසියා මහාද්වීපයේ දකුණු පෙදෙසේ ශ්‍රී ලංකාව පිහිටා ඇත.



ශ්‍රී ලංකාව–ඉන්දියන් සාගරයේ පිහිටීම

1.2 රූපය

ශ්‍රී ලංකාවේ පිහිටීම හොඳින් වටහා ගන්න. 1.1, 1.2, 1·3 – රූපවල ඉන්දියාවේ පිහිටීම බලන්න. ඉන්දියාව තුන් පැත්තකින් මුහුදෙන් වට වී ඇති බව පෙනේ. **ජලයෙන් සම්පූර්ණයෙන් ම වට නොවූ ගොඩබිමකට අර්ධද්වීපය යයි කියනු ලැබේ. එ බැවින් ඉන්දියාව අර්ධද්වීපයකි. අප රටේ උතුරේ** පිහිටි යාපනය ද කුඩා අර්ධද්වීපයකි.



ශ්‍රී ලංකාව අවට පිහිටි දූපත්

1.4 රූපය

ඉන්දියාව ශ්‍රී ලංකාවට උතුරෙන් පිහිටා ඇත. එය ශ්‍රී ලංකාවෙන් වෙන් වන්නේ පටු මුහුදු තීරයකිනි. එක් ගොඩබිම් පෙදෙසක්



ශ්‍රී ලංකාව–ඉන්දියාව ආශ්‍රිතව පිහිටීම

1.3 රූපය

තවත් ගොඩබිම් පෙදෙසකින් වෙන් කරන මෙ බදු පටු මුහුදු **තීරු සමුද්‍ර සන්ධි** නමින් **හැඳින් වේ. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් කරන මේ මුහුදු තීරය පෝක් සමුද්‍ර සන්ධිය යි.** (1.3 රූපය බලන්න) පෝක් සමුද්‍ර සන්ධිය හරහා ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර ඇති කිට්ටු ම දුර කිලෝ මීටර 32 ක් පමණි.

ශ්‍රී ලංකාවේ වෙරළට ආසන්න ව උතුරු හා වයඹ දිගින් පිහිටි දූපත් **රැසක් වේ.** (1.4 රූපය බලන්න) ඉරනතිවු, මන්නාරම් දූපත, කවචතිවු, ඩෙල්ෆ්ට්, පුංකුඩුතිවු, කයිට්ස්, නයිනතිවු (නාගදීප) සහ කරෙයිතිවු ඉන් කිහිපයකි.

ශ්‍රී ලංකාවට ඇතින් ඉන්දියාව සාගරයේ පිහිටි දූපත් කිපයක් ද **වේ.** දකුණු ආසියාවට අයත් මේවා මාලදිවයින්, ලැකදිව්, අන්දමන්, නිකොබාර් සහ මැධගස්කරය යනාදිය යි. ඒ හැරුණු විට පකිස්තානය, බංග්ලාදේශය, නේපාලය, භූතානය ආදිය ද ශ්‍රී ලංකාවට ආසන්න ව පිහිටි දකුණු ආසියානු රටවල් **වේ.**

ශ්‍රී ලංකාව වටා නොගැඹුරු මුහුදු තීරයකි. **එය උතුරේ දී පුළුල් ව ද** සෙසු පැතිවල දී පටු ව ද පිහිදේ. මෙය හඳුන්වන්නේ **මහාද්වීප තටකය** නමිනි (1.6 රූපය බලන්න).



ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි දකුණු ආසියානු රටවල්

1.5 රූපය



1.6 රූපය

1.2 ඉන්දියන් සාගරයේ පිහිටීම

ශ්‍රී ලංකාව එවා ඇත්තේ ඉන්දියන් සාගරය යි. ඉතා විශාල ඉන්දියන් සාගරය උතුරින් ආසියා මහාද්වීපයෙන් ද දකුණින් ඇන්ටාක්ටිකාවෙන් ද බටහිරින් අප්‍රිකාවෙන් ද නැගෙනහිරින් ඔස්ට්‍රේලියාවෙන් ද මායිම් වී ඇති බව දළ වශයෙන් කිව හැකිය (1.1 රූපය බලන්න). ශ්‍රී ලංකාව මේම ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටි කුඩා රටකි. මේ මධ්‍යගත පිහිටීම නිසා ඉන්දියන් සාගරයේ සාත්‍රා කරන නැව් ශ්‍රී ලංකාව පසු කර යා යුතු වෙයි. එපර අපර දෙ දිග වෙළෙඳාම සඳහා යන නැව් ඉන්ධන, ආහාර, ජලය සහාදි අවශ්‍යතා සපයා ගැනීමට ශ්‍රී ලංකාවට පැමිණේ.

1.3 දකුණු ආසියාව ආශ්‍රිතව පිහිටීම

අතීත කාලයේ සිට අප රට චීනය, මැලේසියාව ආදී පෙරදිග රටවල් සමඟ ද ඉරාන්‍යය, (පර්සියාව), අරාබිය ආදී මැද පෙරදිග රටවල් සමඟ ද පසුව පෘතුගාලය, ඕලන්දය, බ්‍රිතාන්‍යය ආදී අපරදිග රටවල් සමඟ ද මුහුදු මාර්ග ඔස්සේ වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගත්තේ ය. එ කල පෙර අපර දෙ දිග වෙළෙඳුමේ සන්ධිස්ථානයක් වූයේ ශ්‍රී ලංකාව යි.අපර දිග සිට අරාබි මුහුදු ඔස්සේ ඉන්දියන් සාගරයටත් ඉන් පසු බෙංගාල බොක්ක ඔස්සේ පෙරදිග රටවලටත් යාත්‍රා කළ නැව්වලට ශ්‍රී ලංකාව කදිම නැවතුම් පොළක් විය. පිටරටවල සිට නැව්වලින් පැමිණි වෙළෙන්දෝ ශ්‍රී ලංකාවේ මුතු මැණික්, ඇත් දත් ආදිය, තම රටවලට ගෙන ගියහ. ඒ රටවලින් රෙදිපිළි, සුවඳ විලවුන් ආදිය මෙ රටට ගෙන ආහ. ඔවුන්ගෙන් සමහරු මෙ රට ස්ථිර පදිංචිය ද ඇති කර ගත්හ.

මෙ සේ ඉන්දියන් සාගරයේ කේන්ද්‍රගත ව පිහිටි දූපතක් වීම ශ්‍රී ලංකාව ලෝකයේ වැදගත් රටක් බවට පත්වීමට හේතු විය. ඉපැරණි කාලයේ සිට ම ශ්‍රී ලංකාව "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" යනුවෙන් හඳුන්වනු ලැබී ය.



ලෝකයේ ප්‍රධාන නැව් මාර්ග

1.7 රූපය

සාරාංශය

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි දූපතකි. ශ්‍රී ලංකාවට ඉතා කිට්ටු රට ඉන්දියාවයි. එය ඉන්දියාවෙන් වෙන් වන්නේ පෝක් සමුද්‍ර සන්ධියෙනි. මේ දිවයින වටා පිහිටි නොගැඹුරු මුහුදු තීරය මහාද්වීප තටකය නමින් හැඳින් වේ. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටා ඇත. මෙම මධ්‍යගත පිහිටීම නිසා පුරාණ කාලයේ සිටම මෙරට ලෝකයේ වැදගත් රටක් බවට පත් විය.

ක්‍රියාකාරකම්

1. මෙහි දක්වෙන ලෝක සිතියමේ (1.8 රූපය) මහාද්වීප සහ සාගර ලකුණු කර ඇත. එය පිටපත් කර ගන්න.
   i එයි මහාද්වීප කොපමණ තිබේ ද යි සොයා ඒවායේ නම් ලියන්න.
   ii එම සිතියමේ ඇති සාගරවල නම් ලියන්න.
2. ගුරුතුමාගේ ආධාරය ඇති ව ලෝක සිතියමේ දූපත් පහක්, අර්ධද්වීප දෙකක් සහ සමුද්‍ර සන්ධි දෙකක් සොයන්න.
3. ආසියාවේ සිතියමක දකුණු ආසියාවට අයත් රටවල් ලකුණු කොට නම් කරන්න.
4. අ කොටසේ ඇති වචනවලට ගැලපෙන වචනය ආ කොටසින් තෝරා ලියන්න

අ	ආ
මැලේසියාව	මහාද්වීපයකි
පැසිෆික්	අර්ධද්වීපයකි.
ශ්‍රී ලංකාව	සමුද්‍ර සන්ධියකි
ඇන්ටාක්ටිකාව	දූපතකි
මලක්කා	සාගරයකි

5. පහත සඳහන් දූපත් ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක ලකුණු කොට නම් කරන්න.
   බෙල්ෆ්ස්ට්
   කයිරිස්
   නයිනතිවු.
   කරෙයිතිවු
   මන්නාරම්
   කව්වතිවු



ලෝකයේ මහාද්වීප සහ සාගර

1.8 රූපය

2

ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ

පාඩමට සූදානම් වීම

මේ පාඩමේ ලියා ඇත්තේ භූ විෂමතා ලක්ෂණ පිළිබඳ කරුණුයි. කඳු, තැනිතලා, සානු ආදිය මොනවා දැයි ඔබට මේ පාඩමේ දී ඉගෙනීමට සුළුවනි. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1 භූමියෙහි ඔතු පිට ඇති වෙනස්කම් කෙසේ හැඳින්වේ ද?

2 භූ විෂමතා ලක්ෂණ අනුව ශ්‍රී ලංකාව බෙදා දක්විය හැකි කොටස් දෙක මොනවා ද?

3 කඳු සහ තැනිතලා යනු කවරේ ද?

4 අප රටේ උස් කඳු මොනවා ද?

5 සානුව යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

6 නිම්නයක් යනු කුමක් ද?

7 ගංගාවක් යනු කුමක් ද?

8 දිය ඇලි සැදෙන්නේ කෙසේ ද?

9 ශ්‍රී ලංකාව බෙදිය හැකි ප්‍රධාන භූ විෂමතා කලාප මොනවා ද?

10 මධ්‍යම කඳුකරය ලෙස හඳුන්වන්නේ කුමන ප්‍රදේශය ද?

වාග්මාලාව

භූ විෂමතාව, මුහුදු මට්ටම, කඳු, තැනිතලා, සානුව, නිම්න, ගංගා, ගංමෝය, දිය ඇලි, භූ විෂමතා කලාප, මෙරළබඩ ලක්ෂණ, මුහුදු බෙංක්ක, කලපුව, භූඩුව, අඩතැන්න, මධ්‍ය කඳුකරය, ඩෙල්ටා

2.1 ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ

පොළොව මතු පිට භූමිය සෑම තැනකම එක ම ආකාරයට පිහිටා නැත. ඔබේ පාසල් වත්ත හෝ ගෙ වත්ත ගැන සිතා බලන්න. පොළොව එක ම මට්ටමක සමතලා ලෙස දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. සමහර තැනක පොළොව පහත් ය; උස ය; ගොඩැලි සහිත ය. තවත් තැනක මඩ වගුරක් හෝ ජලාශයක් හෝ දකිය හැකි ය. පොළොවේ නොයෙක් ආකාරයේ උස් පහත් බිම් තිබේ. මෙ ලෙස යම් ප්‍රදේශයක භූමිය සෑම තැන ම ඒකාකාර නො වන බවත්, නොයෙක් වෙනස්කම් ඇති බවත් පැහැදිලි වේ. භූමියෙහි ඇති මෙ වැනි වෙනස්කම් භූ විෂමතාව යනුවෙන් හැඳින් වේ. ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ කිහිපයක් අපි දැන් අධ්‍යයනය කරමු.

අප රට මුහුදින් වට වී ඇති බව අපි දනිමු. ඕනෑ ම ගොඩබිමක උස මනිනු ලබන්නේ මුහුදු මට්ටමේ සිට ය. මුහුදු මට්ටම දක්වන රේඛාව සාමාන්‍යයෙන් උස 0 ලෙස සැලකේ. මුහුදු මට්ටමට ඉහළින් වඩාත් මතු වී පෙනෙන උස් බිම් කඳු යනුවෙන් හැඳින් වේ. පහත් බිම් තැනිතලා යනුවෙන් හැඳින් වේ. විශාල ප්‍රදේශයක් පුරා කඳු පැතිරී තිබේ නම් ඒ ප්‍රදේශය කඳුකර ප්‍රදේශයක් ලෙස ද තැනිතලා බහුල ප්‍රදේශයක් නම් එය තැනිතලා ප්‍රදේශයක් ලෙස ද හැඳින් විය හැකිය. අප රටේ සමාන මට්ටමකින් යුත් පහත් බිම් හෙවත් තැනිතලා බොහෝ විට දක්නට ලැබෙන්නේ වෙරළට ළංවය. මුහුදු මට්ටමේ සිට මීටර 300 ක් දක්වා උසට දිවෙන එම තැනිතලා මුහුදුබඩ තැනිතලා ලෙස හැඳින් වේ. එහෙත් කඳු, මුහුදු මට්ටමේ සිට මීටර දහස් ගණන් උසට පිහිදේ. 2.1 රූපය දෙස බලමු. අපේ රටේ උස් කඳු ප්‍රදේශය රට මැද පිහිටා ඇත. මෙහි ඉස්මතු වී පෙනෙන ඉතා උස් කඳු මුදුන් කිහිපයක් වේ.



ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය

2.1 රූපය

අප රටේ උස ම කන්ද වන පිදුරුතලාගල පිහිටියේ කොහි ද යි බලන්න. එහි උස මීටර 2509.4 කි. සමනල, කිරිගල්පොත්ත, නමුනුකුල, නකල්ස් ආදී කඳු පන්ති පිහිටා ඇත්තේ කොහි ද යි බලන්න. මේ හැර සිගිරිය, යාපහුව, ගෝවින්ද හෙළ වැනි හුදකලාව පිහිටි කඳු ද අප රටේ ඇත.



2.2 රූපය

මුදුනත බෙහෙවින් ම සමතලා ව පිහිටි විශාල උස බිමකට සානුව යයි කියනු ලැබේ. මේවා උස සම භූමි නමින් ද හැඳින්වේ. ශ්‍රී ලංකාවේ ඔධ්‍යම කඳුකරයේ උස බිම්වල පිහිටි හැටන් සානුව සහ වැලිමඩ සානුව මේවාට නිදසුන් වේ.

කඳු අතර ඇති පහත් බිම් නිම්න යනුවෙන් හැඳින්වේ. නිම්නය දෙ පස ඇත්තේ කඳු ය. දෙ පස ඇති කඳු නිම්නය දෙසට බැවුම් වේ. ඇතැම් නිම්න ඔස්සේ ගංගා ගලා බසී. ඇතැම් නිම්න පටු ය. ගැඹුරු ය. කඳුකර භූමිවල බොහෝ සෙයින් දක්නට ලැබෙන්නේ පටු ගැඹුරු නිම්නයන් ය. පහත් බිම් ප්‍රදේශවල ඇත්තේ මද බැවුම් සහිත පුළුල් නිම්නයන් ය.



2.3 රූපය

2.2 ප්‍රධාන ගංගා

අප රටේ ගංගා වැඩි ප්‍රමාණයක් මධ්‍යම කඳුකරයෙන් පටන් ගෙන නන් දෙසට පිහිදී මුහුදට ගලා බසී. මධ්‍යම කඳුකරයේ අවුරුද්දේ මුළුල්ලේ ම වර්ෂාව ලැබෙන ප්‍රදේශවලින් ආරම්භ වන මෙම ගංගාවල ජලය අවුරුද්දේ තුළ ම පවතී. එහෙත්, සමහර ගංගාවලට ජලය ලැබෙන්නේ අවුරුද්දේ මාස කිහිපයක් තුළ පමණි. විල් ඔය, හැඩ ඔය, ගල් ඔය ආදිය ඉන් සමහරකි. මේ ගංගා පටන් ගන්නේ කඳුකරයේ එක්තරා කාල සීමාවක් තුළ වැසි ලැබෙන කොටසෙනි වැසි නැති කාලයේ මේවායේ ජලය බොහෝ දුරට සිඳී යයි. මෙ වැනි ගංගා බෙහෙවින් දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර කොටසේ ය. ශ්‍රී ලංකාවේ ගංගා 103 ක් පමණ ඇති අතර ප්‍රධාන ගංගා ලෙස සැලකිය හැකි වනුයේ 84 කි. ගංගාවක් මුහුදට වැටෙන ස්ථානය ගං මෝය හෙවත් ගං මුව දෙර නමින් හැඳින්වේ.

ඔධ්‍යම කඳුකරයෙන් පටන් ගන්නා ඇතැම් ගංගාවල ජලය උස් ඔට්ටමක සිට ප්‍රපාතාකාර බැවුමක් ඔස්සේ පහත් ඔට්ටමකට පිවිසීමේ දී එක්වර පහතට ඇද හැලේ. එවැනි අවස්ථාවල දිය ඇලි සැදේ. දුන්හිඳ, දිඇලුම, ලක්ෂපාන සහ ඇබර්ඩීන් දිය ඇලි ඉන් සමහරකි.



ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා

2.4 රූපය

1. කැලණි ගඟ
2. කළු ගඟ
3. බෙන්තොට ගඟ
4. ගිං ගඟ
5. නිල්වලා ගඟ
6. වලවේ ගඟ
7. කිරිඳි ඔය
8. මැණික් ගඟ
9. කුඹුක්කන් ඔය
10. විල් ඔය
11. හැඩ ඔය
12. කරඳ ඔය
13. ගල් ඔය
14. අන්දල්ල ඔය
15. මඟලවටන් ආරු
16. වුන්දෙනි ආරු
17. මාදුරු ඔය
18. මහවැලි ගඟ
19. කන්තලේ ගඟ
20. පන්කුලම් ආරු
21. යාන් ඔය
22. මා ඔය
23. පේ ආරු
24. කනගරායන් ආරු
25. මන්ඩකල් ආරු
26. පලි ආරු
27. පරන්ගි ආරු
28. නේ ආරු
29. මල්වතු ඔය
30. මෝදරගම් ඔය
31. කලා ඔය
32. මී ඔය
33. දුදුරු ඔය
34. මහ ඔය

සිතියමේ සිරස් තලයෙන් කියැවෙන පරිදි මෙම රූපයෙහි දක්වා ඇත්තේ අප රටේ ගංගා අතරෙන් ප්‍රධාන ගංගා පමණකි. ඉන් ප්‍රධානතම ගඟ කුමක් දැයි ඔබට කිව හැකි නේ ද? සිතියම දෙස අවධානයෙන් යුතුව බැලීමෙන් පවා ඔබට එය පහසුවෙන් තෝරා ගත හැකි යි. එය අප රටේ දිග ම ගංගාව ද වේ. එසේ ම අප රටේ දියුණුව සඳහා රජය විසින් ක්‍රියාත්මක කළ විශාලතම ස.වර්ධන ව්‍යාපාරය ද ඒ ගඟ හා සම්බන්ධ ය. එම ගඟ මහවැලි ගඟ යි. එය දිගින් කිලෝමීටර 330 ක් වේ. සිතියමෙහි එය අංක 18 යනුවෙන් දක්වා ඇත. සෙසු ගංගා අතරෙන් කැලණි (1) කළු (2), ගිං (4), නිල්වලා (5), වලවේ (6), කිරිඳි ඔය (7), මැණික් (8), මල්වතු ඔය (29), කලා ඔය (31) හා දුදුරු ඔය (33) වඩා වැදගත් ලෙස සැලකිය හැකිය.



ශ්‍රී ලංකාවේ භූ විපමතා කලාප
2.5 රූපය



ශ්‍රී ලංකාවේ කඳුකර බිම් සහ පහත් බිම්

2.6 රූපය

2.2 භූ විෂමතා කලාප

මෙතෙක් අප ඉගෙන ගත් භූ විෂමතා ලක්ෂණ මුල් කොට ගෙන අප රට භූ විෂමතා කලාපවලට බෙදිය හැකි ය. පොදු භූමි ලක්ෂණ පැතිර ඇති ප්‍රදේශ භූ විෂමතා කලාප නම් වේ. වෙරළබඩ තැන්න, අඩතැනි කලාපය, මධ්‍යම කඳුකරය, සබරගමු කඳු සහ ගල්ඔය කඳු අප රටේ ඇති භූ විෂමතා කලාප වේ.

වෙරළේ සිට රට තුළට යත් ම භූමිය ක්‍රමයෙන් උසින් වැඩි වන බව අපි දනිමු. මුහුදු මට්ටමේ සිට දළ වශයෙන් මීටර 200 කට වඩා උස් ප්‍රදේශ කඳුකර බිම් ලෙස ද උසින් ඊට අඩු ප්‍රදේශ පහත් බිම් ලෙස ද සලකනු ලැබේ. මීටර 200 සමෝච්ච රේඛාව මඟින් උස් බිම් සහ පහත් බිම් වෙන් කැරේ. (සමාන උසක් ඇති ස්ථාන සියල්ල එකතු කරමින් අඳිනු ලබන රේඛාව සමෝච්ච රේඛාවකි. (2.6 රූපය බලන්න).

2.3.1 වෙරළබඩ තැන්න

අප රටේ මුහුදු වෙරළ ආශ්‍රිත ප්‍රදේශය වෙරළබඩ තැන්න වශයෙන් සැලකේ. එහි සීමාව ලෙස මීටර 30 සමෝච්ච රේඛාව සැලකිය හැකි ය. මෙම වෙරළබඩ කලාපයේ කැපී පෙනෙන ස්වරූපය වන්නේ තැනිතලා බවයි. වෙරළ කලාපයේ සෑම තැනම එක් ආකාරයකින් පිහිටා නැති අතර එහි විවිධ ලක්ෂණ ඇති බැවි ඔබට සිතියම බැලීමෙන්



2.7 රූපය

වුව ද වැටහෙනු ඇත. මුහුදු බොකු, කලපු, තුඩු ආදිය එබඳු විවිධ ලක්ෂණවලින් සමන්විත වේ.

මුහුදු ගොඩ බිම තුළට කා වැදීමෙන් මුහුදු බොක්ක සෑදේ. මුහුදු බොක්ක පිරී ඇත්තේ මුහුදු ජලයෙන් හෙවත් කරදියෙනි. මෙය තුන් පැත්තකින් ගොඩබිමින් වට වී ඇත. වැලිගම, ආරුගම් බොක්ක, කොට්ටියාර් බොක්ක මෙබඳු බොකුවලට නිදසුන් ලෙස දැක්විය හැකි ය. ඇතැම් විට ප්‍රමාණයෙන් විශාල ගැඹුරු මුහුදු බොකු වරායයන් ලෙස ප්‍රයෝජනයට ගැනේ. ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි ස්වාභාවික වරායක් වන ත්‍රිකුණාමලය විශාල මුහුදු බොක්කක් තුළ පිහිටා ඇත.

කලපුව යනු පටු ගොඩබිම් තීරයක් මඟින් මුහුදෙන් තරමක් දුරට වෙන් වූ එහෙත් මුහුද හා සම්බන්ධ නොගැඹුරු ජලාශයකි. කලපුව මුහුදට සම්බන්ධ වන ස්ථානය ඉතා පටු ය. කලපුවල ජලය කිවුල් ය. මීගමු කලපුව, හලාවත කලපුව, පුත්තලම් කලපුව, මඩකලපුව අප රටේ ඇති ප්‍රධාන කලපු කිහිපයකි.



2.8 රූපය

මුහුදු දෙසට නොරා ගිය ගොඩබිම් පෙදෙස් තුඩු නමින් හැඳින් වේ. පේදුරු තුඩුව, දෙවුන්දර තුඩුව, ඇත් තුඩුව, රාක්ෂ තුඩුව ඊට නිදසුන් වේ.



2.9 රූපය

ඩෙල්ටා ස්වරූපයක් ගන්නා ලක්ෂණ ද වෙරළබඩ කලාපයේ දක්නට ඇත. ගංගා මුහුදට වැටෙන ස්ථානයේ දී ශාඛා කිපයකට බෙදේ නම් එම ශාඛා අතර දියඵ තැන්පත් වේ. එසේ දියඵ තැන්පත් වීමෙන් සෑදෙන ප්‍රදේශ ඩෙල්ටා නම්. මහවැලි ගඟ, කලා ඔය ආදී ගංගා මුහුදට ගලා බසින ස්ථානවල මෙ බදු ලක්ෂණ දක්නට ලැබේ.

2.3.2 අඩ තැනි කලාපය

වෙරළබඩ තැන්තේ සීමාව ලෙස සැලකෙන මීටර 30 සමෝච්ච රේඛාවත් මීටර 300 සමෝච්ච රේඛාවත් අතර පිහිටි බිම් ප්‍රදේශය අඩතැනි කලාපයට අයත් වේ. **අඩතැන්න** යනු මුල් කාලයේ දී උස් බිමක් ව පැවැත, කාලයක් නිස්සේ අඩිඹ ලෙස බාදනයවීම නිසා පහත් සමතලා බිමක් හෙවත් තැනිතලාවක ස්වරූපයක් ගනිමින් පවත්නා බිමයි. තැනින් තැන ශේෂ කඳු පිහිටා තිබීම අඩතැනි කලාපයේ විශේෂ ලක්ෂණයකි. 2.10 රූපය බලන්න. ඇතැම් ශේෂ කඳු උසින් මීටර 300 ද ඉක්මවයි. මිහින්තලේ, රිවිගල, දිඹුලාගල, කුරුණෑගල. කතරගම කන්ද, සීගිරිය ආදිය එම කඳුවලට සමහරකි.

2.3.3 මධ්‍යම කඳුකරය

මුහුදු මට්ටමේ සිට මීටර 300 ට වඩා උස් ප්‍රදේශ මධ්‍යම කඳුකරය ලෙස අපි සලකමු. ප්‍රධාන කඳුකරය හෙවත් මධ්‍යම කඳුකරය රට මැද පිහිටා ඇත. (2.1 රූපය බලන්න). ශ්‍රී ලංකාවේ උස් කඳු මුදුන් සියල්ල ම පාහේ මධ්‍යම කඳුකරයේ පිහිටා ඇත. මෙ වැනි කඳු මුදුන් පිහිටා ඇත්තේ සමනල, පිදුරුතලාගල, නමුනුකුල වැනි කඳු පන්තිවල ය. හැටන්, වැලිමඩ සහ මහනුවර වැනි සානු ද දුන්හිඳ, දියඵම, ලක්ෂපාන, වැනි දිය ඇලි ද මධ්‍යම කඳුකරයේ භූ විෂමතා ලක්ෂණ අතර කැපී පෙනේ.

2.3.4 සබරගමු කඳු

මධ්‍යම කඳුකර ප්‍රදේශයට නිරිත දිගින් පිහිටා ඇත්තේ සබරගමු කඳු ය. (2.5 රූපය බලන්න). මේවා රක්වාන කඳු හෙවත් බුළුතොට කඳු නමින් ද හැඳින්වේ. හිනිදුම, කොග්ගල, කුකුළුගල මෙහි පිහිටි උස් කඳු වලින් සමහරකි.

2.3.5 ගල්ඔය කඳු

මධ්‍යම කඳුකර ප්‍රදේශයට නැගෙනහිරින් සහ ගිනිකොණින් පිහිටා ඇති කඳු පන්තිය ගල්ඔය කඳු නමින් හැඳින්වේ. (2.5 රූපය බලන්න). ශේෂ කඳු කිපයක් මෙහි වේ. ඉඟිනියාගල, කොකාගල, මොනරාගල, ගෝවින්ද හෙල මින් කිපයකි.

සාරාංශය

පොළොව මතුපිට ඇති වෙනස්කම් භූ විෂමතා ලක්ෂණ යනුවෙන් හැඳින්වේ. පොළොවේ ඕනෑ ම ස්ථානයක උස මනිනු ලබන්නේ මුහුදු මට්ටමේ සිට ය. මුහුදු මට්ටමට ඉහළින් පිහිටා ඇති භූමි පෙනෙන උස් බිම් කඳු නමින් ද සමතලා පහත් බිම් තැනිතලා නමින් ද හැඳින් වේ. සමතලා ව පිහිටි විශාල උස්බිමක් හඳුන්වනුයේ සානුව නමිනි. කඳු අතර ඇති පහත් බිම් නිම්න නම් වේ. ඇතැම් නිම්න හරහා ගංගා ගලා බසී. ගංගාවක් යනු පොළොව මත ස්වාභාවික ව ගලා යන ජල පහරකි. ගංගාවක් මුහුදට වැටෙන ස්ථානය ගං මෝය යනුවෙන් හැඳින්වේ. ගංගාවක් උස් මට්ටමක සිට ප්‍රපාතාකාර බැවුමක් ඔස්සේ පහත් මට්ටමකට පිහිතීමේ දී දිය ඇලි සෑදේ.



ශ්‍රී ලංකාවේ අඩතැනි ප්‍රදේශය

2.10 රූපය

භූ විෂමතාව මුල් කොට ගෙන ශ්‍රී ලංකාව වෙරළබඩ තැන්න, අඩතැන්න, මධ්‍යම කඳුකරය, සබරගමු කඳු සහ ගල්ඔය කඳු ඇතුවෙන් කලාප පහකට බෙදිය හැකි ය.

ක්‍රියාකාරකම්

1. ශ්‍රී ලංකාවේ සිතියමක ප්‍රධාන කඳු සහ ප්‍රධාන ගංගා **පහ** බැගින් ලකුණු කරන්න.

2. හිස් තැන පුරවන්න.

   i. ඔනෑ ම ගොඩ බිමක උස මිනිතු ලබන්නේ.....සිට ය.

   ii මුදුනත බෙහෙවින් සමතලා ව පිහිටි විශාල උස් බිමකට..... .....යයි කියනු ලැබේ.

   iii කඳු අතර ඇති පහත් බිම්..... .....නමින් හැඳින්වේ.

   iv. මුහුදු දෙසට නෙරා ගිය ගොඩබිම් පෙදෙස් .....නම් වේ.

   v. අප රටේ මුහුදු වෙරළ ආශ්‍රිත ප්‍රදේශය.....නමින් හැඳින්වේ.

3. පහත සඳහන් වාක්‍ය අතුරින් නිවැරදි වාක්‍ය යටින් ඉරි අඳින්න.

   i ගංගාවක් යනු පොළොව මත ස්වාභාවික මාර්ගයක් ඔස්සේ ගලන දිය පහරකි.

   ii අප රටේ ගංගා වැඩි ප්‍රමාණයක් පටන් ගන්නේ විශාල කලාපයෙනි.

   iii ගංගාවක් මුහුදට වැටෙන ස්ථානය ගං මෝය නමි.

   iv සමහර ගංගා මුහුදට වැටෙන ස්ථානයේ දී ශාඛා කීපයකට බෙදේ.

   v ඇතැම් ගංගා උස් ම්ව්ටමක සිට ප්‍රපාතාකාර බැවුමක් ඔස්සේ පහත් මට්ටමකට පිවිසීමේ දී දිය ඇලි සාදයි.

4. ශ්‍රී ලංකාවේ කඳු, සානු, ගංගා, දිය ඇලි, කලපු ආදියේ පින්තූර හැකිතාක් එකතු කොට පන්තියට ගෙනවුත් පෙන්වන්න.

5. පහත සඳහන් කඳු ශ්‍රී ලංකාවේ කුමන භූ විෂමතා කලාපයට අයත් දැ සි තෝරා දක්වන්න.

   මිහින්තලේ, කුකුළුගල, ඉහිනියාගල, කොකාගල, රිවිගල, ගොන්ගල, මොනරාගල, දිඹුලාගල.

6. ඔබ ඉගෙන ගත් වෙරළ ලක්ෂණ ඇතුළත් කොට මුහුදු වෙරළක දර්ශනයක් ගොඩ නගන්න.

7. තුඩුව, කලපුව, බොක්ක යන වෙරළ ලක්ෂණ රූප සටහන් මගින් දක්වන්න.

3

ශ්‍රී ලංකාවේ කාලගුණය හා දේශගුණය

පාඩමට සූදානම් වීම

මේ පාඩමේ ඇත්තේ කාලගුණය හා දේශගුණය පිළිබඳ කරුණු ය. කාලගුණය හා දේශගුණය අතර වෙනස ද කාලගුණය මනින ආකාරය ද මෙහි දක්වේ. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් මේ පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. කාලගුණය යනු කුමක් ද ?
2. දේශගුණය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද ?
3. කාලගුණ පෙරනිමිති දැන සිටීම විශේෂයෙන් වැදගත් වන්නේ කවර අයට ද ?
4. උෂ්ණත්වය, වර්ෂාපතනය සහ පීඩනය මැනීමට යොදා ගන්නා උපකරණ මොනවා ද ?
5. සුළඟ හමන වේගය මිනිමා උපකරණය කුමක් ද ?
6. මුහුදු සුළං සහ ගොඩ සුළං මොනවා ද?
7. වර්ෂාව ඇති වන්නේ කෙසේ ද ?
8. අප රටට ලැබෙන ප්‍රධාන වර්ෂා වර්ෂ මොනවා ද ?
9. වර්ෂාපතන ව්‍යාප්තිය අනු ව අප රට බෙදිය හැකි කලාප මොනවා ද ?

වාංමාලාව

කාලගුණය, දේශගුණය, උෂ්ණත්ව මානය, වර්ෂාමානය, පීඩන මානය, සුළං දිශා දර්ශකය, අතිල මානය, සම්කය, මුහුදු සුළං, ගොඩ සුළං, සංනෘප්ත වායුව, වර්ෂාව, මෝසම්, සංවහන, වායුපුළි, තෙත් කලාපය, වියළි කලාපය, අර්ධ ශුෂ්ක කලාපය, රෑං පෙති, වලාකුළ

3.1 කාලගුණය හා දේශගුණය

අප අහස දෙස බැලූ විට දිනකට නිල් පැහැති, පැහැදිලි අහසක් දකිය හැකි ය. තවත් දිනක වැහිබර අඳුරු අහසක් දැකිය හැකි ය. සමහරවිට දින කිපයක් තොට නොඩවා නද වැසි ඇති වේ. ඉන් පසු අඛණ්ඩ සූර්ය රශ්මිය සහිත දිනයක් පැවතිය හැකි ය. තවත් දිනක තද සුළං හමා යනු ඇත. උෂ්ණත්වය, වර්ෂාව, සුළඟ හමන දිශාව, වලාකුළුවල ස්වභාවය, වානයේ තෙත් බව, වියළි බව යනාදියේ වෙනස්කම් නිරතුරු ව අප අවට වායුගෝලයේ ඇති වේ. උදේ දහය, දහයයි තිහ වැනි කිසියම් වේලාවක දී හෝ පැයක්, පැය දෙක තුනක්, දිනක්, දින දෙක තුනක්, සතියක් නැතහොත් සති කීහිපයක් වැනි සාමාන්‍යයෙන් කෙටි කාල පරිවේඡේදයක් තුළ පවතින වායුගෝලයේ ස්වභාවය අපි කාලගුණය යනුවෙන් හඳුන්වමු. එහෙත් දේශගුණය මීට වෙනස් වේ. දීර්ඝ කාල පරිවිඡේදයක් සඳහා වායු ගෝලයේ ස්වභාවය දේශගුණය යනුවෙන් හැඳින්වේ. මෙසේ කාලගුණය හා දේශගුණය යන පද දෙකෙහි ම වායුගෝලයේ ස්වභාවය විස්තර වේ. මේ දෙක අතර වෙනස අදාළ කාල ප්‍රමාණය පිළිබඳ ව වූ වෙනසක් පමණකි.

එදිනෙදා කාලගුණය පිළිබඳ දැන ගැනීමට බොහෝ අය උනන්දු වෙති. එය ඔවුන්ගේ එදිනෙදා ජීවිතයට බලපාන බැවිනි. ඔබ ද ගුවන් විදුලිය මඟින් සහ රූපවාහිනිය මඟින්

දිවයිනේ කාලගුණය පිළිබඳ පූර්ව නිවේදන අසනු ඇත. අසහපත් කාලගුණය බෝග වගාවන්, ගමන් බිමන් ආදියට අහිතකර ලෙස බලපායි. නිදසුන් වශයෙන් මසුන් මරන්නකු මුහුදු යෑමට පෙර එ දින වැසි සහ සුළං සහිත කාලගුණය පවතිනු ඇතැ යි දැන ගත හොත් එ දින මුහුදු යෑම අනතුරුදායි බැවින් ඔහුට එයින් වැළකී සිටිය හැකි ය. එ සේ ම නාවිකයනට, ගුවන් නියමුවන්ට කාලගුණ පෙර නිමිති දැන සිටීම ඉතා අවශ්‍යය. කාලගුණය පිළිබඳ සොයා බලනා කාලගුණ විද්‍යාඥයෝ වෙති. අප රටේ ද කාලගුණය පිළිබඳ කටයුතු සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවක් වේ. මෙම ආයතනය යටතේ දිවයිනේ විවිධ ස්ථානවල කාලගුණ දත්ත එක්රැස් කරන කාලගුණික මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවා ඇත.

3.2 කාලගුණික ලක්ෂණ මැනීම

වායුගෝලයේ ස්වභාවය ගැන සෙවීමේ දී උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළං හමන දිශාව, සුළඟේ වේගය යනාදි කාලගුණික ලක්ෂණ ගැන් තොරතුරු දැන ගත යුතු ය. කාලගුණ විද්‍යාඥයෝ කාලගුණික ලක්ෂණ මැන ගැනීමට නොයෙක් උපකරණ යොදා ගනිති. මේ උපකරණ මඟින් අප අවට වාතය කෙතරම් උෂ්ණ ද? ශීත ද? අහස කෙතරම් පැහැදිලි ද? වලාකුළු සහිත ද? වාතයේ තොපමණ ජලය අඩංගු ද? වර්ෂාව කොපමණ ලැබේ ද? වායු පීඩනය කොපමණ ද? සුළඟ කෙතරම් වේග වත් ද? සුළඟ හමන්නේ කුමන දිශාවෙන් ද ආදී කාලගුණික ලක්ෂණ රැසක් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ය.

උෂ්ණත්වය සතු යම් දෙයක උෂ්ණත්ව ප්‍රමාණය බව අපි දනිමු. උෂ්ණත්වය මැනීමට යොදා ගන්නා උපකරණය උෂ්ණත්ව මානය යි. මින් අප අවට වාතය උණුසුම් වන ප්‍රමාණය මැන ගත හැකි ය.

උෂ්ණත්ව මානය පටු නිදුරු නළයකින් යුක්තය. එහි පහළ කෙළවරේ රසදිය හෝ මද්‍යසාර සහිත බුබුලක් වේ. උෂ්ණත්වය වැඩි වන විට නළයේ රසදිය හෝ මද්‍යසාර තීව්‍රතම ඉහළ යෑම ද උෂ්ණත්වය අඩු වන විට එය පහළ යෑම ද සිදු වේ. උෂ්ණත්වය මනින්නේ සෙන්ටිග්‍රේඩ හෙවත් සෙල්සියස් අංශකවලින් හෝ පැරන්හයිට් අංශකවලිනි.



උෂ්ණත්ව මානය

3.1 රූපය

වර්ෂාව මැනීමට යොදා ගන්නා උපකරණය වර්ෂාමානය යි. වර්ෂාව මනිනුයේ මිලි මීටර වලිනි. එක් එක් දිනයේ වර්ෂාමානයට එක් වූ ජලය මැන බැලීමෙන් වර්ෂාපතන ප්‍රමාණය සටහන් කර ගත හැකි ය.





වර්ෂා මානය

3.2 රූපය

වාතයේ පීඩනය මැනීමට යොදා ගන්නා උපකරණය වායු පීඩන මානය යි. වායු ගෝලයේ ඇති වාතයේ බර නිසා වායු



පීඩන මානය

3.3 රූපය

ගෝලය තුළ තැබූ ඕනෑ ම වස්තුවක් මත තෙරපුමක් ඇති වේ. වාතයේ පීඩනය යනුවෙන් මෙය හැඳින්වේ. වාතයේ පීඩනය ද නිරතුරුව වෙනස් වේ. එක ම මට්ටමක පිහිටි ස්ථාන අතර ද පීඩනය වෙනස් විය හැකිය. සුළං හැමීම සිදු වන්නේ පීඩනය වැඩි ස්ථාන වල සිට පීඩනය අඩු ස්ථානවලටය.

සුළඟ හමන දිශාව දැන ගැනීමට ද උපකරණයක් වේ. එය සුළං දිශා දර්ශකය යි. මේ වැනි උපකරණ උස් ගොඩනැගිලි මුදුනෙහි සවි කර තිබෙනු ඇතැම් විට ඔබ දැක ඇත.



සුළං දිසා දර්ශකය

3.4 රූපය



අනිල මානය

3.5 රූපය

සුළඟ හමන වේගය මැනීමට ද උපකරණයක් තිබේ. එය අනිලමානය නම් වේ. එය සිරස් අක්ෂයක් වටා කැරකෙන රෑං පෙත්තකි.

3.5 රූප සටහනේ ඊතලවලින් පෙන්වා ඇති දිගාවට සුළං හමන කල කෝප්පයක හැඩය ඇති 'A' පෙත්තට සුළං බදියි. 'C' පෙත්ත මත සුළඟ වදින්නේ කෝප්පයේ නොපිටට බැවින් එයට සුළං බැඳීම අඩු ය. මේ නිසා සුළං පෙත්ත වම් අතට කැරකෙයි. අනිල-මානය තත්පරයකට කැරකෙන වාර ගණන සුළඟේ වේගය අනු ව වෙනස් වේ.

සුළඟ පිළිබඳ ව කරුණු සෙවීමට රූං පෙති ද බෙහෙවින් උපකාරී වෙයි. රූං පෙත්තක් සාදු නොයෙකුත් දිශාවලට අල්ලා බැලූ විට එය වඩා හොඳින් කැරකෙන්නේ සුළඟ හමා එන දිශාවට මුහුණ ලා තිබෙන සේ ඇල්ලූ විට ය. එය කැරකෙන වේගය සුළඟේ වේගය අනු ව වෙනස් වෙයි. සුළඟ හෙමින් හමන විට රූං පෙත්ත ද හෙමින් කැරකෙයි. සුළඟ වේගයෙන් හමන විට රූං පෙත්තේ වේගය ද වැඩි වෙයි.



රූං පෙත්ත

3.6 රූපය (අ) 3.6 රූපය (ආ)

වාතයේ තෙත් බව, වියළි බව ආදිය ද කාලගුණික ලක්ෂණ ලෙය සැලකේ. වාතයේ ඇති ජලවාෂ්ප ප්‍රමාණය වැඩි නම් එ විට වාතය තෙත් බවෙන් යුක්ත යයි කියනු ලැබේ. වාතයේ ඇති ජලවාෂ්ප ප්‍රමාණය අඩු නම් වාතය වියළි යයි කියනු ලැබේ. වාතයේ තෙත් බව, වියළි බව මැනීමට උපකරණයක් වේ. එය ආර්ද්‍රතා මැනීමේ උපකරණය යි.

අහසේ නොයෙක් හැඩයේ වලාකුළු අපට දැකිය හැකි ය. සමහර විට වලාකුළු නො මැති පැහැදිලි අහස ද අපට දක්නට පිළිවන.

අපි මේ තෙක් කාලගුණ තොරතුරු ලබා ගැන්නා අන්දම ඉගෙන ගතිමු. අවුරුදු ගණ-නාවක කාලගුණ තත්ත්වය පිළිබඳ වාර්තා තබා ගැනීමෙන් ප්‍රදේශයක දේශගුණය කෙබඳු ද යි දැන ගත හැකිය. දේශගුණය ද වෙනස් වේ, එහෙත් එසේ වෙනස් වන්නේ කාල-ගුණයට වඩා ඉතා සෙමිනි. කිසියම් ප්‍රදේශයක පවත්නා දේශගුණයේ යම් වෙනසක් සිදු වීමට දීර්ඝ කලක් ගත වේ.

3.3 උෂ්ණත්වය

පහත සඳහන් සටහන දෙස බලන්න. ලෝක ගෝලය සමාන කොටස් දෙකකට බෙදෙන අන්දමට බටහිර සිට නැගෙනහිරට ඇඳ ඇති රේඛාව සමකය (නිරක්ෂය) යි. ඇත්ත වශයෙන් ම ලෝකය හරහා එ වැනි රේඛාවක් නැත. එය ඉගෙනීමේ පහසුව සඳහා ආදර්ශ ගෝලය මත අඳින ලද කල්පිත රේඛා-වකි. සමකයට උතුරින් ඇත්තේ උතුරු අර්ධ ගෝලය යි.



3.7 රූපය

සමකයට දකුණින් ඇත්තේ දකුණු අර්ධ ගෝලය යි. උත්තර ධ්‍රැවය සහ දක්ෂිණ ධ්‍රැවය හිම මිදුණු ඉතා ශීත පෙදෙස් ය. ශ්‍රී ලංකාවේ පිහිටීම බලන්න. ශ්‍රී ලංකාව සමක-යට ආසන්න කුඩා රටකි. සමකයට ආසන්න

ප්‍රදේශවලට අවුරුද්දේ සෑම දිනක ම සූර්යයා මුදුන් වේ. ශ්‍රී ලංකාව සමකය ආසන්නයේ පිහිටියත් ඉතා අධික උෂ්ණත්වයෙන් යුක්ත වේ. දූපතක් ව පිහිටීම, උස, හමන සුළං ආදි කරුණු අනු ව අප රටේ උෂ්ණත්වය වෙනස් වෙයි. හම්බන්තොට වැනි වෙරළ අසල නගර-යක සහ නුවරඑළිය වැනි මුහුදු මට්ටමෙන් බොහෝ උසින් පිහිටි නගරයක උෂ්ණත්වයේ වෙනස මෙයට නිදසුන් ය.

අප රට ප්‍රමාණයෙන් කුඩා නිසා උෂ්ණත්-වය ප්‍රාදේශිය වශයෙන් එ තරම් වෙනස් නොවේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් (සෙන්ටිග්‍රේඩ්) අංශක 27.5 ක් පමණ වේ. එහෙත් මුහුදු මට්ටමේ සිට ඉහළට යන සෑම මීටර 164 කට ම උෂ්ණත්වය සෙල්-සියස් අංශක 1 බැගින් අඩු වේ. මුහුදු මට්ටමේ සිට මීටර 1828 කට ආසන්න උසක පිහිටි නුවරඑළියේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 16 ක් පමණ වේ.

ස්ථාන කිහිපයක සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය

අනුරාධපුරය	—	27.2°C
බදුල්ල	—	22.8°C
මඩකලපුව	—	27.5°C
කොළඹ	—	26.0°C
ගාල්ල	—	26.7°C
යාපනය	—	27.7°C
හග්ගල	—	17.2°C
නුවරඑළිය	—	15.6°C
රත්නපුරය	—	26.9°C
මන්නාරම	—	27.8°C
හම්බන්තොට	—	27.0°C

ශ්‍රී ලංකාවේ සුළං රටා

අ. සංවහන සංසරණය – දිවා කාලය



ආ. සංවහන සංසරණය – රාත්‍රී කාලය සහ අලුයම් කාලය



3.8 රූපය

3-4 වර්ෂාපතන ක්‍රියාවලිය

ගොඩබිම ජලයට වඩා ඉක්මනින් රත් වේ. මේ නිසා දහවල් කාලයේ දී ගොඩබිමේ උෂ්ණත්වය ජලය මත උෂ්ණත්වයට වඩා අධික ය. රාත්‍රී කාලයේ දී ගොඩබිම ඉක්මනට සිසිල් වන අතර ජලය සිසිල් වනුයේ සෙමින් ය.

දහවලට ගොඩබිමේ මතුපිට උෂ්ණත්වය මුහුදේ මතුපිට උෂ්ණත්වයට වඩා වැඩි බැවින් ගොඩබිමට උඩින් ඇති වාතය රත් වී ඉහළ නැඟී. මේ නිසා මෙහි අඩු පීඩන කලාපයක් හට ගනී. මෙම අඩුව පිරවීම සඳහා ඒ වන විට වැඩි පීඩන කලාපයක් ව පවතින මුහුදේ සිට ගොඩ බිමට පහළ මට්ටමකින් වායු ධාරාවක් ඇදී එයි. මේවා මුහුදු සුළං නම් වේ. රාත්‍රී කාලයට සිදු වන්නේ මීට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියකි. මුහුදේ මතු පිට උෂ්ණත්වයට වඩා වැඩි හෙයින් මුහුදට උඩින් ඇති වාතය රත් වී ඉහළ නඟින අතර එහි හට ගන්නා අඩු පීඩනය පිරවීම සඳහා වැඩි පීඩන කලාපයක් ව පවතින ගොඩ බිම සිට මුහුදට පහළ මට්ටමකින් වායු ධාරාවක් ඇදී එයි. මේවා ගොඩ සුළං නම් වේ.

අප රට දූපතක් බැවින් දහවල් කාලයට මුහුදේ සිට ගොඩ බිම කරා හමන මුහුදු සුළං විශාල ජල වාෂ්ප ප්‍රමාණයක් ද රැගෙන එයි. යම් වායුවකට දරා සිටිය හැකි ජල වාෂ්ප ප්‍රමාණය උෂ්ණත්වය අනුව වෙනස් වෙයි. එසේ දරා සිටිය හැකි උපරිම ජල වාෂ්ප ප්‍රමාණය එහි අඩංගු නම් එය සංතෘප්ත වායු වකි. ජලවාෂ්ප බහුල මෙම සුළං රට මධ්‍යයේ පිහිටි කඳුවල හැපී ඉහළ යෑමේ දී සිසිල් වෙයි. සිසිල් වී ඝනීකරණය වේ. එවිට ජලවාෂ්ප කුඩා ජල බින්දු බවට හැරෙයි. වාතයේ පා විය හැකි තරමට කුඩා වූ එ වැනි ජල බින්දු රාශියක් වලාකුළක් යනුවෙන් හඳුන්වනු ලැබේ. වලාකුළක් තව දුරටත් සිසිල් වන විට එහි ජල බින්දු විශාල වෙයි. අවසානයේ දී ඒවා වාතයේ පා වීමට නො හැකි තරම් විශාල වී පහළට වැටෙයි. (කිසියම් වායු ස්කන්ධයකට දරා ගත හැකි උපරිම ජල වාෂ්ප ප්‍රමාණයක් අඩංගු වූ කල එය සංතෘප්ත වායුවක් බවට පත් වේ.) මෙ සේ පහළට වැටෙන ජල බින්දු වර්ෂාව යනුවෙන් හැඳින්වේ.

3-5 ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය

ශ්‍රී ලංකාවට වර්ෂාපතනය වර්ෂා ක්‍රම තුනකින් ලැබේ. මෝසම්, සංවහන, වායුසුළි ඒ තුනයි. ශ්‍රී ලංකාව පුරා ම වර්ෂාපතනය සමාන නො වන බව ඔබට සිතියමෙන් පැහැදිලි වනු ඇත.

රටේ නිරිත දිග ප්‍රදේශයට අවුරුද්දේ තුළ ලැබෙන වර්ෂාපතන ප්‍රමාණය මිලි මීටර 2000 කට (අඟල් 75) වැඩි ය. එම වර්ෂාව ලැබෙන්නේ නිරිතදිග මෝසම් සුළංවලිනි. මෙය මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය යි. ජල වාෂ්ප සහිත වාතය මුහුදු හරහා නිරිත දිගින් හමා අවුත් මධ්‍යම කඳුකරයේ හැපී ඉහළ නැඟීමෙන් කඳුකරයෙන් බටහිර ප්‍රදේශයට අධික වර්ෂාව ලැබේ. නොවැම්බර් සිට ජනවාරි දක්වා කාලය තුළ ඊශාන දිග මෝසම් සුළං හමයි. මෙ මඟින් වර්ෂාව බෙහෙවින් ම ලැබෙන්නේ ඊශාන හා නැගෙනහිර ප්‍රදේශවලට ය. මෙම සුළං කෙටි මුහුදු තීරයක් පසු කර හමන බැවින් ඉන් ලැබෙන වර්ෂාපතනය අඩු ය. එය දළ වශයෙන් මිලි මීටර 1250 ක් 2000 අතර වේ.

අපට වැසි ලැබෙන තවත් ක්‍රමයකි සංවහන වැසි. මේවා සවස් කාලයේ දී වහින වැහිවේ. අවුරුද්ද පුරාම පැවතිය හැකි මෙම වැහි මෝසම් බලපෑම් අඩු මාර්තු අප්‍රේල්, සැප්තැම්බර් – ඔක්තෝබර් වැනි මාස වල දී වඩාත් ප්‍රබලව ඇති වේ. අසනි වැහි යනුවෙන් ද හඳුන්වනු ලබන මෙම වැහි මඟින් වැඩිපුර වර්ෂාව ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශයට ය.

ශ්‍රී ලංකාවට වැසි ලැබෙන තවත් ක්‍රමයකි වායුසුළි. අවපාත, සුළි සුළං යනුවෙන් ද මෙම වායුසුළි හැඳින්වේ. වායුසුළි අවුරුද්දේ කවර කලක වුව ද ඇති විය හැකි ය. එහෙත් බොහෝ විට අප රටට ඔක්තෝබර් – නොවැම්බර් මාසවල දී වායුසුළි ඇති වේ. මේ මඟින් වැහි ලැබෙන්නේ උතුරු, නැගෙනහිර සහ ගිනිකොණ දිග පහත් බිම්වලට ය.



ශ්‍රී ලංකාවේ ඕධ්‍ය වාර්ෂික වර්ෂාපතනය
(මිලි මීටර් වලින්)

3.9 රූපය

3-6 දේශගුණික කලාප

ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය සලකා තෙත් කලාපය, වියළි කලාපය සහ අර්ධ ශුෂ්ක කලාපය යනුවෙන් කලාප තුනකට බෙදිය හැකි ය. වර්ෂාපතනය මි.මී. 2000 වැඩි ප්‍රදේශය තෙත් කලාපයට අයත් වේ. මි.මී. 1250 – 2000 ක් අතර වර්ෂාපතනය ලැබෙන



ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප

3.10 රූපය

ප්‍රදේශය වියළි කලාපය යනුවෙන් ද මි.මී. 1250 ට අඩුවෙන් වර්ෂාව ලැබෙන ප්‍රදේශ අර්ධ ශුෂ්ක කලාපය යනුවෙන් ද හැඳින්වේ.

සාරාංශය

යම්කිසි ස්ථානයක බොහෝ කාලයක් තුළ වායු ගෝලයේ පවතින නියම ස්වභාවය කාල ගුණය යනුවෙන් හැඳින්වේ. මිනිසාගේ එදිනෙදා ජීවිතයට කාලගුණය බලපාන බැවින් කාලගුණ පෙර නිමිති දැන ගැනීම වැදගත් ය. කාලගුණය පිළිබඳ සොයා බලන කාලගුණ විද්‍යාඥයෝ බොහෝ වෙති. කාලගුණ ලක්ෂණ මැන ගැනීමට නොයෙක් උපකරණ තිබේ. වායු ගෝලයේ උෂ්ණත්වය මැනීමට යොදා ගන්නේ උෂ්ණත්ව මානය යි. වර්ෂාව මැනීමට යොදා ගන්නේ වර්ෂාමානය යි. වාතයේ පීඩනය මැනීමට යොදා ගන්නා උපකරණය වායු පීඩනමානය යි. සුළඟ හමන දිශාව දැන ගන්නේ සුළං දිශා දර්ශකය ආධාරයෙනි. සුළඟ හමන වේගය මනිනුයේ අනිල මානයෙනි. වාතයේ තෙත් බව, වියළි බව මනිනුයේ ආර්ද්‍රතා මැනීමේ උපකරණයෙනි.

අවුරුදු ගණනාවක කාලගුණ තත්ත්වයේ සාමාන්‍යය දේශගුණය යි. යම් ප්‍රදේශවල පිහිටීම, වුහුදු මට්ටමේ සිට ඇති උස, හමන සුළං ආදී කරුණු අනුව ඒ ප්‍රදේශවල දේශගුණය වෙනස් වෙයි. ශ්‍රී ලංකාව කුඩා රටක් වුව ද දේශගුණික වශයෙන් ගත් කල එක හා සමාන දේශගුණයක් එහි නො පවතී. ඒ ඒ ප්‍රදේශවල පිහිටීම් සහ වුහුදු මට්ටමේ සිට ඇති උස අනුව උෂ්ණත්වය වෙනස් වේ. වර්ෂාපතනය අතින් ද සැලකිය යුතු වෙනස්කම් ඇත. අප රටට වර්ෂාව ලැබෙන ක්‍රම තුනකි. ඒවා මෝසම් සංවහන සහ වාසුලි නම් වේ. ලැබෙන වර්ෂාපතනය අනුව ශ්‍රී ලංකාව තෙත් කලාපය, වියළි කලාපය සහ අර්ධ ශුෂ්ක කලාපය යනුවෙන් කලාප තුනකට බෙදේ.

ක්‍රියාකාරකම්

1. වර්ෂා මානයක් සාදා එහි එකතු වන ජලය දිනපතා මැන සටහන් කර ගන්න.

2. එලිමහනට ගොස් ගුරුතුමාගේ ආධාරයෙන් කාල ගුණය පිළිබඳ තොරතුරු රැස් කොට පහත දෙන ලද සංකේත ඇසුරින් දින පහක හෝ දහයක හෝ පමණ කාලගුණ සටහනක් පිළියෙළ කරන්න.

වර්ෂාව මිලිමීටරවලින්

උෂ්ණත්වය 27°

සුළං දිශාව →

අඩ අඳුරු අහස

පැහැදිලි අහස

වලාකුළු සහිත අඳුරු අහස

අකුණු

3. රූ පෙත්තක් සාදා නොයෙකුත් දිශාවලට වුහුණ ලා සිටින සේ අල්ලා එ මඟින් සුළඟ හමන දිශාව සොයා ගන්න.

4. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප දක්වෙන සිතියමක් අඳින්න.
එහි ඔබේ ගම / නගරය ලකුණු කොට නම් කරන්න.

5. ගොඩ සුළං, වුහුදු සුළං ක්‍රියාවලිය දක්වීමට ගුරුතුමියගේ ආධාර ඇති ව ආකෘතියක් නිර්මාණය කරන්න.

4

පස

පාඩමට සූදානම් වීම

ශ්‍රී ලංකාවේ පස කෙබඳු ද යි ඔබට මේ පාඩමේදී ඉගෙන ගත හැකි ය. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. පස සෑදී ඇත්තේ කෙසේ ද?
2. හ්‍යුමස් සහිත පස යනු කුමක් ද?
3. මූලික පස් වර්ග මොනවා ද?
4. මී, තේ, රබර්, සහ පොල් යන බෝග වැඩීමට වඩාත් සුදුසු පස් වර්ග කවරේ ද?
5. පසේ සාරවත් බව අඩු වන්නේ කෙසේ ද?
6. පසේ සාරවත් බව රැක ගැනීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග මොනවා ද?
7. කඳු බෑවුම්වල පස සේදී යාම වළක්වා ගන්නේ කෙසේ ද?
8. සමුද්‍ර බාදනය වළක්වා ගැනීමට යොදා ගන්නා උපක්‍රම මොනවා ද?

වාංමාලාව

මවු පාෂාණ, වැලි පස, මැටි පස, ලෝම් පස, හ්‍යුමස්, සෝද පාළුව, පස සංරක්ෂණය, සමුද්‍ර බාදනය

4.1 පස සෑදෙන අන්දම

අපට අදාශ්‍ය ආහාර බෝග වර්ග වැවෙන්නේ පසෙහි බැවින් අපට එය ඉතා ප්‍රයෝජනවත් ස්වාභාවික සම්පතකි. පොළොවේ සමහර තැන්වල පස මීටර ගණනක් ගැඹුරු ය. තවත් සමහර තැන්වල එහි ගණකම සෙන්ටි මීටර කිහිපයක් පමණි. පස සෑදී ඇත්තේ අවුරුදු දහස් ගණනක් තිස්සේ වැස්ස, හිම, සුළං ආදියට හසු වී පාෂාණ සියුම් කැබලිවලට කැඩී බිඳී යෑමෙනි. පාෂාණ යනු පෘථිවි පෘෂ්ඨය සෑදී ඇති ඝණ ද්‍රව්‍යවලින් එකකි. මෙම ද්‍රව්‍ය විවිධ වූ ඛනිජ හා රසායනික සංයුතියකින් යුක්ත ය. යම් පසක ස්වභාවය එය සෑදුණු පාෂාණය අනුව තීරණය වේ. පස සෑදීමට ඉවහල් වූ මුල් පාෂාණය මවු පාෂාණය නම් වේ.

4.2 විවිධ පස් වර්ග

පස එකාකාර නොවේ. මීට හේතුව ඔබ දනටමත් දන්නෙහි ය. ඔබ නිවස හෝ පාසල අවට ඇති පස් ස්වල්පයක් හාරා බලන්න. එය කඩදාසියක අතුරා බැලූ විට ඔබට එහි කුඩා කැට, වැලි, මැටි ආදිය දකින්නට පුළුවන. සමහරවිට ඉතා කුඩා කොළ, ඉරටු කැබලි වැනි දේ එහි මිශ්‍රව තිබිය හැකි ය. පස් ස්වල්පයක් ඇඟිලි තුඩුවලින් පිරි මැද බැලුවොත් එහි ඇති රළු බව, සියුම් බව ඔබට දැනෙනු ඇත. වැලි සහිත පසක් නම් ඔබේ ඇඟිලිවලට රළු බවක් දැනේ. මැටි පස ඇලෙන ස්වභාවයක් ගනී. පසෙහි සියුම් බව, රළු බව ආදිය අනුව එය වර්ග කිරීමට පුළුවන. මෙසේ වැලි පස, මැටි පස, ලෝම පස යනුවෙන් මූලික පස් වර්ග තුනක් හඳුන්වා දිය හැකිය.

මේ පස් වර්ග එකිනෙක මිශ්‍ර නොවී නියම ස්වභාවයෙන් ම හමුවන අවස්ථා බොහෝ අඩු ය. බොහෝ විට මේ පස් වර්ග මිශ්‍ර වී දක්නට ඇත. වැලි සහිත ලෝම් පස, මැටි සහිත වැලි පස, හුණු මිශ්‍ර පස ආදී වශයෙන් ඒවා එකිනෙක හා මිශ්‍ර වී පවතී. එබඳු පස් වර්ග රාශියක් වේ.

වර්ණය අනුව පස වෙනස් වේ. ඇතැම් පස් රතු පැහැති ය. ඇතැම් පස් දුඹුරු පැහැති ය. කළු පැහැති, කහ පැහැති පස් වර්ග ද වේ. පසෙහි වර්ණය වෙනස් වන්නේ බොහෝ විට එය සෑදී ඇති මවු පාෂාණය අනුව ය.

පසෙහි ඇතුලත් හ්‍යුමස් ප්‍රමාණය අනුව ද පස වෙනස් වේ. හ්‍යුමස් සෑදී ඇත්තේ දිරා ගිය පැළෑටි සහ සත්ත්ව කොටස්වලිනි. හ්‍යුමස් සහිත පස සරු ය; වගාවන්ට සුදුසු ය.

4.3 ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පස් වර්ග

නොයෙක් පස් වර්ග අප රටේ ද වේ. දියළු පස, වැලි පස, කඩොක් මිශ්‍ර රතු ලැටරසිටි පස, බොරළු පස, හුණු මිශ්‍ර පස අප රටේ ඇති විවිධ පස් වර්ග සි. ඒ ඒ පස් වර්ගයේ වැවෙන බෝග වර්ග ද විවිධ වේ.

අපේ ප්‍රධාන ආහාරය සැපයෙන වී වැවෙන්නේ රොන් මඩ සහිත දියළු පසේ ය. ඒවා වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ ගංගා ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවල ය. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ වැලිපස හමු වේ. පොල් ගස මෙහි සාරවත් ව වැඩේ. කඩොක් මිශ්‍ර රතු ලැටරසිටි යනුවෙන් හැඳින්වෙන පස ඇත්තේ නිරිතදිග තෙත් කලාපයට අයත් බැවුම් ප්‍රදේශවල ය. මෙහි රබර් වගාව හොඳින් කෙරේ. තේ වවන්නේ මධ්‍යම කඳුකරයේ ලෝම් හා ලැටරසිටි මිශ්‍ර පස් සහිත උස් බිම්වල ය.



4.1 රූපය

ගස් වැල් වැඩෙන්නේ පසෙහි වුව ද ඒවායෙහි දේහ ප්‍රමාණයෙන් ඉතා වැඩි කොටස (90% ත් වඩා) වර්ධනය වන්නේ වායුගෝලයෙන් ලැබෙන කාබන් ඩයොක්සයිඩ් වායුවෙන් පසෙන් උරා ගන්නා ජලයේත් ආධාරයෙනි. පසෙන් ලබා ගන්නේ ඛනිජ වර්ග සුළු ප්‍රමාණයකි. අපට විටමින් අවශ්‍ය වන්නා සේ ම ගස් වැල් වැඩෙන විට ඒවාට අවශ්‍ය ඛනිජ වර්ග අඩු වී යයි. වනාන්තරවලත් වල් බිහි වූ තැන්වලත් ගස් වැල් මැරුණ විට එ තැන ම දිරා ගොස් පසට එකතු වන නිසා ගස් වැල් මඟින් ඛනිජ අඩු වීමක් සිදු නොවේ. බෝග වගාවේ දී අස්වැන්න ලබාදුව ඉවත් කැරෙන නිසා ඒ සමඟ ඉවත් වන ඛනිජ ආපසු එම පසට ලැබෙන ස්වාභාවික ක්‍රමයක් නැත. එම නිසා ඒ අඩුව පිරවීමට වගා බිම්වල පසට පොහොර යෙදිය යුතු ය. මේ සම්බන්ධයෙන් ඔබ පාසලට ලබා දී ඇති මිනිසා සහ පරිසරය යන ජනගහන අධ්‍යාපනය අතිරේක පොතේ 32 පිටුව බලන්න.

4.4 පස සෝදා යෑම සහ පස සංරක්ෂණය

පාංශු ඛාදනය සිදු වන අයුරු අපි විමසා බලමු. පසෙහි ආරක්ෂාව ස්වාභාවික ව සැලසෙනුයේ වෘක්ෂලතා මඟිනි. වෘක්ෂලතා ඉවත් කළ හොත් පසෙහි ආරක්ෂාව සඳහා ඇති ස්වාභාවික ආවරණය ඉවත් වී පස බුරුල් වෙයි. තද වැස්සකින් පසු පස සේදී යාමට ඉඩ තිබේ. එවිට එම ප්‍රදේශය සෝද පාළුවට ගොදුරු වේ. මෙසේ සෝද පාළුවට භාජනය වූ ප්‍රදේශයක් පරීක්ෂා කර බැලුවොත් සාරවත්

පස ඉවත් වී ඇති ආකාරය පහසුවෙන් තේරුම් ගත හැකි වනු ඇත.

පස සංරක්ෂණය හෙවත් පස රැක ගැනීම සඳහා විවිධ ක්‍රම යොදා ගැනේ. පහසුවෙන් වැසි ජලයට සේදී යන බැවුම් සහිත බිම්වල වැවි බැඳීම, කානු කැපීම ආදිය කැරේ. පස රැක ගැනීම සඳහා ගස් වැවීම ද කැරේ. ගස් ඇති විට වැහි බින්දු කෙළින් ම වැටෙන්නේ පසට නොව ගස්වල අතුවල ය. ගස්වලින් වැටි දිරාපත් වන කොළ රොඩු පසට ඇලී තිබීම නිසා ජල පහර බැස යන්නේ පස උඩින් නොව එම කොළ රොඩු උඩිනි. එම නිසා පස සේදී යාම වැළකේ. බහුල වශයෙන් කැලෑ කැපීම දුන් රජයෙන් තහනම් කැරේ. කඳුකරයේ සමහර කැලෑ ප්‍රදේශ ආරක්ෂිත වනාන්තර වශයෙන් වෙන් කොට ඇත. එවැනි ප්‍රතිපත්තියක එක් අරමුණක් වනුයේ පස ආරක්ෂා කර ගැනීමයි. තවද රජය විසින් ගස් වැවීම උනන්දු කරනුයේ පස ආරක්ෂා කර ගැනීමේ එක් ප්‍රයත්නයක් වශයෙනි.

වෙරළබඩ ප්‍රදේශවල බුහුදු රළ මඟින් ගොඩ බිමෙහි පස කෙමෙන් සේදී යන අන්දම කොළඹ මාතර ගමන් මාර්ගයේ බේරුවල, හික්කඩුව ප්‍රදේශ පසු කර යන විට ඔබට දැකිය හැකි ය. වේගවත් රළ පහර නිසා වෙරළබඩ තීරයේ ඇති වැලි පස සේදී යයි. මෙය **සමුද්‍ර ඛාදනය** හෙවත් බුහුදුකෑම නමින් හැඳින්වේ. මිනිසා විසින් කොරල් පර කැඩීම නිසා ද සමුද්‍ර ඛාදනය උග්‍ර වී ඇත. බුහුදුකෑම උග්‍ර ප්‍රදේශවල වෙරළ තීරය සේදී යාම වැළැක්වීමට ගල් වැටි බැඳීම, ආරක්ෂක බැම් බැඳීම සහ වෙරළේ වැවෙන බිම් තබුරු, වැටකේ වැනි වෙරළබඩ ගස් වැල් ආරක්ෂා කිරීම ආදිය කැරේ.

සාරාංශය

පසෙහි ස්වභාවය මවු පාෂාණයේ ස්වභාවය මත රදා පවතී. මවු පාෂාණය අවුරුදු දහස් ගණනක් තිස්සේ වැස්ස, හිම, සුළං ආදියට හසු වී කැඩී බිඳී යාමෙන් පස් සෑදේ. පස් නොයෙක් පිදියට වර්ග කළ හැකි ය. පසෙහි ස්වභාවය අනුව වැලි පස, මැටි පස, ලෝම් පස යනුවෙන් මූලික ලෙස වර්ග කිරීමට පුළුවන. වර්ණය අනුව ද පස වර්ග කළ හැකි ය. දිරා ගිය පැළෑටි සහ සතුන්ගේ මළ සිරුරු එකතු වී සෑදෙන පස හ්‍යුමස් සහිත පස නම්.

ඒ ඒ පස අනුව වෙනස් බෝග වර්ග දෙනස් වේ. වී වැවෙනුයේ දියළු පසෙහි ය. පොල් සරු ලෙස වැවෙනුයේ මුහුදුබඩ වැලි පසෙහි ය. කබොක් මිශ්‍ර රතු ලැටරසිටි පසෙහි රබර් වැවේ. ලෝම් හා ලැටරයිට් මිශ්‍ර පසෙහි තේ වැවේ.

පසෙහි සාරවත් බව රැක ගැනීමට පොහොර යෙදිය යුතු ය. පසෙහි ආරක්ෂාව සඳහා ගස් වැවිය යුතු අතර වනාන්තර කැපීම නතර කළ යුතු ය. පස වැහි ජලයට සේදී යාම හෙවත් සෝදා පාළුවට භාජනය වීම වැළැක්වීමට බැවුම් සහිත බිම්වල වැටි බැඳීම, කානු කැපීම ආදිය කැරේ. වෙරළබඩ ප්‍රදේශවල සිදුවන සමුද්‍ර ඛාදනය වැළැක්වීම සඳහා ද ගල් වැටි හා ආරක්ෂක බැම් ඉදි කිරීමත්, වෙරළබඩ වෘක්ෂලතා වැවීමත් කැරේ.

ක්‍රියාකාරකම්

1. ගෙවත්තෙන් හෝ පාසල් වත්තෙන් හෝ වෙනත් ඕනෑ ම ස්ථානයකින් හෝ විවිධ පස් නියැදි ලබා ගන්න. පහත සඳහන් වගුව පිටපත් කර ගෙන ඒවා ආශ්‍රයෙන් එය සම්පූර්ණ කරන්න.

පස් වර්ගය	පසේ ස්වභාවය	පසේ වර්ණය	තෙත් බව, වියළි බව	ලබාගත් ස්ථානය	එම පසේ වැවෙන පැළෑටි

2. නිවැරදි වාක්‍ය අග ✓ ලකුණ ද වැරදි වාක්‍ය අග × ලකුණ ද දි ඇති කොටුවල සොදන්න.

i. පස සේදී යාම වැඩි වශයෙන් සිදු වන්නේ බැවුම් සහිත ඉඩමක ය. ☐

ii. පස සේදී යාම වැඩි වන්නේ ජලය එක් රැස් වී ජල පහරක් සේ ගලා යන විට යි. ☐

iii. කුඹුරු සහ තේ ඉඩම් යන දෙ වර්ගයෙන් පස් සේදී යාම වැඩි පුර සිදු විය හැකි වනුයේ කුඹුරු ඉඩම්වල යි. ☐

iv. බෝග වගා කළ බිම්වල පස සේදී යාම ස්වාභාවික වනාන්තර බිම්වල පස සේදී යාමට වඩා අධික වේ. ☐

v. කානු කැපීම සහ වැටි ඉදි කිරීම නිසා පස ආරක්ෂා වේ. ☐

3. පස්වල ස්වභාවය සහ පයෙහි අඩංගු ද්‍රව්‍ය ගැන වැටහීමක් ලබා ගැනීමට සරල පරීක්ෂණයක් කරන්න. පස් නියැදියක් විදුරු භාජනයකට ජලය සමඟ දමා හොඳින් කලතා මඳ වේලාවක් නිශ්චල ව තබන්න. ඉන් පසු ඇතිවන ප්‍රතිඵලය නිරීක්ෂණය කරන්න. 4.2 රූප සටහන් බලන්න.



4.2 රූපය

4. සරුවට ගස් වැඩෙන ස්ථානයක සහ ගස් නොවැඩෙන ස්ථානයක පස් වර්ගවල ඇති වෙනස්කම් මොනවා ද යි පරීක්ෂා කර බලන්න.

5. ඔබ ගෙවත්තෙහි මතුපිට පස සෝදා යමින් පවතී ද යි විමසිලිමත් ව බලන්න. එසේ වන්නේ නම් එය වළක්වාලීමට අවශ්‍ය පියවර ගෙන ඔබේ ප්‍රයත්නය සාර්ථක වී ඇත් ද යි කලින් කල සොයා බලන්න.

5

ස්වාභාවික වෘක්ෂලතා

පාඩමට සූදනම් වීම

ස්වාභාවික පරිසරයේ වැදගත් අංගයක් වශයෙන් ස්වාභාවික වෘක්ෂලතාදිය හැඳින්විය හැකි ය. රටක ස්වාභාවික සෞන්දර්යය වඩාත් ඔප් නංවන ස්වාභාවික වෘක්ෂලතාදිය අද මිනිසා ලබා ඇති වටිනා ස්වාභාවික දෑයාදයකි. මේ පාඩමේ ඔබට එ ගැන දැන ගන්නට ලැබේ. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. **ස්වාභාවික වෘක්ෂලතා යනු මොනවා ද?**
2. **වෘක්ෂලතා වැඩීම කෙරෙහි බලපාන සාධක කවරේ ද?**
3. **ස්වාභාවික වනාන්තර යනුවෙන් හඳුන්වනුයේ මොනවා ද?**
4. **ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ස්වාභාවික වෘක්ෂලතා කලාප කවරේ ද?**
5. **තෙත් කලාපීය ස්වාභාවික වෘක්ෂලතාවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා ද?**
6. **එම කලාපයේ වැවෙන ස්වාභාවික ගස් වර්ග කවරේ ද?**
7. **වියළි කලාපීය ස්වාභාවික වෘක්ෂලතා හඳුනා ගන්නේ කෙසේ ද?**
8. **ශ්‍රී ලංකාවේ වයඹ හා ගිනිකොණ ප්‍රදේශවල හමු වනුයේ කුමන ස්වාභාවික වෘක්ෂලතා ද? ඒවායේ විශේෂ ලක්ෂණ මොනවා ද?**
9. **ස්වාභාවික වෘක්ෂලතාවලින් අපට ලැබෙන ප්‍රයෝජන මොනවා ද?**
10. **ස්වාභාවික වෘක්ෂලතා සංරක්ෂණය සඳහා ගෙන ඇත්තේ නිනමි පියවර ද?**

වාංමාලාව

ස්වාභාවික වෘක්ෂලතා, ස්වාභාවික වනාන්තර, තෙත් කලාපීය වෘක්ෂලතා, යටිරෝපණය, වියළි කලාපීය වෘක්ෂලතා, අර්ධ ශුෂ්ක කලාපීය වෘක්ෂලතා, ස්වාභාවික වෘක්ෂලතා සංරක්ෂණය

5.1 ස්වාභාවික වෘක්ෂලතා

මිනිසා විසින් වවන ගස් වැල් හැර අප අවට පරිසරයේ ඉබේ වැඩුණු ගස් වැල් ඇති බව ඔබට පෙනෙනු ඇත. ඉබේම, එ නම් ස්වාභාවික ව වැඩුණු ගස් වැල් **ස්වාභාවික වෘක්ෂලතා** යනුවෙන් හැඳින්වේ. වනාන්තර සෑදී ඇත්තේ ගස් වැල් වැඩීම නිසා ය. බොහෝ වනාන්තරවල ගස් වැල් ස්වාභාවික ව වැඩුණු ඒවා ය. එම නිසා ඒවා **ස්වාභාවික වනාන්තර** යනුවෙන් හැඳින්වේ. ස්වාභාවික වනාන්තර අපට ස්වභාවයෙන් ලැබී ඇති ජාතික සම්පතක් වශයෙන් අපි සලකමු. අපේ මුතුන් මිත්තන් විසින් විවිධ අවශ්‍යතාවන් සඳහා භූමිය යොදා ගැනීම නිසා වනාන්තර හෙළි පෙහෙළි කරන ලදී. එම නිසා මුල් ම හෙවත් ප්‍රාථමික ගණයේ ස්වාභාවික වෘක්ෂලතා සහිත වනාන්තර බෙහෙවින් විනාශ වී ගොස් ඇති අතර විශාල ප්‍රාථමික වනාන්තරයක් වශයෙන් අප රටේ ඉතිරි ව ඇත්තේ සිංහරාජ වනාන්තරය පමණි.

5.2 ශ්‍රී ලංකාවේ ස්වාභාවික වෘක්ෂලතා

අප රටේ නොයෙක් වර්ගයේ ස්වාභාවික වෘක්ෂලතා සහිත වනාන්තර වේ. එහෙත් ඒවා ද්විතියික හෙවත් පසු ව වැඩුණු වනාන්තර ලෙස සැලකේ. ඇතැම් ප්‍රදේශවල ඝන ව වැඩුණු වෘක්ෂලතා ඇත. තවත් සමහර ප්‍රදේශවල කටු පදුරු වැනි මිටි ගස් වර්ග පමණක් ඇති කැලෑ තිබේ. මෙ බදු

නොයෙක් වෘක්ෂලතා වැඩීම කෙරෙහි උෂ්ණත්වය, වර්ෂාපතනය, පස ආදී සාධක බලපා ඇත. ශ්‍රී ලංකාවේ දේශගුණය අනුව මූලික ස්වාභාවික වෘක්ෂලතා වර්ග තුනකට බෙදිය හැකි ය. එ නම් තෙත් කලාපීය වෘක්ෂලතා වියළි කලාපීය වෘක්ෂලතා සහ අර්ධ ශුෂ්ක කලාපීය වෘක්ෂලතා යනුවෙනි.



1. තෙත් කලාපීය වෘක්ෂලතා 2. වියළි කලාපීය වෘක්ෂලතා
3. අර්ධ ශුෂ්ක කලාපීය වෘක්ෂලතා

ශ්‍රී ලංකාවේ ස්වාභාවික වෘක්ෂලතා කලාප

5.1 රූපය

5.2.1 තෙත් කලාපිය වෘක්ෂලතා

මේවා ශ්‍රී ලංකාවේ පහත රට සහ කඳු රට තෙත් කලාපවල දක්නට ඇත. අවුරුද්දේ මුළුල්ලේ එකාකාර ව ලැබෙන වර්ෂාපතනය සහ උෂ්ණත්වය මේ ප්‍රදේශවල වෘක්ෂලතා වැඩීමට ඉතා හිතකර වේ. මේ වනාන්තරවල ගස් උසට වැඩේ. මේ ගස්වල පත්‍ර පළල් ය. තද කොළ පැහැති ය. ගස් ඝන ව වැඩේ. ගස්වල එතී ඉහළට වැඩෙන වැල් වර්ග ද බොහෝ ය. ගස් මුදුන් එකිනෙකට ගැටී ඕසනක් සේ පවතී. විශාල ගස් වියන්වල සෙවනේ කුඩා ගස්වලින් සැදුණු තවත් කුඩා කැලෑ ඇත. තෙත් කලාපිය වනාන්තරවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි යටිරෝපණය. **යටිරෝපණය** යනු නොයෙක් වැල් වර්ග, පාසි වර්ග, කුඩා ගස් සහ පදුරු ආදියෙන් සැදුණු ස්වාභාවික ආවරණයකි. නොයෙක් ගස් වර්ග මිශ්‍ර වී පවතින මේ වනාන්තර ඇතුළට ගමන් කිරීම අපහසු ය. හොර, කීන, ගොඩපර ආදී ගස් වර්ග මෙහි වැවේ.

5.2.2 වියළි කලාපිය වෘක්ෂලතා

ශ්‍රී ලංකාවේ පහත රට සහ කඳු රට වියළි කලාපවල මෙම වෘක්ෂලතා දක්නට ලැබේ. අඩික වර්ෂාව ලැබෙන තෙත් කලාපිය වනාන්තරවල ගස් මෙන් මේ ප්‍රදේශයේ ගස් ඉතා උසට නො වැඩෙයි. ඝන කැලෑ මේ ප්‍රදේශවල නැත. ගස් වර්ග වැවෙනුයේ ඉතා සෙමිනි. වියළි කලාපයට ලැබෙන වාර්ෂික වර්ෂාපතනය අඩු වීමත් එය අවුරුද්දේ එක් කාලයකට පමණක් බොහෝ දුරට සීමා වීමත්, අඩික වාෂ්පීකරණයත් මීට හේතු වේ. සවි ශක්තියෙන් යුත් වටිනා ගස් මේ වනාන්තරවල වැවේ. මේ ගස් බොහෝ විට කටු සහිත ය. පත්‍ර කුඩා ය. කළුවර, වීර, පළු වැනි ගස් වියළි කලාපිය වනාන්තරවල වැවේ. මෙම ප්‍රදේශවල බොහොමයක් ම ඇත්තේ කලින් එළි කළ බිම්වල වැඩුණු ද්විතියික වනාන්තර වන බව ද සැලකිල්ලට ගත යුතු යි.

5.2.3 අර්ධ ශුෂ්ක කලාපිය වෘක්ෂලතා

ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපවල මේවා දක්නට ලැබේ. අනෙක් කලාප දෙකට වඩා අඩු වර්ෂාපතනයක් ලැබෙන හෙයින් ද මේ ප්‍රදේශවල ලොකු ගස් නො වැඩේ. කටු පදුරු සහ නොයෙක් පතොක් වර්ග බහුල ව වැඩේ. තැනින් තැන කැලෑ රොදවල් දක්නට ඇත. මේවායේ පැලෑටි නිසඟයට ඔරොත්තු දෙන පරිදි සැදී ඇත. මේ ගස්වල කොළ අඩු ය. බොහෝ විට උල් හැඩයක් ගනී. කටු සහිත ය.

5.3 ස්වාභාවික වෘක්ෂලතාවල ප්‍රයෝජන

ස්වාභාවික වෘක්ෂලතා අප සතු වටිනා සම්පතකි. වෘක්ෂලතා පවතින විට ස්වාභාවික සෞන්දර්ය වැඩි වේ. පරිසරය ප්‍රියජනක වේ. එ පමණක් නොව වෘක්ෂලතා නොයෙක් අයුරින් අපට ප්‍රයෝජනවත් වෙයි. බුරුත, නැටුන්, කළුවර, හල්මිල්ල, තේක්ක, මැහෝගනී ආදී තද අරටුවක් සහිත වටිනා ශක්තිමත් ගස් වර්ග අප රටේ වනාන්තරවල ඇත. අපට අවශ්‍ය ගොඩනැගිලි, ගෘහ භාණ්ඩ, විදුලි කම්බි කණු, වාහන ආදිය සැදීමට අවශ්‍ය ලී, දුම්රිය මාර්ගවලට අවශ්‍ය සිල්පර කඳන් ලබා ගනුයේ මේ ගස්වලිනි.

ස්වදේශීය කර්මාන්ත සඳහා භාවිතයට ගැනෙන නොයෙක් දේ ද ස්වාභාවික වෘක්ෂලතා අතර වේ. ගිනිකුරු සහ ගිනි පෙට්ටි සැදීමට රුක් අත්තන, ඉඹුල් වැනි මෘදු දැව භාවිත කෙරේ. කඩදාසි සැදීමට ද මෘදු දැව ප්‍රයෝජනවත් වේ. වෙස් මුහුණු සහ වෙනත් ලී කැටයම් භාණ්ඩ සැදීමට ද කදුරු වැනි ලී වර්ග යොදා ගැනේ. ඒ හැරුණු විට බට ලී, උණ ලී, වේවැල්, පන් වර්ග, වැටකෙඩියා, තල් ආදිය ද විවිධ වූ විසිතුරු කලාත්මක භාණ්ඩ සැදීමට පාවිච්චි කැරේ. මේ මඟින් විවිධ නිෂ්පාදන රාශියක් බිහිවන අතර විශාල පිරිසකට රැකියා ද සැපයේ.

වනාන්තරවල වැවෙන නොයෙක් ගස් වර්ග දර සඳහා පාවිච්චි කෙරේ. සායම් වර්ග සැදීමට පතඟි, කොස්, කඩොල්, ගම්මාලු, හික් වැනි ගස් ද මැලියම් වර්ග සැදීමට කපු සහ කැකුණ වැනි ගස් ද ප්‍රයෝජනවත් වේ.

ඉතා වටිනා දේශීය ඖෂධ වර්ග ලබා දෙන ස්වාභාවික වෘක්ෂලතා වර්ග අප රටේ ඇත. අරළු, බුළු, නෙල්ලි, කොහොඹ වැනි විශාල ගස් වර්ග ද බින් කොහොඹ, බැබිළ වැනි කුඩා පැළෑටි වර්ග ද රසකිඳ, වෙනිවැල් ගැට, හාතාවාරිය වැනි වැල් වර්ග ද ඊට නිදසුන්ය.

පස ආරක්ෂා කර ගැනීමේ දී ද වෘක්ෂලතා බොහෝ සෙයින් ප්‍රයෝජනවත් ය. පස සෝදා යාම වැළැක්වීමට සහ ජල සම්පත් ආරක්ෂා වීමට වෘක්ෂලතා ආධාර වේ. ගස්වල මුල් පසට තදින් අල්ලා සිටින නිසා වර්ෂා ජලයෙන් පස සේදී නො යයි. එ මෙන් ම කුඩා දිය පාරවල් හා උල්පත් ඇති ප්‍රදේශවල වනාන්තර තිබීම ජලයේ ආරක්ෂාවට උපකාරී වේ.

ගස් වැල් නිසා ස්වාභාවික සෞන්දර්යය වඩාත් ඔප් නැංවෙයි. ස්වාභාවික වන පෙදෙස් නොයෙක් වර්ගයේ වන සතුන්ට ආරක්ෂා ස්ථාන වේ. අප රටේ සාල සහ විල්පත්තු අභය භූමි වන සතුන් සඳහා වෙන් කර ඇත. අලි ඇතුන්, වලසුන්, කුළු හරකුන්, දිවියන්, මුවන් සහ නොයෙක් කුරුලු වර්ග මෙම ප්‍රදේශවල දක්නට ලැබේ. අභය භූමි නැරඹීමට යන විදේශීය සංචාරකයන්ගෙන් මෙන් ම ස්වදේශිකයන්ගෙන් ද අප රටට ආදායමක් ලැබේ. විවිධ ලක්ෂණවලින් සමන්විත වූ ස්වාභාවික පරිසරයේ යම්බරතාව රැක ගැනීමට ස්වාභාවික වෘක්ෂලතා ඉවහල් වන බව දන් ඔබට පැහැදිලි වේ.

5.4 ස්වාභාවික වෘක්ෂලතා සංරක්ෂණය

වර්තමානයේ අප රටේ වනාන්තර ඇත්තේ සීමිත ප්‍රමාණයකි. රටේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඒවායේ ඉඳි වන ජලාශ, නගර, පාරවල්, ගොඩනැගිලි, ජනාවාස ආදිය සඳහාත්, ආහාර දැව්ග වගාවට ඉඩම් ලබා ගැනීම් සඳහාත්, දැව් ලබා ගැනීම් සඳහාත් වනාන්තර හෙළි කිරීමට සිදු වේ. දර ලබා ගැනීම සඳහා ද හේන් ගොවිතැන සඳහා ද කැලෑ හෙළි කෙරේ. ජන සංඛ්‍යාව වැඩිවීම ද කැලෑ හෙළි කිරීමට හේතු වී ඇති තවත් කරුණකි. මේ නිසා අප රටේ ස්වාභාවික වෘක්ෂලතා ප්‍රමාණය බෙහෙවින් අඩු වෙමින් පවතී. දැනට රජය විසින් වෙන්කර ප්‍රදේශවල වනරෝපණය හෙවත් වනාන්තර නැවත වැවීම් ආරම්භ කොට ඇත. රජය මඟින් ඇතැම් කැලෑ ප්‍රදේශ ආරක්ෂිත ප්‍රදේශ වශයෙන් ද වෙන් කොට තිබේ. මහවැලි ව්‍යාපාරය යටතේ ඇති සෝමාවතිය, මිදුරු ඔය සහ වස්ගමුව ආරක්ෂිත වනෝද්‍යාන ඊට උදාහරණ වේ. කැලෑ ආරක්ෂා කර නැතීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ අනාධාරයෙන් කැලෑ කැපීම් ද රජය විසින් තහනම් කොට ඇත. මීට අමතර ව හෙවතුවල ගස් වැල් වැවීමට ද රජය විසින් දිරි ගැන්වෙයි. මෑතක දී සිට පාසල් සිසුන් ලවා ගස් වැවීමේ ව්‍යාපාරයක් ද ඇරඹා ඇත. තව ද වෙහෙත් පැලෑටි ඖෂධ වතු වශයෙන් වැවීම් ද රජය මඟින් ඇරඹා ඇත.

වනාන්තර ආරක්ෂා කිරීම සහ ගස්වැල් නැවත සිටුවීම ඒවා විනාශ වන වේගයට වඩා ඉක්මනින් කළ යුතු ය. එවිට එය අනාගත පරම්පරාව සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

සාරාංශය

ස්වාභාවිකව හෙවත් ඉබේ ම වැඩුණු ගස් වැල් ස්වාභාවික වෘක්ෂලතා නමි වේ. වනාන්තර සැදී ඇත්තේ ගස් වැල් වැඩීමෙනි. වනාන්තර ස්වාභාවික සම්පතකි. ප්‍රාථමික ගණයේ විශාල ස්වාභාවික වනාන්තරයකි සිංහරාජ වනාන්තරය. ද්විතියික හෙවත් පසු ව වැඩුණු වනාන්තර ද අප රටේ වේ. අප රටේ දේශගුණය අනුව මූලික ස්වාභාවික වෘක්ෂලතා වර්ග තෙත් කලාපිය වෘක්ෂලතා, වියළි කලාපිය වෘක්ෂලතා සහ අර්ධ ශුෂ්ක කලාපිය වෘක්ෂලතා යනුවෙන් වර්ග කළහැකි ය. පාරිසරික සම්බරතාව රැක ගැනීමට, පස සහ ජල සම්පත් ආරක්ෂා වීමට, පරිසරය අලංකාර වීමට, වන සතුන්ගේ ආරක්ෂාවට, ගෘහ කර්මාන්ත සඳහා ප්‍රයෝජන ගත් විවිධ ද්‍රව්‍ය ලබා ගැනීමට, දුම්, සායම් වර්ග සහ ඖෂධ වර්ග ලබා ගැනීමට ස්වාභාවික වෘක්ෂලතා ප්‍රයෝජනවත් වේ. රටේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම් සහ ජනා සංඛ්‍යාව වැඩිවීම් ආදී කරුණු නිසා වනාන්තර හෙළි කිරීමට සිදුවේ. එවා සම්පත විනාශ කිරීමෙන් නොයෙක් හානි පැමිණේ. එ බැවින් එවා සම්පත් සංරක්ෂණය කිරීම් පියවරක් වශයෙන් රජය මඟින් වන රෝපණය, ගස් වැවීම් ව්‍යාපාරවලට දිරි දීම් ආදී කටයුතු අරඹා ඇත.

ක්‍රියාකාරකම්

1. ඔබ ජීවත් වන දිස්ත්‍රික්කය අයත් වන්නේ කුමන ස්වාභාවික වෘක්ෂලතා කලාපයට ද?

   i. ඔබ ප්‍රදේශයේ වැවෙන වෘක්ෂලතා නම් කරන්න.

   ii. ඒවායේ කැපී පෙනෙන ලක්ෂණ මොනවා ද?

2. ඔබ නිවසේ ඇති ගෘහ භාණ්ඩ සැදීමට යොදා ගෙන ඇති ලී වර්ග පිළිබඳ ලැයිස්තුවක් සාදන්න. එම ලී වර්ග ලබා ගන්නේ කිනම් ස්වාභාවික වෘක්ෂලතා කලාපවලින් ද?

3. ඔබ ජීවත් වන ප්‍රදේශයේ ස්වාභාවික වෘක්ෂලතා එළි පෙහෙළි කර ඇත්තේ කුමන අවශ්‍යතාවයක් සඳහා ද? ඒ නිසා සිදු වී ඇති අහිතකර ප්‍රතිඵල මොනවා ද?

4. ඔබ ප්‍රදේශයේ වැවිය හැකි ගස් වර්ග මොනවා ද?

5. 5.1 රූපයේ ශ්‍රී ලංකාවේ ස්වාභාවික වෘක්ෂලතා කලාප ලකුණු කොට ඇත. ඔබත් එබදු සිතියමක් අඳ ඒ ඒ කලාප විවිධ වර්ණ යොදා සේයා කොට නම් කරන්න.

6. ඔබේ ගෙවත්තේ ඇති බිම් ප්‍රමාණය සලකා බලා යටත් පිරිසෙයින් එළ පැලයක් වත් වවා එය හොඳින් රැක බලා ගන්න.

7. ඔබ පාසලට ලබා දී ඇති ජනගහනය සහ ස්වාභාවික සම්පත් යන අතිරේක කියවීම් පොතෙහි 25—31 දක්වා පිටු කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   * අපට වනාන්තරවලින් ලැබෙන ප්‍රයෝජන 5 ක් නම් කරන්න. අනාගත පරම්පරාවට ද වනාන්තරවලින් ප්‍රයෝජන ලබා ගැනීම පිණිස අප විසින් කළ යුත්තේ කුමක්ද?

6

ස්වාභාවික සම්පත් සහ බෝග නිෂ්පාදනය

පාඩමට සූදානම් වීම

මේ පාඩම කියවීමෙන් ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් මොනවා දැයි ඔබට ඉගෙන ගත හැකි ය. හොඳ අවබෝධයක් ලබා ගැනීමට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. **අපේ මූලික අවශ්‍යතා මොනවා ද?**
2. **ස්වාභාවික සම්පත් යනු කවරේ ද?**
3. **නිෂ්පාදන යනුවෙන් හඳුන්වනුයේ මොනවා ද?**
4. **වරක් ප්‍රයෝජනයට ගෙන අවසන් කිරීමෙන් පසු නැවත ලබා ගත හැකි ස්වාභාවික සම්පත් මොනවා ද?**
5. **පරිසරයේ ක්‍රියාකාරිත්වය නිසා නැවත නැවත ඇති වන ස්වාභාවික සම්පත් කවරේ ද?**
6. **අප ආහාරයට ගන්නා බෝග වර්ග හඳුන්වන්නේ කුමන නමින් ද?**
7. **වෙළෙඳ බෝග යනු මොනවා ද?**
8. **ඕ වගාවට අවශ්‍ය භූගෝලීය සාධක මොනවා ද?**
9. **ඕ වගා කෙරෙන දිස්ත්‍රික්ක මොනවා ද?**
10. **ඕ වගාව වැඩි දියුණු කිරීමේ අරමුණින් අප රටේ ක්‍රියාත්මක වන සංවර්ධන යෝජනා ක්‍රම මොනවා ද?**

වාග්මාලාව

ස්වාභාවික සම්පත්, නිෂ්පාදන, පාරිභෝගික බෝග, වෙළෙඳ බෝග, අපනයන බෝග, සුළු අපනයන බෝග

6. 1 ස්වාභාවික සම්පත්

මිනිසාට අවශ්‍ය ඇතැම් දේ ඔහු ලබා ගනුයේ ස්වාභාවික පරිසරයෙනි. ගිරු එළිය, වාතය සහ ජලය අපට මෙ ලෙස ලැබේ. එස, වෘක්ෂලතා, බනිජ ආදිය ද පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජනවත් දේ අතර මෙසි. මේ ලෙස මිනිසාගේ බලපෑමක් නොමැති ව ස්වභාව ධර්මයා විසින් ඔහුගේ අවශ්‍යතා සපුරා ගැනීම පිණිස දෙනු ලබන සම්පත් ස්වාභාවික සම්පත් යනු මෙන් හඳුන්වනු ලැබේ.

මිනිසාට එදිනෙදා ජීවත් වීම සඳහා නොයෙක් දේ අවශ්‍ය ය. මේවා අතුරින් මූලික අවශ්‍යතා තුනකි. ආහාර, ඇඳුම් සහ නිවාස යි. මේ හැර බෙහෙත්, ඉගෙනීම සඳහා පොත් පත්, ගමන් බිමන් යාම සඳහා රථ වාහන ආදිය ද ජීවත් වීමට අපට ප්‍රයෝජනවත් වේ.

6. 2 අපේ නිෂ්පාදන

අපේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විවිධ දේ මිනිසා විසින් සාදා ගනු ලබයි. ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස, ගොඩනැගිලි, පාරවල්, නූවන් විදුලි යන්ත්‍ර, රූප මැහිනී යන්ත්‍ර, පොත් පත්, බෙහෙත් ආදිය මිනිසා විසින් සාදා ගනු ලබන හෙවත් නිපදවා ගනු ලබන ද්‍රව්‍ය ය. ගොවියෝ අප ආහාරයට ගන්නා නොයෙක් ධාන්‍ය, එළවළු පලතුරු ආදිය නිපදවති. මසුන් මරන්නෝ අප ආහාරයට ගන්නා මාළු වර්ග සපයති. වතුවෝ, මෙසන්වරු, ඉංජිනේරුවරු අපට අවශ්‍ය බොහෝ දේ නිපදවති. මෙසේ මිනිසාට ප්‍රයෝජනවත් නොවූ මිනිසා විසින් නිපදවන දේවල් **නිෂ්පාදන** ලෙසයෙන් හඳුන්වනු ලැබේ.

අපේ අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය දේ හෙවත් නිෂ්පාදන සඳහා අපි ස්වාභාවික

සම්පත් යොදා ගනිමු. ඔබ පන්තියේ තිබෙන ඩෙස්ක්, පුටු නිෂ්පාදන කර ඇත්තේ ස්වාභාවික සම්පතක් වූ ගස් වලින් ලබා ගන්නා දවඩලිනි. ස්වාභාවික සම්පතක් වන ජලය, සූර්ය ශක්තිය ආදිය ආධාරයෙන් බෝග වගා කොට ආහාර නිෂ්පාදනය කරනු ලැබේ. ඇතැම් ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගෙන අවසන් වූ පසු නැවත ලබා ගත නොහැකි ය. බනිජ තෙල්, ගල් අඟුරු, මැණික්, යපස් වැනි සම්පත් අවුරුදු ගණනාවක් තිස්සේ විශාල ප්‍රමාණයක් හාරා ගත් විට ඒවා අවසන් වනු ඇත. ස්වාභාවික පරිසරයේ ක්‍රියාකාරිත්වය නිසා නැවත නැවත ඇති වන ස්වාභාවික සම්පත් ද වේ. ජලය, ගස් වැල් සහ වන සතුන් මේවාට නිදසුන් වේ. එසේ නම් මේ වැනි සම්පත් ද අසීමිත ව ප්‍රයෝජනයට ගත හොත් අඩු වනු ඇත. විශාල ලෙස කැලෑ එළි පෙහෙළි කිරීමෙන් ද නොයෙක් සත්ත්ව විශේෂ විනාශ වීමෙන් ද ඒවා වඳ වී යෑමට ඉඩ තිබේ.

6. 3 ආහාර බෝග සම්පත්

අපේ ප්‍රධාන ආහාරය බත්ය. එබැවින් අප රටේ වගා කරන කෘෂිකාර්මික බෝගයක් වශයෙන් ම ගොවිතැන ප්‍රධාන තැනක් ගනී. ඒ හැර අප ආහාරයට ගන්නා තවත් බෝග රාශියක් ම අප රටේ වගා කෙරේ. කුරක්කන්, තල, මුං ඇට, ඉරිඟු වැනි ධාන්‍ය වර්ග සහ නොයෙක් එළවළු වර්ග ඒවාට නිදසුන් වේ. මෙසේ අප ආහාරයට ගන්නා බෝග වර්ග **පාරිභෝගික බෝග** හෙවත් සැපුම බෝග වශයෙන් හැඳින්වේ.

අප රටේ ඇතැම් බෝග වර්ග වනුයේ මෙහෙත් රටවලට මිතුරා මූදල් උපයා ගැනීමේ අරමුණ ඇතිව ය. එනම්, රබර් සහ පොල් මෙවැනි බෝග අතර ප්‍රධානය. මෙවා **මෙළෙඳ බෝග** හෙවත් ව්‍යාපාරික බෝග යනුවෙන් හැඳින් වේ.

6. 3. 1 වී

අපේ ප්‍රධාන ආහාර බෝගය වන වී වගාව පුරාණයේ සිට පැවත එන්නකි. වී වගාවට හොඳින් වැඩෙන්නේ ඉතා ම සාරවත් පස් සහිත මඩ බිම්වල ය. දියළු පස් නවීන් හැඳින්වෙන මෙම සාරවත් පස් බහුලව ඇත්තේ ගංගා නිම්න-

වල ය. වී වගාවට පැළ කාලයේ ජලය අවශ්‍ය ය. වර්ෂාව අඩු ප්‍රදේශවල වී ගොවිතැන සඳහා ජලය රැස් කර තබා ගන්නේ මේ නිසා ය. වී අස්වැන්න ලබා ගන්නා කාලයේ දී වියළි කාලගුණයක් තිබිය යුතු අතර වැඩි පැවතුනොත් වී කරල් නරක් වී අස්වැන්න විනාශ වේ. වී වැවෙන්නේ පහත් තැනිතලා බිම්වල වුව ද වඩා උස් නොවූ කඳුකර ප්‍රදේශවල ද පඩි පේළි ආකාර කුඩා ලියැදි කපා වී වගා කරනු ලැබේ. මෝසම් වර්ෂා කාල අනුව වී ගොවිතැන ද යල සහ මහ යනුවෙන් කන්න දෙකකට වගා කෙරේ. මැයි සිට සැප්තැම්බර් දක්වා යල් කන්නය වන අතර නොවැම්බර් සිට මාර්තු පමණ කාලය මහ කන්නය යි.

ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල වී වගා කරන බව ඔබට සිතිඅමෙන් පෙනෙනු ඇත. කුරුණෑගල, පොලොන්නරුව, අනුරාධපුර, අම්පාර, හම්බන්තොට සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල වී වගාව බහුලව කෙරේ. ශ්‍රී ලංකාව සහල් නිෂ්පාදනය සම්බන්ධයෙන් බොහෝ දුරට ස්වයංපෝෂිත වුවි ද පිටරට වලින් සහල් ගෙන්වීමට සිදු වන අවස්ථා ද වේ. වර්තමානයේ ක්‍රියාත්මක වන මහවැලි, නිල්වලා, ලුණුගම් වෙහෙර වැනි සංවර්ධන යෝජනා ක්‍රම අවසන් වූ විට අපට අවශ්‍ය සහල් මෙහි ම නිෂ්පාදනය කෙරෙනු ඇත. තවද අස්වැන්න වැඩියෙන් ලබා දෙන වී වර්ග වැවීම, පොහොර යෙදීම, කෘමීන් හා වල් පැලෑටි නාශක ඵලදායී ලෙස භාවිතා කිරීම ආදිය මඟින් ඵලදාසි බව වැඩි කර ගත හැකි ය.

මෙහි දී සමුපකාර ව්‍යාපාරය මඟින් වැදගත් මෙහෙයක් ඉටු වේ. ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ සාමූහික ව්‍යාපාරයක් වන සමුපකාර ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණක් වනුයේ රටවල ආර්ථික සංවර්ධනය සැලසීමයි. මේ යටතේ වී වගාවේ දී නිෂ්පාදන කටයුතු වැඩි කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මූදල් ආයෝජනය, නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා ගැනීම්, ගොවිබිමට වගා කිරීම, පොහොර, බීජ්නාශක වී සැපයීම වැනි බොහෝ සේවාවන් පහසුවෙන් ඉටුකර ගැනීම් සඳහා සමුපකාර සමිති උපයෝගී වේ.

6.3.2 වෙනත් ධාන්‍ය, එළවළු හා පලතුරු

අප ආහාරයට ගන්නා වෙනත් ධාන්‍ය බෝග වන කුරක්කන්, මේනේරි, මුං ඇට, ඉරිඟු තල වැනි ධාන්‍ය වර්ග වගා කෙරෙනුයේ වියළි කලාපයේ ය. මිරිස් රනුවැණු වැනි අතිරේක ආහාර බෝග ද අර්තාපල් හා වෙනත් අල වර්ග ද අප රටේ වැවේ.

අපේ ආහාර වේලට අවශ්‍ය එළවළු වර්ග ද අප රටේ වගා කෙරේ. පහත රට එළවළු සහ උඩරට එළවළු යනුවෙන් දෙ වර්ගයකි. උඩරට එළවළු වශයෙන් හැඳින්වෙන ගෝවා, බෝංචි, කැරට්, බීට්, ලීක්ස් වැනි එළවළු කඳුකර ප්‍රදේශවල ද වට්ටක්කා, කරිවිල, තක්කාලි, මැ බණ්ඩක්කා වැනි එළවළු වර්ග පහත රට ප්‍රදේශවල ද හොඳින් වැවේ. අප රටේ එළවළු ගෙ වනු වශයෙන් ද කෙරේ. තව ද ශ්‍රී ලංකාවේ වැවෙන පලතුරු බෝග අතර අන්නාසි, අඹ, රඹුටන්, පේර, කෙසෙල්, ගස් ලබු සනාදිය ද පෙයාර්ස්, බිදි සහ ඇපල් ද වේ.

6. 4 අපනයන බෝග

අප රටේ වවන ප්‍රධාන මෙළෙඳ බෝග වන තේ, රබර් සහ පොල් ප්‍රධාන අපනයන බෝග ලෙස සැලකේ. **අපනයන බෝග** යනු පිටරට යැවීම සඳහා වගා කරන බෝගයි. මෙම බෝග වගා කෙරෙනුයේ එක යාසට හෙක්ටාර විශාල ගණනකින් සමන්විත වනු වශයෙනි. කුරුටු ගම්මිරිස්, කරදමුංගු, කරාබුනැටි වැනි ඒවා අප රටේ වවන මෙනත් මෙළෙඳ බෝගයන් ය. ඒවා සුළු අපනයන බෝග නමින් හැඳින් වේ.

සාරාංශය

අපට එදිනෙදා ජීවිතය ගත කිරීමට නොයෙක් දේ අවශ්‍ය ය. මිනිසාගේ අවශ්‍යතා සපුරා ගැනීම පිණිස ස්වභාව ධර්මයා විසින් දෙනු ලබන සම්පත් ස්වාභාවික සම්පත් යනුවෙන් හඳුන්වනු ලැබේ. අපේ ඇතැම් අවශ්‍යතා සපුරා ගැනීම පිණිස මිනිසා විසින් යම් යම් දේ සාදා ගනු ලබයි. මේවා නිෂ්පාදනා නම් වේ. නිෂ්පාදන සඳහා ස්වාභාවික සම්පත් යොදා ගැනේ. ඇතැම් ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගෙන අවසන් වූ පසු නැවත ලබාගත නොහැකි අතර ස්වාභාවික පරිසරයේ ක්‍රියාකාරිත්වය නිසා නැවත ඇති වන ස්වාභාවික සම්පත් ද වේ.

අප ආහාරයට ගන්නා බෝග ධාන්‍ය භෝගික බෝග යනුවෙන් හැඳින්වේ අප රටේ වගා කරන ප්‍රධාන පාරිභෝගික බෝගය වී ය. මේ හැර කුරක්කන්, තල, මුං ඇට, වැනි ධාන්‍ය බෝග සහ නොයෙක් එළවළු වර්ග අප රටේ වැවේ. වුදුල් ලබා ගැනීමේ අරමුණ ඇතිව වවන බෝග වෙළෙඳ බෝග නම් වේ. තේ, රබර් සහ පොල් මේවා අතර ප්‍රධානයි. පිටරට වලට සවන බෝග අපනයන බෝග නමි. කුරුඳු, ගම්මිරිස්, කරදමුංගු, කරාබු නැටි අප රටේ වවන මෙනත් වෙළෙඳ බෝගයන් ය. ඒවා සුළු අපනයන බෝග අතරට වැටේ.

ක්‍රියාකාරකම්

1 පහත දක්වෙන දේ ස්වාභාවික සම්පත් සහ නිෂ්පාදන යන කොටස් දෙකට බෙදා දක්වන්න.

වාතය, මෝටර් රථ, පැන්සල්, කුරුල්ලෝ, ජලය. රූපවාහිනී යන්ත්‍ර, මෙය, පස, පොත්

ස්වාභාවික සම්පත්	නිෂ්පාදන	රූකිසා

2. ඔබ ප්‍රදේශයේ ඇති ස්වාභාවික සම්පත්, නිෂ්පාදන සහ ඒ සම්බන්ධ රැකියා දක්වෙන සටහනක් පිළියෙල කරන්න.

3. ස්වාභාවික සම්පතක් වන ජලය ඇසුරින් කරන රැකියාවන් මොනවා ද ?

4. පහත සඳහන් කරුණු ආශ්‍රය කර මෙහෙ කුඩා රචනයක් ලියන්න.

වී වැපිරීම, පැළ සිටුවීම, නගුල හාවීම කිරීම්, කුඹුර මඩ කිරීම්, කෘමි නාශක ඉසීම, රසායනික පොහොර යෙදීම්, අස්වැන්න ලබා ගැනීම්.

5. ශ්‍රී ලංකාවේ වගා කරන බෝග පහත දක්වෙන වර්ග යටතේ බෙදා දක්වන්න.

i. ධාන්‍ය
ii. එළවළු
iii. පළතුරු

6. පහත දක්වෙන එක් එක් පේළියේ එන පද හතරෙන් තුනක් අතර යම් සම්බන්ධතාවක් ඇත. ඒවායේ ඇති නොගැලපෙන පදය කපා හරින්න.

i. රබර්, වී, පොල්, තේ

ii. කුරුල්ලෝ, ගස්වැල්, ගොඩනැගිලි, ගංගා

iii. වව්වක්කා, මැ, කැරවී, බණ්ඩක්කා,

iv. කුරක්කන්, කෙසෙල්, මෙනේරි, මුං ඇට

v. කුරුඳු, ගම්මිරිස්, රබර්, කරදමුංගු

7

ජලය

පාඩමට සූදානම් වීම

මෙම පාඩමේ අඩංගු වන්නේ ජලය පිළිබඳ ඔබ දැන ගත යුතු කරුණු ය. ජලයෙන් ලබා ගන්නා ප්‍රයෝජන සහ ජලය ආශ්‍රිත කර්මාන්ත සමහරක් මෙහි විස්තර කොට ඇත. ඉගෙනීමේ පහසු ව සඳහා මෙහි දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. **කරදිය හා මිරිදිය අතර මෙනෙය කුමක් ද ?**
2. **ශ්‍රී ලංකාව වටා පිහිටි මහාද්වීප තටකයේ ඔසුන් බහුල කුමක් නිසා ද?**
3. **කඩතොලු සහිත වෙරළ සිවර කර්මාන්තයේ දියුණුවට බලපාන්නේ කෙසේ ද ?**
4. **කරදියේ සහ මිරිදියේ අල්ලා ගනු ලබන මත්ස්‍ය වර්ග මොනවා ද ?**
5. **කරදිය සිවර කර්මාන්තයේ දියුණුවට හේතු වන නව උපක්‍රම මොනවා ද ?**
6. **ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සිවර වරායයන් මොනවා ද ?**
7. **ජල විදුලි බලය යනු කුමක් ද ?**
8. **ශ්‍රී ලංකාවේ ඉදිකර ඇති ජල විදුලි බලාගාර මොනවා ද ?**
9. **සිවර සමුපකාර යෙනි මගින් සිවර කාර්මිකයින්ට සිදුවන සේවාවන් මොනවා ද ?**
10. **ශ්‍රී ලංකාවේ දනට නිෂ්පාදනය කෙරෙන මාලු ප්‍රමාණය දේශීය පරිභෝජනය සඳහා ප්‍රමාණවත් නො වන්නේ ඇයි ?**

වාග්මාලාව

කරදිය, මිරිදිය, මහද්වීප - තටකය, සිවර වරාය, ජල විදුලි බලය, විදුලි ජනකය, වර්ඛයින, විදුලි බලාගාර

7. 1 ජලයෙන් ඇති ප්‍රයෝජන

ජලය මිනිසාට උපතේ සිට මරණය දක්වා ම අවශ්‍ය වන ස්වාභාවික සම්පතකි. පානය කිරීම, නෑම, සේදීම ආදී මිනිස් ජීවිතයේ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීමට උපකාරී වන්නේ ජලය යි. සතුන්ගේ ජීවිතය පවත්වා ගැනීමට ද ජලය නැතිව ම බැරි සම්පතකි. එ පම ණක් නොව ශාක ලෝකයේ පැවැත්ම ද රඳා පවතින්නේ ජලය මත යි. මිනිස් ආහාරය සඳහා මාලු සැපයීමට ජලය උපකාරී වන අන්දමත්, ගමනා ගමන මාධ්‍යයක් වශයෙන් ජලය ප්‍රයෝජනවත් වන අන්දමත් ජලයෙන් මිනිසාට විවිධ ජීවනෝපායන් සපයා දෙන අන්දමත් ඔබ හය වන වසරේ සමාජ අධ්‍යයන පාඩම්වල දී ඉගෙන ගන්නට ඇත.

පොළොව මත ඇති ජලය කරදිය හා මිරිදිය වශයෙන් වර්ග කළ හැකි බව ද අපි දනිමු. විශාල ජලස්කන්ධයක් ඇති මුහුදුවල ඇත්තේ ලුණු රසින් යුත් කරදියයි. ගොඩ බිම් මත පිහිටා ඇති වැසි ජලයෙන් පෝෂණය වන ගංගා, ඇළ දෙළ හා වැව් ආදියේ ද උල්පත්වලින් ජලය ලබන ළිංවල ද ඇත්තේ මිරිදිය යි. (මේ සම්බන්ධයෙන් ඔබ පාසලට ලබා දී ඇති "ජනගහනය හා ස්වාභාවික සම්පත්" අතිරේක කියවීම පොතේ 1 – 13 පිටු කියවන්න.)

7. 2 සිවර කර්මාන්තය

ජලය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අතර සිවර කර්මාන්තය මුල් තැන ගනී. එය ඉතා පැරණි කර්මාන්තයකි. මෙම කර්මාන්තය

මිනියා අප රටේ ජැතාවට අවශ්‍ය ප්‍රෝටීන් වැඩි වශයෙන් සැපයේ. ධීවර කර්මාන්තයට යොදු ගන්නා ජලයේ ස්වභාවය අනු ව එය කොටස් දෙකකට බෙදා දක්විය හැකි ය. එ නම් කරදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ධීවර කර්මාන්තය යි.

7.2.1 කරදිය ධීවර කර්මාන්තය

කරදිය ධීවර කර්මාන්තය යනුවෙන් හඳුන්වන්නේ මුහුදේ හෙවත් කරදියේ මසුන් ඇල්ලීමයි. මුහුදින් එට වූ ශ්‍රී ලංකාවේ මුහුදු තීරයේ ජීවත් වන ජනයාගේ ප්‍රධාන රැකියාව ක් වි ඇත්තේ ද ධීවර කර්මාන්තය යි. ශ්‍රී ලංකාව වටා පිහිටා ඇති නොයෙකුත් මුහුදු තීරය මෙකෝපිල නවසය යනුවෙන් හඳුන්වන බව බොහෝ දෙනා දනී. මෙයට ප්ලැන්ක්ටන් ඇතුළු පෝෂ්‍ය ආහාර බහුල නිසා මත්ස්‍යයෝ ද බහුල වෙත්. කඩතොලු සහිත වෙරළ ලක්ෂණ ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ දියුණුවට හේතුවකි. ධීවර විරායයන් පිහිටුවීමට ද ධීවර යාත්‍රා නවතා තැබීමට ද ඒවා උපකාර වන බැවිනි.

කරදිය ධීවර කර්මාන්තය යටතේ නෝ ගැඹුරු මුහුදු තීරයේ හුරුල්ලන්, සාලයන්, ඉස්සන්, හාල්මැස්සන් වැනි කුඩා මාලු වර්ග බහුල වශයෙන් අල්ලා ගනු ලබන අතර තරමක් ඇත ගැඹුරු මුහුදින් බලයන්, කෙලවල්ලන්, සහ තෝර, මෝර, පරා වැනි ලොකු මාලු වර්ග ද අල්ලා ගනු ලබත්. මසුන් ඇල්ලීම සඳහා අපේ ධීවරයෝ විවිධ ක්‍රම උපයෝගි කර ගනිති. දැල් ඇදීම හා බිලි බැම සම්ප්‍රදායික මාලු ඇල්ලීමේ ක්‍රම යි. මේ සඳහා ධීවරයෝ කුඩා රුවල් ඔරු, වල්ලම්, කට්ටුමරම් ආදි පැරණි සම්ප්‍රදායේ ධීවර යාත්‍රා යොදා ගත් හ. මෙම පාරම්පරික ධීවර ක්‍රම දැනුදු ප්‍රයෝජනයට ගනු ලැබේ.

එහෙත් නූතන තාක්ෂණික දියුණුවත් සමග ම බිඟි වී ඇති නව උපක්‍රම බෙහෙවින් උපයෝගි කොට ගැනීමෙන් වර්තමාන ධීවර කාර්මිකයෝ වැඩි වැඩියෙන් මාලු නිෂ්පාදනය කරති. අල්ලා ගන්නා මාලු කල් තබා ගත හැකි ශීත කාමරහා වෙනත් පහසුකම් සහිත විශාල ට්‍රෝලර් යාත්‍රා, මසුන් සොයා ගැනීමේ නවීන විද්‍යුත්මක උපකරණ, මුහුදත් ගොඩ බිමත් අතර නිතර සම්බන්ධතා පවත්වා ගත හැකි දියුණු තුවන් විදුලි පණිවුඩ හුවමාරු ක්‍රම ගත මේවා කරදිය ධීවර කර්මාන්තය මඟින් විශාල මාලු ප්‍රමාණයක් නිෂ්පාදනය කර ගැනීමට උපකාරී වේ. මෝදර, බෙරුවල, ගාල්ල, මිරිස්ස, තංගල්ල, ත්‍රිකුණාමලය හා කිරින්ද යන වෙරළබඩ ස්ථානවල ධීවර අමාත්‍යාංශය මඟින් පිහිටුවා ඇති නවීන පහසුකම් සහිත ධීවර වරායන් නිසා ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තයේ විශාල දියුණුවක් ඇතිවීමට මං පාදි ඇත.



ධීවර වරායක්

7.1 රූපය

7.2.2 මිරිදිය ධීවර කර්මාන්තය

මිරිදිය ධීවර කර්මාන්තය යනුවෙන් හඳුන්වන්නේ රට තුළ පිහිටි ගංගා, ඇළ දෙල, වැව්, කෘත්‍රිම ජලාශ ආදියෙහි කෙරෙන ධීවර කටයුතු ය. මිරිදිය ජලාශවල මසුන් ඇල්ලීම ද පුරාණයේ සිට ම ශ්‍රී ලංකාවේ සිදු වුවත් එය කර්මාන්තයක් වශයෙන් දියුණු කිරීමට පියවර ගෙන ඇත්තේ මැතක සිට ය. වලයා, ලූලා, හිරිකනයා, කොරලියා, පෙතියා, මඟුරා වැනි දේශීය මසුන් ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් අතර ආහාරයට සුදුසු මසුන් ය. මෙම මසුන් ආහාරය සඳහා ඇල්ලීම පුරාණයේ සිට කර ගෙන එන ලද්දේ බිලි බැම, දැල් දැමීම, ජලාශ ඉසිඹ, විෂ ගෙඩි වර්ග දැමීම ආදි සම්ප්‍රදායික ක්‍රමවලට ය. වර්තමානයේ මිරිදිය ධීවර කර්මාන්තය පැරණි සම්ප්‍රදායික ක්‍රම අත්හැර වැඩි වැඩියෙන් මසුන් ලබා ගැනීමේ නව ක්‍රම කෙරෙහි යොමු වී ඇති බව ද පෙනේ. මේ යටතේ රටේ අභ්‍යන්තර ජලාශවල විදේශ වලින් ගෙන්වන ලද ඉක්මනින් බෝවන හා ප්‍රමාණයෙන් විශාලව වැඩෙන මිරිදිය මසුන් ඇති කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කොට තිබේ. තිලාපියා, ගුරාමි ආදි මත්ස්‍යයෝ එසේ විදේශ වලින් ගෙනවුත් ශ්‍රී ලංකාවේ ජලාශවල ඇති කරනු ලබත්. රටේ අභ්‍යන්තර ජලාශ හැරුණු විට කෘත්‍රිම ලෙස සාදනු ලබන කුඩා ප්‍රමාණයේ ජලාශවල පවා මිරිදිය මසුන් ඇති කිරීමේ වැඩ පිළිවෙළක් ද ධීවර අමාත්‍යාංශය මඟින් ආරම්භ කොට ඇත. කෙසේ වුවත් තවමත් ශ්‍රී ලංකාවේ මාලු නිෂ්පාදන ප්‍රමාණයෙන් මිරිදිය මසුන්ගෙන් ලැබෙන්නේ සියයට දහයටත් අඩු ප්‍රමාණයකි.

කරදිය හා මිරිදිය ධීවර කාර්මිකයන්ගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ධීවර සැලසුම්කාර පිහිටුවා ඇත. ධීවර බෝට්ටු, ඔරු පහසු මිලට ලබා දීම සහ ණය මුදල් සැපයීම වැනි කටයුතු මෙම සමිති මඟින් ඉටු කෙරේ.

ශ්‍රී ලංකාවේ දැනට නිපදවනු ලබන කරදිය හා මිරිදිය මාලු ප්‍රමාණය රටේ ජනගහනයේ අවශ්‍යතාවන් සඳහා ප්‍රමාණවත් නොවේ. විදේශ රටවලින් වසර මාලු මෙ රටට ගෙන ඒමට සිදු වී ඇත්තේ එබැවිනි.

7.3 ජලවිදුලි බලය

විදුලි බලය නිපදවීම ජල සම්පත ඇසුරින් කෙරෙන තවත් ප්‍රයෝජනවත් කාර්යයකි. මෙයින් දී ප්‍රයෝජනයට ගැනෙන්නේ වේගයෙන් ගලා සන ජලයේ ඇති ශක්තිය යි. විවිධ වූ මැඩ කටයුතු සඳහා අද මිනිසා විදුලිය උපයෝගී කොට ගනී. ආලෝකය ලබා ගැනීම, ගෙදරදොර විවිධ උපකරණ ක්‍රියා කරවීට, කර්මාන්ත ශාලාවල විවිධ යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කරවීම මේවා අතර වේ. මෙ සේ අත්‍යවශ්‍ය බල ශක්තියක් වන ජල විදුලි බලය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ යොදු ගන්නේ රටේ මධ්‍යම කඳුකරයේ සිට ගලා බස්නා ගංගාවල ජල බලය යි. ගලා සන ජලයේ ඇති ශක්තිය විදුලි බලය නිපදවීම සඳහා විදුලි ජනකය කැරීමට යොදවා ගැනීම මේ යටතේ සිදු වේ. මෙහි දක්වෙන සටහනින් පෑහැදිලි කර ඇති පරිදි ජල විදුලි බලය නිපදවීම සඳහා ඉහළ මට්ටමක ජලය රඳවා තබා ගත හැකි භූ විෂමතාවන් අවශ්‍ය ය. එ බදු ස්ථානයක ගංගාවක් හරහා වේල්ලක් බැඳ ජලය රැස් කර ගන්නා ජලාශයේ සිට නළ මඟින් පහත් ප්‍රදේශයකට ජලය ගෙන ගොස් එම නළවලින් වේදිනු ලබන ජල පහරවල ආධාරයෙන් විශාල විදුලි ජනකවලට සවි කර ඇති ටර්බයින යනුවෙන් හඳුන්වන ජල රෝද කරකවනු ලැබේ. එ සේ ජල රෝද කරකැවීමෙන් පසු ව එම ජලය නැවතත් පහළ මට්ටමක දී ගලා යන ගංගාවට එක් කරයි. ජල රෝදය කරකැවීමේ දී ඒට සම්බන්ධ කොට ඇති විදුලි ජනකය ද කර කැවෙන බැවින් ඉන් විදුලි බලය නිපද වේ. එ සේ නිපදවන විදුලි බලය කම්බි මාර්ග ඔස්සේ රටේ විවිධ පළාත්වලට බෙදා හරියි. මෙ සේ විදුලිය නිපදවන විදුලි බලාගාර



7.2 රූපය

ජල විදුලි බලය නිපදවීම

කිහිපයක් ම දැන් ශ්‍රී ලංකාවේ ඇත. ඉහිනියාගල, ලක්ෂපාන, නෝටන් බ්‍රිජ් මුලින් ම ඉදි කළ ජල විදුලි බලාගාර වේ. මහවැලි ආදි නූතන ජල සම්පාදන ව්‍යාපාර සටතේ තවත් ජල විදුලි බලාගාර කිහිපයක් ම දැන් ඉදි කොට ඇත. වික්ටෝරියා, කොත්මලේ, මොරගහකන්ද හා රන්දෙනිගල ජලාශ ආශ්‍රිත ව නව ජල විදුලි බලාගාර නිදසුන්වේ. (මේ සම්බන්ධයෙන් ඔබ පාසලට ලබා දී ඇති "ජනගහනය හා ඉන්ධන පරිභෝජනය" අතිරේක කියවීම් පොතේ 4—7 පිටු කියවන්න.)

සාරාංශය

ජලය මිනිසාට අතිශයින් ප්‍රයෝජනවත් ය. ධීවර කර්මාන්තය යොදා ගන්නා ජලය අනු ව එය කොටස් දෙකකට බෙදේ. කාරදිය ධීවර කර්මාන්තය, මිරිදිය ධීවර කර්මාන්තය ආදි වශයෙනි. ජල විදුලි බලය නිපදවනු ලබන්නේ ද ජලය ඇසුරෙනි.

ක්‍රියාකාරකම්

1. ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංග මොනවා ද?
2. කාරදිය ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් මහාද්වීප තටකයෙන් ඇති ප්‍රයෝජන විස්තර කරන්න.
3. ශ්‍රී ලංකාවේ අවට ඇත මුහුදින් අල්ලා ගනු ලබන මසුන්ගේ ද, වෙරළාසන්න ප්‍රදේශවල අල්ලා ගන්නා මසුන්ගේ ද නම් ලැයිස්තුවක් පිළියෙල කරන්න.
4. ධීවර කර්මාන්තය සඳහා යොදා ගන්නා පැරණි ක්‍රම හා උපකරණ මොනවාදැ යි පන්තියේ සාකච්ඡා කරන්න.
5. තාක්ෂණික ක්‍රම හා උපකරණ මගින් දියුණු වී ඇති නූතන ධීවර කර්මාන්තය පිළිබඳව පේළි 10 ක පමණ කුඩා රචනයක් ලියන්න.
6. ශ්‍රී ලංකාවේ සිතියමක ධීවර වරාය‍න් ලකුණු කොට නම් කරන්න.
7. මිරිදිය ධීවර කර්මාන්තය සටතේ ශ්‍රී ලංකාවේ බෝ කිරීමට තෝරා ගෙන ඇති විදේශ මසුන් කුමන නම්වලින් හැඳින්වේ ද?
8. ශ්‍රී ලංකාවේ සිතියමක ප්‍රධාන ජල විදුලි බලාගාර ලකුණු කොට නම් කරන්න.
9. මහවැලි ගංගාව ආශ්‍රිතව ඉදිකර ඇති ජල විදුලි බලාගාර මොනවා ද?
10. ශ්‍රී ලංකා සිතියමක් පිටපත් කොට ලුණු ලේවායන් ලකුණු කොට නම් කරන්න.

8

ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්

පාඩමට සූදනම් වීම

පහත දැක්වෙන්නේ 'ඛනිජ සම්පත්' පාඩම සටහේ ඔබට ඉගෙනීමට ලැබෙන විෂය කරුණු පදනම් කර ගත් ප්‍රශ්න කිහිපයකි. එම ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම කියවා අධ්‍යයනය කරන්න.

1. ශ්‍රී ලංකාවේ ඇති ඛනිජ සම්පත් මොනවා ද?
2. එදිනෙදා ජීවිතයේ දී වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගන්නා ඛනිජය කුමක්ද?
3. පිගන් මැටි විශාල වශයෙන් හැන්පත් වී ඇති ප්‍රදේශ මොනවා ද?
4. උළු ගඩොල් කර්මාන්තය සඳහා යොදා ගන්නා මැටි වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ කුමන පරිසරයක ද?
5. ශ්‍රී ලංකාවේ පිගන් කර්මාන්ත ශාලා පිහිටා ඇති ස්ථාන මොනවා ද?
6. මිනිරන්වලින් ගන්නා ප්‍රයෝජන මොනවා ද?
7. ප්‍රධාන මිනිරන් පතල් මොනවා ද?
8. ඛනිජ මැලි වර්ග අතරින් ගුවන් යානා නිපදවීමේ දී වඩා ප්‍රයෝජනයට ගන්නා ඛනිජ මැලි වර්ගය කුමක් ද?
9. විදුරු සෑදීමට ගන්නා ඛනිජ මැලි වර්ගය කුමක් ද?
10. ත්‍රිකුණාමලයට උතුරින් පිහිටි ප්‍රධාන ඛනිජ මැලි නිධිය පිහිටා ඇත්තේ කිනම් නගරය ආශ්‍රිතව ද?

වාග්මාලාව

ඛනිජ නිධි, ඛනිජ මැලි, නුණුගල්, කෙඕලින්, ඔලිසා, වයිවේනියම්, කිරිගල්

8.1 ඛනිජ සම්පත්

ඛනිජ යනුවෙන් හඳුන්වනු ලබන්නේ පොළොවෙන් ලබාගන්නා **ස්වාභාවික සම්පත්** විශේෂයකි. ඛනිජ විශාල වශයෙන් තැන්පත් වූ විට ඛනිජ නිධි නමින් හැඳින් වේ. ආර්ථික වටිනාකමක් ලබා දෙන්නේ ඛනිජ, නිධි වශයෙන් තැන්පත් වූ විට ය. මිනිසාගේ අවශ්‍යතාවන් සඳහා ප්‍රයෝජනයට ගත හැකි ඛනිජ වර්ග 2000 ක් පමණ මේ වන විට හොයා ගෙන ඇත. මේවායින් සමහර ඛනිජ වර්ග ඉතා වටිනා ඒවා වන අතර සමහර ඒවා වටිනාකමින් අඩු ය. රන්, මැණික්, යුරේනියම් ඉතා වටිනා ඛනිජ වර්ගවලට උදාහරණ වේ. මැටි, නුණුගල් සහ මිනිරන් වටිනාකමින් අඩු ඛනිජ වර්ග ලෙස දැක්විය හැකි ය. මෙම වර්ග දෙකට ම අයත් ඛනිජ වර්ග ශ්‍රී ලංකාවේ තිබේ. ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් දේශීය අවශ්‍යතා සඳහා යොදා ගන්නා අතර ඇතැම් ඛනිජ වර්ග විදේශවලට යැවීමෙන් රටට ආදායමක් ලබා ගනී.

8.2 මැටි

මිනිසාගේ එදිනෙදා ජීවිතයේ දී ප්‍රයෝජනයට ගන්නා ඛනිජ අතර මැටි වැදගත් තැනක් ගනී. නිවාස හොඳනැඟීමට අවශ්‍ය ගඩොල් හා උළු, මැටිවලින් සාදා ගනු ලබන අතර ආහාර පිළියෙල කර ගැනීමට අවශ්‍ය වළං හා පිගන් භාණ්ඩ සාදා ගන්නේ ද මැටි උපයෝගි කොට ගෙන ය.

උළු හා ගඩොල් නිපදවීමට අවශ්‍ය මැටි ලබා ගන්නේ ගංගා නිම්නවල පහළ ඉවුරු ප්‍රදේශවලිනි. විශාල මැටි නිධි මහ ඔය, කළු ගඟ, කැලණි ගඟ හා ගිං ගඟ ආදී නිම්නවල තිබේ. එසේ ම වියළි කලාපයේ ජරාවාස වූ වැවිවල ද මැටි නිධි තැන්පත් වී ඇත. බංගදෙණිය, කොච්චිකඩේ, කැලණිය, සටියාය, අම්පාර, අනුරාධපුර ආදී ප්‍රදේශවල උළු ගඩොල් නිෂ්පාදනය විශාල වශයෙන් සිදු වන අතර වළං සෑදීම ද බොහෝ දුරට ඉහත කී ප්‍රදේශවල ම සිදු වේ.

පිගන් සෑදීම කරනු ලබන්නේ 'කෙඕලින්' නමින් හඳුන්වන කිරි මැටි විශේෂයකිනි. ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයක ම කිරිමැටි විශාල නිධි වශයෙන් තැන්පත් වී ඇති බව සොයා ගෙන තිබේ. විශාල ම කිරි මැටි නිධිය බොරලැස්ගමුව ප්‍රදේශයේ පිහිටා ඇති අතර අම්බලන්ගොඩ අසල පිහිටි මීවිසාගොඩ ද උතුරු පළාතේ ඉරනමඩු ප්‍රදේශයේ ද විශාල කිරිමැටි නිධි පිහිටා ඇති බව සොයා ගෙන ඇත. කෙඕලින් උපයෝගි කොට ගෙන උසස් තත්ත්වයේ පිගන් නිෂ්පාදනය කරන පිගන් කර්මාන්තශාලා කිහිපයක්ම දැන් ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇත. ඒවා නම් පිළියන්දල, රත්නොට හා දංකොටුව ආදි ස්ථානවල පිහිටුවා ඇති පිගන් කර්මාන්ත ශාලායි. මේවායේ නිපදවනු ලබන උසස් තත්ත්වයේ පිගන් භාණ්ඩ බොහොමයක් විදේශ රටවලට ද යවනු ලැබේ.

8.3 මිනිරන්

ඔබ පාවිච්චි කරන පැන්සල සාදා නිබෙන්නේ කිරාමි ද්‍රව්‍යයකින් දැයි ඔබ දන්නවා ද? එහි පිටතින් ඇත්තේ ලී ආවරණයක් වුවත් ලියැවෙන කුර සාදා ඇත්තේ මිනිරන් මිශ්‍රණයකිනි. මිනිරන් ශ්‍රී ලංකාවේ හමුවන තවත් ප්‍රයෝජනවත් ඛනිජ වර්ගයකි. ඉතා සිනිදු පහසුවෙන් කුඩු වී යන ස්වභාවයක් ඇති මිනිරන් නිධි ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයක ම තිබේ. එඩා ප්‍රදේශවල මිනිරන් පතල් රුවන්වැල්ල අසල පිහිටි බෙංගල දෙනලන් කුරුණෑගල කහවඟහ සහ කොලොන්ගහ පතලුත් වේ.

පොළොව මත සිට හයාරස් ඉදුණ් කපන ආකාරයට පළමුවෙන් ම මිනිරන් පතල ගැබුරට කපනු ලැබේ. පොළොව තුළ දී ඉල්ලම් ඇති ප්‍රදේශවලට හරස් දෝනා විහිදුවමින් මිනිරන් කඩා ගැනීම සිදු කෙරේ. පතල තුළ දී කඩා ගන්නා මිනිරන් යාන්ත්‍රික දෙඔකර මඟින් පොළොව මතට ගෙනවුත් ඒවා සකස් කරන කර්මාන්ත ශාලාවලට යවා සකස් කොට පිටරට යැවේ.

මිනිරන් විවිධ ප්‍රයෝජන සඳහා යොදා ගන්නා ඛනිජ වර්ගයකි. පැන්සල් සෑදීම, තීන්ත වර්ග සෑදීම, බැටරි ඉලෙක්ට්‍රෝඩ සෑදීම, කෝච සෑදීම, ආදිය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබේ.

8.4 මැණික්

මැණික් ගල් අල්ලා සකස් කළ මුදු හෝ මාල ඔබ දක ඇත. විවිධ වර්ණවලින් යුත් මැණික් ශ්‍රී ලංකාවේ තිබෙන ඉතා වටිනා ඛනිජ වර්ගයකි. පුෂ්පරාග, වෛරෝඩි, නිල් කැට, කිරිංචි, පයින්ගල්, රතු කැට මෙරට මැණික් ඉල්ලම්වලින් ලබා ගන්නා මැණික් වර්ග වලින් කිහිපයකි.

ශ්‍රී ලංකාවේ මැණික් වැඩි වශයෙන් ම ලැබෙන්නේ යබරගමු පළාතේ ය. මැණික් නගරය යා තේරුම ඇති රත්නපුරය මැණික් හමුවන ප්‍රධාන ප්‍රදේශය යි. පැල්මඩුල්ල, බලංගොඩ හා කහවත්ත ඒ අවට ඇති මැණික් බහුල ව ලැබෙන ප්‍රදේශයන් ය. ඇලහැර, ඔක්කම්පිටිය, පස්සර දුණුගල යන ප්‍රදේශ ද මැණික් සඳහා ප්‍රසිද්ධියක් උසුල යි.

පොළොවේ ඇති මැණික් ලබා ගන්නේ පතල් කැණීමෙනි. මැණික් පතල් මිනිරන් පතල් තරම් ගැඹුරු නැත. රත්නපුර ප්‍රදේශයේ පොළොව මතු පිට ම වාගේ මැණික් ඉල්ලම් හමුවේ. මැණික් පතල්වලින් ගොඩ ගන්නා ඉල්ලම් සහිත පස්, විශේෂ වර්ගීවලින් ගරා මැණික් කැට වෙන් කර ගනී. මෙසේ ලබා ගන්නා මැණික් ගල් කපා ඔප වර්ගීම කිරීම සිදු කරන්නේ ඒ සඳහා විශේෂ පුහුණුවක් ලැබූ විරියන් විසිනි. මැණික් කැවිලි මැහෙන් වන තුරු අත්සන්ත්‍ර උපයෝගි කර ගෙන කරනු ලැබුවත් දැන් බොහෝ විට මැණික් කැපීම සඳහා දියුණු යාන්ත්‍රික ක්‍රම භාවිත කෙරේ. මැණික් විටරට සැපයීමෙන් ශ්‍රී ලංකාවට සැලකිය යුතු ආදායමක් ලැබේ. මැණික් සංස්ථාව මැණික් වෙළඳාම පිළිබඳ ප්‍රධාන රාජ්‍ය ආයතනය යි. ඒ හැරුණු විට පෞද්ගලික ව්‍යාපාරිකයෝ ද දේශීය මෙන් ම විදේශීය මැණික් වෙළඳාමේ යෙදී සිටිති.

8.5 ඛනිජ මැලි

ශ්‍රී ලංකාවේ හමු වන තවත් ඛනිජ සම්පතකි, ඛනිජ මැලි. මේවා වෙරළාසන්න ප්‍රදේශවල මැලි යටිගල මිශ්‍ර ව තැන්පත් ව ඇත. ඉල්මනයිට්, රුටයිල්, සර්කෝන්, මොනසයිට්



8.1 රූපය

ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් I



8.2 රූපය

ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් II

ඒවායින් කිහිපයකි. විදුරු සෑදීමට ගන්නා සිලිකා වැලි ද බනිජ වැලි විශේෂයකි. මෙම බනිජ වැලි අතරින් වැඩි ප්‍රමාණයක් ඇත්තේ ඉල්මනයිටිය. ඉල්මනයිට් වලින් තුවන් ශානා නිපදවීමට අවශ්‍ය ටයිටේනියම් ලෝහය සාදා ගනු ලැබේ. ඒ හැරුණු විට තීව්‍ර වර්ග සෑදීමට ද පිගන් කර්මාන්තයට ද ඉල්මනයිට් භාවිත කරයි.

රූටයිල් ද පිගන් කර්මාන්තය යඳහා යොදා ගනු ලබන අතර පෝර්සිලේන් විදුලි භාණ්ඩ නිපදවීමට ද පැස්සුම් කුරු නිෂ්පාදනයට ද යොදා ගනී. සර්කොන් යොදා ගන්නේ තාප භාණ්ඩ නිපදවීමට හා වාන්තු වැලි වශයෙනි.

ඉහත කී බනිජ වැලි වර්ග හමුවන විශාල ම නිධිය පිහිටා ඇත්තේ ත්‍රිකුණාමලයට උතුරින් පිහිටි පුල්මුඩේයි ය. මධකලපුවට දකුණින් පිහිටි තිරුක්කොවිල් ප්‍රදේශයේ ද කුදිරමලේ, කයිකාවල, කළුවැල්ල, පොල්කොටුව, හා දෙවිනුවර යන ප්‍රදේශවල ද මෙම බනිජ වැලි නිධි සොයා ගෙන ඇත.

සිලිකා වැලි හෙවත් විදුරු වැලි නමින් හඳුන්වන බනිජ වැලි විශේෂය විදුරු කර්මාන්තය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබේ. මෙම සිලිකා වැලි වෙරළබඩ තීරය දිගට ම ඇති කඳුන් වඩා ප්‍රයෝජනවත් නිධි පිහිටා ඇත්තේ නාන්තන්ඩිය හා මාදම්පේ අවට මුහුදුබඩ තීරයේ ය.

බනිජ වැලි සහස් කිරීමේ ප්‍රධාන කම්හල පුල්මුඩේයි පිහිටුවා ඇති අතර විදුරු වැලි උපයෝගී කොට ගෙන විදුරු නිපදවීමේ කම්හල නාන්තන්ඩියේ ඉදි කොට ඇත. බනිජ වැලි විටරට ගැවිමෙන් රටේ ජාතික ආදායමට සැලකිය යුතු මුදලක් එක් කර ගැනීමට ද හැකි වී තිබේ.

8.6 ගුණුගල්

ශ්‍රී ලංකාවේ බනිජ සම්පත් අතරට ගැනෙන තවත් බනිජ සම්පතකි, ගුණුගල්. පුත්තලමේ සිට මුලතිව් දක්වා දේබාවක් ඇත්තේත් ඉන් උතුරු ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුණුගල් ප්‍රදේශය සි. මේ හැරුණු විට කාලපාදු, පලාගොඩ, බිබුල්ල ආදී ප්‍රදේශවල ද ගුණුගල් විශේෂයක් දක්නට ලැබේ. ගිරිගල් යනුවෙන් හඳුන්වන ගුණුගල් වර්ගය අම්බලන්ගොඩ සිට මාතර දක්වා වෙරළබඩ තීරයේ හමුවේ.

ගුණුගල් වැඩි වශයෙන් ම උපයෝගී කර ගන්නේ සිමෙන්ති කර්මාන්තයට ය. ඒ හැරුණු විට ගොඩනැගිලි කර්මාන්තයේ ද අලුතුණු නිපදවා ගැනීමට ද ගුණුගල් ප්‍රයෝජනවත් වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සිමෙන්ති කර්මාන්ත ශාලා දෙකක් ඉදි කොට ඇත. කන්කසන්තුරේ පිහිටි කර්මාන්ත ශාලාව ඉන් පැරණි ම කර්මාන්ත ශාලාව සි. පුත්තලමේ පිහිටි සිමෙන්ති කම්හල දෙවන කම්හල සි.

8.7 ලුණු

ලුණු ද බනිජයක් වශයෙන් හැඳින්විය හැකි ද්‍රව්‍යයකි. ලුණු නිපදවා ගනු ලබන්නේ මුහුදු ජලයෙනි. මුහුදු ජලයේ ලුණු ඇතුළු තවත් බනිජවල මූලද්‍රව්‍ය රාශියක් අඩංගු බව සොයා ගෙන තිබේ. මුහුදු ජලය ලුණු රස බැවින්ම ලුණු අධිකව ඇති බව සිතා ගැනීම අපහසු නො වේ.

මුහුදු ජලයෙන් ලුණු සකස් කර ගැනීම සිදු කරනු ලබන්නේ ඒ සඳහා සුදුසු භූමි ස්වභාවයක් හා සුදුසු කාල ගුණික තත්ත්වයක් පවතින ප්‍රදේශවල ය. ලුණු සකස් කර ගැනීම සඳහා සමුද්‍රාසන්නයේ පහත් බිම්වලට මුහුදු ජලය ලබා ගැනීමට පහසු වන සේ ලේවාය සනුවෙන් හඳුන්වන කෙත්වලට වරින් වර මුහුදු ජලය පුරවනු ලැබේ. එසේ පුරවන ලද ජලය සූර්ය තාපය නිසා වාෂ්ප වී යාමෙන් පසු ලුණු තට්ටු වශයෙන් මිදීම සිදු වේ. එසේ මිදුණු ලුණු රේක්ක වැනි උපකරණවලින් කඩා රැස්කර ගනු ලබයි. නිතර වැසි පවතින අප රට තෙත් කලාපයේ ලුණු නිෂ්පාදනය කිරීමේ කාර්යාවලිය සිදු කිරීම අපහසු ය. ශ්‍රී ලංකාවේ ලුණු ලේවා පිහිටා ඇති ප්‍රදේශ ගැන සොයා බැලුවොත් පෙනී යන්නේ ඒවා පිහිටා ඇත්තේ වාර්ෂික වර්ෂාපතනය ඉතා ම අඩු ප්‍රදේශවල බව යි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ලුණු ලේවාශයන් පිහිටා ඇත්තේ හම්බන්තොට, පුත්තලම, නිලාවේලි හා එලිඋප්පව් පාස් යන ස්ථානවලය. මේවායේ නිපදවනු ලබන ලුණුවලින් වැඩි කොටයක් දේශීය පාරිභෝජනය සඳහා යොදා ගනු ලැබේ. ලුණු කර්මාන්තය ආශ්‍රිත ව වෙනත් රසායනික

ද්‍රව්‍ය ද නිෂ්පාදනය කරනු ලැබේ. කෝස්ටික් සෝඩා, සෝඩියම් බයිකාබොනේට්, විරංජන කුඩු ආදිය ලුණු ඇසුරෙන් සාදා ගන්නා ද්‍රව්‍ය වේ.

සාරාංශය

බනිජ යනුවෙන් හඳුන්වනු ලබන්නේ පොළොවෙන් ලබා ගන්නා ස්වභාවික සම්පත් විශේෂයකි. බනිජ විශාල වශයෙන් තැන්පත් වූ විට එය හැඳින් වෙන්නේ බනිජ නිධි නමිනි. විවිධාකමින් වැඩි මෙන් ම විවිධාකමෙන් අඩු බනිජද ඇත. ශ්‍රී ලංකාවේ ඇති මෙම දෙවර්ගයේ ම බනිජ දේශීය අවශ්‍යතා වලට යොදා ගන්නා අතර ඇතැම් බනිජ වලින් විදේශීය ආදායමක් ද ලැබේ.

ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධාන බනිජ වර්ග යම් මැටි, මිනිරන්, මැණික්, ඛනිජ වැලි, ගුණුගල් සහ ලුණු ය. මේ බනිජ වර්ග මිනිසාට එදිනෙදා ජීවිතයට ප්‍රයෝජනවත් වේ. ඒ සැර මේ කර්මාන්ත ආශ්‍රිත ව විශාල කර්මාන්ත ශාලා ද අරඹා ඇත.

ක්‍රියාකාරකම්

1. කිරිමැටි, මිනිරන්, ගුණුගල්, ලුණු සහ මේවායින් සාම්පලය බැගින් සපයා ගෙන ඒවා හොඳින් පරීක්ෂා කර බලා පහත දක්වෙන ගිරිය ඇතුලත් වන සේ වගුවක් සාදා ඒ ඒ බනිජ වර්ගය යටතේ එට වගුව සම්පූර්ණ කරන්න.

බනිජ වර්ගය	සපයා ගත් ස්ථානය	වර්ණය	ස්පර්ශය (අල්ලා බලන විට දැනෙන)	ගෙන ඇති ප්‍රයෝජන	ගතහැකි සැබි ඔබ කියන්න ප්‍රයෝජන
උදාහරණය:- කිරි මැටි		සුදු	සිනිදුයි, ඇලෙන සුළුයි.	පිගන් සෑදීම වළං සෑදීම	විවිධ ආකාරයේ සෑදීම

2. මෙම පාඩමේ දී ඔබ හඳුනාගත් බනිජ වර්ග හැර වෙනත් බනිජවලින් සාදා ඇති භාණ්ඩ පන්ති කාමරයට ගෙන එන්න. ගෙනෙන ලද සියල්ල රැස් කොට ඒවා සාදා ඇත්තේ කිනම් බනිජ වර්ගයකින් ද යි ගුරුතුමාගේ ද සහාය ඇති ව දැනගන්න.

3. ශ්‍රී ලංකාවේ සිතියමක පහත දක්වෙන බනිජ නිධි ඇති ප්‍රදේශ දෙක (2) බැගින් ලකුණු කර නම් කරන්න.

i. මැණික් ii. බනිජ වැලි iii. මැටි

9

වෙළෙඳ බෝග

පාඩමට සූදානම් වීම

වෙළෙඳාම පිණිස වගා කරන්නා වූ බෝග වෙළෙඳ බෝග හෙවත් අපනයන බෝග යනුවෙන් හැඳින්විය හැකි ය. මෙම බෝග ප්‍රධාන වශයෙන් ම වගා කරනු ලබන්නේ පිට රටවලට යවා වුදල් ලබා ගැනීම සඳහා ය. තේ රබර්, පොල් මෙසේ වගා කරනු ලබන ප්‍රධාන බෝග ය. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සොයමින් මෙට පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. ශ්‍රී ලංකාවේ තේ වගාව ප්‍රධාන වශයෙන් පැතිර පවත්නේ කුමන දිස්ත්‍රික්කවල ද?
2. තේ වැවීමට බලපාන පාරිසරික සාධක කවරේ ද?
3. ශ්‍රී ලංකාවෙන් තේ මිල දී ගන්නා රටවල් මොනවා ද?
4. අප රටේ රබර් වගා කෙරෙන ප්‍රධාන දිස්ත්‍රික්ක මොනවා ද?
5. රබර් ගස වැවීමට අවශ්‍ය පාරිසරික සාධක කවරේ ද?
6. ටයර් කර්මාන්ත ශාලාව පිහිටියේ කොහේ ද?
7. පොල් වගාව බහුල ව පැතිර ඇත්තේ කිනම් ප්‍රදේශවල ද?
8. පොල් වගාවට අවශ්‍ය පාරිසරික සාධක මොනවා ද?
9. කොහු කර්මාන්තය ඇසුරින් දේශීය වශයෙන් නිපදවන භාණ්ඩ මොනවා ද?
10. සවිපකාර අංශය මගින් යකුන් ඇනි කිරීට ටැඩි දියුණු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේ ද?

වාග්මාලාව

ලැටරයිට් පස, ස්වයංරුකියා, පර්යේෂණාගාර, ජාතික කිරි මණ්ඩලය, අමු ද්‍රව්‍ය, ජීවානුහරිත කිරි

9.1 තේ

අප රටේ වැවෙන වෙළෙඳ බෝග අතුරින් ප්‍රධාන තැනක් ගනුයේ තේ ය. තේ වතු ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේත් ඊට ආසන්න නිරිත දිග තෙත් කලාපයේත් ප්‍රධාන වශයෙන් පැතිර ඇත. තේ වගාව සඳහා ඉතා ම වැදගත් වනුයේ මාතලේ, මහනුවර, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන් ය. අප රටේ තේ වැවෙන ප්‍රදේශ කොටස් තුනකට බෙදේ. නුවරඑළිය වැනි වඩා උස් බිම්වල වගා කරන තේ "උඩරට තේ" යන නමින් හැඳින් වේ. හොඳම තේ ලෙස ගණන් ගැනෙන මේවා ප්‍රණීත රසයෙන් යුක්ත ය. මහනුවර, මාතලේ වැනි ප්‍රදේශවලින් ලැබෙන තේ "මැද රට තේ" නමින් හැඳින්වේ. මොරවක, දෙණියාය වැනි ප්‍රදේශවල වැවෙන තේ "පහත රට තේ" නමින් හැඳින්වෙන අතර මේවා රසයෙන් අඩු ය.

තේ ගස වර්ෂාව වැඩි කඳු බෑවුම්වල හොඳින් වැඩේ. වර්ෂය පුරා ම පැතිර පවත්නා වර්ෂාව තේ ගසට අවශ්‍ය ය. තේ පැලයේ මුල් ජලය රඳා නොපැවතිය යුතු බැවින් හොඳින් ජලය බැස යන බෑවුම් ප්‍රදේශ තේ වගාවට යෝග්‍ය වේ. ලැටරයිට් මිශ්‍ර රතු පස් සහිත බිම් තේ වගාවට යෝග්‍ය වෙයි. තේ නිපදවන්නේ දළු වලිනි. තේ දළු කඩා ගැනීමට හැකි වන පරිදි තේ ගස මිටි, පැතිරුණ පදුරක් ලෙස සකස් කළ යුතු වේ. තේ දළු නෙලීම, තේ ගස් කප්පාදු කිරීම, වල් නෙලීම සහ තේ කර්මාන්ත ශාලාවල



9.1 රූපය

වැඩට විශාල කම්කරු පිරිසක් අවශ්‍ය ය. අප රටේ තේ දළු නෙළනු ලබන්නේ වැඩි වශයෙන් කාන්තාවන් විසිනි. තේ දළු නෙළා ගැනීමෙන් පසු ඒවා කර්මාන්ත ශාලාවල දී පවනේ විසලා ගනු ලැබේ. ඉන් පසු යන්ත්‍රවල දමා කැඩලිවලට කඩා සකස් කර ගනු ලැබේ. මෙසේ සකස් කර ගත්තා තේ නොයෙක් වර්ගවලට වෙන් කොට පිට රට යැවීම සඳහා සුදුනම් කෙරේ. ශ්‍රී ලංකා තේ උසස් වර්ගයක තේ වශයෙන් ලෝක ප්‍රසිද්ධ ය. එක්සත් රාජ්‍යය, පකිස්ථානය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ඉරාකය, දකුණු අප්‍රිකාව අපේ තේ මිල දී ගන්නා ප්‍රධාන රටවල් ය.

තේ වගාව ගැන නොයෙක් අත්හදා බැලීම් පැවැත්වීම සඳහා තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයක් පිහිටුවා ඇත. තේ වගාවට අවශ්‍ය පොහොර ලබා දීම, තේ නිෂ්පාදන වැඩි දියුණු කිරීම ආදිය සඳහා තේ නිපදවන්නන්ගේ සමූපකාර සමිති කිහිපයක් දිවයිනේ ක්‍රියාත්මක වෙයි.

9.2 රබර්

අප රටට විශාල ආදායමක් ගෙන දෙන තවත් වෙළෙඳ බෝගයකි, රබර්. විවිධ කර්මාන්ත සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍යයක් වන රබර් නිපදවන්නේ රබර් ගසෙන් ලැබෙන කිරිවලිනි.

ශ්‍රී ලංකාවේ රබර් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක වනුයේ කෑගල්ල, රත්නපුර, හා කළුතර ය. ගාල්ල, කොළඹ, මාතර, මාතලේ, බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල ද සුළු වශයෙන් රබර් වගා කෙරේ.

රබර් ගස හොඳින් වැඩීමට අවශ්‍ය පාරිසරික සාධක කිහිපයකි. වැඩි උෂ්ණත්වයක්



9.2 රූපය



9.3 රූපය

සහ වැඩි වර්ෂාපතනයක් තිබීම, ජලය හොඳින් බැස යන බැවුම් සහිත බිම් සහ රතු පාට කබොක් පස මේවා අතර වැදගත් වේ. ඉහත සඳහන් සාධක වැඩි වශයෙන් දක්නට ලැබෙන නිරිත දිග තෙත් කලාපිය ප්‍රදේශවල රබර් හොඳින් වැඩේ.

රබර් ගසේ කඳෙහි කැපුමක් යෙදීමෙන් රබර් කිරි ලබා ගනී. මෙම කිරි ලුදිය යන්ත්‍රවල දමා සකස් කර ගැනීමෙන් ලු රබර්, ක්‍රෙප් රබර් සහ කුට්ටි රබර් ස ගනු ලැබේ.



9.4 රූපය



ශ්‍රී ලංකාව–පොල් වගා කරන ප්‍රදේශ
9.5 රූපය

ශ්‍රී ලංකාව ලෝකයේ රබර් නිපදවන රටවල් අතර වැදගත් තැනක් ගනී. අප රටේ නිපදවන රබර්වලින් මැඩි ප්‍රමාණයක් පිට රට සවිනු ලැබේ. චීන මහජන සමූහාණ්ඩුව, සෝවියට් දේශය, ඇමෙරිකා එක්සත් ජනපදය උපලන්තය, රුමේනියාව, පකිස්තානය, චෙක්සිලෝවැ අද්ධ අප රටේ රබර් මිලදී ගන්නා රටවල් වේ. රබර්වලින් ලුළු ප්‍රමාණයක් දේශීය කර්මාන්ත සඳහා ද පාවිච්චියට ගැනේ. ටෝවර් රථ හා ට්‍රේවර් යකිකල් සඳහා, වයර් නිපදවීම ඉන් ප්‍රධාන තැනක් ගන්නා කර්මාන්තයකි. මේවා නිපදවනු ලබන්නේ කැලණියේ පිහිටි ශ්‍රී ලංකා වයර් සංස්ථාවට අයත් කර්මාන්ත ශාලාවේ ය. මේ හැරුණු විට බයිසිකල් සඳහා වයර් හා ටියුබ්, පාවිහන්, රබර් මුද්‍රිත මේජට්, සෙල්ලම් බඩු, අත්වැසුම්, වැඹිකබා ඩිබ පාවිච්චි කරන මකන කැලි, සහාදි නිෂ්පාදනයන් ද ශ්‍රී ලංකාවේ රබර් ආශ්‍රිත නිෂ්පාදන වශයෙන් සැලකිය හැකි ය.

රබර් වගාව ගැන නොසෙක් අවධානය යොමු කෙරෙන රබර් පර්යේෂණාගාරය පිහිටා ඇත්තේ අගලවත්තේ ය. මේ හැර විවිධ සේවා සවූපකාර සමිති රහින් ද නොසෙක් අන්දමේ සේවාවන් ඉටු වේ. මේවා අතර වගා තුම දියුණු කිරීම, කුඩා රබර් හිමියන්ට ණය පහසුකම් ලබා දීම, සාධාරණ මිල ක්‍රමය, නිෂ්පාදනය වැඩි කිරීම සහ නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා රබර් සැකසුම් මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑම ආදිය සඳහන් කළ හැකි ය.

9.3 පොල්

අප රටේ වැදගත් තවත් වෙළඳ බෝගයකි, පොල්. පොල් ආහාර බෝගයක් වශයෙන් අප රටේ ප්‍රයෝජනයට ගන්නා අතර පිටරට සැහෙන්නේ ද විශාල ආදායමක් ලැබේ.

පොල් වගාව විශාල වශයෙන් පැතිර ඇත්තේ තෙත් කලාපයේ පහත් බිම්වල බව 7.3 රූපය බැලීමේ දී ඔබට පෙනෙනු ඇත.

යාපනය, කුරුණෑගල, හලාවත සහ නගර සම්බන්ධ කෙරෙන ප්‍රදේශයේ පොල් බහුල ව වැඩෙන අතර එම කලාපය පොල් ත්‍රිකෝණය නමින් හැඳින් වේ. කොළඹ, කළුතර, ගාල්ල, මාතර, තංගල්ල සහ දිස්ත්‍රික්කවල වෙරළබඩ කිරයේත් පොල් වගා කෙරේ. මේ හැර ඔබකලපුව, සාපනය, මන්නාරම, මහනුවර සහ ප්‍රදේශවල ද සුළු වශයෙන් පොල් වැවේ.

තේ සහ රබර් වගාවට මෙන් ම පොල් වගාවට ද අවශ්‍ය පාරිසරික යාඩක කිහිපයකි. වැඩි උෂ්ණත්වයක් සහ වැඩි වර්ෂාපතනයක් තිබීම, මුහුදුබඩ ප්‍රදේශවල ඇති ලුණු මිශ්‍ර වැලි සහිත පස මේවා අතර ප්‍රධාන වේ. පොල් ගසේ සෑම කොටසක් ම ප්‍රයෝජනයට ගනු ලැබේ. පොල් තෙල්, රස කැවිලි, සබන් සෑදීමට ද පොල් ලෙලි කොහු භාණ්ඩ සෑදීමට ද පොල් ලී ගොඩනැගිලි සෑදීමට ද පොල් අතු ගෙවල් සෙවිලි කිරීමට ද පොල් මල මී රා, පැණි, විනාකිරි, අරක්කු ආදිය සෑදීමට ද පොල් කටු විසිතුරු භාණ්ඩ සෑදීමට ද කපාපු පොල් පුන්නාක්කු සහ සත්ත්ව ආහාර වර්ග නිපදවීමට ද භාවිත කෙරේ.

රබර් මෙන් ම පොල් ද ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබා දෙන වෙළෙඳ බෝගයක් වුවත්, දේශීය වශයෙන් සිදු කැරෙන නිෂ්පාදන කර්මාන්ත රැසක් ද පොල් වගාව ආශ්‍රිත ව ආරම්භ වී ඇත. පොල් ගෙඩියේ මෙරූ මදය වේලා සකස් කර ගන්නා කොප්පරා යන්ත්‍රානුසාරයෙන් අඹරා පොල් තෙල් නිෂ්පාදනය කිරීම ඉන් එක් කර්මාන්තයකි. පොල් තෙල් දේශීය පාරිභෝජනයට වැඩි වශයෙන් ම යොදා ගන්නා අතර, පිට රටවලට යැවීම ද සිදු කැරේ. කපාපු පොල් නිපදවනු ලබන්නේ ද පොල් මදයෙනි. මේවා ද පිටරට සවනු ලබන අතර ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් දියුණු වී ඇති රසකැවිලි කර්මාන්තයට ද යොදා ගනු ලැබේ. පොල් ලෙලි අවු ද්‍රව්‍ය වශයෙන් යොදා ගනිමින් කැරෙන කොහු කර්මාන්තය පොල් වගාව ආශ්‍රිත ව තෙරෙන තවත් වැදගත් කර්මාන්තයකි. පොල් ත්‍රිකෝණයේ හා නිරිතදිග වෙරළබඩ පොල් තිරයේ මෙම කොහු

නිෂ්පාදනය කම්හල් රාශියක් පිහිටුවා ඇත. මේ සවසේ විවිධ වර්ගවල කොහු නිපදවා ඒවායින් වැඩි කොටසක් විදේශවලට යවනු ලැබේ. කොහුවලින් කැරෙන දේශීය නිෂ්පාදන වශයෙන් මෙවිට, බුමුතුරුණු, ලණු, බුරුසු ආදිය දැක්විය හැකි ය. පොල් ගසේ මලෙන් ලබා ගන්නා මී රා උපයෝගි කොට ගෙන දේශීය වශයෙන් බිසි පි ඇති නිෂ්පාදන කර්මාන්ත ද කියිපයකි. දේශීය පාරිභෝජනය සඳහා පමණක් යොදා ගන්නා මේවා අතර රා, විනාකිරි, අරක්කු නිපදවීම ප්‍රධාන වේ. මීට අමතරව පොල් පැණිවලින් රස කැවිලි සෑදීම හා පොල් සකුරු නිපදවීම ද සිදු කැරේ.

පොල් වලිබඳ අත්හදා බැලීමට ලුණුවිල පොල් පර්යේෂණ ආයතනයක් වේ. සවූපකාර ව්‍යාපාරය යටතේ පිහිටුවා ඇති පොල් නිපදවන්නන්ගේ සවූපකාර සමිති මගින් පොල් මිලට ගැනීම, කොප්පරා, පොල් තෙල් ආදිය නිෂ්පාදනය කිරීම, සාධාරණ මිල ක්‍රමය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම ආදිය කැරේ.

9.4 සත්ත්ව පාලනය

අප රටේ සත්ත්ව පාලනය යටතේ එළදයි ලෙස ඇති කරනු ලබන සත්ත්ව වර්ග වනුයේ ගවයින්, කුකුළන් සහ ඌරන් ය. අප රටේ පවතින දේශගුණික තත්ත්වයන් මත මේ සතුන් ඇති කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන වෙනස් වේ. සත්ත්ව පාලනය යටතේ ප්‍රධාන වශයෙන් කිරි පිණිස ගවයන් ඇති කැරෙනුයේ මධ්‍යට නඳුකරයේ තෙත් කලාපයට අයත් තණ බිම්වල ය. මේවායේ ගව පට්ටි වශයෙන් ඇති කරනු ලැබේ. තමන්කඩුව, බෝපත්තලාව මීට නිදසුනි. හලාවත දිස්ත්‍රික්කයේ ආඩිගම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ඔරිපුර, වලහපිටිය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයම්බුව, මහඉලුප්පල්ලම ද මධකලපු දිස්ත්‍රික්කයේ කිරි මුට්ටි ප්‍රදේශයේ ද හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටඅත ද සත්ත්ව ගොවි පොළවල් පිහිටා ඇත. විශේෂ ව්‍යාපාර යටතට මහබේරියතැන්න, කොටගල රොසෙටා ගොවි පොළ සහ අඹේවෙල ගොවිපොළ අයත් වේ. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන කටයුතු ප්‍රධාන ලෙස කැරෙනුයේ විශාල ගොවිපොළවල් වශයෙන් නො ව අතිරේක ආදායම් මාර්ගයක් ගෙන දෙන පෞද්ගලික ව්‍යාපාර වශයෙනි.

කිරි ඉතා පෝෂ්‍යදායක ආහාරයකි. මනුෂ්‍ය ශරීරයට අවශ්‍ය ප්‍රෝටීන් ඇතුළු වෙනත් වටිනා විටමින් උදුරථ අඩංගු ආහාර අතුරින් කිරිවලට හිමි වන්නේ ප්‍රධාන තැනකි. දිවසිනේ සොසෙකුත් මධ්‍යස්ථානවලින් කිරි එකතු කරනුයේ ජාතික කිරි මණ්ඩලය මගිනි. ජාතික කිරි මණ්ඩලය මගින් කිරි මිල දී ගෙන කල් කිරි, ජීවානුහරිත කිරි, උකු කිරි, පිටි කිරි ආදී වශයෙන් සකස් කොට මහජනයාට අලෙවි කැරේ. මින් බලාපොරොත්තු වන්නේ මහජනයා අතර කිරි පානය කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ පිටරටින් ගෙන්වන කිරි ප්‍රමාණය අඩු කිරීම ය.

කිරි එකතු කිරීමේ දී සවූපකාර අංගය ජාතික කිරි මණ්ඩලයට සහාය වෙයි. කිරි නිෂ්පාදන කටයුතු වැඩි දියුණු කිරීමේ අරමුණ ඇති ව විවිධ මධ්‍යස්ථානවලින් කිරි එකතුකොට ජාතික කිරි මණ්ඩලයට භාර දීමට සාමාජිකයන්ට අවශ්‍ය පහසුකම් සැපයීම සවූපකාර කිරි නිෂ්පාදන සමිති මගින් සිදු කැරේ. දැනට සවූපකාර කිරි නිෂ්පාදන සමිති සියයකට අධික සංඛ්‍යාවක් කිරි නිෂ්පාදන ප්‍රදේශවල පිහිටුවා ඇත. සමහර සමිති මගින් යෝගට්, මුදවපු කිරි සහ එළහි තෙල් වැනි අතුරු නිෂ්පාදන ද එකතු කැරේ. මේ හැරුණු විට කිරි නිෂ්පාදනය වැඩි කිරීමෙහි ලා සාධාරණ මිල ක්‍රමය, පශු වෛද්‍ය සේවාවන් සැලසීම, සත්තව ආහාර සැපයීම, උසස් වර්ගයේ ගවයන් සැපයීම ආදිය උදෙසා සවූපකාර සංවිධාන සහාය වෙයි. ජාතික පශු සංවර්ධන මණ්ඩලය ද බෝකිරීමට සුදුසු ගවයන් සංඛ්‍යාව වැඩි කිරීම, රෝග මගින් අධික වශයෙන් මරණයට පත් වන වසු පැටවුන් මුදවා ලීම, ආදායම් අඩු තේ වතුවල තෘණ වගා කිරීම, කිරි නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම ආදිය සඳහා පියවර ගෙන ඇත.

අප රටේ හුදෙක් මස් ලබා ගැනීම සඳහා පමණක් ගවයින් ඇති නො කැරේ. මස් සහ බිත්තර ලබා ගැනීම සඳහා කුකුළන් ඇති කිරීම ද සත්ත්ව ගොවිපොළවල කෙරේ. මේ හැර බොහෝ සෙයින් ගෘහාශ්‍රිත ව කුකුළන් සහ ඌරන් ඇති කැරේ. ස්වයං රැකියාවක් ලෙස කුකුළන් ඇති කිරීම සහ පුද්ගලික ව්‍යාපාර ලෙස කුකුළන් ඇති කිරීම අප රට සිදු වේ. එය අද අප රටේ බොහෝ දෙනාගේ ආදායම් මාර්ගය බවට පත් ව ඇත.

සාරාංශය

අප රටේ ප්‍රධාන වෙළෙඳ බෝග වනුයේ තේ, රබර් සහ පොල් ය. තේ ප්‍රධාන

වශයෙන් මාතලේ, මහනුවර, නුවරඑළිය, බදුල්ල යන දිස්ත්‍රික්කවල වැවේ. තේ ගස වර්ෂාව වැඩි කඳුකර බැවුම්වල හොඳින් වැවේ. තේ නිෂ්පාදනය කරනුයේ තේ ගසින් ලබා ගන්නා දළුවලිනි. රබර් ප්‍රධාන වශයෙන් වැවෙනුයේ කෑගල්ල, රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කවල ය. රබර් හොඳින් වැඩෙන්නේ උෂ්ණත්වය සහ වර්ෂාපතනය මැනවින් ලැබෙන බැවුම් සහිත බිම්වල ය. ශ්‍රී ලංකාවේ නිපදවන රබර්වලින් වැඩි කොටසක් පිට රටවලට යැවේ. දේශීය වශයෙන් කෙරෙන කර්මාන්ත සඳහා ද රබර් යොදා ගනී. අප රටේ පොල් වගාව ප්‍රධාන වශයෙන් කෙරෙනුයේ කොළඹ, කුරුණෑගල, හලාවත සම්බන්ධ කරන ප්‍රදේශයේ සහ එම පොල් ත්‍රිකෝණයේ සිට කෑගල්ල දක්වා වෙරළබඩ තීරයේත් ය. පොල් වගාවට උෂ්ණත්වය සහ වර්ෂාපතනය හොඳින් ලැබෙන උෂ්ණ තෙත් දේශගුණයක් අවශ්‍ය ය. පොල් ගසේ සෑම කොටසක් ම ප්‍රයෝජනයට ගැනේ. ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදන රාශියක් පිටරට යැවේ. දේශීය වශයෙන් කෙරෙන කර්මාන්ත රැසකට ද පොල් ගසේ විවිධ කොටස් උපයෝගී කොට ගනී. තේ, රබර්, පොල් පිට රට යැවීමෙන් ආදායමක් ලැබෙන බැවින් මේ වෙළෙඳ බෝග අප රට ආර්ථිකයෙහි ප්‍රධාන තැනක් ගනී.

අප රටේ සත්ත්ව පාලනය යටතේ ගවයන්, කුකුළන් සහ ඌරන් ඇති කෙරේ. විශාල ගොවිපොළවල් කිපයක් දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටුවා ඇති අතර සත්ත්ව පාලනය වැඩි වශයෙන් කෙරෙනුයේ අතිරේක ආදායම් ලබා දෙන පුද්ගලික ව්‍යාපාර ලෙස සහ ස්වයං රැකියා මාර්ගයක් ලෙස ය.

ක්‍රියාකාරකම්

1. තේ පැළ සිටුවීමේ සිට තේ කර්මාන්ත ශාලාවක තේ නිෂ්පාදනය වන අන්දම තෙක් කරුණු ඇතුළත් කොට "තේ නිෂ්පාදනය" යන මාතෘකාව යටතේ වාක්‍ය 10 ක් ලියන්න.
2. තේ වත්තක දර්ශනයක් චිත්‍රයට නගන්න.
3. රබර්වලින් නිපදවන භාණ්ඩ නම් කරන්න.
4. පොල් ගසක රූප සටහනක් ඇඳ ඒ රූප සටහන වටා එම ගසේ කොටස් වලින් ගන්නා ප්‍රයෝජන ලියා දක්වන්න.
5. පොල් ගස ඇසුරෙන් කෙරෙන දේශීය නිෂ්පාදන පිළිබඳව පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් සකස් කළ බිත්ති චාට් සටහනක් ඔබේ පන්තියේ සාමාජික සාමාජිකාවන් සමඟ එක්ව සකස් කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. ගුරුතුමා/තුමියගේ උපදෙස් ද මේ සඳහා ලබාගන්න.
6. ශ්‍රී ලංකාවේ සිතියමක පහත සඳහන් දෑ ලකුණු කොට නම් කරන්න.
   i. පොල් ත්‍රිකෝණය
   ii. කැලණිය ටයර් කම්හල
   iii. අඹේවෙල කිරිපිටි කම්හල
7. අපේ රටේ කිරි නිෂ්පාදන වර්ග දහයක් ලියන්න.

පොල් ගස – අපේ කප්රුක		
පොල්ගසෙන් ලබා ගන්නා ද්‍රව්‍ය	කෑරෙන නිෂ්පාදන	නිෂ්පාදනයට අදාල පින්තූර/ලේබල් ආදිය
පොල් මදය		
පොල් කටුව		
පොල් ඵලල්ල		
පොල් ලීය		
පොල් මල		
පොල් කොළ		

10
ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස

පාඩමට සූදානම් වීම

ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස පිහිටුවා ගත් ආකාරය මෙ පාඩමේ දී ඉගෙන ගැනීමට ඔබට අවස්ථාව ලැබේ. මෙහි සඳහා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් මේ පාඩම කියවා මෙහි ඇති කරුණු ඉගෙන ගන්න.

ප්‍රශ්න

1. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ආරම්භයේ සිට ලියැවී ඇති ග්‍රන්ථය කුමක් ද?
2. ශ්‍රී ලංකාවට ආර්ය භාෂා කථා කරන පිරිස පැමිණියේ කොහි සිට ද?
3. ශ්‍රී ලංකාවට පැමිණි වැදගත් ම ආර්ය කණ්ඩායමේ නායකයා කවරෙක් ද?
4. එම පිරිස එන විට මෙහි වාසය කළේ කවරහු ද?
5. විජය කුමරු ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට පැමිණියේ කවර දා ද?
6. ශ්‍රී ලංකාවට පැමිණි ආර්යයන්ගේ ප්‍රධාන ජීවනෝපාය කුමක් වී ද?
7. මේ පිරිස මෙහි ජනාවාස පිහිටුවා ගත්තේ කුමන ප්‍රදේශවල ද?
8. ඔවුන් එම ප්‍රදේශය තෝරා ගත්තේ මන්ද?

වාංමාලාව

මහාවංශය, ආර්යයන්, සංක්‍රමණය, වංග දේශය, ද්‍රවිඩ ජනයා,

10.1 ශ්‍රී ලංකාවට මුලින් සංක්‍රමණය වූ ජන සමූහ

ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය මීට අවුරුදු 2500 කට පමණ ඈතට, එනම් ක්‍රි. පූ. 6 වන සිය වස තරම් ඈතට දිවෙයි. ඊට පෙර ද මෙ රට විසූ දේශීය ජන කොටස් පිළිබඳව නොයෙකුත් පුරාවෘත්ත ඇත. ඉතා ඈත අතීතයේ දී විසූ රජෙකු යි සැලකෙන රාවණ රජු සහ යක්ෂ හා නාග ගෝත්‍ර පිළිබඳ පුරාවෘත්ත බොහෝ ය. එහෙත් මේ අය පිළිබඳව නිශ්චිත අදහස් පළ කිරීමට තරම් ස්ථිර සාක්ෂ්‍ය මෙතෙක් හමු වී නැත.

ශ්‍රී ලංකාවේ ජනාවාස පිහිටුවා ගන්නා ලද්දේ මේ දිවයිනට ඉතා ළඟින් පිහිටි ඉන්දියාවෙන් පැමිණි ජන සමූහ යි යිනි. මේ ජන සංක්‍රමණ බොහෝ ඈත කාලයක සිදු වූ බැවින් ඒවා පිළිබඳව ද සැබෑ තත්ත්වය වටහා ගැනීම අපහසු ය. ලැබී ඇති සාක්ෂ්‍ය අනුව මෙ සේ සංක්‍රමණය වූ අයගෙන් ඉතා වැඩි පිරිසක් උතුරු ඉන්දියාවේ සහ දකුණු ඉන්දියාවේ සිට පැමිණි ආර්ය භාෂා කථා කරන ජන සමූහයක් වූ බව පෙනේ. කලින් කළ දකුණු ඉන්දියාවේ සිට පැමිණි ද්‍රවිඩ භාෂා කථා කරන ජනයා ද මොවුන්ට එක් වූ හ.

මෙ සේ සංක්‍රමණය වූ ජනතාව විසින් ගොඩ නඟන ලද ඉතිහාසය හා ශිෂ්ටාචාරය පිළිබිඹු වන පැරණි ඓතිහාසික ග්‍රන්ථය මහාවංශය යි. මේ ග්‍රන්ථයෙහි අප රටේ ඉතිහාසය අඛණ්ඩව දක්වේ. මහාවංශය හැරුණු විට දිවයිනේ ඓතිහාසික තොරතුරු ඇතුළත් වන වෙනත් පොත් පත් කිහිපයක් ද ඇත. එහෙත් ශ්‍රී ලංකාව ජනවාස වීම පිළිබඳව සවිස්තර තොරතුරු ඇතුළත් වී තිබෙන්නේ මහාවංශයේ ය.



ඉන්දියාව සහ ශ්‍රී ලංකාවේ පිහිටීම

10.1 රූපය

ඒ පොපොයි දැන්වෙන අන්දමට ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස පිහිටුවා ගත්තා ලද්දේ විජය කුමරු සහ ඔහු සමඟ පැමිණි 700 ක් වූ පිරිස විසිනි. විජය වංග දේශයේ ලාට රට සිංහපුරයේ සිංහබාහු රජුගේ වැඩිමහල් පුත්‍රයා ය. පිය රජුගේ උපදෙස්වලට අවනත නොවී ඒ රාජ්‍යයේ සාමයට බාධා කළ විජය කුමරු සහ ඔහුගේ පිරිස නැව් නංවා රටින් පිටුවහල් කරනා ලද හ. මෙසේ නික්ම ගිය මොවුහු ඉන්දියාවෙහි බටහිර වෙරළෙහි පිහිටි පැරණි සුප්පාරක නැව් තොටට සේන්දු වූ හ. එ තැනින් ද නික්ම යැමට සිදු වූයෙන් යළි නැව් නැඟ ලංකාවේ වයඹ දිග වෙරළට ගොඩබට හ. ඔවුන් ගොඩබට ස්ථානය තම්බපණ්ණි නම් විය.

මේ කාලයේ ශ්‍රී ලංකාවේ විසුවෝ කවරහු දැයි ස්ථිර ව කිව නොහැකි වුවත් මහාවංශයේ ඔවුන් හඳුන්වා ඇත්තේ **යක්ෂ** සහ **නාග** යන නම්වලිනි. විජය කුමරුට මේ රටෙහි දී කුවෙණිය නම් වූ යක්ෂණිය හමු විය. ඇය සරණ පාවා ගත් හෙතෙම ඇයගේ ද සහාය ඇති ව සෙසු යක්ෂයන් පරාජය කොට මෙහි බලය පිහිටුවා ගැනීමට සමත් විය. ලංකාවේ ආදිතම ජනාවාසවල ආරම්භය මේ පරිද්දෙන් සිදු වූ බව මහාවංශයේ දක්වේ.

මෙරට ජනාවාස **ඇති වීම සහ ඒවායේ** පැනිරීම ඉතා කෙටි **කාලයක් තුළ සිදු** වූවක් නොවන බව අප වටහා **ගත** යුතු ය. සිය වස් කිහිපයක් ගෙවී යන **තුරු** ම මෙ බදු ජන සමූහ දිවයිනට **සංක්‍රමණය** වූ හ.

10.2 ජන සමූහ රට තුළට පැතිර යෑම

මෙසේ මෙරටට **සංක්‍රමණය** වූ ජන කොටස් ඔවුන්ගේ ජනාවාස පිහිටුවා ගත්තේ ගංගාශ්‍රිත ව ය. වයඹ දිග පෙදෙසේ කලා ඔය හා මල්වතු ඔය ආශ්‍රිත ව ද, ගිනිකොණ දිග කිරිදි ඔය, මැණික් ගඟ සහ කුඹුක්කන් ඔය ආශ්‍රිත ව ද ප්‍රධාන ජනාවාස බිහි විය. ඇනෑම ජන සමූහ මහවැලි ගඟ ඇසුරෙහි සහ නැගෙනහිර ප්‍රදේශයේ ගල්ඔය හා දීඝවාපියෙහි ද ජනාවාස පිහිටුවා ගත් හ. මේ හැරුණු විට කැලණි ගඟ අසල ද ජනාවාස කිහිපයක් බිහි විය. මේ ජනාවාස අතරින් වඩා වැදගත් වූයේ වයඹදිග ප්‍රදේශයේ පිහිටුවා ගන්නා ලද ජනාවාසයි. පසු කලෙක දී ශ්‍රී ලංකාවේ සිංහල රාජ්‍යයේ අගනුවර වූ අනුරාධපුරය බිහි වූයේ වයඹදිග පෙදෙසේ ජනාවාස ඇසුරෙනි.

මී ළඟට වැදගත් වූයේ ගිනිකොණ දිග ප්‍රදේශයේ පිහිටි ජනාවාසයි. පසු ව රුහුණු ජනපදය බවට පත් වූයේ මේ ප්‍රදේශයේ සහ නැගෙනහිර ප්‍රදේශයේ පිහිටුවා ගන්නා ලද ජනාවාස ය. කැලණි ගඟ අසබඩ පදිංචි වූවන්ගේ ජනාවාස සංඛ්‍යාව අඩු ය.

10.3 ජනාවාස පිහිටුවා ගැනීමට හේතු වූ කරුණු

මොවුන් ඉහත කී ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනීමට හේතු වූ කරුණු අපි දන් සලකා බලමු. මේ කාලය තුළ සංක්‍රමණය වූ ජනයා ගොපිතැන ජීවනෝපාය කර ගත් පිරිසක් වූ හ. එ බැවින් මේ රටට පැමිණි විට ද ඔවුන් පදිංචියට තෝරා ගත්තේ ගොපිතැනට හිත කර වූ ප්‍රදේශය. මොවුහු මෙහි පදිංචි වූ පසුව ද වී ගොපිතැනෙහි යෙදුණෝ ය. මොවුන් ප්‍රධාන ජනාවාස පිහිටුවා ගෙන තිබුණු වයඹදිග ප්‍රදේශය සහ ගිනිකොණ දිග ප්‍රදේශය වී වගාවට ඉතා සුදුසු විය. ඩවුහු වී වගාවට වුවමනා ජලය ඉහත කී ගංගාවලින් ලබා ගත් හ. මේ ප්‍රදේශ වී වගාවට යෝග්‍ය සාරවත් පසකින් යුත් තැනිතලා බිම් විය. කාල ගැමෙදී වයඹදිග පිහිටි ජනාවාස රජරට නමින් හැඳින් වුණු උතුරුදිග මහා තැනිතලා භූමියෙහි පැතිර ගියේය.

අධික වර්ෂාපතනයෙන් සහ ඝන වනාන්තරවලින් යුක්ත වූ ද මැද කඳුරට සහ නිරිතදිග ප්‍රදේශයෙහි ජනාවාස පිහිටුවා ගැනීමට මොවුහු කැමැත්තක් නො දක් වූහ. ඒ ප්‍රදේශවල දුෂ්කර පරිසරය වාසස්ථාන පිහිටුවා ගැනීමට සහ වී ගොවිතැනට හිතකර නොවූ බැවිනි.

සාරාංශය

ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩ ව ලියැ වී ඇත්තේ මහාවංශයේ ය. මෙ රටේ මුල් ම ජනාවාස පිහිටුවා ගත්තා ලද්දේ ඉන්දියාවේ සිට පැමිණි ආර්ය භාෂා කථා කරන ජන කොටස් විසිනි. කලින් කල දකුණු ඉන්දියාවේ සිට පැමිණි ද්‍රවිඩ භාෂා කථා කරන්න ජන කොටස් ද මොවුන්ට එක් වූ හ. ආර්ය භාෂා කථා කළ ජන කොටස් පදිංචි වූයේ ගංගා ආශ්‍රිත ව ය. වයඹ දෙස ද ගිනිකොණ දෙස ද වැඩියෙන් ජනාවාස පැතිරිණි. ප්‍රධාන රැකියාව ගොවිතැන විය. මේ ජන කොටස් වැසි අඩික පෙදෙස්වල හා යහ වනාන්තරවලින් යුත් පෙදෙස්වල ජනාවාස පිහිටුවා ගැනීමට කැමැත්තක් නො දක්වූ හ.

ක්‍රියාකාරකම්

1. රාවණ රජු සහ යක්ෂ නාග ගෝත්‍ර පිළිබඳ ව පවතින පුරාවෘත්ත ගුරු තුමියගේ ද සහාය ලබා ගෙන පන්තියේ දී සාකච්ඡා කරන්න.

2. ශ්‍රී ලංකාවේ සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

i. තම්බපණ්ණි	vi. කැලණි ගඟ
ii. දීඝවාපිය	vii. කිරිදි ඔය
iii. කැලණිය	viii. මැණික් ගඟ
iv. අනුරාධපුරය	ix. කුඹුක්කන් ඔය
v. මල්වතු ඔය	x. මහවැලි ගඟ

3. මුලින් ශ්‍රී ලංකාවට පැමිණි ජන සමූහ පැමිණියේ කොහි සිට ද?

4. ඔවුන් වාසස්ථාන පිහිටුවා ගැනීමේ දී සැලකිල්ලක් යොමු කළේ කවර කරුණු කෙරෙහි ද?

5. මේ සම්බන්ධයෙන් ඔබ පාසලට ලබා දී ඇති "ජන ජීවිතය එදා සහ අද" යන අතිරේක කියවීම් පොතේ අදාළ කොටස් කියවන්න.



ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස
10.2 රූපය

11
ශ්‍රී ලංකාවේ මුල් ම රජවරු

පාඩමට සූදනම් වීම

මේ පාඩමෙන් ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකාවේ මුල් ම රජවරුන් පිළිබඳ කතා පුවත යි. ඔවුන් රාජධානි පිහිටුවා ගත් ආකාරයත්, බලය තහවුරු කර ගත් ආකාරයත්, මේ පරිච්ඡේදයෙන් විස්තර වෙයි. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. **විජය රජු සහ ඔහුගේ ඇමතිවරුන් ඉදි කළ ජනාවාසවල නට මොනවා ද?**
2. **පඬුවාසුදේව රජුගේ දෙමව්පියෝ කවරහු ද?**
3. **විජය රජු හා පිරිසට පසු ශ්‍රී ලංකාවට පැමිණි වෙනත් ආර්ය කණ්ඩායම් කවරේ ද?**
4. **මිහිදු මා හිමියන් ශ්‍රී ලංකාවට වැඩම කළ කාලයේ අනුරාධපුරයේ සිටි රජතුමා කවරෙක් ද?**
5. **පණ්ඩුකාභය කුමරු අධ්‍යාපනය ලැබුවේ කවරකුගෙන් ද?**
6. **පණ්ඩුකාභය රජුගේ කාලයේ පැවති ඇදහිලි ක්‍රම මොනවා ද?**
7. **මහ මෙවුනා උයන ඉදි කරවනු ලැබුවේ කවරකු විසින් ද?**

වාංමාලාව

අධ්‍යාපනය, සෞඛ්‍යය, සනීපාරක්ෂාව, ග්‍රාම සීමා, පරිව්‍රාජකයෝ, ජෛනයෝ, බිසවක්කුළම වැව, නගර ගුත්තික, මිහින්තලා පව්ව, මහමෙවුනා උයන, ශ්‍රී මහා බෝධිය

11.1 අනුරාධපුර රාජධානියේ මුල් ම රජවරු

ශ්‍රී ලංකාව ආර්ය ජනාවාසයක් වූ පසු විජය කුමාරයා එහි බලයට පත් වූ මුල්ම රජු ලෙස මහා වංශයේ සඳහන් වේ. ඔහුගේ මෙහෙයිය බවට පත් වූයේ ඉන්දියාවේ දකුණු මදුරා පුරයෙන් ගෙන්වා ගත් පඬි රජුගේ දියණියකි. විජය රජුගේ ඇමතිවරුන් වූ, අනුරාධ, උපතිස්ස, උදේනි, උරුවේල, විජිත යන අය ඔවුන්ගේ නම් වලින් ජනාවාස ඉදි කළහ. තම්බපණ්ණි නගරය අගනුවර කර ගත් විජය රජු විසින් මේ ජනාවාස අවුරුදු තිස් අටක් පාලනය කරනු ලැබිය. විජය රජුගෙන් පසු ව මෙ රටේ රජකම ලබා ගත්තේ ඔහුගේ සොහොයුරකුගේ පුතකු වූ පඬුවාසුදේව කුමරා යි. ඔහු මෙහි පාලනය බාර ගැනීම සඳහා පිරිවරකුත් සමග පැමිණි බව මහාවංශයේ සඳහන් වේ. මොවුන්ගේ පැමිණීම තවත් වැදගත් ආර්ය සංක්‍රමණයක් ලෙස සැලකිය හැකි ය. පඬුවාසුදේව රජුගේ බිසව බවට පත් වූයේ නැගෙනහිර ඉන්දියාවේ පණ්ඩු ශාක්‍ය රජුගේ දියණියක වූ භද්දකච්චානා කුමරිය යි.

භද්දකච්චානා කුමරිය ශ්‍රී ලංකාවට එන බව අසා ඇයගේ සහෝදරයෝ ද ඇය සමග පැමිණිය හ. ඔවුන් අනුරෙන් කිහිප දෙනෙක් දිවයිනේ ප්‍රදේශ කිහිපයක, ජනාවාස පිහිටුවා ගත් හ. ඔවුහු ඒ ජනාවාස නම් කළේ තමන්ගේ ම නම් අනුව ය. මේ පිරිසගේ පැමිණීම ද ශ්‍රී ලංකාවට ඇති වූ තවත් ආර්ය සංක්‍රමණයකි. මෙයින් පෙනී යන්නේ, මේ රජු දවස දිවයිනේ ආර්ය භාෂා කථා කරන ජන සමූහ පිහිටුවා ගත් ජනාවාස තව දුරටත් පැතිර ගිය බව යි.

උපතිස්සගම සිට රට පාලනය කළ පඬුවාසුදේව රජුගෙන් පසු ව සිහසුන යිම් කර ගත්තේ අභය කුමාරයා ය. මොහු පඬුවාසුදේව රජුගේ පුත්‍රයන් දස දෙනා ගෙන් වැඩිමහලු පුත්‍රයා ය. මේ අතට රජ පැමිණියේ ඔහුගේ සොහොයුරියගේ පුත් පණ්ඩුකාභය යි. ඔහුගේ පාලන සමය ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් කාලයක් වෙයි.

පණ්ඩුල නම් බ්‍රාහ්මණයාගෙන් අධ්‍යාපනය ලබා, තරුණ වියසට පත් පණ්ඩුකාභය කුමරු මාමාවරුන්ට විරුද්ධව සටන් කළේය. මේ සටන්වලින් ජය ලබා ගත් මොහු අනුරාධ පුර, ග්‍රාමයේ පිලසට පත් වූයේ බ්‍රාහ්මණයන්ගේ අනාවැකි සැබෑ කරමිනි. මේ රජුගේ රාජ්‍ය සමය අවුරුදු හැත්තැවයි.

පණ්ඩුකාභය රජුගේ පාලන කාලය කරුණු කිහිපයක් නිසා ශ්‍රී ලංකා ඉතිහාසයට වැදගත් වේ. අනුරාධ ග්‍රාමය අනුරාධපුරය බවට පත් වූයේ මේ රජුගේ කාලයේ දී ය. සෞභ්‍යය සහ සනීපාරක්ෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ පණ්ඩුකාභය රජ තුමා අනුරාධපුරයේ කැලිකසළ බැහැර කිරීමට, වැසිකිළි ශුද්ධ පවිත්‍ර කිරීමට සහ මළමිනි බැහැර කිරීමට අවශ්‍ය විධිවිධාන සෙදූ ය. මීට අමතර ව සුසාන භූමි ද පිහිටුවනු ලැබිණ. මේ කාලයේ දී ශ්‍රී ලංකාව මුළුල්ලේ ග්‍රාම සීමා පිහිටුවන ලද බව ද කියනු ලැබේ.

පණ්ඩුකාභය රාජ්‍ය සමය ආගමික වශයෙන් ද වැදගත් වේ. එතෙකට ඉන්දියාවේ තිබුණු හැම ආගමික විශ්වාසයක් ම පණ්ඩුකාභය රජු දවස ශ්‍රී ලංකාවේ ද පැවතිණ. ආජීවකයන්, පරිව්‍රාජකයන් සහ ජෛනයන් ද ශ්‍රී ලංකාවේ වාසය කළ බව මහාවංශයේ සඳහන් වේ.

පණ්ඩුකාභය රජු විසින් මෙ හැටට ම ලෙන්, දේවාල, ආරාධ හා අසපු ආදිය අනුරාධපුර නගරයෙහි විවිධ දෙයින් ඉදි කරවා දෙනු ලැබී ය. අභයවැව (ථර්තාමාභය බසමන්කුලම) කරවන ලද්දේ ද පණ්ඩුකාභය රජු විසිනි. නගර ගුත්තිකා (නගර ආරක්ෂක) නම් නිලධාරියකු ගැනත් අසන්නට ලැබෙන්නේ මේ රජු දවස ය.

පණ්ඩුකාභය රජුගේ මරණින් පසුව ඔහු පුත් මුටසිව බලයට පත් විය. ඔහුගේ කාලයේ දී සිදු වූ වැදගත් සිද්ධියක් ලෙස සැලකිය හැක්කේ පසු කලෙක බුද්ධ ශාසනයේ කේන්ද්‍රස්ථානය බවට පත් මහමෙවුනා උසන ඉදි කිරීම ය.

11.2 දේවානම්පියතිස්ස රජු දවස බුදු සසුන පිහිටුවීම සහ පැතිරී යෑම

මුටසිව රජුගෙන් පසු ඔහුගේ පුත් දේවානම්පියතිස්ස රජ (ක්‍රි. පූ. 250–210) බලයට පත් විය. හතලිස් වසක් වූ ඔහුගේ රාජ්‍ය සමය ශ්‍රී ලංකා ඉතිහාසයේ දීප්තිමත් යුගයකි. ආර්ය භාෂා කථා කළ ජන සමූහයන්ගේ පැමිණීම නිසා මෙරට ඇති වූ ශිෂ්ටාචාරය එතාත් බව නැගුණේ මේ රජුගේ රාජ්‍ය සමයේ දී ය. මේ සඳහා උපකාරී වූයේ, මිශ්‍රදු ගිමියන් ප්‍රධාන ධර්මදූත කණ්ඩායම් බෙරවාදී බුද්ධාගම ලංකාවට ගෙන ඒම ය.

දේවානම්පියතිස්ස රජු ශ්‍රී ලංකාව පාලනය කරද්දී ඉන්දියාවේ පාලනය ගෙන ගියේ මෞර්ය වංශයට අයත් ශ්‍රේෂ්ඨ පාලකයකු වූ ධර්මාශෝක මහ රජතුමා යි. මිශ්‍රදු හිමියන් ඇතුළු ධර්ම දූත කණ්ඩායම් ශ්‍රී ලංකාවට පැමිණියේ මේ රජතුමාගේ අනුග්‍රහය ලබමින් ය.

මිශ්‍රදු හිමියන් ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට පා තැබුවේ දේවානම් පියතිස්ස රජු බලයට පත් වී මද කලකට පසු ව පොසොන් පුර පසළොස්වක් දිනයක දී ය. මෙ දින දහසක් සෙනඟ පිරිවරා දඹයටෙ ගොස් ඩිවි දේවානම් පියතිස්ස රජුට මිහින්තලා පර්වතයේ දී මිශ්‍රදු හිමියන් මුණ ගැසුණි. මිශ්‍රදු මහ හිමියන් මිහින්තලා පර්වත පාදයේ දී රජු ඇතුළු පිරිසට දහම් දෙසීමෙන් බුදු දහම් පැතිරවීම ආරම්භ විය. ඒ ධර්ම දේශනාවෙන් පසු ඒ පිරිස බුදු දහම වැළඳ ගත් හ. දෙ වන දින අනුරාධපුරයට වැඩ ම කළ මිශ්‍රදු මහාතිස්සෝ තවත් විශාල පිරිසකට ධර්මය දේශනා කළ හ. දේවානම් පියතිස්ස රජුගේ බෑනා කෙනෙකු වූ අරිට්ඨ කුමරු පැවිදි වීමෙන් ශ්‍රී ලාංකික ශාසනයේ ආරම්භය මේ රට ඇති විය.

රජු අනුගමනය කරමින් සටත් වැසියෝ ද බුදු දහම් වැළඳ ගත්හ. මේ නිසා අනුරාධපුරයෙන් බැහැර ප්‍රදේශවලත් බුදු දහම වෙගයෙන් පැතිර ගියේය. මිශ්‍රදු හිමියන්ගේ සොහොයුරිය වූ සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහා බෝධි ශාඛාවක් රැගෙන මෙහි පැමිණ භික්ෂුණී ශාසනය ආරම්භ කිරීම ද මෙ කල ඇති වූ තවත් වැදගත් සිදු වීමකි. ශ්‍රී මහා බෝධි ශාඛාව මහමෙවුනා



මුල් අනුරාධපුර යුගය
11.1 රූපය

උයනෙහි රෝපණය කරනු ලැබී ය. අදත් මහ මේවුනා උයනෙහි දක්නට ලැබෙන ශ්‍රී මහා බෝධිය බෞද්ධයන් සතු වටිනා පූජ්‍ය වස්තුවකි. ශ්‍රී මහා බෝධිය ලෝකයේ ඇති පැරණි ම ඉතිහාස ගත වෘක්ෂය ද වේ.

දේවානම් පියතිස්ස රජු විසින් බුදු රජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව නිදන් කොට මහ මෙවුනා උයනෙහි ථූපාරාමය ඉදි කරවනු ලැබී ය. ශ්‍රී ලංකාවේ පළමුවෙන්ම ඉදි කළා යැ යි සැලකෙන ස්තූපය මෙය යි. මේ රජ තුමා ඉසුරුමුණි විහාරය, පඨවියා වේතිය නම් සෑය, නාගදීපයේ (යාපන අර්ධද්වීපයේ) ජම්බුකෝල විහාරය සහ ප්‍රාචීනාරාමය ද මෙස්සගිරි විහාරය සහ මහාපාලි දන්සැල ද ඉදිකරවිමෙන්, බුද්ධාගමේ දියුණුවට විශාල සේවාවක් ඉටු කළේ ය. අනුරාධපුර තිසාවැව කරවන ලද්දේ ද මේ රජු විසිනි. ඒ මේ රටේ ගොවිතැන දියුණු කිරීමට ගත් උත්සාහයකි.

11.3 මුල් දකුණු ඉන්දියානු ආක්‍රමණ

එතිහාසිකව සිදුවුවෙන් පිහිටා තිබීම නිසා ඈත කාලයේ සිට ම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික සම්බන්ධතා පැවති බව පෙනේ. උතුරු ඉන්දීය සම්බන්ධතා නිසා සංස්කෘතික බලපෑම් පමණක් ඇති වූයේ ය. දකුණු ඉන්දීය බලපෑම සංස්කෘතික සම්බන්ධතාවන්ට පමණක් සිටා නොවී ය. දකුණු ඉන්දියානුවෝ අවස්ථා කිහිපයක ම මෙ රට ආක්‍රමණය ද කළ හ.

දේවානම් පියතිස්ස රජුගෙන් පසු ඔහුගේ සහෝදරයන් වූ උත්තිය, මහාසිව හා සුරතිස්ස යන කුමාරවරු පිළිවෙළින් බලයට පත් වූ හ. සුරතිස්ස රජුගේ පාලන කාලය අවසන් වනුයේ දකුණු ඉන්දීය ආක්‍රමණයකිනි. සේන හා ගුත්තික යන දකුණු ඉන්දියානුවන් දෙ දෙනා විසින් මේ ආක්‍රමණයන් එල්ල කරනු ලැබිය. ශ්‍රී ලංකාවට එල්ල වූ මුල් ම දකුණු ඉන්දියානු ආක්‍රමණය එය යි. අනුරාධපුර රාජධානිය අත් පත්කර ගත් ඔවුහු අටුරුදු විසි දෙනෙක් එහි රාජ්‍යය කළ හ. මෙම දකුණු ඉන්දියානුවන් දෙ දෙනා දැහැමෙන් පාලන කටයුතු ගෙන ගිය බව මහා වංශයේ සඳහන් වේ. ඔවුන්ගේ පාලනයෙන් රටට හානියක් නොවූ බව එයින් පැහැදිලි වේ.

දේවානම් පියතිස්ස රජුගේ බාල සොහොයුරෙකු වූ අසේල රජු විසින් දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් දෙ දෙනාගෙන් අනුරාධපුර රාජ්‍යය නිදහස් කර ගනු ලැබී ය. එහෙත් ඔහුගේ පාලන කාලය අවසන් වන්නේ නවත් දකුණු ඉන්දියානු ආක්‍රමණයක් ඇති වීමෙනි. මෙ වර ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ දකුණු ඉන්දියානු ආක්‍රමණිකයා සොළී කුමරකු වූ එළාර ය. අසේල බලයෙන් පහ කොට එළාර විසින් බලය අල්ලා ගන්නා ලදී. ඔහුගේ බලය ද පැතිර ගියේ අනුරාධපුර රාජ්‍යයේ පමණි. මේ රජ අවුරුදු හතළිස් හතරක් අනුරාධපුරය පාලනය කළේ ය. එළාර රජු යුක්ති ගරුක සාධාරණ පාලකයකු වූ බව මහාවංශයේ සඳහන් කථාන්තර කිහිපයකින් ම පැහැදිලි වේ. ඔහු මිනිසුන්ට පමණක් නොව සතුන්ට ද සාධාරණය ඉටු කිරීමට කටයුතු කෙළේය. හිතා මතා කිසි විටෙක බුද්ධාගමට හානියක් නොකෙළේ ය. බෞද්ධ භික්ෂූන්ට දන් දීමට පවා ඉදිරිපත් විය. සිංහලයෝ එළාර රජුගේ හමුදාවේ පවා සිටිය හ. එසේ වුව ද එළාර රජු අනුරාධපුර රාජ්‍යයෙන් ඉවත් කොට රට එක්සේසත් කිරීමට බලාපොරොත්තු වූ දුටුගැමුණු රජතුමා ඔහුගෙන් රට බේරා ගත්තේ ය.

සාරාංශය

ශ්‍රී ලංකාව ආර්ය ජනාවාසයක් වූ පසු මුල් ම රජු ලෙස බලයට පත් වූයේ විජය කුමාරයා ය. අනුරාධපුරයේ රජ කළ මුල් ම රජවරුන් අතර පණ්ඩුකාභය, දේවානම් පියතිස්ස සහ එළාර ප්‍රධාන වූ හ. ලංකාවට බුද්ධාගම ගෙන එන ලද්දේ දේවානම් පියතිස්ස රජතුමාගේ කාලයේ ය. මෙම සිදුවිමේ ප්‍රතිඵල ඉතා වැදගත් විය.

ක්‍රියාකාරකම්

1. ශ්‍රී ලංකාවේ සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.
   i. අනුරාධපුරය
   ii. මිහින්තලය
   iii. නාගදීපය
   iv. දඹකොළ පටුන
   v. අභය වැව (බසවක්කුලම)

2. පණ්ඩුකාභය රජතුමා දේවානම් පියතිස්ස රජතුමා සහ එළාර රජතුමා වැදගත් වීමට හේතු 5 බැගින් ලියන්න.

3. හිස් තැන් පුරවන්න.
   i. විජය රජුගේ අඟතුවර වූයේ .....
   ii. විජය රජුගේ ඇමතිවරුන් පස් දෙනෙකි.
   අ..... ආ.....
   ඇ.....ඈ.....
   ඉ.....
   iii. අභය වැව අද හැඳින්වෙන්නේ .....නමිනි.
   iv. තෙරවාදී බුද්ධාගම ශ්‍රී ලංකාවට ගෙන ආවේ.....
   v. එවිට ලංකාවේ සිටියේ.....
   ඉන්දියාවේ රජ කළේ .....
   vi. ශ්‍රී මහා බෝධි ශාඛාව ශ්‍රී ලංකාවට ගෙනෙන ලද්දේ.....
   .....විසිනි.
   vii. දේවානම් පියතිස්ස රජතුමා සැදූ විහාර තුනක් නම්:
   අ. .....
   ආ. .....
   ඇ. .....

12

අනුරාධපුර රාජධානිය

පාඩමට යුදෙනම් වීම

මේ පාඩමේ ලියා ඇත්තේ අනුරාධපුර රාජධානිය කොට ගෙන පාලනය කළ වූ රජවරුන් කිහිප දෙනකු ගැනිබඳව යි. ඒ රජවරුන්ගෙන් ඉටු වූ සේවය සහ ඔවුන් රජ කළ කාලවල දී සිට ගත් සිදුවීම් ද මෙහි විස්තර වේ. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම ඉගෙන ගන්න.

ප්‍රශ්න

1. අනුරාධපුර රාජ්‍යය හැරුණු විට ලංකාවේ නිබුණු වෙනත් රාජ්‍ය මොනවා ද?
2. මහාවංශයේ සඳහන් වන පරිදි රෝහණ රාජ්‍යයේ මුල් පාලකයා කවරෙක් ද?
3. දුටුගැමුණු රජතුමාගේ පියා කවරෙක් ද?
4. මහාථූපය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?
5. වලගම්බා රජු දවස සිදු වූයේ කුමක් ද?
6. ඕන්නේරිය යැද වූ රජතුමා කවරෙක් ද?
7. කලා – වලලු වැටි කරවූ රජතුමා කවරෙක් ද?
8. සීගිරිය ප්‍රසිද්ධ කුමක් හෙයින් ද?
9. 1017 දී සොළීන් ලංකාවට පැමිණෙන විට මෙහි රජ කළේ කවරෙක් ද!
10. සොළීන් පාම අගනුවර කර ගත්තේ කුමන නගරය ද?

වාංමාලාව

ත්‍රිපිටකය, මෝරිය වංශය, ලම්බකර්ණ වංශය, මහායානය, ආක්‍රමණ.

12.1 රුහුණු රාජ්‍යය

පණ්ඩුකාභය රජතුමා පිහිටු වූ අනුරාධපුර රාජධානිය අවුරුදු 1500 ක් තරම් කාලයක් අඛණ්ඩව පැවතුණි. මෙම කාලය තුළ දී පණ්ඩුකාභය, දේවානම් පියතිස්ස (ක්‍රි: පූ: 250 – 210) දුටුගැමුණු (ක්‍රි: පූ: 161 – 137) වලගම්බා (ක්‍රි: පූ: 103 – 77) වසභ (ක්‍රි: පූ: 65–109) යසලාලක තිස්ස (ක්‍රි: ව: 52 – 59) මහසෙන් (ක්‍රි: ව: 276 – 303) බුද්ධදාස (ක්‍රි: ව: 340 – 368) ධාතුසේන (ක්‍රි: ව: 459 – 477) I කාශ්‍යප හෙවත් සීගිරි කාශ්‍යප (ක්‍රි: ව: 477–495) V මිහිඳු (ක්‍රි: ව: 982–1029) වැනි රජවරු ගණනාවක් ම මෙම රාජධානිය පාලනය කළ හ. මේ කාලය තුළ දී ඔවුහු විහාර ආරාම ආදී ගොඩනැඟිලි හා වැව් අමුණු ආදිය ද ඉදි කරවූ හ. අනුරාධපුර රාජධානිය හැරුණු විට මුල් යුගයේදී රුහුණ නම් වූ තවත් රාජ්‍යයක් තිබිණ. මහවැලි ගඟින් දකුණේ විශාල පෙදෙසක එම රාජ්‍යය පැතිර ගියේය. අනුරාධපුර යුගයේ අවසන් කාලයේදී දක්ඛිණ දේශය නම් තවත් රාජ්‍යයක් බිහි විය.

මහා වංශයේ සඳහන් වන පරිදි රෝහණ රාජ්‍යයේ මුල් පාලකයා වූයේ අනුරාධපුරයෙන් පැමිණි මහානාග නම් සුව රජෙකි. ඔහු සිය අග නුවර ලෙස තෝරා ගත්තේ මාගමයි. ඔහුගෙන් පසු ව ඔහුගේ පුත් යඨාලතිස්ස ද ඉන් අනතුරු ව යඨාලතිස්සගේ පුත් ගෝඨාභය ද රුහුණේ බලයට පත්වූ හ.

කාවන්තිස්ස කුමරු ගෝඨාභය රජුගේ පුත්‍ර යා ය. පියාගේ ඇවැමෙන් ඔහු රෝහණ දේශයේ



අනුරාධපුර රාජධානිය

12.1 රූපය

බලයට පත් විය. ඒ වන විට අනුරාධපුර රාජ්‍යයේ පාලනය කළේ එළාර රජුයි. කාවන්තිස්ස රජ තෙමේ එළාරගෙන් රජ රට බේරා ගැනීමට මාර්ගය සකස් කළේය. රුහුණු රාජ්‍යයේ ආරක්ෂා සංවිධානය තර කළේය. මොහුගේ වැඩ කටයුතු ඔහු පුත් දුටුගැමුණු රජතුමාගේ යුද ව්‍යාපාරයට බෙහෙවින් ප්‍රයෝජනවත් විය. කාවන්තිස්සගේ මරණයෙන් පසු ව දුටුගැමුණු කුමාරයා රුහුණේ රජකමට පත් විය.

දුටුගැමුණු රජ වී නොබෝ කාලකින් එළාර සටන සටන් කොට ඔහු පරාජය කරමින් අවුරුදු හතලිස් හතරක් පැවති සොළී බලය අවසන් කොට ශ්‍රී ලංකාව එක් සේසත් කළේ ය. එළාර රජුගෙන් රජ රට නිදහස් කර ගැනීමට බලවත් සටන් ව්‍යාපාරයක් මෙහෙයවීමට දුටුගැමුණු රජුට සිදු වූයේ ය. ඒ සටනේ දී එළාරගේ මරණය සිදු විය. දුටුගැමුණු රජතුමා සතුරාට වුවත් ගරු කරමින් ඔහුගේ අවසංඥල කටයුතු ඉතා ගෞරවාකාර ව සිදු කළේ ය. ඔහු සිහි පත් වීම සඳහා ඔහු ආදහනය කළ ස්ථානයේ සොහොන් ගෙයක් ඉදි කළේ ය. එම ස්ථානය පසු කර යනවිට පංචතූර්ය වාදනය නොකරන ලෙසත්, රථවලින් බැස යාමෙලසත් නියෝග කළේ ය.

දුටුගැමුණු රජුගේ පාලන කාලයේ දී බුද්ධ ශාසනය ඉමහත් දියුණුවකට පත් වූයේ ය. ඔහු වෙහෙර විහාර අනු නවයක් කර ඊ සයි මහාවංශය සඳහන් කරයි. ඔහු විසින් ඉදි කර ඵූ වැදගත් ම සිද්ධස්ථාන ලෙස සැලකිය හැක්කේ රුවන්වැලි මහා සෑය, මිරිසවැටිය හා ලෝවාමහා ප්‍රාසාදයයි. මහාථූපය නමින් ද හැඳින් වෙන රුවන්වැලි මහාසෑය ශ්‍රී ලංකාවේ ඇති විශාල ස්තූපයකි. රුවන්වැලි සෑයේ වැඩ දුටුගැමුණු රජුට ඔහුගේ මරණය දක්ක ම අවසන් කර ගැනීමට නො හැකි විය. ඒ රජුගේ මරණින් පසු එයි වැඩ කටයුතු අවසන් කරන ලද්දේ ඔහුගේ බාල සොහොයුරු සද්ධාතිස්ස රජු විසිනි.

දුටුගැමුණු රජතුමාගේ මරණින් පසු ව සද්ධාතිස්ස කුමාරයා අනුරාධපුරයේ සිහසුනට පත් විය. ලෝවා මහා ප්‍රාසාදය ගිනිගෙන් දැවී ගිය අවස්ථාවේ එය ප්‍රතිසංස්කරණය කරවන ලද්දේ ද සද්ධාතිස්ස රජු විසිනි.

මොහුගෙන් පසු ව පිළිවෙළින් ථුල්ලත්ථන, ලංජතිස්ස සහ බල්ලාටනාග යන කුමාරවරු බලයට පත් වූ හ. බල්ලාටනාග රජු පහ කොට මහාරත්තක නම් සෙන්පතිවරයෙක් රජ වූයේ ය. ඔහු ද හෙරයා හැර සද්ධාතිස්සගේ බාල ම පුත් වළගම්බා කුමරු බලයට පත් විය.

කෙසේ වුවත් මේ රජුට වැඩි කලක් පාලනය කළ නො හැකි විය. මේ රජුගේ කාලයේ තීය නම් බමුණා විසින් ඇති කරන ලද කැරැල්ල ගැන ද අවුරුදු දෙළහක් තිස්සේ පැවති සාගතයක් ගැන ද දකුණු ඉන්දිය ආක්‍රමණයක් ගැන ද සඳහන් වේ. ත්‍රිපිටකය මෙතලේ අළු විහාරයේ දී ග්‍රන්ථාරූඪ කරන ලද්දේ ද මේ රජුගේ සමයේ ය. වළගම්බා රජු විසින් අභයගිරි දගැබ කරවන ලදී.

වළගම්බා රජුගෙන් පසු ඒ වංශයේ රජවරු කිහිප දෙනෙක් ම අනුරාධපුර රාජධානියේ රජකම් කළ හ. පණ්ඩුකාභයගෙන් ආරම්භ වූ රාජ වංශය අවසන් වූයේ යසලාලක තිස්ස රජුගෙනි. සුබ නම් කුමරෙක් මොහු මරා රජකම ලබා ගත්තේ ය.

මොහු පහ කොට ලම්බකර්ණ වංශයට අයත් වසභ නම් වූවෙක් බලයට පත් විය. වසභ රජු ශ්‍රී ලංකා ඉතිහාසයේ වඩාත් වැදගත් වන්නේ රටේ ගොවිතැන දියුණු කිරීමට වැව් අමුණු ආදිය ඉදි කරවීම නිසයි. ඔහු විසින් වැව් එකොළහක් හා ඇළ මාර්ග දෙළහක් කරවන ලදී. මෝහාරික තිස්ස නම් රජු අයත් වන්නේ ද මේ රාජ වංශයට ය. මහායාන බුද්ධාගම මුල් වරට ශ්‍රී ලංකාවට හැඳින්වූයේ මේ රජු දවස යි.

ලම්බකර්ණ පෙළපතට අයත් වැදගත් රජෙකි, මහසේන. මේ රජුගෙන් අනුග්‍රහය ලැබුණේ මහා විහාරයට නො ව අභයගිරි විහාරයට යි. මොහු මහා විහාරයට විරුද්ධ ව කටයුතු කෙළේ ය. මහා විහාර භූමියේ ම පේතවන දගැබ කරවා එය මහා යානික භික්ෂූන්ට පූජා කළ බව සඳහන් වේ.

මහසෙන් රජු දවස වාරිකර්මාන්තයේ දියුණුවක් ද ඇති විය. ඔහු විසින් මින්නේරි, නුරුළු, කන්දරා හා කවුඩුළු ඇතුළු මහ වැව් දහසක් සහ ඇළ මාර්ගයක් ද කරවන ලදී. එයින් රටේ ගොවිතැනට සිදු වූයේ ඉමහත් සේවයකි. මින්නේරිය වැව කරවීම නිසා පසු කලක මහසෙන් රජ 'මින්නේරි දෙවියන්' යනුවෙන් හඳුන්වනු ලැබී ය.

මහසෙන්ගෙන් පසු බලයට පත් වූයේ ඔහු පුත් කිත්සිරි මෙවන් කුමාරයා ය. දළදා ලංකාවට වැඩම කරවන ලද්දේ මේ රජු දවස ය.

බුද්ධදාස රජු වසභ රජු ආරම්භ කළ රජ පෙළ පතේ තවත් වැදගත් පාලකයෙකි. ඔහු දක්ෂ වෛද්‍යවරයෙක් වූයේ ය. මිනිසුන්ට පමණක් නොව සතුන්ට ද ප්‍රතිකාර කොට සුවපත් කළේ ය. රෝගීන් සඳහා වෛද්‍ය පහසුකම් සැලසූ මොහු වෛද්‍ය ග්‍රන්ථයක් ද රචනා කළේ ය.

වසභගෙන් ආරම්භ වූ ලම්බකර්ණ වංශය මිත්‍ර සේනගෙන් අවසන් විය. මොහුට අනුරාධපුරයේ රජකම අත් හැරීමට සිදු වූයේ දකුණු ඉන්දියානු ආක්‍රමණයක ප්‍රතිඵලයක් වශයෙනි. මේ ආක්‍රමණිකයන් පලවා හැර අනුරාධපුර රජකම යළි ලබා ගැනීමට මෝරිය වංශයට අයත් ධාතුසේන නම් කුමාරයා සමත් විය.

ධාතුසේන වඩා වැදගත් වන්නේ වාරිකර්මාන්තයට ඔහු අතින් සිදු වූ සේවය නිසා ය. කලා බලලු වැව සහ යෝධ වැව ආදි වැව් දහ අටක් ද ජය ගඟ නම් වූ දීර්ඝ ඇළ මාර්ගයක් ද ඔහු විසින් කරවන ලදී.

ධාතුසේනගේ ඇවැමෙන් ඔහුගේ පුත් කාශ්‍යප කුමරු රජකමට පත් විය. අනුරාධපුරය අත් හැර සීගිරියේ තම අගනුවර පිහිටුවා ගත් නිසා ඔහු සීගිරි කාශ්‍යප නමින් ප්‍රසිද්ධ විය. සීගිරි පර්වතයේ දෑනට දක්නට ලැබෙන චිත්‍ර මේ රජුගේ කාලයේ කරවන ලද ඒවා ය.

12.1 අනුරාධපුර රාජධානිය බිඳ වැටීම

අනුරාධපුර යුගයේ අවසන් සිය වස් තුනක පමණ කාලය පාලනය කරන ලද්දේ මානවර්ම පෙළපතේ රජවරුන් විසිනි. රජවරුන් විසිපස් දෙනකු පමණ මේ පෙළපතට අයත් වුවත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් දුර්වල පාලකයෝ වූ හ. මේ කාල පරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාවට දකුණු ඉන්දියානු ආක්‍රමණ කිහිපයක් එල්ල විය. ඉන් ඉතා ම දරුණු ආක්‍රමණය ලෙස හැඳින් විය හැක්කේ I සේන (833 - 53) කාලයේ දී පාණ්ඩ්‍ය රාජ්‍යයෙන් එල්ල කරන ලද ආක්‍රමණයත් අනුරාධපුර අවසාන පාලකයා වූ V මිහිඳු (984–1029) සමයේදී සොළී රටින් එල්ල වූ ආක්‍රමණයත් ය. මිහිඳු පරාජය කොට අනුරාධපුර රාජ්‍යය අත්පත් කොට ගත් සොළිහු ඔවුන්ගේ අගනුවර පොළොන්නරුවේ පිහිටුවා ගත් හ. මේ නිසා අවුරුදු 1500 කට වැඩි කාලයක් පැවති අනුරාධපුර රාජධානිය අභාවයට ගියේ ය.

සාරාංශය

පණ්ඩුකාභය රජු අනුරාධපුර රාජධානිය පිහිටු වූයේ ය. වසර 1500 ක් පමණ පැවති මේ රාජධානිය සොළී ආක්‍රමණය නිසා පිරිහිණි. මේ තරම් දිගු කාලයක් තුළ වැදගත් රජවරුන් කිප දෙනෙක් ම රජ කළ හ. ආගමට, කෘෂිකර්මයට, වෛද්‍ය විද්‍යාවට හා කලාවන්ට අත හිත දුන් පාලකයෝ මොවුන් අතර වූ හ.

ක්‍රියාකාරකම්

1. වළගම්බා රජු සමයේ ඇති වූ සිදු වීම් තුනක් ලියන්න.
2. මහසේන සැදූ වැව් තුනකි,
   i. .. ..
   ii. ..... සහ
   iii. .....
3. ධාතුසේන සැදූ වැව් දෙකකි,
   i. ..... සහ
   ii. .....
4. I කාශ්‍යපගේ අගනුවර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.
   i. අනුරාධපුරය
   ii. සීගිරිය
   iii. පොළොන්නරුව
5. පහත සඳහන් වෙහෙර විහාර තැනවූ රජවරු කවරහු ද?
   i. දඹයගිරිය
   ii. පේතවනය

13

පොළොන්නරු රාජධානිය

පාඩමට සූදානම් වීම

මෙට පාඩමේ ලියා ඇත්තේ පොළොන්නරුවේ රජ කළ ප්‍රධාන රජවරුන් පිළිබඳ විස්තරයයි. ඒ රජවරුන්ගෙන් රටට වූ සේවය ගැන සඳහන් කොට ඇත. එහෙත් සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. ක්‍රි: ව: 1017 දක්වා ශ්‍රී ලංකාවේ අගනුවර වූයේ කිනම් නගරය ද?
2. සොළීන්ගෙන් පොළොන්නරුව අත්පත් කර ගත් රජතුමා කවරෙක් ද?
3. මේ රජු හිඟි වූයේ කිනම් පෙදෙසක ද?
4. I විජයබාහු රජතුමා සම්බන්ධතා ඇති කර ගත් විදේශ රටවල් මොනවා ද?
5. I විජයබාහු රජතුමාට පසු ව මුල් රට ම එක් රජයක් කළ රජතුමා කවරෙක් ද?
6. කාමිකාරඕය දියුණුව සඳහා I පරාක්‍රමබාහු රජතුමා කළේ කුමක් ද?
7. මහා පරාක්‍රමබාහු රජතුමා කර වූ විශාල ම මැටි කුමක් ද?
8. I පරාක්‍රමබාහුගෙන් පසු ව පොළොන්නරුවේ රජ කළ වැදගත් රජතුමා කවරෙක් ද?
9. නිස්සංක මල්ල රජතුමා සෑදූ වූ තොඩනැගිලි මොනවා ද?
10. පොළොන්නරුව නිදන් වැවට සිදු වූයේ කුමන රජුගේ ආක්‍රමණය නිසා ද?

වාග්මාලාව

උපයෝජදේව, ආක්‍රමණය, දුනගාලා, රාමඤ්ඤ දේශය, කනිකාවත, ආයිපත්‍යය

13.3 I විජයබාහු රජතුමා (ක්‍රි: ව: 1055 - 1110)

සොළීන් අනුරාධපුර රාජධානිය අල්ලා ගෙන පොළොන්නරුව අගනුවර කර ගත් බව කලින් පාඩමේ දී ඔබ ඉගෙන ගත්තෙහි ය. චෝල ආධිපත්‍යයෙන් රජ රට නිදහස් කර ගත හැකි නායකයෙක් රෝහණයෙන් බිහි විය.

මොහු 1055 දී රුහුණේ බලයට පත් විය. එතැන් සිට මොහු හඳුන්වනු ලැබුයේ විජයබාහු නමිනි. රෝහණයේ සිට බුද්ධරාජ නම් නායකයකුගේ ද සහාය ඇති ව විජයබාහු කුමාරයා සොළීන් පලවා හැරීමට සූදානම් විය. අවුරුදු කිහිපයක් තුළ සංවිධානය වී සොළීන් සමඟ සටන් කිහිපයකින් පසු ව 1070 දී ඔවුන් ගෙන් පොළොන්නරුව නිදහස් කර ගත්තේ ය. මොහු පොළොන්නරුවේ රජ වූ මුල්ම සිංහල රජතුමා යි. මේ රජතුමා අවුරුදු 40 ක් පමණ එක්සත් ශ්‍රී ලංකාවක පාලකයා ලෙස කටයුතු කළේ ය.

අවුරුදු 80 ක් පමණ පැවති සොළී පාලනය නිසා විනාශ වී තිය සිද්ධස්ථාන හා වැව් කිහිපයක් I විජයබාහු රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කරවන ලදී. පොළොන්නරුවේ මුල් ම දළදා මන්දිරය කරවන ලද්දේ මොහු ය. මේ රජතුමා ශ්‍රී පාද වන්දනාකරුවන්ට ඉදුම් හිටුම් කෑම් බීම් ආදියෙන් පහසුකම් සලසන ලදී. මේ කාලය වන විට මෙහි



පොළොන්නරු රාජධානිය
13.1 රූපය

උපසම්පදාව ලැබූ භික්ෂූන් නොසිටි බැවින් රාමඤ්ඤ දේශයෙන් (බුරුමය) භික්ෂූන් ගෙන්වා යළි මෙහි උපසම්පදා කර්මය සිදුකර විය. එ පමණක් නො ව මොහු පාණ්ඩ්‍ය, කාලිංග සහ බටහිර චාලුක්‍ය යන රාජ්‍යයන් සමඟ සම්බන්ධතා ඇති කර ගත්තේ ය. මෙසේ සොළී ආධිපත්‍යයෙන් රජරට නිදහස් කර ගත් I විජයබාහු රජතුමා ශ්‍රී ලංකාවේ ආර්ථික හා සාමාජික දියුණුව සඳහා කටයුතු කෙළේ ය.

13.2 I පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි. ව. 1153 - 1186)

I විජයබාහු රජතුමාගේ මරණයෙන් පසු ශ්‍රී ලංකාව රජරට, දක්ෂිණ දේශය, අටදහස් රට හා දෙළොස් දහස් රට යනුවෙන් රාජ්‍ය හතරකට බෙදී ගියේ ය. පොළොන්නරු රාජධානියේ විජයබාහු ගේ පුත්‍රයා රජකම් කළ අතර, දක්ෂිණ දේශය දෙළොස් දහස් රට සහ අටදහස් රට යන ප්‍රදේශවල විජයබාහු රජුගේ සහෝදරියකගේ පුතුන් තිදෙනා වූ මාණාභරණ, කිත්සිරිමෙවන් සහ ශ්‍රී වල්ලභ පිළිවෙළින් පාලනය කළෝය.

පරාක්‍රමබාහු දක්ෂිණ දේශය පාලනය කළ මාණාභරණ රජුගේ සහ රත්නාවලී බිසවගේ පුත්‍රයාය. ඔහු මුලින් රජ වූයේ දක්ෂිණ දේශයේය. දක්ෂිණ දේශයේ රජ කමට පත් වූ ඔහුගේ අරමුණ වූයේ එක්සත් ශ්‍රී ලංකාවක් ඇති කර ගැනීමයි.

ඔහු දඹදිවෙන් ව්‍යාපාරයකින් පසු ව එවකට පොළොන්නරුවේ පාලකයා වූ II ගජබාහු රජු ද ශ්‍රී වල්ලභ රජුගේ පුත් රුහුණේ II මානාභරණ රජු ද පරදවා 1153 දී ශ්‍රී ලංකාවේ අග රජු ලෙස පොළොන්නරුවේ රජ විය. මොහු රජ වීමෙන් පසු ව බුරුමය සහ පාණ්ඩ්‍ය රට සමඟ ද යුද්ධ දෙකකට සම්බන්ධ විය.

එක්සත් ශ්‍රී ලංකාවක් ඇති කිරීමෙන් පසු ව I පරාක්‍රමබාහු රජුගේ අවධානය යොමු වූයේ රටේ ආගමික හා කෘෂිකාර්මික දියුණුවක් ඇති කිරීමට ය. එතුමා තුන් නිකාය වශයෙන් බෙදී සිටි සංඝයා වහන්සේ අතර සමගිය ද ඇති කෙළේ ය. සංඝ සමාජය පිරිහීමෙන් ආරක්ෂා කිරීම සඳහා කතිකාවතක් ද කරවිය. (කතිකාවතක් යනු භික්ෂූන් වහන්සේලා විසින් පිළිපැදිය යුතු විනය නීති මාලාවකි.) මේ රජු චාර්ෂික ව උපසම්පදා කිරීම පැවැත් වූ බව ද සඳහන් වී ඇත.

නටබුන් ව ගිය පූජනීය සිද්ධස්ථාන රැසක් ප්‍රතිසංස්කරණය කර වූ I පරාක්‍රමබාහු රජතුමා අලුතින් ද විහාර ආරාම් කරවී ය. ඒවා අතර පොළොන්නරුවේ දෙමළ මහ සෑය, කිරි වෙහෙර, තිවංක පිළිම ගෙය, ලංකාතිලක පිළිම ගෙය, උත්තරාරාමය හෙවත් ගල් විහාරය, අලාහන පිරිවෙන, පොත්ගුල් විහාරය යන ඒවා වැදගත් වන අතර දැදිගම සූතියඝර චෛත්‍යය ද වැදගත් ය.

රටේ කෘෂිකර්මාන්තය නගා සිටුවනු සඳහා වාරි කර්මාන්තය දියුණු කිරීමට ඔහු විශාල උත්සාහයක් දැරී ය. දක්ෂිණ දේශයේ පාලකයා ලෙස පරාක්‍රමබාහු රජතුමා දුටුරු ඔය මුල් කර ගනිමින් වාරි කර්මාන්ත කිහිපයක් ඇරඹී ය. දක්ෂිණ දේශයේ නටබුන් ව ගිය වැව් කිහිපයක් ප්‍රතිසංස්කරණය කරවී ය. අහසින් වැටෙන එක් දිය බිඳක් වත් ප්‍රයෝජනයට නො ගෙන මුහුදට නො යවන බව ඔහු ප්‍රකාශ කළේ ද දුටුරු ඔය ඇසුරෙන් වාරිකර්මාන්ත ආරම්භ කරමිනි.

I පරාක්‍රමබාහු රජු අලුත් වැව් කිහිපයක් ම කර වූ අතර නටබුන් වැව් රාශියක් ද ප්‍රතිසංස්කරණය කළේ ය. මොහු විසින් කරවන ලද වැව් අතර පරාක්‍රම සමුද්‍රය මුල් තැන ගනී. මේ රජුට පෙර හෝ පසු ව ශ්‍රී ලංකාවේ රජ කළ කිසිදු රජ කෙනකු මෙ වැනි වැව් සංඛ්‍යාවක් කරවා නැත.

ක්‍රි. ව. 1186 දී මරණයට පත් වූ මේ රජු ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයන් කිහිප දෙනා අතුරෙන් කෙනකු සේ සැලකේ. මහා පරාක්‍රමබාහු රජුට පසු පොළොන්නරු රාජධානියේ රජ වූ වැදගත් ම පාලකයා වූයේ කාලිංග වංශයට අයත් නිස්සංක මල්ල රජතුමා ය.

13.3 නිශ්ශංකමල්ල රජතුමා (1187 - 1196)

එතුමා අවුරුදු නවයක් පැවති සිය පාලන කාලය තුළ දී පොළොන්නරුවේ දක්නට ලැබෙන රන්කොත් වෙහෙර නිශ්ශංක ලතා මණ්ඩපය හා හැටදා ගෙය ඇතුළු සිද්ධස්ථාන කිහිපයක් කර වූයේ ය. දඹුලු විහාරයේ නව කර්මාන්ත කරවා එහි ස්වර්ණමය බුදු පිළිම ගණනාවක් ද පිහිටු විය. දුන ශාලා ඇති කොට දුගී මගී යාචකයන්ට වස්තුව දන් දුන් බව ද සඳහන් වේ.

13.4 පොළොන්නරු යුගයේ පිරිහීම

ක්‍රි. ව. 1215 දී කාලිංග මාඝගේ ආක්‍රමණයේ ප්‍රතිඵලයක් ලෙස රජරට රාජ්‍යය වැටෙනතෙක් පැවතියේ දුර්වල දේශපාලනික තත්ත්වයකි. මෙම අවුරුදු දහ නව අතර පාලකයන් දෙළොස් දෙනකු බලයට පත් වීම එ කල පැවති දුර්වල තත්ත්වය පැහැදිලි වීමට ප්‍රමාණවත්ය. මේ කාලයේ බලයට පත් පාලකයන්ට ගොවිතැන දියුණු කිරීම සඳහා වැව් අමුණු ඉදි කිරීමට නො හැකි විය. තිබූ ඒවා අලුත් වැඩියා කර පවත්වා ගෙන යෑමට ද අපහසු විය. ශාසනික දියුණුව සඳහා සිද්ධස්ථාන අලුතින් ඉදි කරවීමට මෙම පාලකයෝ අසමත් වූ හ. ඔවුන් අතින් පැරණි සිද්ධස්ථාන අලුත් වැඩියා වූයේ ද නැත. මෙ වැනි තත්ත්වයක් පවතිද්දී ක්‍රි. ව. 1214 දී කාලිංග මාඝ නම් වූවකුගේ බිහිසුණු ආක්‍රමණයක් නියා පොළොන්නරු රාජධානිය ඔහු අතට පත් විය. පොළොන්නරු රාජ්‍ය බිඳ වැටිණි. ක්‍රි. ව. 1214 – 1255 දක්වා පොළොන්නරු රාජ්‍ය පාලනය සිංහලයන්ට අහිමි විය. සිංහල රාජධානිය ජල දුර්ග, වන දුර්ග, ගිරි දුර්ග ආදියෙන් ආරක්ෂිත ස්ථානයන්යි පිහිටුවා ගනු ලැබී ය. පොළොන්නරුවට පසු ව දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල, රයිගම හා කෝට්ටේ යන ස්ථානයන්යි රාජධානී පිහිටුවා ගන්නා ලදී.

සාරාංශය

මුලින් ම රුහුණේ බලයට පත් I වන විජයබාහු රජ අප රට සොළීන්ගෙන් මුදා ගත්තේ ය. ඔහු රටේ දියුණුවට කටයුතු කළා පමණක් නොව පිට රට සමඟ ද සබඳතා ඇති කර ගති. මි ළඟට පොළොන්නරුවේ රජ වූ වැදගත් රජු I වන පරාක්‍රමබාහු ය. මේ රජතුමා රට එක්සත් කළේ ය. ඔහු විශේෂයෙන් ම වැදගත් වන්නේ කෘෂිකර්මය නගා සිටුවීම සඳහා ගත් පියවර නිසා ය. මෙ කල ආගමික දියුණුවක් ද ඇති විය. මාඝගේ ආක්‍රමණය නිසා පොළොන්නරු රාජ්‍යය පිරියමට පත් විය.

ක්‍රියාකාරකම්

1. ශ්‍රී ලංකා සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.

   i. පොළොන්නරුව ii. දක්ෂිණ දේශය

   iii. දුටුරු ඔය iv. දෙළොස් දහස් රට

   v. අට දහස් රට

2. හිස්තැන් පුරවන්න.

   i. මුල් ම දළදා මන්දිරය.....

   ii. දෙමළ මහ සෑය..... .....

   iii. රන්කොත් විහාරය .....

   iv. හැටදාගෙය..... .....

   v. පොත්ගුල් විහාරය.....

   vi. පරාක්‍රම සමුද්‍රය.....

3. පහත සඳහන් රජවරුන්ගේ වැදගත් කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න. සටහන පේළි 8 කට වඩා දිග නො විය යුතු ය.

   i. I විජයබාහු රජතුමා

   ii. I පරාක්‍රමබාහු රජතුමා

   iii. නිශ්ශංකමල්ල රජතුමා

14

රජරට ජලාශ්‍රිත ශිෂ්ටාචාරය

පාඩමට සූදනම් වීම

මෙම පාඩමේ දී ඔබට දැනගන්නට ලැබෙනුයේ අනුරාධපුර, පොළොන්නරු යුගවල යාදන ලද වැව්, අමුණු පිළිබඳ ව ය. වැව් අමුණු සැදවීම නිසා රජරට කෘෂි කර්මාන්තය බෙහෙවින් දියුණු විය. එය සිදු වූ ආකාරය දැන ගැනීමට පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. රජරට යනු කුමක් ද?
2. ශ්‍රී ලංකාවට පැමිණි ආර්‍යයන්ගේ ජීවනෝපාය කුමක් ද?
3. රජරට වියළි කලාපයට අයත් පෙදෙස්යි ප්‍රධානතම ලක්ෂණ කවරේ ද?
4. අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා පැරණි ජනයා කුමක් කළා සු ද?
5. ශ්‍රී ලංකාවේ විශාල ම වැව් ඉදි වී තිබෙනුයේ කුමන සියවසින් පසුව ද?
6. අප රටේ වැව් තැනීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ රජවරු කවරහු ද?

වාංමාලාව

රජරට, බිසවන්කුලම, වියළි කලාපය, පරාක්‍රම සමුද්‍රය, ජය ගඟ, ඕන්ගේරි වැව, කලා-බලලු වැව, මාරිකර්මාන්තය

14.1 රජරට ප්‍රදේශය

අනුරාධපුර හා පොළොන්නරු රාජධානි පිහිටා තිබුණු ප්‍රදේශ රජරට යනුවෙන් හැඳින් වේ. දඹුරු ඔයෙන් හා මහවැලි ගඟට උතුරින් පිහිටා ඇති මුලු ප්‍රදේශය ම මෙයට අයත් ය. රජරට යනුවෙන් භාවිත වන්නට වූයේ අනුරාධපුර යුගය අවසාන කාලයේ දී ය. පසුව මේ ප්‍රදේශය, පිහිටි රට නමින්ද හඳුන්වන ලදී.

ඉන්දියාවේ සිට මුලින් පැමිණි ජන සමූහ ජනාවාස පිහිටුවා ගත් අයුරු අපි කලින් පරිච්ඡේදයක ඉගෙන ගත්තෙමු. ඔවුන් ජනාවාස පිහිටුවා ගන්නා ලද්දේ ගංඉවුරු ආශ්‍රිත ව බවත් ගොවිතැන් කිරීමට ගංගා වලින් ජලය ලබා ගත් බවත් අපි කලින් ඉගෙන ගත්තෙමු. ඔවුන් පදිංචි වූ ස්ථානවල පස සරු වූ අතර දේශගුණය ගොවිතැනට හිතකර විය.

14.2 මුල් ජනාවාස පිහිටුවා ගත් ස්ථාන

මුල් ජනාවාස පිහිටුවා තිබූ ප්‍රදේශ අයත් වූයේ වියළි කලාපයට යි. වසරේ සීමා සහිත කාලයක වර්ෂාව ලැබීමත් ඉතිරි කාලය වියළි ව පැවතීමත් වියළි දේශගුණ කලාපයේ ලක්ෂණ වේ. වැසි ලබන කාලයේ දී රජරට වියළි කලාපයේ ගොවිතැන් සාර්ථක ලෙස කළ හැකි විය. වර්ෂාව නොලැබෙන කාලයේ දී ගොවිතැන් කිරීමට බලවත් ප්‍රශ්නයක් වූයේ ජලය යි. ජනසංඛ්‍යාව ක්‍රමයෙන් අධික වීමෙන් කැලෑ එළිපෙහෙළි කිරීම සිදු විය. මෙය සහ වෙනත් හේතූන් නිසා මහවැලි ගඟ හැර සෙසු හැම ගංගාවක් ම පාහේ ඉඩෝර කාලයට සිදී සෑම ජල ප්‍රශ්නයට හේතු විය. එම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා ජල සම්පාදන ක්‍රම වෙත අවධානය යොමු කරන ලදී.

14.3 ජලසම්පාදන ක්‍රම ආරම්භ කිරීම

ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි මුල් ජන සමූහයන්ට වාරි කර්මාන්තය පිළිබඳ ව ශිල්පීය දැනුම තිබුණු බව පෙනේ. ඔවුහු මුලින් ම කුඩා ගම් වැව් තැනීම ආරම්භ කළ හ. ඒවා තැනීම සඳහා තමන් දත් ශිල්පීය දැනුම උපයෝගී කර ගන්නට ඇත. කල්සාමේ දී ජනසංඛ්‍යාව තවත් වැඩි වූයෙන් ගම් වැව් වල ජලය ප්‍රමාණවත් නො වී ය. මෙයි ප්‍රතිඵලය වූයේ මධ්‍යම කඳුකරයෙන් ආරම්භ ව විශාල කලාපය ඔස්සේ ගලා බස්නා ගංගා ඇසුරින් ජලසම්පාදන ක්‍රම ආරම්භ කිරීම යි.

14.4 වැව් සෑද වූ රජවරු

වැව් ඉදි කරදීමට රජවරු ඉදිරිපත් වූහ. ශ්‍රී ලංකාවේ මුලින් ම වැව් කරවූ පාලකයා ලෙස සලකනුයේ පණ්ඩුකාභය රජු ය. අද බසවක්කුලම නමින් හැඳින්වෙන අභය වැව ඇතුළු වැව් තුනක් ඉදිකර වූ පාලකයා ඔහු ලෙස සැලකේ. අනුරාධපුරයේ තිසා වැව කර වූයේ දේවානම්පියතිස්ස රජතුමා ය. වැව් සෑදීම රජ රටට පමණක් සීමා නො වී ය. දිවයිනේ ගිනිකොණ දිග ප්‍රදේශයේ ද වැව් ඉදි වුණු බවට සාධක ඇත. ඉලනාග රජු (ක්‍රි. ව. 47 – 43) තිසා වැව හා දුර තිසා වැව යනුවෙන් වැව් දෙකක් රුහුණු ප්‍රදේශයේ ඉදි කර වී ය.

ශ්‍රී ලංකාවේ විශාල වැව් ඉදිවනු දක්නට ලැබෙන්නේ ක්‍රි. ව. පළමු වන සිය වසේ සිට ය. එයට පදනම වැටුනේ විසභ රජු (ක්‍රි. ව. 65 – 109) දවස ය. ඔහු විසින් වැව් 11 ක් හා ඇළමාර්ග 12 ක් කරවූ බව වංශ කථාවේ සඳහන් ය. මෙම වැව් බොහොමයක් දැනට හඳුනා ගෙන ඇත. ඒවා පසු කාලෙක ඉදී වූ ඇතැම් වැව් තරම් විශාල නොවූවත් ගම් වැව්වලට වඩා බෙහෙවින් විශාල ය. වසභ රජු කරවූ ඇළ මාර්ග අතර ඉතා විදගත් වන්නේ පසු කාලයේ වාරි කර්මාන්ත කටයුතුවලට බෙහෙවින් උපකාරී වූ ඇළහැර ඇළ යි.

වසභ රජුගෙන් පසු ශ්‍රී ලංකාවේ ජලසම්පාදන කටයුතු සම්බන්ධයෙන් වැදගත් පාලකයා වූයේ මහසෙන් රජතුමා ය. ඕන්ගේරි, කවුඩුල්ල, නුරුල්ල, කන්දරා, මියගල්කඩවල ආදී වැව් 16 ක් හා ඇළ මාර්ගයක් ද ඔහු විසින් කරවන ලදී. යළිත් වාරි කර්මාන්ත කටයුතුවල දියුණුවක් දක්නට ලැබෙන්නේ ධාතුසේන (ක්‍රි. ව. 459 – 477) රාජ්‍ය සමයේ දී ය. ඔහු කලා – බලලු හා යෝධ වැව් ඇතුළු වැව් 18 ක් කරවී ය. කලා – බලලු හා තිසා වැව සම්බන්ධ කරමින් ජය ගඟ නම් ඇළ මාර්ගය කරවන ලද්දේ ද ධාතුසේන රජු විසිනි. එම වැව් දෙක අතර විශාල පෙදෙසක් ගොවිතැනට යොදා ගනු ලැබී ය. ධාතුසේන රජු ගෙන් පසු බලයට පත් පාලකයන් අතුරෙන් II මුගලන් (ක්‍රි. ව. 531 – 551) රජු පන්පහන් වැව (නාවිවදූව) හා පදවිය ඝන වැව් කරවී ය. I අග්ග බෝධි විසින් (ක්‍රි. ව. 571 – 604) වැව් රැසක් ද ඇළමාර්ග කිහිපයක් ද කරවන ලදී. මිනිපේ ඇළ කරවන ලද්දේ ඔහු විසිනි. II අග්ගබෝධි (ක්‍රි. ව. 604 – 614) රජු වාරි කර්මාන්තයේ දියුණුවට විශාල සේවාවක් කළ පාලකයෙකි. ඔහු කරවූ වැව් අතර කන්තලේ වැව හා සිරිතලේ වැව වැදගත් ය.

හත් වන සියවසින් පසු වාරි කර්මාන්තයේ දියුණුවට අනුරාධපුර පාලකයන් අතින් නව වැව් ඉදි වූ බවට සාධක නැත. එහෙත් 7, 8, 9 යන සියවස්වල බලයට පත් පාලකයෝ තිබූ වාරිකර්මාන්ත ප්‍රතිසංස්කරණය කර පවත්වා ගෙන ගිය හ.

වියළි කලාපයේ බහුල ව ඉදිකළ වැව් එකිනෙකාට සම්බන්ධ වූයේ ඇළ මාර්ග මගිනි. මෙම ඇළ මාර්ග සහ වැව් ඉදි කිරීමේ දී යොදා ගත් ශිල්පීය දැනුම තුනන ඉංජිනේරුවන් පවා පුදුමයට පත් කරවන සුලු ය.

කලා වැව හා තිසා වැව සම්බන්ධ කරමින් ධාතුසේන රජු විසින් කරවන ලද මීටර 87 ක් දිග ඇළ මාර්ගය ජය ගඟ නමින් හැඳින්වේ. ඇළ මාර්ග ඉදි කිරීමේ දී ඔවුන් දැක් වූ ශිල්පීය දක්ෂතාවලට හොඳ නිදසුනකි. පොළොව මතු පිටින් යාළු ඇළ මාර්ග ඔස්සේ පමණක් නොව පොළොව යටින් යාළු මාර්ග ඔස්සේ ද ජලසම්පාදන ක්‍රම ඇති කිරීමට දක්ෂතා මෙම ශිල්පීන්ට හිමිවිණි ය.



14.1 රූපය

අනුරපුර යුගයෙන් පසු මෙ රටේ වාරි කර්මාන්තයට යළින් දීප්තිමත් යුගයක් උදා වූයේ පොළොන්නරු යුගයේ දී ය. එහි ආරම්භක පාලකයා වූ I විජයබාහු ජරාජීර්ණ වූ වැව් රැසක් හා ඇළ මාර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය කර විය. අනතුරුව බලයට පත් වූ I පරාක්‍රමබාහු රජතුමා දක්ෂිණ දේශයේ පාලකයා ව සිටි කාලයේ පටන් ම වාරිකර්මාන්තයේ දියුණුව සඳහා කටයුතු කළේ ය. එම යුගය පරිච්ඡේදයේ දී දැදුරු ඔය ආශ්‍රිත ව වාරි කර්මාන්ත දියුණු කිරීමට ඔහු විශේෂ උනන්දුවක් දැක්වී ය. ඒ සඳහා ඔහු දැදුරු ඔයෙහි ස්ථාන තුනක වේලි බැන්ද වී ය. පඬුවස් නුවර පරාක්‍රම සමුද්‍ර නමි වැවක් කර වී ය. I පරාක්‍රමබාහු රජතුමා එක්සත් ශ්‍රී ලංකාවක පාලකයා ලෙස පත් වූ පසු මුළු දිවයිනේ ම වාරිකර්මාන්ත කටයුතු දියුණු කළේ ය. ඔහු අලුත් වැව් සහ ඇළ මාර්ග කිහිපයක් ඉදි කළ අතර ජරාජීර්ණව ගිය පැරණි වැව් සහ ඇළ මාර්ග රාශියක් ප්‍රතිසංස්කරණය කරවී ය. I පරාක්‍රමබාහු රජතුමාගේ විශිෂ්ටතම නිර්මාණයක් ලෙස සැලකිය හැක්කේ පරාක්‍රම සමුද්‍රය යි. තෝපා වැව සහ දුම්බුළුළු වැව ද එක් කොට මෙම වැව ඉදි කරවන ලදී. වංශ කථාවේ සඳහන් වන පරිදි ශ්‍රී ලංකාවේ ජල සම්පාදන කටයුතු දියුණු කිරීමට I පරාක්‍රමබාහු රජතුමා ගෙන් තරම් සේවයක් වෙනත් කිසි ම පාලකයකු අතින් සිදු වී නැත. මෙම රජතුමා ගෙන් සිදු වූ වාරිකර්මාන්ත දියුණුව නිසා රට අහරින් ස්වයංපෝෂිත ව ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය බවට පත් වී ය. පරාක්‍රමබාහු රජුගෙන් පසු රජ වූ නිස්සංක මල්ල රජතුමා ද වැව් කිහිපයක් ප්‍රතිසංස්කරණය කර වී ය. පොළොන්නරු යුගයේ වාරි කාර්මිකයන් ද වැව් අමුණු හා ඇළමාර්ග ඉදි කිරීමේදී හා ප්‍රතිසංස්කරණය කිරීමේ දී දක්වා ඇත්තේ විශ්මයජනක ශිල්පීය ඥානයකි.

වැව් තැනීමේ දී භූගෝලීය සාධක ප්‍රයෝජනයට ගන්නා ලදී. තුන් පැත්තකින් උස් වූ පෙදෙසක ඉතිරි පැත්ත බැම්මකින් ඇහිරීමෙන් ද කෝණයක් මෙන් කඳු දෙකක් එකි නෙකට හමුවෙන තැනක ඉතිරි කොටස බැම්මකින් ඇහිරීමෙන් ද එසේත් නැත්නම් ගංගාවක් හරහා බැම්මක් බැඳීමෙන් ද ජලාශ ඉදි කර ගන්නා ලදී.

14.5 ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ අභාවය

නිශ්ශංක මල්ල රජුගෙන් පසු දඹදෙණි හා කුරුණෑගල ආදී යුග වල සාදන ලද වැව් පිළිබඳ ව අසන්නට නො ලැබේ. රාජධානි මාරුවන්නට වූවාට පසු ව නඩත්තු කිරීමක් සිදු නො වූ නිසා වැව් අමුණු නටබුන් වී ගියේ ය. මේ නිසා රජරට වාරි කර්මාන්තය පිරිහී ගියේ ය.

වැව් තැනීම පමණක් නො ව වැව් පවත්වා ගැනීම ද රජවරුන් විසින් කළ බවට සාධක ඇත. තලා අරක්ක හා වැවජ්ඣරුම් නම් වැව අධීක්ෂක නිලධාරීන් සිටි බව සෙල් ලිපිවල සඳහන් ය. වැව් පොදු වස්තුවක් ලෙස සැලකූ හෙයින් ජලය පරිහරණය කිරීමේ දී සාධාරණ ව ජලය බෙදා දීම පිළිබඳ ව නීති පනවා තිබුණි. කුඹුරුවලට ජලය බෙදා දී 'දිය බෙදුම්' නම් සලාක ක්‍රමයක් ද පැවතියේ ය. ජල නාස්තිය වැළැක්වීම ද එම නීති පැනවීමේ එක් අරමුණක් විය. ජල බද්දක් ද මෙම කාර්‍යයේ දී අය කරන ලදී. මේ බද්ද අනුරපුර යුගයේ දී 'දූකපති' නමින්ද පොළොන්නරු යුගයේ දී ''පිසඹුරුවත්'' නමින්ද හැඳින්වූ බව පෙනේ. මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට වෙල් කැමි නම් නිලධාරී පිරිසක් ද වූහ. ජලයේ අවශ්‍යතා මෙන් ම ජල රක්ෂණය පිළිබඳ ව ද අවබෝධයක් මේ කාලයේ දී තිබුණු බව පෙනේ.

සාරාංශය

වැඩියෙන් ආහාර නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වූ විට කෘෂිකර්මය සඳහා ජල සම්පාදනය කිරීම අවශ්‍ය විය. ජල සම්පාදනය කිරීම සඳහා රජවරු උනන්දු වූහ. මේ කාලයේ කුඩා වැව් හා විශාල වැව් තනවන ලදී. භූගෝලීය ලක්ෂණ වැව් සැදීමේ දී බෙහෙවින් ප්‍රයෝජනයට ගන්නා ලදී. ජලය නාස්ති නො කිරීම කෙරෙහි ද මේ කාලයේ දී අවබෝධයක් තිබුණි. වැව් අමුණු නඩත්තුව නැති වූ විට ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පිරිහී ගියේය.

ක්‍රියාකාරකම්

1. රජරට ප්‍රදේශයේ සීමා මොනවා ද?
2. පහත සඳහන් රජවරු සැදූ වූ වැව් නම් කරන්න.
   i. මහසෙන්
   ii. ධාතුසේන
   iii. II අග්ගබෝ
   iv. ඉලනාග
   v. මහා පරාක්‍රමබාහු
3. වැව් සැදවීමට ඇති වූ අවශ්‍යතාව කුමක් ද?
4. 'අප රටේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය' යනුවෙන් පෙළි දහසක කුඩා රචනයක් ලියන්න.

15

රජ රට සභ්‍යත්වය

පාඩමට සූදානම් වීම

මෙම පාඩමෙහි අඩංගු වී ඇත්තේ රජරට ශිෂ්ටාචාරය පිළිබඳ කරුණු ය. අනුරාධපුර, පොළොන්නරු යුගවල ආගම්, ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව, පරිපාලන සංවිධානය, සාහිත්‍ය සහ සමාජ තත්ත්වය පිළිබඳ කරුණු මෙහි සඳහන් කොට ඇත. පහත සඳහන් ප්‍රශ්න කියවා පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. **රජ රට සභ්‍යත්වයට පදනම් දමන ලද්දේ කවුරුන් විසින් ද?**
2. **බෞද්ධාගම ගෙන එම නිසා ශ්‍රී ලංකාවේ ඇති වූ වෙනස්කම් මොනවා ද?**
3. **මේ අවධියේ දී සාදවන ලද විශාල දගැබ් මොනවා ද?**
4. **අනුරාධපුර පොළොන්නරු යුගවල ලියැවුණු පොත්පත් කවරේ ද?**
5. **මේ යුගවලට අයත් මූර්ති, සැටියෙන් සහ මිනුම් දන්නට ලැබෙන්නේ කුමන ස්ථාන වල ද?**
6. **රජ රට සමයේ රාජ්‍ය නායකයා තැබූන්වූයේ කුමන නමකින් ද?**
7. **නගර නාගරිකයා වූයේ කවරෙක් ද?**

වචන මාලාව

සභ්‍යත්වය, මිනෙ මිහිකරන්න, නාගර ශිල්පීන්, නිල්පෙ, අභයගිරි විහාරය, ජේතවනාරාමය, මූර්ති කලාව, පොළොන්නරු

15.1 ශ්‍රී ලංකාවේ සංස්කෘතියේ ආරම්භය

ශ්‍රී ලංකාවේ මුලින් සිටි දේශීය ජනයා දියුණු තත්ත්වයක සංස්කෘතියක් සහිත ව සිටි බවට ස්ථිර සාක්ෂ්‍ය මෙ තෙක් ලැබී නැත. මේ කාලය පිළිබඳ ව දැන ගැනීමට ඉතිරි ව ඇත්තේ ගල් ආයුධ කිහිපයක් පමණි. රජ රට සභ්‍යත්වයට හෙවත් ශිෂ්ටාචාරයට පදනම් දමන ලද්දේ උතුරු සහ දකුණු ඉන්දියාවෙන් පැමිණි ආර්ය භාෂා කථා කරන ජන සමූහ විසින් යැයි පිළිගැනීමක් ඇත. ඔවුන් දැමූ පදනම් මත වැඩුණු සභ්‍යත්වය විරින් වර පැමිණි ද්‍රවිඩ භාෂා කථා කරන ජනයා ද පෝෂණය විය. ශ්‍රී ලංකාවට ඉතා කිට්ටුවෙන් පිහිටි රට වූ ඉන්දියාවේ අභාෂය රජරට කෙරෙහි බෙහෙවින් බල පැවේ ය. එහෙත් බුද්ධාගම පැමිණියාට පසු ව රජරට වැඩි සිටියේ මේ රටට ම ආවේණික වූ සංස්කෘතියකි.

15.2 රජ රට කෘෂිකර්මාන්තය

මුලින් ශ්‍රී ලංකාවට පැමිණි ජන සමූහ තමන්ට හිතකර භූගෝලීය පරිසරයක් ඇති ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගත්හ. හුරු පුරුදු ගොවිතැන් ජීවනෝපාය කර ගත් ඔවුහු ඉන්දියාවේ දී මෙන් ගංගා ගොවිතැන් ද්‍රවිඩ වේගින ද නැවත කළහ. මෙයින් පැමිණියායින් පසු වූ වුවුන් වැඩි වශයෙන් එකා කළේ වී අඳු වාසය වර්ගය. ඒහා සංඛ්‍යාව වැඩෙන්න් ම ආහාර වැඩියෙන් නිෂ්පාදනය කර ගත්තාට වුවමනා වූ ජල පහසුකම් සපයා ගැනීමට ඔවුන්ට සිදු විය. ගොවිතැන දියුණුවේ සඳහා උපවිරුන් ගෙන් යුදු වූ සේවා ම ප්‍රතිලාභය ශිල්පීන්ගේ පිළිබඳ පරිවිශේදය ඉගෙන ගත්තාහු දිවි ගිහිට වැටහෙන්නට ඇත. රජරට සමාජයේ රාජකීය ලක් වූ ජලාශ ඒ හා බැඳුණු කෘෂිකර්මය යි

15.3 බෞද්ධාගමේ පැමිණීම හා බලපෑම

ශ්‍රී ලංකාවට බෞද්ධාගම ගෙන එම ද රජරට සභ්‍යත්වයේ දියුණුවට බෙහෙවින් උපකාරී විය- බෞද්ධාගම නිසා ලේඛන කලාවත්, සාහිත්‍යයත්, ගෘහනිර්මාණ ශිල්පය හා මූර්ති කලාවත්, මෙ රට ඇති විය. මේ සියලු ම අංශ කෙරෙහි ඉන්දියානු ශිෂ්ටාචාරයේ බලපෑම දක්නට ලැබුණත් මෙහි සංස්කෘතිය මෙ රටට ආවේණික වූ සම්ප්‍රදායක් අනුව වර්ධනය වීම කැපී පෙනෙන ලක්ෂණයකි.

ඉන්දියාවෙන් ලත් දායාදය වූ බෞද්ධාගම රජරට රජවරුන්ගෙන් ලත් අනුග්‍රහය නිසා බෙහෙවින් දියුණු විය. මෙ රට රාජ්‍යාගම වූයේ ද බුද්ධාගම යි. මිහිඳු හිමියන් ගෙනා ථෙරවාදී බුද්ධාගමද පසුව මෙ රටට වරින් වර පැමිණි මහායාන බුද්ධාගම ද මෙහි පැතිර ගියේ ය. එහෙත් වඩා බලවත් වූයේ ථෙරවාදී බුද්ධාගම යි. බුද්ධාගම දියුණු වී පැතිර ගිය ආකාරය මෙහි ඇති පුරා විද්‍යාත්මක නටබුන් වලින් හා මහා වංශය වැනි කෘතීන්ගෙන් සහ චීනියන් වැනි දේශාටකයන්ගේ වාර්තාවලින් මැනවින් පැහැදිලි වේ.

15.4 අධ්‍යාපනය

බුද්ධාගම දියුණුවත් ම ඒට සම්බන්ධ අධ්‍යාපන ක්‍රමයක් ද දියුණු විය. හැම ආරාමයක් ම විහාරයක් ම අධ්‍යාපනික මධ්‍යස්ථානයක් විය. මහා විහාරය, අභයගිරි විහාරය, ජේතවනාරාම විහාරය අනුරපුර යුගයේ ප්‍රධාන විහාර වේ.

මෙම ආයතනවලට අනුබද්ධිත මූල නම් භික්ෂු සමූහ ආයතන අටක් තිබුණි. දක්ඛිණ මූලය, උත්තර මූලය, විල්ගම් මූලය, මහාපෝත්‍ර ප්‍රාසාද මූලය, ආදිය එ වැනි විද්‍යා විය කිහිපයකි.

15.5 බුද්ධ ශාසනය පවත්වා ගැනීම

බුදු සසුන රැකීමට නම් සිල්වත් භික්ෂු පිරිසක් සිටිය යුතු බව රජරට රජවරු මනාව කළහ. දුශ්ශීල මහණුන්ට විරුද්ධ ව කටයුතු කිරීම මේ අවධියේ දක්නට ලැබේ. අනුරාධපුර යුගයේ මෙන්ම පොළොන්නරු කාලයේ දී ද සසුන පිරිහුණ අවස්ථාවල රජවරු කතිකාවත් පිහිටුවා ශාසන ශුද්ධිය ඇති කළහ. උපසම්පදා නොවැති වූ විට උපසම්පදා කර්මය කරවා සංඝයත් හික්ෂු පරපුරත් බිහිවීමට අත දුන් හ.

බෞද්ධාගම පමණක් නොව යුධ්‍යාදී ආගට ද රජරට පැතිර ගියේ ය. මේ කරුණු පිළිබිඳ ව දකුණු ඉන්දියාවේ යම්බන්ධය දක්වන පරිච්ඡේදයේ ද විස්තර ගැනීමට පුළුවන.

15.6 රජරට සාහිත්‍යය

රජරට සමයේ සාහිත්‍ය දියුණුවක් ද දක්නට ලැබුණි. සාහිත්‍ය දියුණුවට රජවරුන්ගේ අනුග්‍රහය විශේෂයෙන් ලැබුණි. මුල් අනුරාධපුර කාලයේ ලියන ලද සාහිත්‍ය කෘතීන් තිබුණු බවට සාක්ෂ්‍ය තිබුණත් අද ඒවා දක්නට නැත. දැනට ලැබී ඇති පැරණි ම සාහිත්‍ය කෘතිය පාලියෙන් ලියැවී ඇති සිහලවත්ථුප්පකරණය යි. දීපවංශ, මහාවංශ වැනි පාලි පොත් ද අමාවතුර බුත්සරණ වැනි සිංහල පොත් ද ථෙරවාදී බුද්ධාගම සංස්කෘත පොත් ද රජරට සමයේ ලියැවී ඇත. සාමාන්‍ය ජනතාව අතර ද සාධ්‍ය ලිවීමේ දක්ෂතාවක් ඇති අය සිවි බව සීගිරි කුරුටු ගීවලින් හෙළිදරව් වේ.

15.7 ගෘහ නිර්මාණ ශිල්පය

ගෘහ නිර්මාණ ශිල්පයද රජරට සමයේ වැදගත් තැනක් ගනී යි. විශාල දගැබ් තැනීම විශේෂ ලක්ෂණයකි. අනුරාධපුරයේ රුවන්වැලි සෑය, අභයගිරි දගැබ සහ ජේතවනාරාමය සහ කාලණියේ දගැබ ද රුහුණු රාජ්‍යයේ මාගමයෙහි දගැබ ද තිස්ස මහාරාම දගැබ ද වැනි විශාල ස්තූප අනුරපුර යුගයේ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ දක්ෂතාවය හොඳින් දක්වයි. පොළොන්නරු යුගයේ දෙමළ මහා සෑය, රත්නොත් ප්‍රාසාදය සහ කිරිවෙහෙර ද විශාල ස්තූප ලෙස හඳුන් ගැනේ. පොළොන්නරුවේ වටදාගෙය, තිවංක පිළිමගෙය, ලංකාතිලක පිළිමගෙය හා නිශ්ශංක ලතා මණ්ඩපය මෙම යුගයට අයත් වැදගත් ගොඩනැගිලි වේ.

ඒහා ඒ ආගමික නොවැ ගොඩනැගිලි කිහිපයක් ද පොළොන්නරු අවධියේ ද තනවා තිබේ. පොළොන්නරුවේ සොළීන රජ කරන අවධියේ එම රජවරුන් විසින් කෝවිල් කිහිපයක් ම තනවා තිබුණි. ශිව දේවාල සතුවෙන් හැඳින් වෙනුයේ මේවා යි. මේවා තනා ඇත්තේ දකුණු ඉන්දිය සම්ප්‍රදාය අනුව යි.



15.1 රූපය

15.8 මූර්ති කලාව

රජරට මූර්ති කලාව කෙරෙහි ද ඉන්දියානු ආභාෂය ලැබී ඇතත් මෙ රටට ආවේණික ශෛලීයකින් යුතු ව නෙළන ලද අලංකාර බුදු පිළිම කිහිපයක් මේ යුගයට අයත් ය. අනුරාධපුර යුගයේ යමාඩි බුදු පිළිමය, අවුකන බුදු පිළිමය, මාළිගාවිල හිටපිළිමය සහ දුනට කොළඹ කෞතුකාගාරයෙහි තැන්පත් කර ඇති තොලුවිල බුදු පිළිමය ද පිළිම නෙළීමේ උසස් කුසලතා පෙන්නුම් කරයි. පොළොන්නරු යුගයේ බුදු පිළිම අතරට මහා පරාක්‍රමබාහු රජු විසින් කරවන්නා ලද ගල් විහාරය අසල ඇති බුදු පිළිම කිහිපය ද වටද ගෙය සිව් පසින් ඇති බුදු පිළිම ද ඇතුළත් වේ.

මෙයට අමතර ව රජරට සමයෙ මූර්ති ශිල්පීන්ගේ දක්ෂතාට පෙනෙනුයේ අනුර පුරයේ ඉසුරුමුණි ඇතුළු ගුහාවල, ගඩොල්පාල රූප, සඳකඩ පහන්, ලියවැල් ආදිය දෙස බලනා විට ය.

15.9 චිත්‍ර කලාව

රජරට සමයේ චිත්‍ර ශිල්පය ගැන ද යමක් කිව යුතු යි. වර්තමානයේ ආරක්ෂා වී ඇති පැරණිම චිත්‍ර ඩිතිරි චිත්‍ර වේ. ඒවා ම ආසන්න කාලයේ දී අඳින ලද යි කියන පේරාදෙණිය අසල නිදගල ගල්ලෙනක ඇති චිත්‍ර ද උසස් කුසලතාවක් දක්වයි. පරාක්‍රමබාහු රජුගේ මාළිගයේ සරස්වති මණ්ඩපය ඉහා අලංකාර ලෙස සිතුවම් කර තිබේ. මහියංගන දගැබේ ධාතු ගර්භයේ බිත්තිවල ඇඳ ඇති චිත්‍රත් පොළොන්නරු යුගයේ උසස් ම චිත්‍ර කිහිපයකි.

15.10 රජරට පාලනය

මේ අවධියේ පැවතියේ රාජාණ්ඩු ක්‍රමයකි. එහි නායකයා වූයේ රජු ය. රජතුමා දුර්ණ බල සම්පන්න පුද්ගලයෙක් විය. එහෙත් සාමාන්‍යයෙන් ඔහු ක්‍රියා කළේ ජනතාවගේ යහපත උදෙසා වීමට ය. රටේ දියුණුවට වැඩ කළ අග්‍රශ්‍රේෂ්ඨ රජවරුන් යේ පිළිගනු ලැබූ හ. එ නම් දුටුගැමුණු, මහසෙන්, ධාතුසේන, I විජයබාහු, මහා පරාක්‍රමබාහු වැනි රජවරු එම පිරිසට අයත් වෙති. රජුට සහාය වීමට ඇමති මණ්ඩලයක් ද විය. පුරෝහිත, සේනාපති, භාණ්ඩාගාරික, මහලේ, ගණ අය ඒ ඇමති මණ්ඩලයේ සාමාජිකයන් අතර වූහ. රාජ්‍ය පාලනයේ පහළ ම ඒකක පෙත්තෙහා වූයේ ගම පාලනය යි. ගමක් පාලනය වූයේ ගමක හෝ



15.2 රූපය

ගාමිණී නම් වූ ගම් ලද්දෙකු විසිනි. ගමේ වැඩිහිටියන් ගෙන් යුත් ගම් සභාවක් මඟින් ගම් පාලනය කළ බව සිතිය හැකිය.

15.11 සමාජ ක්‍රමය

සමාජයට පදනම් වූයේ පවුලයි. පවුල් රැසක් එක්වී ගමක් සැදුණි. මේ ගම්වල සිටියේ විවිධ රැකී රක්ෂා කරන පවුල්වලට අයත් පුද්ගලයින් ය. රටේ එවකට පැවති ස්වයංපෝෂිතභාවය ඇති කිරීමට සෑම පවුලකට ම අයත් මිනිස්සු තමන්ට අයත් කායික ශ්‍රම දායකත්වය ඉටු කළ හ. ආවාහ විවාහ සිදු වූයේ එක ම රැකියාව කරන පවුල් අතරය.

සාරාංශය

ඉන්දියාවෙන් පැමිණි මෙහි ජනාවාස පිහිටුවා ගත් ජන සමූහ උරුම කොට දුන් සංස්කෘතිය හා සභ්‍යත්වය බුද්ධාගම පැමිණීම නිසා ඔපවත් විය. රජරට අධිපතිය යනුවෙන් හැඳින් වෙන අනුරපුර පොළොන්නරු යුගවල දී සමාජයේ විවිධ අංශ දියුණු කොට උසස් තත්ත්වයකට ගෙන ඒමට රජවරු සමත් වූහ.

ක්‍රියාකාරකම්

(1) බුද්ධාගම ශ්‍රී ලංකාවට පැමිණීමෙන් ඇති වූ බලපෑම් තුනක් නම් කරන්න.

(2) අනුරාධපුර යුගයට අයත් චිත්‍ර තිබෙන ස්ථාන දෙකක් සහ පොළොන්නරු යුගයට අයත් චිත්‍ර තිබෙන ස්ථාන දෙකක් නම් කරන්න.

(3) පහත සඳහන් ගොඩනැගිලි සැදූ වූ රජවරුන්ගේ නම් ගොඩනැගිලිවල ඉදිරියේ සඳහන් කරන්න.
   i. රුවන්වැලි සෑය
   ii. අභයගිරිය
   iii. තිමංක පිළිමි ගෙය
   iv. නිශ්ශංකලතා මණ්ඩපය

(4) .. .. සහ ....
... .
අනුරපුර යුගයේ ලියැවුණ පොත් දෙකකි.

(5) .... සහ . . . ...
පොළොන්නරු යුගයේ ලියැවුණ පොත් දෙකකි.

(6) රජරට සභ්‍යත්වය යනුවෙන් පෙළි දහයක කුඩා රචනයක් ලියන්න.

16

ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර පැවති ආර්ථික සංස්කෘතික සහ සමාජ සම්බන්ධතා

පාඩමට සූදනම් වීම

මේ පාඩමේ සඳහන් වී ඇත්තේ දකුණු ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පැවති සම්බන්ධය යි. සාමාන්‍යයෙන් සිංහල-දෙමළ ජනතාව අතර පැවති සුහද සම්බන්ධය කෙරෙහි මෙය අවධාරණය කොට දක්වා ඇත. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. දක්ෂිණ පථය යනු කුමක් ද?
2. දකුණු ඉන්දියානු වෙළෙඳුන් මෙයි පැමිණි බවට සාක්ෂ්‍ය මොනවා ද?
3. පන්හිහි ඇදහිල්ල සහ ශිව ආගම මෙරටට ලැබුණේ කුමන ප්‍රදේශයෙන් ද?
4. දකුණු ඉන්දියානුවන් මේ රටට පැමිණියේ කෙ බඳු අවස්ථාවල ද?
5. දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට පැමිණ ඇති වචන මොනවා ද?
6. සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට පැමිණ ඇති වචන මොනවා ද?

වාංමාලාව

දක්ෂිණ පථය, නා නා දේශී වෙළඳ සමාගම, මහායාන ධර්මය, ශිව ඇදහිල්ල, රාජ රාජ පෙරුම්පල්ලි, විජයරාජ ප්ෂ්වරම්

16.1 දකුණු ඉන්දියාව

ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටා ඇති හෙයින් ඉතා ඉහත කාලයේ සිට ම දෙරට අතර සම්බන්ධතා පැවතුණු බව ඔබ කලින් ඉගෙන ගත්තෙහි ය. දකුණු ඉන්දියාවෙන් ද්‍රවිඩ භාෂා කථා කළ ජන සමූහ ශ්‍රී ලංකාවට පැමිණි බව ද ඔබට දැනගන්නට ලැබුණි. දකුණු ඉන්දියාව ලෙස අප අදහස් කරන්නේ වින්ධ්‍ය කඳු වැටියෙන් සහ නර්මදා ගඟින් දකුණින් පිහිටි මුළු ප්‍රදේශයයි. මේ ප්‍රදේශය මුල් කාලයේ දී හඳුන්වන ලද්දේ දක්ෂිණ පථය යනුවෙනි.

16.2 දකුණු ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සම්බන්ධය

ද්‍රවිඩ භාෂා කථා කළ ජනයා මෙරටට මුලින් ම පැමිණියේ වෙළෙන්දන් වශයෙනි. මේ බව ‘පියඟුමල් නම් චීන භික්ෂුවගේ ‘දේශාටන වාර්තාවෙන්’ ද තහවුරු වේ. ක්‍රි. පූ. දෙවන සියවසේ දී මෙරට පැමිණි සේන හූතික දෙදෙනා අශ්ව වෙළෙන්දෙකුගේ පුත්‍රයින් දෙදෙනෙකි. ක්‍රි. ව. දෙවන සියවසට අයත් අනුරපුරයෙන් ලැබුණු දෙමළ ගෘහපතියාගේ සෙල්ලිපියෙහි ද මෙය දෙමළ වෙළෙඳුන් සිටි බව සඳහන් වේ. ක්‍රි. ව. හතර වන ශත වර්ෂයේ පමණ සිංහල වෙළෙන්දන් රෙදි පිළි වෙළෙඳාමට භාරුකච්ච වරායට ගිය බවට සාක්ෂ්‍ය ඇත. 10 වන ශත වර්ෂයේ “වලංජියර්” හෙවත් නා නා දේශී නම් ඉන්දියානු වෙළෙඳ සමාගමක ශාඛා ද මෙහි තිබුණු බව සෙල්ලිපිවල සඳහන් වී තිබේ. කෝවිවේ යුගයේ දී වුව ද දකුණු ඉන්දියානුවෝ මෙයි වෙළෙඳ කටයුතු කර ගෙන ගියහ. ගණ දෙවි කෝවිලක් සෑදූ වූ රාමවන්ද්‍රන් නම් වෙළෙන්දෙකු ගැන පරෙවි සන්දේශය කියයි. IV පරාක්‍රමබාහු රජුගේ වෙළෙඳ නැව් පවා ඉන්දියාවට ගිය බව ගිරා සන්දේශයේ සඳහන් වේ.



දකුණු ඉන්දියාව සහ ලංකාව

16.1 රූපය

16.3 දකුණු ඉන්දියාව සමග පැවති සංස්කෘතික සම්බන්ධතා

බ්‍රාහ්මණ ආගමේ ඇතැම් ලක්ෂණ උතුරු ඉන්දියාවෙන් පැමිණි ආර්යයන්ට සහ දකුණු ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩයන්ට පොදු විය. එහෙත් ශිව ඇදහිල්ල මෙරටට ලැබුණේ දකුණු ඉන්දියාවෙනි. ගජබා රජු දවස පත්තිනි ඇදහිලි ක්‍රමය ද මෙහි පැතිර ගියේ ය. අනුරපුර යුගයේ මුල් කාලයේ දී බෞද්ධාගම වැළඳ ගත් ද්‍රවිඩයන් හා ද්‍රවිඩ භික්ෂූන් සිටි බව සෙල් ලිපිවලින් සහ සාහිත්‍යයෙන් පෙනේ. චූලවංශයේ සඳහන් වන පරිදි VI අග්බෝ රජුගේ කාලයේදී උසස් තනතුරු දරූ ද්‍රවිඩයන්ගෙන් සමහරෙක් බෞද්ධාගමට සහයෝගය දක්වූ හ. මහායාන බෞද්ධ ධර්මය මේ රටට ලැබුණේ දකුණු ඉන්දියාවෙනි. නාගර්ජුනීකොණ්ඩා ප්‍රදේශය මහායාන මධ්‍යස්ථානයක් විය.

11 – 12 වන ශත වර්ෂවල දී ද්‍රවිඩයන් විසින් බෞද්ධ ආයතනවලට කරන ලද පරිත්‍යාග පිළිබඳව දෙමළ සෙල්ලිපි ඇත. වෙල්ගම් විහාර සෙල්ලිපිවල රාජ රාජ නම් සොළී රජුගෙන් එම විහාරයට ලැබුණු අනුග්‍රහය මැනවින් පෙනේ. එම විහාරය ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු ව එය රාජ රාජ ත්‍රී පෙරුම්පල්ලි යනුවෙන් හඳුන්වනු ලදී. සොළීන් ශ්‍රී ලංකාවට පැමිණි පසු ශිව ආගම මෙන් ම විෂ්ණු ආගම ද මෙ රටේ පැතිරිණ. පොළොන්නරු යුගයට අයත් ශිව දේවාල සහ විෂ්ණු දේවාල කිහිපයක නටබුන් හමු වී ඇත.

බමුණෝ රාජානුග්‍රහය ලැබූහ. I විජයබාහු ද ඔවුන්ට හොඳින් සලකා තිබිණ. විජයරාජ ඒශ්වරම් නම් ශිව කෝවිලක් මේ රජු විසින් තනවනු ලදී. මේ රජුගේ කාලයේ දී දළදුව ආරක්ෂා කිරීම පවරා තිබුණේ වේදලෙන්කාර භට පිරිසකට ය. මෙයින් පෙනෙන්නේ ද්‍රවිඩයන් වුවත් මොවුන් කෙරෙහි රජතුමාගේ තිබුණු විශ්වාසය සි.

පසු කාලවල දී, ද්‍රවිඩයන් වැඩියෙන් සිටි ප්‍රදේශවල නොව, කෝට්ටෙට ශිව කෝවිලක් ගැනත් කළුතර ගණදෙවි කෝවිලක් ගැනත්, බෙන්තොටට නුදුරින් තිබුණු කාලි කෝවිලක් ගැනත් මාතර අසල කෝවිලක් ගැනත් අසන්නට ලැබේ. බෞද්ධ පන්සල් භූමියේ බොහෝ විට දේවාල තිබීම සුලභ දර්ශනයක් විය. මින් පෙනී යන්නේ සිංහලයන් සහ ද්‍රවිඩයන් අතර සුහද සම්බන්ධයක් තිබුණු බවයි.

දෙමළ සිංහල භාෂා ද එකිනෙකින් පෝෂණය වී ඇත. සංස්කෘති සහ පාලි භාෂාවලින් පමණක් නොව ද්‍රවිඩ භාෂාවෙන් ද සිංහල භාෂාව පෝෂණය විය. සිංහල භාෂාවට ඇතුළු වූ දෙමළ වචන රාශියකි. දස ගමනම් පාලන ඒකකයට කියන "පත්තු" සහ නම් ද්‍රවිඩ භාෂාවෙන් ආ වචනයකි. "මෙකප්පාර්" "උල්පඩු කනක්කාර්" "මේලාවිසි" ආදි දෙමළ වචන සෙල්ලිපිවල පවා ඇත. සිංහල භාෂාවෙන් වචන කිහිපයක් ම දෙමළ භාෂාවට ඇතුළත් වී තිබේ. ගම්වලට යෙදී ඇති නම් විශේෂයෙන් දක්වීමට පුළුවන. "ගම" කාමම් ලෙස ද "ගොඩ" කොඩෙයි ලෙස ද තොට තුරෙයි ලෙස ද "පිටිය" පිඩ්ඩි ලෙස ද දෙමළෙහි වෙනස් වී ඇත. උදාහරණ දක්වන්නේ නම් හුණුගම වුන්නාම් ද වඩුගොඩ වඩුකෝඩෙයි ද උරාතොට ඌරාතුරෙයි ද කුඹුරුපිටිය කුඹුරුවිඩ්ඩි ද වශයෙන් සැකසී ඇත. මීට අමතර ව සිංහල සාහිත්‍යය කෙරෙහි ද දෙමළ භාෂාවේ බලපෑම දක්නට ලැබේ. නුවර යුගයේ ප්‍රශස්ති ගී වල ද දෙමළ වචන තිබේ.

16.4 සාමාජික සම්බන්ධතා

විජය රජුට සහ සත් සියයක් ඔහුගේ පිරිසට භාර්යාවන් ගෙනෙන ලද්දේ දකුණු ඉන්දියාවේ මධුරා පුරයෙනි. දකුණු ඉන්දියාවෙන් භාර්යාවන් ගෙන ඒමේ මේ පුරුද්ද මින් පසුව විවිධ අවස්ථාවල ද දක්නට ලැබිණ. මහාදඨික මහනාග (ක්‍රි. ව. 09–21) රජුගේ එක් බිසවක් වූයේ දමිළදේවි නම් ද්‍රවිඩ කුමාරිකාවකි. වන්ද්‍රමුඛසිව (ක්‍රි. ව. 42–52) රජතුමාගේ එක් බිසවක් ද්‍රවිඩ කාන්තාවක් වූවා ය. මහානාම රජුගේ (ක්‍රි. ව. 410–432) ද්‍රවිඩ බිසවක කුසින් උපන් දරුවා ශ්‍රී ලංකාවේ සොන්ති සේන නම් රජ විය. පොළොන්නරු යුගයේ දී ද, මෙ වැනි විවාහ සම්බන්ධකම් අසන්නට ලැබේ.

විජයබාහු රජුගේ සොහොයුරිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමරකු හා විවාහ වූවා ය. මේ රජුගේ දෙවන බිසව වූයේ ද තිලෝකසුන්දරි නම් කාලිංග කුමාරියකි. පොළොන්නරු යුගයේ දී බටහිර චාලුක්‍ය රටට සිංහල කුමාරියක් යැවූ බවට සාක්ෂ්‍ය තිබේ. ද්‍රවිඩ බිසවවරුන් ගෙන ඒමේ සිරිත මහනුවර රාජධානිය පවතින තෙක් ම දක්නට ලැබිණ. මස්සිනා සමග විවාහ වීම ඔවුන් පැමිණීමෙන් මෙහි පුරුදු වූ සිරිතකි.

16.5 ද්‍රවිඩ ජන සමූහ මෙහි සමාජයට එක්වීම

ඇතැම් සිංහල රජවරු දකුණු ඉන්දියාවෙන් කුලී සේනා ශ්‍රී ලංකාවට ගෙන ආහ. ක්‍රි. ව. පළමු වන සිය වසේ දී ඉලනාග රජතුමා දකුණු ඉන්දියාවෙන් සේනා ගෙනවිත් තමාට අභිමි වූ සිහසුන යළි ලබාගත්තේ ය. 7 වන සිය වසේ දී ද සිංහල රජවරුන් කිහිප දෙනෙක් ම තම රජකම ලබා ගනු පිණිස දකුණු ඉන්දියාවෙන් කුලී භට කණ්ඩායම් ගෙන්වා ගත්හ. සොළී ආක්‍රමණයට රජරට යටත් වූ පසු ව ශ්‍රී ලංකාවේ සිටි ද්‍රවිඩ ජන සංඛ්‍යාව වැඩි වූහ. ආක්‍රමණිකයන් වශයෙන් මෙහි පැමිණි ද්‍රවිඩයන්ගෙන් කොටසක් ද සමාජයට එක් වූහ. එසේ වුව ද ඔවුන් හා සිංහලයන් අතර එ කල අසමගියක් පැවති බවට නම් සාධක නැත. විවාහ සම්බන්ධකම් නිසා මෙ රටට පැමිණියත්, වෙළෙන්දන් හෝ ආක්‍රමණිකයන් වශයෙන් පැමිණියත් මෙහි පැමිණ පදිංචි වූ ද්‍රවිඩ පිරිස් සිය සිරිත් විරිත් දිගට ම පවත්වා ගත්හ.

පාඩමේ ඉහත සඳහන් කරුණු වලින් පෙනී යන්නේ දක්ෂිණ පථය සහ යනුවෙන් හඳුන්වනු ලැබූ ඉන්දියානු ප්‍රදේශය සමග රජරට සමයේ ද ඉන් පසුව ද විවිධ සම්බන්ධතා පවත්වා ගත් බවයි.

සාරාංශය

ඉන්දියාව, ශ්‍රී ලංකාවට ඉතා ආසන්න ව පිහිටා ඇති රටයි. මේ කරුණ නිසා හොඳට ම එරට සමග සම්බන්ධතා පැවතිණ. උතුරු ඉන්දියාව සමග මෙන් ම දකුණු ඉන්දියාව සමග ද ආර්ථික සංස්කෘතික සහ සාමාජික සම්බන්ධතා පවත්වා ගත් බවට සාක්ෂි තිබේ.

ක්‍රියාකාරකම්

1. ඔබ සිටින ප්‍රදේශයේ දෙමළ සිංහල පවුල් නිරීක්ෂණය කරන්න. පෙ මාතෘකා යටතේ ඒවා දක්වන්න.

   සිංහල සිරිත් විරිත් දෙමළ සිරිත් විරිත්

   i ..... i . . ...

   ii .... ii .....

   iii .... iii ... .

   මෙවා කොතරම් සමානදැයි සලකා බලන්න.

2. කෝවිල් සහ පන්සල් සමිහර තැන්වල කිව්ටුව පිහිටා ඇති බව ඔබ දැක තිබේ ද? ඔබ සිටින ප්‍රදේශයේත් එසේ තිබේ ද? පන්සල් භූමිය තුළ දේවාල තිබේ ද? මින් ඔබට සිතා ගත හැකි එනුයේ කුමක් ද?

3. සිංහලෙන් දෙමළ භාෂාවට ගිය වචන සහ දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට ආ වචන ලැයිස්තු දෙකක් පිළියෙල කරන්න.

17

රාජධානී මාරුවීම

පාඩමට සූදානම් වීම

මේ පරිච්ඡේදයේ අඩංගු වන්නේ පොළොන්නරුව කාලිංග මාඝයන අතට පත්වූ පසු රාජධානී නැතිනම් නැතට මාරු වූ ආකාරය විස්තර කිරීමයි. අනුරා රාජධානී විසිවුවා ගත් රජවරුන් විස්තර කිරීම ඇත. එහත යළිත් ප්‍රශ්නාවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. පොළොන්නරුව අල්ලා ගත් කාලිංග රජතුමා කවරෙක් වී ද?
2. දඹදෙණිය රාජධානිය ලෙස පසු කර ගත්තේ කුමර රජතුමා ද?
3. II පරාක්‍රමබාහු බැඳගත් වන්නේ කුමක් නිසා ද?
4. ගම්පොළ යුගයට අයත් ප්‍රසිද්ධ ගොඩ නැගිලි මොනවා ද?
5. ගම්පොළ ආර්ය චක්‍රවර්තිවරුන්ගෙන් ආරක්ෂා කර ගත් ඇමති කෙරෙක් වී ද?
6. කෝට්ටේ යුගයේ බලවත් ම සිවිලේ කිනම් රජතුමා ද?
7. අධ්‍යාපනය සම්බන්ධයෙන් කෝට්ටේ යුගයේ ප්‍රසිද්ධ වූ ආයතන මොනවා ද?
8. විජයබා කොල්ලය කුමක් ද?
9. ඉන් පසුව ඇති වූ රාජ්‍ය තුන කවරේ ද?
10. සෙන්කඩගල රාජධානිය පිහිටුවා ගන්නා ලද්දේ කවුරුන් විසින් ද?

වාග්මාලාව

දඹදෙණි — කතිකාවත, කව්සිළුමිණ, වන්නිකරය, ආර්යචක්‍රවර්තිවරු, මුල්ලේරියා සටන

17. 1 මුල් රාජධානිය බිඳ වැටීම

අනුරාධපුර සහ පොළොන්නරු රජධානි බිඳ වැටුණු ආකාරය ඔබට කලින් පරිච්ඡේදයේ දී කියවන්නට ලැබුණි. ඒවා අත්හැර සෑමෙන් පසු සිංහල රජවරුන් විසින් රාජධානි පිහිටුවා ගනු ලැබුයේ දඹදෙණිය, කුරුණෑගල, යාපහුව ආදී ප්‍රදේශවලය. මෙසේ රාජධානි මාරු කිරීමට හේතු කිහිපයක් විය. මාඝයාගේ ආක්‍රමණය සහ රජ රට ඔහු සතු වීම ඊට මූලික හේතුවයි. රාජ අනුග්‍රහය නොලැබ වැව් අමුණු ආදිය විනාශ වී ගිය නිසා මිනිසුන්ට තම ජීවනෝපාය සලසා ගැනීමට අපහසු වූයෙන් ඔවුහු ද රජරට අත්හැර දමා නිරිතට ඇදෙන්නට වූ හ.

17.2 දඹදෙණි රාජධානිය

III විජයබාහු රජතුමා (1232–36) නම් අගනුවර දඹදෙණිය ලෙස තෝරා ගත්තේ ය. ඔහුගේ රාජ්‍යය මායා රටටත් රුහුණු රටේ සුළු ප්‍රදේශයකටත් සීමා විය. ඔහු මෙසේ මුල් වරට නිරිත දිග ප්‍රදේශයේ රාජ්‍යයක් පිහිටුවා ගත්තේ ය. මේ කල පොළොන්නරුව පාලනය කළේ මාඝ නම් වූ කාලිංග ජාතිකයෙකි.

III විජයබාහුගෙන් පසු ඔහුගේ වැඩිමහල් පුත් II පරාක්‍රමබාහු (1236–70) දඹදෙණියේ රජු බවට පත් විය. මොහු දඹදෙණි රාජධානියේ වැදගත් ම රජතුමා විය. අවුරුදු තිස් හතරක කාලයක් තුළ පාලනය මෙහෙය වූ ඔහුගේ රාජ සමය තුළ දී මෙලේ ජාතික වන්ද්‍රභානු නම් රජ දෙවරක් ම ශ්‍රී ලංකාව ආක්‍රමණය කෙළේ ය. එහෙත් මේ ආක්‍රමණය සාර්ථක නොවී ය. මාඝ පොළොන්නරුවෙන් පළවා හැර රජ රට ප්‍රදේශය යළි අල්ලා ගත්තේ ද මේ කාලයේ දී බව පෙනේ. ආගමික කටයුතුවලට ද සාහිත්‍ය දියුණුවට ද ඔහුගෙන් වූ සේවය විශාල ය. අත්තනගල්ල වැනි ස්ථාන කිහිපයක ඔහු විසින් ආගමික ගොඩනැගිලි ඉදි කරන ලදි. II පරාක්‍රමබාහු රජුට ආගමික කටයුතු වල දී දේවපතිරාජ නම් ඇමතිගේ ද සහයෝග ලැබිණ. දඹදෙණි කතිකාවත ලියැවුණේ ද මේ යුගයේ ය.

සහජ කවියකු සහ බහුශ්‍රැත පඬිවරයකු වූ මේ රජතුමා කව්සිළුමිණ කළහ යි විශ්වාස කැරේ. ඔහු කලිකාල සර්වඥ පණ්ඩිත සන උපාධි නාමයෙන් ද හඳුන්වනු ලැබේ. මීට අමතර ව පූජාවලිය ආදී සාහිත්‍ය පොත් ලියැවුනේ ද මේ යුගයේ ය.

17.3 යාපහුව සහ කුරුණෑගල රාජධානි

දඹදෙණිය අත්හැර දමුවාට පසු ව ශ්‍රී ලංකාවේ රාජධානිය බවට පත් වූයේ යාපහුවයි. යාපහුව රාජධානිය කර ගත්තේ II පරාක්‍රමබාහු රජුගේ පුතකු වූ I බුවනෙකබාහු රජු ය. ඊ ලඟට II බුවනෙකබාහු විසින් තම රාජධානිය ලෙස තෝරා ගන්නා ලද්දේ කුරුණෑගල හෙවත් ඇතුගල් පුරයයි.

17.4 ගම්පළ රාජධානිය

කුරුණෑගල සිට පාලන කේන්ද්‍රස්ථානය මාරු වූයේ ගම්පොළටයි. ගම්පොළ ආරම්භක රජු ලෙස සලකනු ලබන්නේ IV බුවනෙකබාහු රජු ය. ගඩලාදෙනි විහාරය ලංකාතිලක විහාරය සහ ඇම්බැක්කේ දේවාලය ද ගම්පොළ යුගයේ දී සාදන ලද ගොඩනැගිලි වේ.

ගම්පළ යුගයේ දී සිදුවූ තවත් වැදගත් සිද්ධියක් ලෙස සැලකිය හැක්කේ යාපනේ රාජ්‍යයේ බලය අල්ලා ගෙන සිටි ආර්ය චක්‍රවර්තිවරුන්ගෙන් එල්ල වූ තර්ජනය යි. නොවුන් මෙල්ල කරන ලද්දේ එවකට සිටි ගම්පළ රජුගේ ඇමතිවරයෙකු වූ කේරළ ජාතික නිශ්ශංක අලගක්කෝනාර විසිනි. සිංහලයකු නොවූවත් මොහුගෙන් ඉටු වූ සේවය ඉමහති. මොහු ආර්ය චක්‍රවර්තිවරුන්ගෙන් ගම්පොළ ආරක්ෂා කර ගත්තා පමණක් නොව කෝට්ටේ රාජ්‍යය පියවුවීමට අඩිතාලම ද දැමුයේ ය. නිශ්ශංක අලගක්කෝනාර සිය කටයුතුවල සෙවුනේ රසිගම් සිට ය.

17.5 කෝට්ටේ රාජධානිය

ගම්පොළ රාජධානිය බිඳ වැටුණු පසු කෝට්ටේ හෙවත් ජයවර්ධනපුරයට පාලන කේන්ද්‍රස්ථානය ගෙන යන ලදි. මෙහි මුදලින් ම රජු ලෙස සලකනු ලබන්නේ IV වන පරාක්‍රමබාහු රජතුමා ය. ඔහු අවසානා වරට ශ්‍රී ලංකාව එක් සේසත් කළේ ය. අඹුළුගල කුමාරයා සමා නාන්දු උඩරට රාජ්‍යය ද සපුමල් කුමාරයා සමා වන්නිකරය (වන්නි නායකයන් සිටතේ පාලනය වූ ප්‍රදේශ) සහ යාපනය රාජ්‍යය ද සටත් කර ගැනීමට හේ සමත් විය.

IV පරාක්‍රමබාහුගේ රාජ්‍ය කාලය ශ්‍රී ලංකා ඉතිහාසයේ සුවර්ණමය යුගයක් ලෙස සැලකීමට පුළුවන. මේ අවධියේ දී වෙළඳාම දියුණු වීම රට සමෘද්ධිමත් වූවා පමණක් නොව සංස්කෘතික අංශයේ ද පිබිදීමක් ඇති විය. නොටගමුවේ විජයබා පිරිවෙණ, කැරගල පද්මාවති පිරිවෙණ සහ පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙණ ආදී අධ්‍යාපන ආයතන කිහිපයක් ම පැවතියේ ය.

මේ යුගයේ දී විවිධ විෂයයන් සිටතේ සිංහල, පාලි, සංස්කෘත යන භාෂාවලින් ලියැවුණු සාහිත්‍ය කෘතීන් රාශියක් බිහිවිය. ගිරා, සැලලිහිණි වැනි සංදේශ කාව්‍ය රාශියක් ම මේ යුගයේ දී ලියන ලද ඒවා ය. විදගම මෛත්‍රිය මාහිමියන් සහ තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් වැනි විද්වත් මාහිමිවරු මේ යුගය ආලෝකවත් කළ හ.

IV පරාක්‍රමබාහු රජතුමා මිය යෑමත් සමග ම කෝට්ටේ පිරිහීම ද ආරම්භ විය. මොහුගෙන් පසු ව සපුමල් කුමාරයා IV බුවනෙකබාහු නමින් රජ වුව ද කෝට්ටේ රාජ්‍යයේ බල පරාක්‍රමය පවත්වා ගැනීමට ඔහුට ශක්තියක් නොවී ය. කන්ද උඩරට රාජ්‍යයක්, යාපනය රාජ්‍යයක් නැමතත් ස්වාධීන විය.



රාජධානි මාරුවීම

17.1 රූපය

17.9 සෙන්කඩගල හෙවත් මහනුවර රාජධානිය

මේ කාලයේ දී සේනාසම්මත වික්‍රමබාහු නම් කුමරෙක් සෙන්කඩගල රාජ්‍යය සිය රාජධානිය කර ගත්තේ ය. පසු කාලයේ දී මේ රාජ්‍යයේ දක්ෂ රජවරුන් කිහිප දෙනකු ම බිහිවූයෙන් 1815, දක්වා ම බටහිර ජාතීන්ට යටත් නො වී මහනුවර රාජ්‍යය ස්වාධීන රාජ්‍යයක් සේ පැවතියේ ය.

17.7 කෝට්ටේ පිරිහීම

IV පරාක්‍රමබාහුගෙන් පසු ව කෝට්ටේ පිරිහුණ බව අපි කලින් කිවෙමු. 1521 දී සිදු වූ "විජයබා කොල්ලය" නමින් හැඳින්වෙන කුමන්ත්‍රණයක් නිසා කෝට්ටේ රාජ්‍යය එ කල පාලනය කළ VI විජයබාහු රජුගේ පුත්‍රයන් තිදෙනා අතර රාජ්‍ය තුනක් ලෙස බෙදී ගියේ ය. කෝට්ටේ, රයිගම සහ සීතාවක ඒ රාජ්‍ය තුනයි. VI විජයබාහු රජුගේ දෙවු පුත් VII වුවනෙකබාහු කෝට්ටේ රජ වූ අතර දෙවන පුත් රයිගම් බණ්ඩාර රයිගම ද, බාල ම පුත්‍රයා වූ මායාදුන්නේ සීතාවක ද රජ වූ හ.

17.8 සීතාවක නැගීම හා පිරිහීම

නොබෝ කලකින් රයිගම් බණ්ඩාර මිය ගියෙන් රයිගම සීතාවකට ඇදා ගන්නා ලදී. මායාදුන්නේ සහ ඔහුගෙන් පසු රජ වූ I රාජසිංහ රජු යටතේ සීතාවක බලවත් විය. මහනුවර රාජ්‍යය පවා සීතාවකට අයත් වූ අවස්ථාවක් තිබුණි. 1505 දී මෙරටට පැමිණි කොළඹ පැළපදියම් වී සිටි පෘතුගීසීන්ට විරුද්ධ ව මායාදුන්නේ සහ රාජසිංහ සටන් වැදුනාහ. රාජසිංහ අතින් පෘතුගීසිහු කිහිප වරක් ම පරාජය වූ හ. මෙ වැනි අවස්ථාවකට කදිම නිදසුනකි මුල්ලේරියා සටන. රාජසිංහ රජුගේ මරණින් පසු ව සීතාවක රාජ්‍යය අභාවයට පත් විය.

17.9 යාපනේ රාජ්‍යය

13 වන සිය වසේ සිට යාපනේ ආර්ය චක්‍රවර්ති වරු දකුණේ සිංහල රජවරුන්ගේ ආධිපත්‍යය ප්‍රතික්ෂේප කළහ. VI පරාක්‍රමබාහු රජතුමා ඔවුන් යටත් කර ගෙන සිටියත් ඔහුගේ මරණින් පසු යාපනේ නැවතත් ආර්ය චක්‍රවර්තිවරුන් විසින් බලහත්කාරකමින් පාලනය කරන ලදී. පෘතුගීසීන් පැමිණි කාලයේ දී මෙහි පාලකයා ලෙස සිටියේ පරරාජසේකරම් නම් වූවෙකි. මොහු පළවා හැර යාපනය අල්ලා ගත් ඉංගිරි නම් කුමාරයෙකු පෘතුගීසීන්ට විරුද්ධ වූ නිසා පෘතුගීසිහු 1619 දී ඔහු නෙරපා යාපනය රාජ්‍යය අල්ලා ගත් හ.

සාරාංශය

හේතු කිහිපයක් ම නිසා අනුරාධපුර සහ පොළොන්නරු රාජධානි පිරිහී ගියේ ය. ඉන් පසු ව පාලන කේන්ද්‍රස්ථානය පොළොන්නරුවෙන් දකුණු දෙසටත් අවසානයේ නිරිතටත් මාරු විය. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පළ, කෝට්ටේ සහ ස්ථානවල රාජධානි පිහිටවනු ලැබිණ. මේ රාජධානිවල වැඟත් රජවරු කිහිප දෙනෙක් රජ කළ හ. 16 වන සිය වස වන විට කෝට්ටේ මහනුවර සහ යාපනය වශයෙන් රාජ්‍ය තුනක් පැවතියේ ය.

ක්‍රියාකාරකම්

1. ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමක් ගෙන පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.

i. දඹදෙණිය	vi. මහනුවර
ii. යාපහුව	vii. යාපනය
iii. කුරුණෑගල	viii. රයිගම
iv. ගම්පළ	ix. සීතාවක
v. කෝට්ටේ	

2. ශ්‍රී ලංකාවේ රාජධානි ලෙස පැවති ස්ථාන ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

3. පහත සඳහන් රජවරුන් අයත් වන්නේ කිනම රාජධානියකට ද?

i. දේවානම් පියතිස්ස .....

ii. නිශ්ශංකමල්ල.....

iii. මහසෙන් .....

iv. II පරාක්‍රමබාහු.....

v. VI පරාක්‍රමබාහු..... ....

vi. I විජයබාහු ....

vii. V මිහිඳු ....

viii. I රාජසිංහ.. ....

ix. පරරාජසේකරම්.. .....

x. I පරාක්‍රමබාහු ....

xi. සේනාසම්මත වික්‍රමබාහු..... .....

xii. VI විජයබාහු .....

4. ඔබ සිටින ප්‍රදේශයේ පැරණි සිද්ධස්ථාන කිහිපයක් නම්, ඒවා පිළිබඳ ව ගුරුතුමාගේ ද සහාය ඇතිව සාකච්ඡා කරන්න.

5. මේ පොත් ලියැවී ඇත්තේ කුමන යුගවල ද?

i. කව්සිළුමිණ ii. පූජාවලිය

ii. සැළලිහිණි සංදේශය

6. මෙ අය වැදගත් වන්නේ කවර හේතුවක් නිසා ද?

i. දේවපතිරාජ

ii. නිශ්ශංක අලගක්කෝනාර

iii. IV විජයබාහු

iv. තොටගමුවේ ශ්‍රී රාහුල

18

බටහිර ජාතීන්ගේ පාලනය

පාඩමට සූදානම් වීම

මෙහි පහත දැක්වෙන ප්‍රශ්නවලට උත්තර සොයමින් පාඩම කියවන්න. එය ඔබට පාඩම ඉගෙනීමට බෙහෙවින් උපකාර වනු ඇත.

ප්‍රශ්න

1. **පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාව රාජ්‍ය කීයකට බෙදී තිබුනේ ද?**
2. **ඉන් ප්‍රධාන රාජ්‍යය වූයේ කුමක් ද?**
3. **පෘතුගීසීන් පැමිණෙන විට මෙ රට වෙළෙඳාමේ යෙදී සිටියේ කවරහු ද?**
4. **පෘතුගීසීන්ගෙන් අපට ලැබුණු ප්‍රධාන දායාද කවරේ ද?**
5. **ඕ. ඕ. සී. යනුවෙන් හැඳින් වූයේ කුමන සමාගමක් ද?**
6. **වර්ෂ 1638 දී ලන්දේසීන් සමග ගිවිසුමක් ඇති කර ගත් රජ කවරෙක් ද?**
7. **ලන්දේසීන්ගෙන් අප ලත් වැදගත් ම දායාදය කුමක් ද**
8. **ශ්‍රී ලංකාව ඉංග්‍රීසීන් රජයේ පාලනය යටතට පත්වූයේ කවදා ද?**
9. **ඉංග්‍රීසීන් උඩරට යටත් කර ගන්නට සිතුයේ කවර හේතු නිසා ද?**
10. **සිංහලයන් මෙහෙය වූ ඉංග්‍රීසි විරෝධී සටන් කවරේ ද?**

වාංමාලාව

පෙරදිග වෙළෙඳාම, වෙළෙඳ හාණ්ඩ, කුළු බඩු, රෝම ලන්දේසි නීතිය, උඩරට රාජ්‍යය, දිසාව, කෝරළය, පත්තුව, කැරැල්ල.

18.1 පෘතුගීසි පාලනය

දහ සය වන සිය වස ආරම්භ වන විට අප රට ප්‍රධාන රාජ්‍ය තුනකට බෙදී පැවති බව ඔබට පසු ගිය පාඩමේ දී කියවන්නට ලැබිණි. මෙයින් මුල් තැන ගෙන තිබුණේ කෝට්ටේ රාජ්‍යය බව දන් ඔබ දන්නෙහි ය. මේ වන විට යුරෝපයේ ඇති වූ යම් යම් සිදු වීම් නිසා යුරෝපිය ජාතීන්ගේ සැලකිල්ල පෙර දිගට යොමු වන්නට පටන් ගත්තේ ය.

ගොඩ බිම් මාර්ග ඔස්සේ පෙර දිග සමග ගෙන ගිය වෙළෙඳ කටයුතු ඔවුන්ට තව දුරටත් කර ගෙන යෑමට අපහසු විය. එයට හේතුව වූයේ ඒ ගමන් මාර්ගයේ වැදගත් ම ස්ථානයක් වූ කොන්ස්තන්තිනෝපලය යුරෝපියයන් සමග සටන් වැදුණු තුර්කීන් අතට පත් වීමෙන් ඒ ගමන් මාර්ගය වැසී යෑම ය. එ නිසා ඒ වෙළෙඳාම දිගට ම ගෙන යෑමට යුරෝපිය ජාතිකයෝ පෙර දිගට පිවිසෙන මුහුදු මාර්ගයක් සොයා ගත්හ. මේ මුහුදු මාර්ගය සොයා ගන්නා ලද්දේ පෘතුගීසීන් විසිනි.

මොවුන් පළමුවෙන් ම පැමිණියේ ඉන්දියාවට ය. වරක් ඉන්දියාව බලා පිටත් වූ හැවි කණ්ඩායමක් කුණාටුවකට අසු වී ශ්‍රී ලංකා වෙරළට ගසා ගෙන ආවේ ය. මෙ සේ ක්‍රි. ව. 1505 දී පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණියේ අහම්බෙනි. එ කල කුරුඳු, ගම්මිරිස්, සාදික්කා ආදි කුළු බඩු ද, ඇත් දත් මුතු මැණික් ආදි වෙනත් විවිධ වෙළෙඳ හාණ්ඩ ද නිපදවන රටක් හැටියට අපේ රට ප්‍රසිද්ධියට පත් වී තිබිණි. ඒ වන විට මෙ රට වෙළෙඳ කටයුතුවල යෙදී සිටියේ මුස්ලිම් ජාතික වෙළෙඳුන් ය. ඔවුන්ගෙන් මෙම වෙළෙඳාම උදුරා ගැනීමට මාන බලමින් සිටි පෘතුගීසීන්ට අහම්බෙන් ම අප රටට පැමිණෙන්නට ලැබීම මහත් සතුටට කරුණක් විය. එහෙත් වෙළෙඳාම අයිති කර ගෙන සිටි මුස්ලිම් වෙළෙන්දෝ පෘතුගීසීන්ගේ පැමිණීම ගැන කොහෙත් ම සතුටු නො වූ හ.



පෘතුගීසීන්ගේ පෙරදිග ගමන් මාර්ගය

18.1 රූපය

කෝට්ටේ රජු සමඟ ඇතිවූ සාකච්ඡාවකින් පසු පෘතුගීසීන්ට මේ රට වෙළෙඳාම් කිරීමේ අවසරය ලැබිණි. ඒ වෙළඳාවට සුදුසු අප වෙරළ වීදේශීය සතුරන්ගෙන් ආරක්ෂා කර දීමට කෝට්ටේ රජුට පෘතුගීසීන් ශ්‍රී ලංකාවේ කොටසුතු වලට පදිංචිවන් සම්බන්ධ වූයේ මේ අයුරිනි.

මුල දී රට අතුලා හැකිලෙමි අදහසෙන් පෘතුගීසීන් තුළ පොළඹවා ය. දුර්වල සිංහල රජය කොට්ටේ රාජ්‍යය ඒවා දී සිදු දී විජයබාහු කොලඹෙහෙ පළි ගැනීමටද, සිතාවක හා

රසිඟම් යනුවෙන් ඉතිහාස තුනකට බෙදී සැමෙන් පෘතුගීසීන්ට අප රටේ දේශපාලන තුවසුතු වලට මැදිහත් වීමට අවස්ථාව ලැබුණි. මේ රාජ්‍ය තුන අතර අරඟලවල දී කෝට්ටේ පාලකයා පෘතුගීසීන්ගේ පිහිට පැතුවේ ය. අවිස්ථාවෙන් ප්‍රයෝජන ගත් පෘතුගීසීහු ක්‍රමයෙන් සිය බලය තහවුරු කර ගත්තේ ය.

කෝට්ටේ රජ කළ VII වන බුවනෙකබාහු රජුගේ මුණුබුරු කතෝලික ආගම වැළඳ ගෙන සිය නාමය ධර්මපාල කුමරු කෝට්ටේ රජ වීම වෙනුවට මහරජ මාසියන් විය. ඔහුට උපහාර

කිරීමට අවශ්‍යවම ලැබුණ හෙයිනි. මේ වන විට රසිඟම් ද සිතාවකට ඇදී ගොස් එහි රජ කළ මායාදුන්නේ හා පළමුවන රාජසිංහ යන පිය පුතු දෙදෙනාගේ මරණින් පසු සිතාවක ද කෝට්ටේ රාජ්‍යයට අයත් වී තිබිණි. ධර්මපාල රජතුමා තැඟි ඔප්පුවකින් තම රාජ්‍යය පෘතුගීසීන්ට ලියා දී තිබුණෙන් 1597 දී ඔහුගේ මරණින් පසු කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන්ට අයත් විය. මින් අනතුරුව යාපනය රාජ්‍යය ද තම පාලනය යටතට ගත් පෘතුගීසීහු කෝට්ටේ හා යාපනය රාජ්‍යවල පාලකයෝ වූ හ.

කන්ද උඩරට රාජ්‍යය ස්වාධීනව පැවතිණ. කෝට්ටේ රාජ්‍යයේ රජවරු මෙන් ම උඩරට රාජ්‍යයේ රජවරු ද සිතාවක රාජ්‍යය සමඟ කළ සටන්වල දී පෘතුගීසීන්ගේ ආධාරය පැතූ හ. උඩරට රජකමට පත් ව සිටි කරලියැද්දේ සිය දියණිය හා බෑණනුවන් සමඟ ආරක්ෂාව පතා පෘතුගීසීන් වෙත ගියේ .ය දියණිය සහ බෑණනුවන් කතෝලික ආගම වැළඳ ගත් පසු මේ දෙදෙනා දෝන කැතරිනා හා දොන් පිලිප් නමින් ප්‍රසිද්ධ වූ හ. කතෝලිකයකු උඩරට රජ කරමා එහි තම බලය තහවුරු කර ගැනීමට පෘතුගීසීහු උත්සාහ කළ හ. මේ වැයම අසාර්ථක විය. උඩරට සිහසුන පිළිබඳ අරඟලය අවසන් වූයේ අවුස්ත්‍රියාවේ දොන් ජුවන් නමින් හැඳින්වුණු කොනප්පු බණ්ඩාර උඩරට රජකම අල්ලා ගැනීමෙනි. හෙතෙම විමලධර්මසූරිය නමින් රජ වී, රජකමට උරුමක්කාරිය වූ දෝන කැතරිනා හෙවත් කුසුමාසන දේවිය සිය බිසව කර ගෙන රජකම තහවුරු කර ගත්තේ ය. මේ විට පෘතුගීසීන් කන්ද උඩරට යටත් කර ගැනීමට තුන් වරක් ම උත්සාහ කර ඇත. එම ප්‍රයත්න සියල්ල ම අසාර්ථක විණි.

පෘතුගීසීහු තමන් අත් කර ගත් කෝට්ටේ හා යාපනය රාජ්‍ය දෙක එකිනෙකකින් වෙන් ව පාලනය කළ හ. මේ ප්‍රදේශ පැරණි නීති හා චාරිත්‍ර අනු ව පාලනය කිරීමට තීරණය විය. කෝට්ටේ රාජ්‍යය දිසා හතරකට ද එක් එක් දිසාවක් කෝරළවලට ද කෝරළයක් පත්තුවලට ද බෙදුණි. පත්තුවක් ගම දහයක් එක් වී සෑදුණි.

18.1.1 පෘතුගීසීන් ගේ පාලනයේ බලපෑම

කතෝලික ආගම මෙරට ප්‍රචාරය වීම අප සංස්කෘතිය කෙරෙහි පෘතුගීසීන්ගෙන් ඇති වූ ප්‍රධාන ම බලපෑම ය. විවිධ මිෂනාරි සුජකවරු පැමිණ කෝට්ටේ හා යාපනය රාජ්‍යවල මහත් උද්යෝගයකින් කටයුතු කළ නිසා බර්මපාල රජු සහ රජ මාලිගයේ ප්‍රාණ පිරිස කතෝලික ආගම වැළඳ ගැනීම කෝට්ටේ රාජ්‍යයේ කතෝලික ආගම පැතිර වීමට මහත් රුකුලක් විය. කතෝලික ආගම නියා පෘතුගීසි සංස්කෘතියේ ඇතැම් ලක්ෂණ අප රටට ලැබුණි. බයිලා සංගීතය, සාය, කලිසම්, කබා කුරුන්තු යන ඇඳුම්, පස් තැල, අච්චාරු වැනි කෑම වර්ග, කෝප්ප, පිරිසි වැනි වචන, පෙරේරා, සිල්වා, ප්‍රනාන්දු යන නම් අප රට පෘතුගීසි පාලනයට යටත් ව පැවති බව සිහි ගන්වයි.

18.2 ලන්දේසි පාලනය

පෘතුගීසීන්ට පසු ව පෙර දිගට පැමිණි යුරෝපීය ජාතිය ලන්දේසීන් ය. පෙරදිග වෙළෙඳාම සඳහා ඔවුහු ලන්දේසි පෙරදිග වෙළෙඳ සමාගම (වී. ඕ. සී) පිහිටුවා ගත් හ. එ ටගින් පෘතුගීසීන් සතුව පැවති වෙළෙඳ කටයුතු තමන් අතට ගැනීමට පියවර ගත් හ. ඔවුන්ගේ ප්‍රධාන පරමාර්ථය වූයේ අඩු ම වියදමින් වැඩි ම ලාභ ලබා ගැනීම ය. මේ නිසා යුද්ධ වලට පැටලීමෙන් වැළකී, පාලකයන් සමඟ සුහද සබඳතා මඟින් තම අදහස් ඉටු කර ගැනීමට මාන බැලූ හ.

ලන්දේසීන් පළමු වරට ලංකාවට පැමිණියේ 1602 දී ය. එම කාලයේ සිට කන්ද උඩරට රජවරු ලන්දේසීන් සමඟ සම්බන්ධතා ඇති කර ගැනීමට උත්සාහ දැරූ හ. 1638 දී ලන්දේසීන් හා 11 වන රාජසිංහ රජු අතර ගිවිසුමක් ඇති විය. ඒ අනුව අල්ලා ගත් බලකොටු ආපසු රජුට බාර දීමට ලන්දේසීහු පොරොන්දු වූ හ. 11 වන රාජසිංහ රජ ද ලන්දේසීන්ගේ ආධාර පැතුවේ පෘතුගීසීන් අල්ලා ගෙන සිටි බලකොටු ඔවුන්ගෙන් වුදු ගැනීමට ය. එහෙත් අල්ලා ගත් බලකොටු රජුට නො දීමට ලන්දේසීහු උපක්‍රම යෙදූ හ. ලන්දේසීන් ලංකාවේ ප්‍රදේශ



ලන්දේසින් යටතුව පැවති ප්‍රදේශ

18.2 රූපය

අත් කර ගැනීම පටන් ගත්තේ මේ අයුරිනි. මේ නිසා ම ලන්දේසින් හා උඩරට රජු අතර නිතර නිතර ආරවුල් ඇති විය. අඩු ම වියදමින් වැඩි ම ලාභ ලැබීමේ අරමුණ, සටන්වලට සම්බන්ධ වීමෙන් කඩා කප්පල් වන බව දත් ඔවුහු රජු සමග හැකි තාක් දුරට සුහද සම්බන්ධතා පැවැත්වීමට උත්සාහ කළහ.

උඩරට සමග සහයෝගයෙන් කටයුතු කරන විට වෙළෙඳ භාණ්ඩ ලබා ගැනීම ද පහසු විය. එවිට ලාභ ලබා ගැනීමට ද හැකි විය. එසේ වුවත් නායක්කාර් රජවරු උඩරට සිහසුනට පත් වූ විට එම ලාභය තමන් අතට ගැනීමට සිතූ හ. එ නිසා රජු හා ලන්දේසින් අතර පැවති සුහදතාව බිඳ වැටුණි. එවිට කන්ද උඩරට රජවරු ඉංග්‍රීසීන්ගේ සහාය ලබා ගැනීමට උත්සාහ කළ හ. මේ නිසා ඉංග්‍රීසීන්ට ශ්‍රී ලංකාවේ කටයුතුවලට මැදිහත් වීමට අවස්ථාව සැලසුණි. මෙයින් තම බලාපොරොත්තු සුන් වී යනැයි සිතූ ලන්දේසිහු උඩරට ආක්‍රමණය කළ හ. එය අසාර්ථක විය. එහෙත් 1766 දී ඇති කර ගත් ගිවිසුමකින් දිවයිනේ වුහුදුබඩ බිම් තීරුව ලන්දේසීන්ට දීමටත්, වෙනත් විදේශීය වෙළෙඳුන් සමග වෙළෙඳුම් නො කිරීමටත්, උඩරට කුරුඳු ලන්දේසීන්ට විකිණීමටත් රජතුමා පොරොන්දු විය. ඒ වෙනුවට උඩරට රාජ්‍යය විදේශිකයන්ගෙන් ආරක්ෂා කර දීමට ලන්දේසිහු පොරොන්දු වූ හ. එම ගිවිසුමෙන් තමන්ට අමාසි සිදු වී ඇති බව වටහා ගත් උඩරට පාලකයෝ වරින් වර ලන්දේසීන්ට එරෙහි ව කටයුතු කළ හ. මේ නිසා ලන්දේසීන්ට ශ්‍රී ලංකාවේ දී නොයෙකුත් ගිරිහැරවලට මුහුණ දෙන්නට සිදු විය. එසේ නිබිඝ දී ඒ කාලයේ වඩා බලවත් ව සිටි ඉංග්‍රීසීන්ගෙන් ඔවුන්ට තර්ජන එල්ල විය. මෙවැනි කරුණු නිසා ලන්දේසි බලය පිරිහිණි. 1796 දී ලන්දේසීන් හා ඉංග්‍රීසීන් අතර ඇති කර ගත් ගිවිසුම අනු ව ලන්දේසීන් සතුව තිබූ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත් කර ගැනීමට ඉංග්‍රීසිහු සමත් වූහ.

18.2.1 ලන්දේසි පාලනයේ බලපෑම

පෘතුගීසි පාලන සමයේ දී මෙන් ම ලන්දේසි පාලන සමයේ දී ද අප රටේ පාලනය හා සංස්කෘතිය කෙරෙහි යම් යම් බලපෑම් ඇති විය. ලන්දේසිහු තමන් සටහේ පැවති ප්‍රදේශ ක්‍රමවත් ලෙස පාලනය කිරීමට උත්සාහ දැරූහ. පහත රට ප්‍රදේශ කොළඹ, ගාල්ල යාපනය යන කොටස් තුනකට බෙදනු ලැබී ය. මේවා කොමාන්ඩරි හෙවත් විධානාංශ නමින් හැඳින් වුණි. එහි පාලකයා විධානාධිපති විය. මේවා දිසාවලට ද දිසා කෝරළවලට ද කෝරළ පත්තුවලට ද පත්තු ගම්වලට ද බෙදන ලදී.

ලන්දේසින් රෝම ලන්දේසි නීතිය පදනම් කර ගත් නීති මාලාවක් සකස් කර, තමන් පාලනය කළ ප්‍රදේශ තුළ නීතිය හා සාමය රැකීමට මනා උසාවි ක්‍රමයක් පිහිටුවා ගත් හ.

මොවුහු වෙළඳම් ඇන සැලෑතිද්දීන් වූ හ. ඔවුන්ට අවශ්‍ය වූ කුරුඳු, ගම්මිරිස් ආදී වෙළෙඳ බෝග වගා කිරීමට කටයුතු කළ හ. අප රටේ අපනයන බෝග වගාව මුල් වරට සැලේ ලන්දේසින් බව ඔබට දන් පෙනී යනු ඇත.

රෙපරමාදු ක්‍රිස්තියානි ධර්මය මේ රට පැතිර යාම ලන්දේසි පාලනයේ තවත් ප්‍රතිඵලයකි. ඔවුහු ජනතාව ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීමට අධ්‍යාපනය උදවු කර ගත් හ. මේ සඳහා පාසල් පිහිටු වූ හ. මේ හැර ඔවුන්ගේ ගෘහ නිර්මාණ ශිල්පය හා ගෘහ භාණ්ඩ සැදීමේ ක්‍රමයක් ද අප රටට අලුතින් එක් විය. පොත් පළ කිරීමට මුද්‍රණ යන්ත්‍රයක් පිහිටුවීම ද ඔවුන්ගෙන් සිදු වූ සේවයකි. ලන්දේසි වචන ද සිංහල භාෂාවට එක් විය. අද්මාපල්, කොකිස්, බ්‍රැදර් වැනි කැටවිල නම් ද, නොතාරිස්, සෙක්‍රතාරිස් වැනි තානාතුරු නම් ද ලන්දේසි පාලනය නිසා සිංහල භාෂාවට එක් වූ වචන ය.

18.3 ඉංග්‍රීසිහු මුල් දිවයින ම යටත් කර ගැනීම

ලන්දේසීන්ගෙන් මුහුදුබඩ ප්‍රදේශ අත් කර ගන්නා ලද්දේ 1796 දී බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම විසිනි. මුල දී මෙම ප්‍රදේශ සමාගම විසින් පාලනය කළ ද පසු ව පැන නැඟි ප්‍රශ්න නිසා 1802 දී එම ප්‍රදේශ බ්‍රිතාන්‍ය රජයේ පාලනය යටතට පත් විය. ඒ අනුව ආණ්ඩුකාරයකු මගින් රට පාලනය කරන ලදී. මොහුට උපදේශන මණ්ඩලයක් ද විය.

මුල දී බ්‍රිතාන්‍ය පාලනය මුහුදුබඩ පළාත් වලට සීමා විය. රට මැද ස්වාධීන රාජ්‍යයක් තිබීම ඔවුන්ගේ පාලනයට අහිතකර වූ නිසා තම පාලනය තහවුරු කර ගැනීමට උඩරට ප්‍රදේශ යටත් කර ගැනීම බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය විය. වැදගත් වරායක් වූ ත්‍රිකුණාමලයට කොළඹ සම්බන්ධ කරමින් උඩරට හරහා මාර්ගයක් තැන වීම ද ඔවුන්ගේ තවත් අරමුණක් විණි. මේ අරමුණ ඉටු කර ගැනීම සඳහා ඔවුන් උඩරට ආක්‍රමණය කළ ද 1802 දී මොවුන්ගේ මුල් ප්‍රයත්නය අසාර්ථක විය. ඒ ලග ප්‍රයත්නය සාර්ථක වූයේ උඩරට ඇතැම් රදළවරුන්ගේ සහාය බ්‍රිතාන්‍යයන්ට ලැබුණ නිසා ය. මෙලෙස 1815 දී මුළු රටම බ්‍රිතාන්‍ය පාලනයට යටත් විය. පසුව වරින් වර වෙල්ලස්සේ කැරැල්ල, මාතලේ කැරැල්ල වැනි බ්‍රිතාන්‍ය විරෝධී සටන් වූ සිංහලයන් විසින් ගෙන යන ලදී. පසු ව උඩරට හා පහත රට යා කර එකම පාලන ක්‍රමයක් යටතට පත් කරන ලදී.

අනෙකුත් විදේශීය පාලන යුගවල දී මෙන් ම බ්‍රිතාන්‍ය පාලනයෙන් ද අප රට කෙරෙහි නොයෙකුත් බලපෑම් ඇති විය. මොවුන්ගෙන් ඇති වූ බලපෑම පෘතුගීසි හා ලන්දේසි පාලනයෙන් ලද, බලපෑම්වලට වඩා වැදගත් ය. ආගම, භාෂාව සංස්කෘතිය යන හැම අතින් ද විශේෂයෙන් ම ආණ්ඩු ක්‍රමය හා වැවිලි කර්මාන්තය අතින් ද ඔවුන්ගේ බලපෑම දක්නට තිබේ. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී අප රටේ රාජ්‍ය භාෂාව ලෙස පැවති ඉංග්‍රීසි භාෂාව අද ඔබ දෙ වන භාෂාව ලෙස උගනී. අනිකුත් බලපෑම් පිළිබඳ වැඩි විස්තර ඔබට මී ළග පාඩමේ දී ඉගෙනීමට ලැබෙනු ඇත.

සාරාංශය

පළමුවෙන් ම අප රටට පැමිණි යුරෝපීය ජාතිය පෘතුගීසිහු ය. ඒ ලගට පැමිණියේ ලන්දේසිහු ය. මොවුන් පැමිණියේ වෙළඳාම සඳහා ය. ඔවුන්ගෙන් අපට ක්‍රිස්තියානි ආගම ද ලන්දේසින්ගෙන් රෝම ලන්දේසි නීතිය ද ලැබිණි. ඉන් පසු පැමිණි ඉංග්‍රීසින් අප රට යටත් කර ගෙන ඔවුන්ගේ ආණ්ඩු ක්‍රමය ද අපට උරුම කළ හ.

වචන		ආගම		කැම වර්ග	
පෘතුගීසි	ලන්දේසි	පෘතුගීසි	ලන්දේසි	පෘතුගීසි	ලන්දේසි

ක්‍රියාකාරකම්

1. සිතියමක් ඇඳ පෘතුගාලය, ඔලන්දය, බ්‍රිතාන්‍යය, ඉන්දියාව හා ලංකාව ලකුණු කරන්න.
2. පෘතුගීසීන්ගෙන් හා ලන්දේසීන්ගෙන් අපට දායාද වූ දේ පහත දක්වෙන වගුවේ සටහන් කරන්න.
3. .....දී පෘතුගීසිහු ශ්‍රී ලංකාවට පැමිණියහ. විජයබා කොල්ලයෙන් පසු ව කෝට්ටේ රාජ්‍යය..... .... යනුවෙන් කොටස් තුනකට බෙදී ගිය නිසා මොවුන්ට රටේ පාලනයට මැදිහත් වන්නට ඉඩ ලැබිණි. මෙය වඩාත් පහසු වූයේ... .... රජතුමා ගේ කාලයේ දී ය. පෘතුගීසීන්ට උඩරට අල්ලා ගැනීමට නොහැකි වූයේ..... රජතුමා ඔවුන් පරදවා උඩරට රජ වූ නිසාය. පෘතුගීසීන්ගෙන් මුහුදුබඩ පළාත් අල්ලා ගත්තේ .... ය. මොවුහු 1638 දී උඩරට ..... රජු සමග ගිවිසුමක් ඇති කර ගත් හ. යළිත් 1766 දී .....රජු සමග ද ගිවිසුමක් අත්සන් කළ හ. මේ ගිවිසුමෙන් උඩරට රාජ්‍යයට තිබූ නිදහස සීමා විය. එනිසා උඩරට රජවරු..... .....පළවා හැරීමට මාර්ග සෙවූ හ. ලන්දේසීන්ට අයත් ව තිබූ ප්‍රදේශ .....දී බ්‍රිතාන්‍යයන් අතට පත් විය. උඩ රට රජු හා සමහර රදළයන් අතර ඇති වූ අමනාපකම් නිසා .....දී උඩරට රාජ්‍යය ද බ්‍රිතාන්‍යයන් අතට පත් විය.

19

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය

පාඩමට සූදානම් වීම

ශ්‍රී ලංකාව යටත් කර ගත් බ්‍රිතාන්‍යයන් එංගලන්තයේ පාලන ක්‍රමය මෙහි ක්‍රියාත්මක කිරීමට වරින්වර පියවර කිහිපයක් ගෙන තිබේ. විවිධ අවස්ථාවල දී ඔවුන් පාලන ක්‍රමය වෙනස් කළ ආකාරය මෙම පරිච්ඡේදයෙන් කියවන්නට ලැබේ. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් බ්‍රිතාන්‍යයන්ට යටත් වූයේ කිනම් වර්ෂයේ ද?
2. ද්විත්ව පාලනය යනු කුමක් ද?
3. ශ්‍රී ලංකාවේ පළමු වැනි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාගේ නම කුමක් ද?
4. කෝල්බෘක් කොමිසම පත් කරන ලද්දේ කුමක් සඳහා ද?
5. කෝල්බෘක් යෝජනා කළ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් පත් වූයේ කෙසේ ද?
6. රාජකාරී ක්‍රමය යනු කුමක් ද?
7. මැකලම් ප්‍රතිසංස්කරණ අනු ව ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීන් ගණන කියක් වී ද?
8. බ්‍රිතාන්‍යයන් යටතේ ව්‍යාප්ත වූ ප්‍රධාන වෙළෙඳ බෝග දෙනවා ද?

වාර්තාව

ද්විත්ව පාලනය, කිරීට විජිතය, කෝල්බෘක් ප්‍රතිසංස්කරණය, ස්වයංපෝෂිත ආර්ථිකය, වෙළෙඳ ආර්ථිකය, ආනයනය අපනයනය

19.1 පාලන ප්‍රතිසංස්කරණ

ක්‍රි: ව: 1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් අත්පත් කර ගත් බ්‍රිතාන්‍යයෝ පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම, එතැන් සිට වසර දෙකක් ම මදුරාසියේ ගෙන ගිය පාලන ක්‍රමයම මෙහිදී ක්‍රියාත්මක කළහ. මේ ක්‍රමය යටතේ පාලනයක් ගෙන යෑම නොව නිලධාරීන් ලවා බදු එකතු කර ගැනීම ප්‍රධාන පරමාර්ථය විය. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් මේ ක්‍රමයට විරුද්ධ වූ නිසා 1793 දී ද්විත්ව පාලන ක්‍රමය අරඹන ලදී. ද්විත්ව පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් විය. එනම් යටත් ප්‍රදේශවල පාලන කටයුතු එංගලන්තයේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසිනුත්, බදු එකතු කිරීම වෙළෙඳ සමාගම යටතේත්, පවත්වා ගෙන යෑම යි. මෙයි පාලන ක්‍රමයට මෙහෙයවීමට ප්‍රෙඩ්රික් නෝත්, ආණ්ඩුකාරයා ලෙස පත් කර එවන ලදී. ද්විත් ව පාලනය එතරම් සතුටුදායක නොවූ නිසා වර්ෂ 1802 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතට ගෙන "කිරීට විජිතයක්" ලෙස පාලනය කරන ලදී. කිරීට විජිතයක් යනු කෙලින් ම බ්‍රිතාන්‍ය පාලනයේ අංශයකට යටත් වූ ප්‍රදේශයකි.

බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ උපදෙස් අනු ව කටයුතු කළ හෙයින් ද, එංගලන්තයේ සිට ලංකාවට එවනු ලබන උපදෙස් ලැබීම ප්‍රමාද වන හෙයින් ද, ආණ්ඩුකාරයාට නොයෙක් ගැටළු වලට මුහුණ දෙන්නට සිදු විය. මේ හේතු



19.1 රූපය

නිසා ආණ්ඩුකාරයාගේ පාලනය අසාර්ථක මට්ටමකින් පැවතුනු බව කිව හැකිය. මේ තත්ත්වය වෙනස් වූයේ 1833 දී ය. 1815 දී මුළු ශ්‍රී ලංකාවම බ්‍රිතාන්‍යයන්ට යටත් විය. එහෙත් උඩරට සහ පහතරට සම්බන්ධ කොට ඒකාබද්ධ පාලනයක් ඇති කරන ලද්දේ 1833 දී කෝල්බෘක් ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක වූ පසු ව ය.

29.2 කෝල්බෘක් ප්‍රතිසංස්කරණය

ආණ්ඩුකාරයාට පැවරී තිබුණු ඉලතල සීමා කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභා පිහිටුවන ලදී. ව්‍යවස්ථාදායකය යනු නීති පැනවීමට බලය ඇති මණ්ඩලයයි. විධායක යනු එසේ පනවනු ලබන නීති ක්‍රියාත්මක කරන මණ්ඩලයයි. කෝල්බෘක් කොමිසමේ යෝජනා අනුව පිහිටුවන ලද ව්‍යවස්ථාදායක සභාව පහලොස් දෙනෙකුගෙන් යුක්ත විය. ඔවුන් සියල්ලන් ම පත් කරන ලද්දේ ආණ්ඩුකාරයා විසිනි. පසලොස් දෙනාගෙන් නම දෙනෙක් නිල ලත් අය වූහ. ඉතිරි හය දෙනා නිල නොලත් අය වූ හ. මේ හය දෙනා පත් කරන ලද්දේ එවකට ශ්‍රී ලංකාවේ සිටි විවිධ ජාතීන් අනුව ය. මේ යටතේ යුරෝපියයන් වෙනුවෙන් තිදෙනෙක්ද, සිංහල, ද්‍රවිඩ සහ බර්ගර් ජාතිකයන් වෙනුවෙන් එක් අයෙක් බැගින් ද පත් කරන ලද හ. මේ අනු ව මහජන නියෝජිතයන් පත් කිරීමේ මූලික අවස්ථාව මේ ප්‍රතිසංස්කරණය සි ඛිව හැකි ය.

ව්‍යවස්ථාදායක සභාවේ සහිකයෝ තමන් වෙත කිසිදු බලයක් පැවරී නොමැති බව වටහා ගැනීමෙන් පසු එම තත්ත්වය වෙනස් කළ යුතු සයි බලවත් ලෙස උද්ඝෝෂණය කළ හ. මේ උද්ඝෝෂණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් 1912 දී හෙන්රි මැකලම් ආණ්ඩුකාරයාගේ කාලයේ ව්‍යවස්ථාදායක සභා ක්‍රමය නැවත සංශෝධනය කරන ලදී. එම සංශෝධනය මැකලම් ප්‍රතිසංස්කරණ යන නමින් හැඳින්වේ.

19.3 මැකලම් ප්‍රතිසංස්කරණ

මැකලම් ප්‍රතිසංස්කරණ යෝජනා අනු ව ව්‍යවස්ථාදායක සභාවේ සංඛ්‍යාව 21 කි. නිල ලත් අය එයින් 11 කි. නිල නොලත් අය 10 දෙනෙකි. නිල ලත් අය ආණ්ඩුකාරයා විසින් පත් කරන ලද හ. නිල නොලත් අය පත් කරන ලද්දේ ආණ්ඩුකාරයා විසින් නම් කිරීමෙන් 6 දෙනෙකු ද ජන්දයෙන් 4 දෙනෙකු ද වශයෙනි. පහත සඳහන් සටහන එය තව දුරටත් පැහැදිලි කරයි.

1912 ව්‍යවස්ථාදායක මන්ත්‍රී මණ්ඩලය

නිල නොලත් මන්ත්‍රීන්ගේ සංඛ්‍යාව 10

නාම යෝජනා කිරීමෙන්		ජන්දයෙන් තෝරා පත් කරනු ලැබූ අය		ගනු ලැබූ අය
පහතරට සිංහලයන්	2	යුරෝපියයන්	2	
ද්‍රවිඩ ජාතිකයන්	2	බර්ගර් ජාතිකයන්	1	
උඩරට මැසියන්	1	උගත් ලාංකිකයන්	1	
මුස්ලිම් වරුන්	1			

නිල ලත් මන්ත්‍රීන්ගේ සංඛ්‍යාව 11

19.4 මැනිං ප්‍රතිසංස්කරණ

මැනිං ප්‍රතිසංස්කරණ යෝජනා අනු ව ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 37 ක් විය. නිල ලත් අය 14 කි. නිල නොලත් අය 23 කි. නිල නොලත් අය පත් වූ ආකාරය පහත දක්වේ.

ජන්දයෙන් තෝරා ගත් අය

කොළඹ ආසන	1
බස්නාහිර පළාත ආසන	2
අනික් පළාත් ආසන	8
බර්ගර් ජාතිකයන් ආසන	1
යුරෝපියයන් ආසන	2
පහතරට ද්‍රව්‍ය නිෂ්පාදන සංගමය වෙනුවෙන් ආසන	1
වෙළෙඳ පාලන මණ්ඩලය	1

නාම යෝජනා කිරීමෙන් පත් කර ගනු ලැබූ අය

උඩරට සිංහලයන් ආසන	2
මුස්ලිම් ජාතිකයන් ආසන	1
ඉන්දියන් ආසන	1
විශේෂ මණ්ඩල ආසන	3
නිලධාරී පක්ෂය ආසන	14
මුළු ගණන	37

* මෙම සටහන සකස් කර ඇත්තේ ජී. සී. මැන්ඩිස් මහතාගේ 'ලංකාවේ ඉතිහාස යුගය' යන පොත අසුරෙනි.

මට පසු ව ඇති වූ ප්‍රතිසංස්කරණ යටතේ ව්‍යවස්ථාදායක සභාවේ ගණන 49 දක්වා වැඩි කරන ලදී.

19.5 ආර්ථික ක්‍රමය වෙනස් කිරීම

ගෙවීමකින් තොර ව රජය වෙනුවෙන් ඉටු කළ යුතු සේවාව රාජකාරි ක්‍රමය යනුවෙන් හැඳින් වෙයි. මේ සේවය කුල ක්‍රමය මත පදනම් වූවිකි.

19.5.1 රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

සිංහල රාජාණ්ඩු පාලනය යටතේ පැවති මේ ක්‍රමය කෝල්බෘක් ප්‍රතිසංස්කරණ දක්වා ම නො වෙනස් ව පැවතුණි. රටේ පොදු කටයුතු වල දී රාජකාරි ක්‍රමය ප්‍රයෝජනවත් විය. කරුණු මෙසේ වුවත් වෙනත් හේතූන් නිසා කෝල්බෘක් කොමිසමේ යෝජනාවක් අනු ව රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසා තමන් අනිවාර්යයෙන් ම නොමිලේ කිරීමට බැඳි සිටි වැඩ වලින් වැසිසා නිදහස් වූහ. එමෙන් ම ප්‍රදේශවල පොදු කටයුතු අඩාල වීම ද සිදු විය. රාජකාරි ක්‍රමය අහෝසි කිරීමෙන් රදලයන්ට විශේෂයෙන් ම පාඩු සිදු වූ බැවින් ඔවුහු මේ ගැන තදින් ම විරුද්ධ වූහ.

19.5.2 කුල ක්‍රමය හා සමාජ ක්‍රමය

පැරණි සිංහල සමාජ - ආර්ථික ක්‍රමය කුල ක්‍රමය මත පදනම් වූවකි. සිංහල රජවරුන්ගේ පාලනය යටතේ ඒ ඒ කුල විසින් කළ යුතු රාකියා වෙන් වශයෙන් දක්වා තිබුණි. මේ රාකියා සියල්ල ම සමාජයේ පැවැත්මට රුකුලක් විය. එහෙත්, රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසා කුල ක්‍රමය මත පදනම් වූ සමාජ-ආර්ථික ක්‍රමය දෙදරා ගියේ ය. ඒ නිසා කුල පදනමකින් තොර ව වැසියනට ඔවුන් කැමති රාකියාවක් සෙදීමට අවස්ථාව උදා විය. මේ නිදහස් රාකියා ක්‍රමය කෝල්බෘක් විසින් යෝජනා කරන ලද වැවිලි ආර්ථික ක්‍රමයට බොහෝ සෙයින් හිතකර විය.

19.5.3 වැටුපට සේවය කරන පිරිසක් ඇතිවීම

රාජකාරි ක්‍රමය අහෝසි වීම නිසා ප්‍රධාන කරුණු දෙකක් සිදු විය. එනම් නො මිලේ වැඩ කර දීමට ඇති බැඳීම් ඉවත්වීම සහ ඒ ඒ කුලවල අය විසින් අනිවාර්යයෙන් ම සෙදිය යුතු රාකියාවලින් පිටස්තර ව ඔවුනට රාකියා-වල සෙදීමට හැකි වීමයි. එනිසා රජයේ මෙන්ම පෞද්ගලික වැඩවල යොදවා ගන්නා සේවකයන්ට වැටුප් ගෙවා වැඩ ගැනීමේ ක්‍රමයක් බිහි විය.

19.5.4 මධ්‍යම පංතිය බිහිවීම

කෝල්බෘක් යෝජනා අනු ව ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කරන ලද්දේ රජයේ රාකියා වල අවශ්‍ය පුද්ගලයන් ලබා ගැනීමට ය. මේ හේතුවෙන් ඉංග්‍රීසි අධ්‍යාපන ක්‍රමය වැඩි දියුණු කරන ලදී. එ නිසා ඉංග්‍රීසි භාෂාව උගත් පිරිසක් බිහි විය. මේ පිරිස රජයේ සහ වෙනත් රාකියාවලට බඳවා ගන්නා ලදහ. වතු වගාව නිසා අළුතින් ධනවත් වූ පිරිසක් ද බිහි විය. මේ අනු ව ශ්‍රී ලංකාවේ මධ්‍යම පන්තිය ලෙස සැලකෙන ඉංග්‍රීසි උගත් ධනවත් සමාජ පන්තියක් බිහි වීමට පදනම වැටුණි.

19.5.5 ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම

පැරණි සමාජයේ ශ්‍රී ලංකාවේ පැවතියේ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයකි. විශේෂයෙන් ආහාර අතින් ශ්‍රී ලාංකිකයා ස්වයංපෝෂිත විය. එ කල පැවති සමාජ ආර්ථික රටාව මේ සඳහා හිතකර විය. එහෙත් බ්‍රිතාන්‍යයන් යටතේ ඉහත සඳහන්වූ වෙනස්කම් සිදු වූ නිසා ආහාර බෝග වැවීමට වඩා වෙළෙඳ බෝග වගා කිරීමට පෙළඹීමක් ඇති විය. ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම වඩා ලාභදායක බව පාලකයන්ට ද පෙනී ගියේ ය. මේ කරුණු නිසා ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටී වෙළෙඳ ආර්ථික රටාවකට ශ්‍රී ලංකාව යොමු විය.

19.5.6 වැවිලි කර්මාන්තයේ නැගිටීම

බ්‍රිතාන්‍යයන් යටතේ කුඑ බඩු වෙළෙඳ බෝග වෙනුවට වෙනත් වෙළෙඳ බෝග වැවීම ආරම්භ විය. රජයේ ඉඩම් අඩු මිලකට ඉංග්‍රීසි ජාතිකයින්ට ලබා දීමෙන් මේ සඳහා දිරි ගැන්වීම ද ඇති විය.

19.6 වැවිලි ආර්ථික ක්‍රමයේ ප්‍රතිඵල

වැවිලි කර්මාන්තය නිසා තේ, කෝපි, රබර්, පොල් වැනි බෝග පිට රට යවා මුදල් උපයා ගන්නා ලදී. ආහාර බෝග වැවීම කෙරෙහි රජය එතරම් උනන්දු නො වී ය. ආහාර බෝග ඇතුළු අනෙකුත් දේ ආනයනය කිරීමට සිදු විය. ඒ කාලය අනු ව මෙම ක්‍රමය වාසිදායක බව ද පෙනුණි. එ නිසා ශ්‍රී ලංකාව ආනයන - අපනයන ආර්ථික ක්‍රමයකට යොමු විය.

බඩු පිට රට යැවීමේ අවශ්‍යතා නිසා වගා ප්‍රදේශ හා කොළඹ වරාය සම්බන්ධ කරන මහා මාර්ග සහ දුම්රිය මාර්ග ඉදි කරන ලදී. කොළඹ වරාය ද වැඩි දියුණු කරන්නට සෙදුණි. පණිවුඩ හුවමාරු කර ගැනීම සඳහා තැපැල් සේවය ආරම්භ විය. මුදල් ගනු දෙනු පහසු කිරීමට බැංකු පිහිටුවන ලදී.

මේ බලපෑම නිසා 1948 දී ශ්‍රී ලංකාව ස්වාධීන රටක් බවට පත් වන විට මේ රටේ සමාජ ආර්ථික ක්‍රමය සැහෙන දුරට වෙනස් වී තිබුණි.

සාරාංශය

1796 දී මුහුදුබඩ පලාත් අයත් කර ගත් බ්‍රිතාන්‍යයෝ 1815 දී මුළු ශ්‍රී ලංකාව ම යටත් කර ගත් හ. මොවුන් යටතේ ශ්‍රී ලාංකාවේ පාලන ක්‍රමය බෙහෙවින් වෙනස් විය. ක්‍රමයෙන් මහජනයා ද පාලනයට සහභාගි වූ හ. 1948 දී ශ්‍රී ලංකාව ස්වාධීන රටක් බවට පත් විය. බ්‍රිතාන්‍ය පාලනයේ බලපෑම නිසා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ක්‍රමයේ ද සැහෙන වෙනසක් ඇති විය.

ක්‍රියාකාරකම්

1. 1796, 1815 යන වර්ෂවල ඇති වූ වැදගත් සිදු වීම් මොනවා ද?
2. කෝල්බෘක් ප්‍රතිසංස්කරණ නිසා ඇති වූ වැදගත් ප්‍රතිඵල දෙකක් නම් කරන්න
3. ස්වයංපෝෂිත - ආර්ථික ක්‍රමය බිඳ වැටීමට හේතු කවරේ ද?
4. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඇති වූ ප්‍රතිඵල පහත සඳහන් මාතෘකා යටතේ ලියන්න.
   i. ආණ්ඩු ක්‍රමයේ වෙනස් වීම
   ii. අධ්‍යාපනයේ වෙනස් වීම
   iii. ආර්ථික ක්‍රමයේ වෙනස් වීම

20

නිදහස් ශ්‍රී ලංකාව

පාඩමට යුදෙනට් වීම

මෙම පරිච්ඡේදයෙන් ඔබට අප රටේ ආණ්ඩු ක්‍රමය පිළිබඳ ව කරුණු ඉගෙනීමට ලැබෙනු ඇත. 1931 සිට ආණ්ඩු ක්‍රමය විකාශනය වූ අයුරු මෙහි දැක්වේ. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම් අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. ශ්‍රී ලංකාවේ නිදහස් දිනය යෙදී ඇත්තේ කවදාට ද?
2. ශ්‍රී ලංකාව නිදහස ලැබුයේ කුමන වර්ෂයක ද? කුමන රටකින් ද?
3. ඩොනමෝර් කොමිසට යන් කරන ලද්දේ කවර කරුණු හේතු කොට ගෙන ද?
4. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය අනුව ශ්‍රී ලාංකික සහභාගිත්වය වැඩි දියුණු වූයේ කෙසේ ද?
5. 'සර්වජන ඡන්දය' යනුවෙන් කුමක් අදහස් වේ ද?
6. 'ව්‍යවස්ථාදායක' 'විධායක' යන වචනවල තේරුම් මොනවා ද?
7. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය වෙනස් කිරීමට හේතුම කුමක් ද?
8. සෝල්බරි ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වූයේ කවර වර්ෂයේ සිට ද? සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට ඩොමිනියන් තත්ත්වයක් ලැබුණේ ද?
9. සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ විශේෂ ලක්ෂණ මොනවා ද?
10. 1948 ක්‍රියාත්මක වූ ආණ්ඩු ක්‍රමයේ හා සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ වෙනසක් තිබේ ද?

වාග්මාලාව

ව්‍යවස්ථාදායක සභාව, විධායක සභාව, සර්ව ජන ඡන්දය, ඩොමිනියන් තත්ත්වය, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය, රාජ්‍ය මන්ත්‍රණ සභාව, සෙනෙට් සභාව, කැබිනට් ක්‍රමය, ආණ්ඩුකාරයා, අග්‍රාණ්ඩුකාරයා

20.1 ශ්‍රී ලංකාව දේශපාලන නිදහස ලබයි.

සෑම අවුරුද්දක ම පෙබරවාරි 04 වන දින අපේ රට වන ශ්‍රී ලංකාවට වැදගත් දිනයකි. එදින රජයේ නිවාඩු දිනයක් වන හෙයින් ඔබේ පාසැලට ද නිවාඩු දිනයකි. පාසැල් ළමයකු වන ඔබ, සමහර විටක, එදින පවත්වන උත්සවයට සහභාගි වන්නට ද ඇත. ඒ උත්සව පැවැත්වෙන්නේ එදින සිදු වූ වැදගත් දෙයක් සිහිපත් කරන්නට බවත් ඔබ දන්නවා විය හැකිය. අප එදින සිහිපත් කරන්නේ අපේ රට නිදහස ලද දිනයයි. එදින අප දේශපාලන (රට පාලනය කිරීමේ) නිදහස ලද දිනය යි. අවුරුදු එකසිය පනහකටත් වැඩි කාලයක් ශ්‍රී ලංකාව පැවතියේ මහා බ්‍රිතාන්‍යයට යටත් රටක් ලෙස ය. එනිසා අපේ රට පාලනය කරන ලද්දේ පිට රටක අයගේ ඕනෑ එපාකම් අනුව ය. 1948 පෙබරවාරි 04 වන දින සිට අපේ රට පාලනය කිරීමේ අසිනිය තිබුණේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. අපි එතැන් පටන් සෑම වසරක ම පෙබරවාරි 04 වන දිනය නිදහස් දිනය හෙවත් ජාතික දිනය ලෙස සලකමු.

අප රට පමණක් නොව ලෝකයේ බොහෝ රටවල් පිට රටියන් ගේ පාලනයට යටත් ව පැවත ඇත. එසේම ඒ ඒ රටවල් නොයෙකුත් ක්‍රම වලින් තම නිදහස ලබා ගෙන ඇත. එනම් සටන් කිරීමෙන් හෝ සාකච්ඡා කිරීමෙන් හෝ ඒ ක්‍රම දෙක ම මගිනි. ශ්‍රී ලංකාව සටන් වලින් තොර ව හුදෙක් සාකච්ඡා මගින් ම තම නිදහස දිනා ගැනීම අපේ සතුටට කරුණකි. සෑම විට ම සාමය සටනට වඩා අගය කළ යුතු දෙයක් වන හෙයිනි. 1948 පෙබරවාරි 04 වන දින නිදහස ලැබීම අවුරුදු පනහකට වැඩි කාලයක් කරන ලද සාකච්ඡා වල ප්‍රතිඵලයකි. කවුරුන් සමග කරන ලද සාකච්ඡාවක් දැයි යන්න පැනයට පිළිතුරු ඔබ දනටමත් දන්නෙහි ය. ඒ සාකච්ඡාවන් ඇතිවූයේ ශ්‍රී ලාංකික නායකයන් සහ ලංකාව පාලනය කළ මහා බ්‍රිතාන්‍යයේ ආණ්ඩුව සමග ය. මුල දී ශ්‍රී ලාංකිකයෝ තම රටේ පාලන කටයුතුවලට හවුල් වීමේ අසිනිය ඉල්ලා සිටිය හ. බ්‍රිතාන්‍ය ආණ්ඩුව ඒ ඉල්ලීම් සලකා විවින් විට, ගම් යම් අසිනිවාසිකම් ශ්‍රී ලාංකික යන්ට ලබා දුන්නේ ය.

මුල් කාලයේ දී ලද අසිනිවාසිකම් පිළිබඳ ව ඔබ කලින් පරිච්ඡේදයේ උගත්තෙහි ය. ඊට පසු ව ඇති වූ වෙනස් කම් කිහිපයක් අපි දැන් සලකා බලමු.

20.2 ශ්‍රී ලාංකිකයන්ට පාලන බලය ක්‍රමයෙන් පැවරීම

සූර්ණ දේශපාලන නිදහස ලැබීමට පෙර ඩොනමෝර් සහ සෝල්බරි ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ මගින් පාලනයේ දී ශ්‍රී ලාංකික සහභාගිත්වය වැඩි වූ ආකාරය මෙහි පහත දැක් වේ.

20.2.1 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය. තම රට තමා විසින් ම පාලනය කිරීමේ අසිනියෙන් කොටසක් හෝ ලබා දෙන ලෙස ශ්‍රී ලාංකික නායකයෝ බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් නැවත නැවතත් ඉල්ලා සිටියෝ ය. ශ්‍රී ලංකාණ්ඩුව කවර ආකාරයකට වෙනස් විය යුතු දැයි සෙවීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් 1927 දී කොමිහන් සභාවක් පත් කරන ලදී. එහි නායකයා හෙවත් සභාපති ඩොනමෝර් සාමි නම් විය. එම කොමිසමට තවත් තුන් දෙනෙක් ද අයත් වූහ. කොමිසමේ යෝජනා අනුව ශ්‍රී ලංකාවේ නව ආණ්ඩුක්‍රමයක් ඇති විය. ඩොනමෝර් නම් පුද්ගලයාගේ ප්‍රධානත්වයෙන් යුතු කොමිසමක යෝජනා මත පදනම් වූ හෙයින් නව ආණ්ඩු ක්‍රමය ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය නමින් හඳුන්වන ලදී. නව ආණ්ඩු ක්‍රමය 1931 සිට 1947 දක්වා ක්‍රියාත්මක විය. එහි ප්‍රධාන ලක්ෂණ පිළිබඳ ව ඔබ දැන ගත යුතු ය. ඒවා දුහුඹින් මෙසේ ය.

1. **සර්ව ජන ඡන්ද බලය** – 1931 පෙර පැවතියේ ඇතැම් විශේෂ සුදුසුකම් ඇති අයට පමණක් ඡන්දය දීමේ අසිනිය තිබිම ය. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ වයස අවුරුදු 21 න් වැඩි (එනම් වැඩිහිටි) ස්ත්‍රී පුරුෂ සියලු දෙනාට ම ඡන්දය දීමේ අසිනිය හෙවත් බලය ලැබුණි.

2. **පළාත් අනුව මන්ත්‍රීන් තේරීම** – 1931 ට කලින් ඇතැම් මන්ත්‍රීවරු සිංහල, දුවිඩ, බර්ගර් ආදී විවිධ ජනතා වර්ග අනුව නෝරන ලද හ. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ එසේ ජාතීන් අනුව තේරීම නවතා පළාත් අනුව පමණක් තේරීම ආරම්භ විය.

3. **රාජ්‍ය මන්ත්‍රණ සභාව** – 1931 ට පෙර රජයේ නීති පැනවීම කළේ ව්‍යවස්ථාදායක (ව්‍යවස්ථාව – නීතිය, දායක – දෙන්නා) සභාව නම් ආයතනයකි. 1931 සිට ඒ කාර්යය පැවරුණේ 61 දෙනෙකු ගෙන් යුක්ත රාජ්‍ය මන්ත්‍රණ සභාව නම් ආයතනයට ය.

4. **විධායක කාරක සභා ක්‍රමය** – ඉතා සරල ලෙස ගත් කල විධායක කාර්යය නිති ක්‍රියාත්මක කිරීම ලෙස හැඳින් විය හැකි ය. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ රජයේ ඇතැම් විධායක කටයුතුවලට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරු හවුල් වූහ. එසේ හවුල් වූයේ විධායක කාරක සභා මඟිනි. එ බදු විධායක කාරක සභා හතක් විය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි ඡන්දයෙන් තේරුණු මන්ත්‍රීවරුන් 58 දෙනා කාරක සභා හතකට බෙදුණි. මෙසේ ඇතැම්

කාරක සභාවක සාමාජිකයෝ හත් දෙනක් හෝ අට දෙනෙක් සිටිය හ. රජයේ ඇතැම් විධායක කටයුතු පිළිබඳ වගකීම ඒ සභාවට පවරන ලදී.

5. **රාජ්‍ය ලේකම් වරු** – රජයේ වඩා වැදගත් විධායක කටයුතු, ආරක්ෂක කටයුතු, විදේශ කටයුතු, පොදු සේවා පරිපාලනය ආදිය වුදල්, අධිකරණ හා විදේශ කටයුතු යනුවෙන් බෙදී වෙන් කොට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ රාජ්‍ය ලේකම්වරුන් තිදෙනකුට භාර දෙන ලදී. ඔවුන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයන් වුවත් පත්වීම් ලැබ සිටියේ ආණ්ඩුකාරයා විසින් නම් කිරීමෙනි.

6. **ඇමති මණ්ඩලය** – රාජ්‍ය ලේකම්වරුන් තිදෙනා හා විධායක කාරක සභාවල සභාපති වරුන් හත් දෙනා මෙයි සාමාජිකයෝ වූ හ. ආණ්ඩුකාරයාගේ අනුමැතිය ඇති ව සියලු විධායක කටයුතු මෙහෙය වීම එම මණ්ඩලයේ කාර්යය විය.

7. **ආණ්ඩුකාරයා** – ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ රජයේ ප්‍රධානියා වූයේ ආණ්ඩුකාරයා ය. ඔහු පත් කළේ බ්‍රිතාන්‍ය රජය විසිනි. ඔහුට විශේෂ බලතල තිබුණි.

20.2.2 සෝල්බරි ආණ්ඩු ක්‍රමය

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ආරම්භවී නොබෝ දිනකින් ම එම ක්‍රමය වෙනස් කරන ලෙස ඉල්ලීම් ඇති විය. කල් යත් ම ශ්‍රී ලාංකිකයෝ පාලන කටයුතු වලින් කොටසක් නො ව සම්පූර්ණ නිදහස හෙවත් **ඩොමිනියන් තත්ත්වය** ඉල්ලා සිටිය හ. මේ ඉල්ලීම් පිළිබඳ ව සලකා බැලීම සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් 1944 දෙසැම්බර් මාසයෙහි කොමිෂන් සභාවක් පත් කරන ලදී. **සෝල්බරි සාම් එහි සභාපති විය.** එම කොමිෂන්ගේ යෝජනා අනුව අලුත් ආණ්ඩු ක්‍රමයක් ඇති විය. එය 1947 අග කොටසේදී ආරම්භ විය. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මෙන් ම මෙම සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ ද දැන ගැනීම වැදගත් ය. ඒවා මෙසේ ය.

1. **මන්ත්‍රී මණ්ඩල දෙකක්** – ව්‍යවස්ථා කටයුතු සඳහා මණ්ඩල දෙකක් පිහිටුවන ලදී. **නියෝජිත මන්ත්‍රී මණ්ඩලය** මන්ත්‍රීන් 101 දෙනකු ගෙන් ද යුක්ත විය. මන්ත්‍රීන් 30 දෙනෙකු ගෙන් යුත් අනිත් මණ්ඩලය උත්තර මන්ත්‍රී මණ්ඩලය හෙවත් **සෙනෙට් සභාව** නම් විය.

2. **කැබිනට් ක්‍රමය** – ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙහි විධායක කටයුතු කළේ ඇමති මණ්ඩලය යි. සෝල්බරි ක්‍රමය යටතේ කැබිනට් මණ්ඩලයක් පිහිටුවන ලදී. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ වැඩි ආසන ගණනක් හිමි දේශපාලන පක්ෂයේ නායකයා අගමැති විය. ඔහුම **කැබිනට් මණ්ඩලයේ නායකයා** විය. **සෙසු කැබිනට් ඇමතිවරුන්** අගමැතිගේ උපදෙස් පරිදි තෝරනු ලැබිණ.

3. **ආණ්ඩුකාරයා** – විශේෂයෙන් සුළු ජාතීන්ගේ ආරක්ෂාව සඳහා විශේෂ බලතල සහිත විය. එසේ ම ඔහු රටේ නායකයා වූ අතර බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් පත් කරන ලදී.



ශ්‍රී ලංකාවේ පළමු වන අගමැති
ඩී. එස්. සේනානායක මැතිතුමා
20.1 රූපය

20.3 නිදහස ලැබීම

1948 පෙබර්වාරි 04 වන දින ශ්‍රී ලංකාවට දේශපාලන නිදහස හෙවත් ඩොමිනියන් තත්ත්වය ලැබුණු බව අපි ඉහත උගතිමු. එ දින සිට ක්‍රියාත්මක වූ ආණ්ඩු ක්‍රම බොහෝ දුරට සෝල්බරි ආණ්ඩු ක්‍රමයට සමාන විය. සෝල්බරි ක්‍රමය මඟින් ශ්‍රී ලංකාව බොහෝ දුරට නිදහස් රටක් වීම ඊට හේතුවයි. සෝල්බරි ක්‍රමය මඟින් පූර්ණ නිදහස සම්බන්ධ ව තිබූ සීමා, උදහරණ වශයෙන් ආණ්ඩුකාරවරයාගේ බලතල ඉවත් කරන ලදී. නිදහස් ශ්‍රී ලංකාවේ අග්‍රාණ්ඩුකාරයා බ්‍රිතාන්‍ය රාජ්‍ය නායකයා විසින් පත් කළ ද ඒ පෙර මෙන් නො ව ශ්‍රී ලාංකික අගමැතිගේ නාම යෝජනාව අනුව විය. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය රාජ්‍ය නායකයා තම නායකයා වශයෙන් පිළිගත් නමුත් එයින් දේශපාලන වශයෙන් ශ්‍රී ලංකාව කෙරෙහි කිසිදු සීමාවක් ඇති නො වී ය. අප ඉහත දැක්වූ සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ නිදහස් ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණ ද වෙයි. වෙනස අග්‍රාණ්ඩුකාරයා නාම මාත්‍රික නායකයෙකු වීම යි. එසේ ම බ්‍රිතාන්‍ය රාජ්‍ය නායකයා නාමමාත්‍රික ව ශ්‍රී ලංකාවේ නායකයා වුවත් සියලු බලතල ශ්‍රී ලාංකික අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය සතු වීම යි. මෙම ආණ්ඩු ක්‍රමය 1948 සිට 1972 දක්වා පැවතියේ ය.

සාරාංශය

1948 පෙබරවාරි 04 වන දින මහා බ්‍රිතාන්‍යය ශ්‍රී ලංකාවට දේශපාලන නිදහස දුන්නේ ය. සෑම අවුරුද්දක ම පෙබරවාරි 04 වන දින නිදහස් දිනය ලෙස සලකමු. ශ්‍රී ලංකාව නිදහස ලබා ගත්තේ බ්‍රිතාන්‍යය හා සාකච්ඡා පැවැත්වීමෙන් සාමකාමී ව ය.

නිදහස ලැබීමට පෙර පාලන කටයුතුවල ශ්‍රී ලාංකික සහභාගිත්වය ද වැඩි වූ වැදගත් අවස්ථාවකි ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව. එය 1931 සිට 1947 දක්වා ක්‍රියාත්මක විය. එහි ප්‍රධාන ලක්ෂණ නම් සර්ව ජන ඡන්ද බලය, පළාත් අනුව මන්ත්‍රීන් තේරීම්, රාජ්‍ය මන්ත්‍රණ සභාව, විධායක කාරක සභා ක්‍රමය, රාජ්‍ය ලේකම්වරුන්, ඇමති මණ්ඩලය හා ආණ්ඩුකාරයා ය.

ක්‍රියාකාරකම්

1. පහත සඳහන් නිල දරු අයගේ නම් ඔබේ වැඩිහිටියන්ගෙන් හෝ ගුරුතුමා ගෙන් අසා දැන ගන්න.
   i. නිදහස් ශ්‍රී ලංකාවේ පළමු වන අග්‍රාණ්ඩුකාරයා
   ii. නිදහස් ශ්‍රී ලංකාවේ පළමු වන අගමැති

2. සර්ව ජන ඡන්ද බලය පිළිබඳ ව වගන්ති පහක් ලියන්න.

3. ශ්‍රී ලංකාවේ නිදහස් දිනය යනුවෙන් වගන්ති අටක රචනයක් ලියන්න.

4. යුද්ධ මඟින් නිදහස ලබා ගැනීම, සාමකාමී ව සාකච්ඡා මඟින් නිදහස ලබා ගැනීම යන මේ ක්‍රම දෙකෙන් වඩා හොඳ කවර ක්‍රමය ද යි පිළිබඳ ව පන්තියෙහි විවාදයක් පවත්වන්න.

21

ශ්‍රී ලංකාවේ ජනරජ ආණ්ඩු ක්‍රමය

පාඩමට සූදානම් වීම

මෙම පාඩමෙහි ජනරජ ආණ්ඩු ක්‍රමය ඇති වූ අවධියේ සිට ආණ්ඩුක්‍රමයේ විකාශනය දක්වේ. ඔබේ විශේෂ අවධානය යොමු විය යුතු වැදගත් ම කරුණු අළලා සකස් කළ ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. **ජනරජයක් යනු කුමක් ද? එහි අත්‍යවශ්‍ය ලක්ෂණයක් නම් කරන්න.**
1. **ශ්‍රී ලංකාව මුල් වරට ජනරජයක් වූයේ කවර අවුරුද්දේ ද?**
3. **ජනරජයක ප්‍රධානියා කවු ද**
4. **පළමු ජනරජයේ ව්‍යවස්ථාදායක බලතල පැවරුණු ආයතනයේ නම කුමක් ද?**
5. **පළමු ජනරජ ආණ්ඩු ක්‍රමයත් 1948 නිදහස් ආණ්ඩු ක්‍රමයත් අතර ප්‍රධාන වෙනස කුමක් ද?**
6. **දෙ වන ජනරජ ආණ්ඩු ක්‍රමය ආරම්භ වූයේ කවද ද?**
7. **දෙ වන ජනරජ ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවා ද?**
8. **1978 ආණ්ඩු ක්‍රමය යටතේ ජනාධිපති කෙනෙක් බලයට පත්වන්නේ කෙසේ ද?**

වාංමාලාව

ජනරජය, පරමාධිපත්‍යය, ජනාධිපති, ජාතික රාජ්‍ය සභාව, මූලික අයිතිවාසිකම්, සමානුපාතික ඡන්ද ක්‍රමය

1972 වන වසර ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වූ අවුරුද්ද වශයෙන් අපි සලකමු. ජනරජයක් යනු කුමක් ද? මහජනයාගේ නියෝජිතවරුන්ගේ - පරමාධිපත්‍යය පිළිගත් රාජ්‍යයක් ජනරජයක් නම් වෙයි. **ජනාධිපති** නම් නිල නාමයෙන් හඳුන්වන **රාජ්‍ය** නායකයෙකු සිටීම, ඔහු **පාරම්පරික** උරුමයෙන් නොව, මහජන ඡන්දයෙන් හෝ මහජන නියෝජිතවරයෙකු විසින් නම් කිරීමෙන් හෝ එම පදවිය ලැබීම ජනරජයක අත්‍යවශ්‍ය **ලක්ෂණ** වේ. 1972 වර්ෂයෙහි පිහිටු වූ ජනරජය අපි පළමු වන ජනරජය වශයෙන් හඳුන්වමු. පළමු වන ජනරජය ආණ්ඩු ක්‍රමය පිහිටු වූයේ 1948 - 1972 දක්වා පැවති ආණ්ඩු ක්‍රමය වෙනුවට ය.

21.1 පළමු වන ජනරජ ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

21.1.1 ජනාධිපති

ජනරජයක **රාජ්‍ය** නායකයා ජනාධිපති නම් නිල නාමයෙන් හැඳින්වේ. ශ්‍රී ලංකාව ජනරජයක් වීමත් සමග **රාජ්‍ය** නායකයා වශයෙන් ජනාධිපති වරයෙක් පත් විය. 1972 දී ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කිරීමට එක් ප්‍රධාන හේතුවක් වූයේ බ්‍රිතාන්‍ය **රැජින** ලංකාවේ **රාජ්‍ය** නායකයා වශයෙන් පිළිගැනීමට තිබූ අකමැත්ත යි. 1948 ආණ්ඩු ක්‍රමය අනුව අප රටෙහි නායකයා බ්‍රිතාන්‍ය රජු හෝ රැජින වූ බව ඔබට මතක ඇත. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාවෙහි සිටි නියෝජිතයා අග්‍රාණ්ඩුකාරයා විය. එහෙත් එම අග්‍රාණ්ඩුකාරයා සතු වුයේ නාම මාත්‍ර බලතල වුවත් පිට රටියෙකු අත තිබීම නිදහස අඩු වීමක් ලෙස ඇතැම් ලාංකිකයෝ සිතූ හ. මෙසේ 1972 පළමු වන ජනරජ ව්‍යවස්ථාව අනුව ආණ්ඩුකාරයාගේ තැන ගැනීමට ජනාධිපතිවරයෙක් පත් කරන ලදී. ඔහු නාම මාත්‍රික ව රාජ්‍ය නායකයා වූ අතර පෙර මෙන් ම සියලු බලතල අගමැතිවරයා අත පැවතුණි.

21.1.2 ජාතික රාජ්‍ය සභාව

සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේත් 1948 නිදහස් ආණ්ඩු ක්‍රමය යටතේත් ව්‍යවස්ථා කටයුතු පවරා තිබුනේ **නියෝජිත** මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව හෙවත් උත්තර මන්ත්‍රී මණ්ඩලය යන ආයතන දෙකට ය. 1972 නව ව්‍යවස්ථාව යටතේ ඒ මණ්ඩල දෙක වෙනුවට ජාතික **රාජ්‍ය** සභාව පිහිටුවන ලදී.

21.1.3 අගමැතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය

මහ මැතිවරණයෙන් පසු ජාතික **රාජ්‍ය** සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් වැඩි දෙනකු අයිති පක්ෂයේ නායකයා අගමැති වශයෙන් පත් වෙයි. ඇමති මණ්ඩලය තෝරා ගන්නා ලද්දේ අගමැතිවරයා විසිනි. රටේ විධායක කටයුතු භාර වූයේ අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයටය.

21.1.4 මූලික අයිතිවාසිකම්

සෑම මිනිසකු ම සතු මූලික අයිතිවාසිකම් ඇත. ඒවා රටේ ව්‍යවස්ථාවෙහි පළමු වන වරට ලියා දක්වන ලද්දේ 1972 ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි ය. කෑමති දෙයක් කිනන්නට ඇති අයිතිය, එනම් සිහිමේ නිදහස, කැමති ආගමක් ඇදහීමේ නිදහස එනම් ආගමික නිදහස, වධ හිංසාවලින් නිදහස යනාදී ලෙස විවිධ වූ අයිතිවාසිකම් ජනතාව සතුවෙයි.



ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා

21.1 රූපය

21.2 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

1972 ව්‍යවස්ථාව යටතේ 1977 පැවති මහ මැතිවරණයෙන් පසු ව බලයට පැමිණි රජය 1978 දී නව ව්‍යවස්ථාවක් සකස් කෙළේ ය. එම 1978 ව්‍යවස්ථාව අනු ව සකස් වූ ආණ්ඩු ක්‍රමය දෙ වන ජනරජ ආණ්ඩු ක්‍රමය යනුවෙන් හැඳින්වේ. මෙය කලින් පැවති සියලු ව්‍යවස්ථාවන්ට බොහෝ සෙයින් වෙනස් වෙයි.

21.2.1 ජනාධිපති

1972 ව්‍යවස්ථාව අනුව ජනාධිපති කෙනෙකු සිටි බව ඔබට මතක ඇත. දෙ වන ජනරජයෙහි ද රාජ්‍ය නායකයා ජනාධිපති විය. එහෙත් 1972 ව්‍යවස්ථාවේ ජනාධිපති තනතුරත් 1978 ව්‍යවස්ථාවේ ජනාධිපති තනතුරත් අතර කැපී පෙනෙන වෙනසක් ඇත. 1978 ව්‍යවස්ථාව අනුව පත් වූ ජනාධිපති රටේ පූර්ණ බලතල සහිත ය. පෙර ව්‍යවස්ථාවෙහි ජනාධිපති නාම මාත්‍රික ව රටේ නායකයා වූ අතර සියලු බලතල අගමැති සතු ව පැවතිණි. තවද 1978 ව්‍යවස්ථාව අනුව ජනාධිපති අගමැතිගේ නාම යෝජනාවෙන් තොර ව අවුරුදු හයකට වරක් මහජන ඡන්දයෙන් තෝරා ගනු ලැබේ.

21.2.2 පාර්ලිමේන්තුව

1972 පළමු වන ජනරජ ආණ්ඩු ක්‍රමය යටතේ ව්‍යවස්ථා කටයුතු සඳහා පිහිටු වූ ආයතනය වූ ජාතික රාජ්‍ය සභාව වෙනුවට පාර්ලිමේන්තුව නම් ආයතනය ඇති කරන ලදි. එහි මන්ත්‍රී සංඛ්‍යාව 196 කි. පාර්ලිමේන්තුව සඳහා ඡන්ද විමසන්නේ අවුරුදු හයකට වරකි.

21.2.3 කැබිනට් මණ්ඩලය හෙවත් ඇමති මණ්ඩලය

මෙහි ප්‍රධානියා ජනාධිපති ය. මෙතෙක් පැවති ව්‍යවස්ථා අනුව ඇමති මණ්ඩලයේ ප්‍රධානියා වූයේ අගමැති ය. 1978 ව්‍යවස්ථාව අනුව ද අගමැතිවරයෙක් සිටී. පාර්ලිමේන්තුවේ වැඩි ම ඡන්ද ගණන ලබාගත හැකි මන්ත්‍රීවරයා අගමැති වශයෙන් පත් කිරීම ජනාධිපති විසින් කරනු ලැබේ. පාර්ලිමේන්තු කැබිනට් මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව ජනාධිපතිවරයා විසින් අගමැතිවරයාගේ අදහස් ද විමසා බලා තීරණය කරනු ලැබේ. 1978 ට පෙර ව්‍යවස්ථා අනු ව සියලු ම ඇමතිවරු කැබිනට් මණ්ඩලයට අයත් වෙති. 1978 ව්‍යවස්ථාව අනු ව කැබිනට් මණ්ඩලයට අයත් නොවන ඇමතිවරු ද සිටිති. උදාහරණ දිසා ඇමතිවරු, ව්‍යාපෘති හාර ඇමතිවරු වෙත්.

21.2.4 මූලික අයිතිවාසිකම්

මූලික අයිතිවාසිකම් දක්වා තිබීම 1972 ව්‍යවස්ථාවේ වැදගත් ලක්ෂණයක් ලෙස අපි සඳහන් කළෙමු. එම මූලික අයිතිවාසිකම් දක්වා තිබීම 1978 ව්‍යවස්ථාවෙහි ද වැදගත් ලක්ෂණයකි. 1978 ව්‍යවස්ථාවේ මේ අයිතිවාසිකම් වඩා දීර්ඝ ලෙස විස්තර වන අතර, ඒවාට බාධා පැමිණි විට යුක්තිය ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටීමේ ආඥතන ගැන ද විස්තරාත්මක ව සඳහන් වෙයි. උදාහරණ වශයෙන් යම් පුරවැසියෙකුට තම මූලික අයිතිවාසිකම්වලට බාධා පැමිණි බව පෙනී යන්නේ නම් ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු ඉදිරිපත් කළ හැකි ය. 'ඔම්බුඩ්ස්මන්' හෙවත් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට කරුණු දක්වා යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

21.2.5 සමානුපාතික ඡන්ද ක්‍රමය

1978 ව්‍යවස්ථාව මගින් ඡන්ද ක්‍රමයෙහි යම් වෙනසක් ඇති කළේ ය. ඒ අනුව ඡන්දය දෙන්නේ කෙළින් ම පුද්ගලයෙකුට නොව දේශපාලන පක්ෂය මගින් හෝ ස්වාධීන කාණ්ඩයක් මගින් හෝ ඉදිරිපත් කරන ලැයිස්තුවකට ය. එක් එක් පක්ෂයට හෝ කාණ්ඩයට ලැබෙන ඡන්ද සංඛ්‍යාවට අනුපාතික ව මැතිවරණ දිස්ත්‍රික්කය තුළ ඒ ඒ පක්ෂයට හෝ කාණ්ඩයට හිමි ආසන වෙන් කර ගනු ලැබේ. මේ ක්‍රමය මගින් ඡන්ද විමසීම් වඩා ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපයක් ගනු ඇතැ යි බලාපොරොත්තු වේ.

සාරාංශය

1972 දී ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් විය. 1972 පළමු වන ජනරජයෙහි ප්‍රධාන ලක්ෂණ ජනාධිපති, ජාතික රාජ්‍ය සභාව, අමාත්‍ය මණ්ඩලය සහ මූලික අයිතිවාසිකම් ව්‍යවස්ථාවෙහි ම ලියා දක්වීම යි. මේ ජනරජයේ ජනාධිපතිට හිමි වූයේ නාම මාත්‍ර බලතල පමණකි. දෙවන ජනරජය 1978 සිට ක්‍රියාත්මක විය. එහි ප්‍රධාන ලක්ෂණ ජනාධිපති, පාර්ලිමේන්තුව, කැබිනට් මණ්ඩලය, මූලික අයිතිවාසිකම් ව්‍යවස්ථාවෙහි ලියා දක්වීම හා සමානුපාතික ඡන්ද ක්‍රමය යි. දෙ වන ජනරජයේ ජනාධිපති අවුරුදු හයකට වරක් මහජන ඡන්දයෙන් තෝරනු ලබන අතර සියලු බලතල සහිත ය.

ක්‍රියාකාරකම්

1. පහත සඳහන් නිලතල දරු හෝ දරණ පුද්ගලයන්ගේ නම් මොනවා දැයි ඔබේ ගුරුතුමාගෙන් හෝ වෙනත් වැඩියිවැසෙකුගෙන් අසා දැන ගන්න.
   (අ) පළමු වන ජන රජයේ ප්‍රථම ජනාධිපති
   (ආ) පළමු වන ජන රජයේ ප්‍රථම අගමැති
   (ඇ) දෙවන ජනරජයේ ප්‍රථම ජනාධිපති
   (ඈ) දෙවන ජනරජයේ ප්‍රථම අගමැති
2. 1972 ආණ්ඩු ක්‍රමය යටතේ ජනාධිපතිගේ බලතල සහ 1978 ජනාධිපතිගේ බලතල අතර ඇති වෙනස්කම් දක්වන්න.
3. මූලික අයිතිවාසිකම් පිළිබඳ ව වඟන්නි අටක රචනයක් ලියන්න.

22

අප රට මුහුණ පාන ප්‍රශ්න

පාඩමට සූදානම් වීම

මෙම පාඩමේ විස්තර කැරෙන්නේ අපේ රට මුහුණ පා ඇති ප්‍රශ්න පිළිබඳව යි. ආහාර ප්‍රශ්නය, රැකී රක්ෂා ප්‍රශ්නය, ජනසංඛ්‍යා ප්‍රශ්නය හා ඉඩම් ප්‍රශ්නය ඉන් ප්‍රධාන වේ. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සොයමින් පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. **අප රට මුහුණ පාන වැදගත් ප්‍රශ්න මොනවා ද?**
2. **යම් රටක ආහාර ප්‍රශ්නයක් ඇති වීමට හේතු කවරේ ද?**
3. **ආහාර ලබා ගැනීමේ ප්‍රභවය කවරේ ද?**
4. **ශ්‍රී ලංකාවේ ආහාර ප්‍රශ්නය විසඳීමට රජය ගෙන ඇති පියවර මොනවා ද?**
5. **යම් රටක ජනසංඛ්‍යා ප්‍රශ්නයක් ඇතැයි කිව හැක්කේ කවර අවස්ථාවල ද?**
6. **දැනට ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව වැඩෙන වේගය කුමක් ද?**
7. **යම් රටක රැකී රක්ෂා ප්‍රශ්නයක් ඇති වීමට හේතු මොනවා ද?**
8. **අප රටේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීමට මෑත දී ගත්හල් සූ කරුණු මොනවා ද?**
9. **ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් වගා කළ හැකි බිම් ප්‍රමාණය කොපමණ ද?**
10. **අප රට මුහුණ පාන මෙම ප්‍රධාන ගැටලු එකිනෙකට සම්බන්ධ වයි කිව හැක්කේ කුමක් නිසා ද?**

වාර්තාවට

පෝෂ්‍යපදාර්ථ ගුණාත්මක භාවය, සම්බර ආහාරය, ප්‍රෝටීන්, භෞතික සම්පත්, මූල්‍ය සම්පත්, ජන සංඛ්‍යාව, ජ්‍යාගහනය, සංවර්ධන ඉඩවම.

ලෝකයේ පොහොසත් හෝ දුප්පත් හෝ ඕනෑම රටක් යම් යම් ප්‍රශ්නවලට මුහුණ පායි. මෙවන් ප්‍රශ්න මතු වනුයේ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමට පියවර ගන්නා අවස්ථාවලදීය. අප එකිනෙකාගේ පවුල් ගැන සිතා බැලුවත් කවර හෝ ප්‍රශ්නයකට අප කාටත් මුහුණ පැවිට සිදු ව ඇති බව ඔබට පෙනී යනු ඇත. අපේ රට වන ශ්‍රී ලංකාව ද ඇතැම් ප්‍රශ්නවලට මුහුණ පායි. ආහාර ප්‍රශ්නය, ඉඩම් ප්‍රශ්නය, රැකී රක්ෂා ප්‍රශ්නය, සහ ජන සංඛ්‍යා ප්‍රශ්නය එයින් වඩාත් වැදගත් ප්‍රශ්න ලෙස අපට සැලකිය හැකි ය. අපි දැන් එම වඩා වැදගත් ප්‍රශ්න ගැන කරුණු උගනිමු.

22.1 ආහාර ප්‍රශ්නය

ලෝකයේ බොහෝ රටවලට මෙන් ම අප ශ්‍රී ලංකාවට ද මෙම ප්‍රශ්නයට මුහුණ පෑමට සිදුව ඇත. යම් රටක ජනතාවට අවශ්‍ය ආහාර ප්‍රමාණය ඒ රටවයි නොඑනේ නම් එයි ආහාර ප්‍රශ්නයක් ඇතැයි දැකා සරලම පැවසිය හැකි ය. තව ද අපේ ආහාරය ප්‍රමාණය අතින් මෙන් ම පෝෂ්‍යපදාර්ථ අන්තර්ගත ගුණාත්මක භාවයෙන් ද යුක්ත සමබර ආහාරයක් විය යුතු බව අප අමතක නොකළ යුතු ය. ආහාර ප්‍රශ්නයක් ඇති වීමට හේතුව කුමක් ද? ජනගහන වැඩි වන වේගයට අඩු වේගයකින් ආහාර නිපදවීම ආහාර ප්‍රශ්නයට මූලික හේතුව යි. දැනට වැඩි ආහාර ප්‍රමාණයක් නිපදවන නමුත් ජනසංඛ්‍යාව ඊට සාපේක්ෂව වැඩි වන නිසා ආහාර ප්‍රමාණවත් නොවෙයි. එ පිට පිටරටින් ආහාර ගෙන්වීමට සිදු වේ. ආහාර ඔබ වූ විට ජනතාව දුබල වේ. එ විට යවුනට වැඩපොළවල යෙදී ආහාර බෝග වවා ගැනීම අසීරු වී ආහාර ප්‍රශ්නය තවත් උග්‍ර වෙයි. ආහාර ප්‍රශ්නයට විසඳුම් මොනවා ද? ප්‍රධානතම විසඳුම නම් වැඩි වැඩියෙන් ආහාර නිපදවීම යි. ආහාර නිපදවා ගත හැකි ක්‍රම ගැන ඔබ දන්නෙහි ය. උදාහරණ වශයෙන් ආහාර බෝග වගා දායක ද්‍රව්‍ය ලබා ගත හැකි ය. අපි මේ වගා සහල් ලබා ගනිමු. එසේ ම ගවයින්, එළුවන් ආදී සතුන් ඇති කිරීමෙන් ද අපට ආහාර ද්‍රව්‍ය ලැබේ. මසුන් අල්ලා ගැනීම ද ආහාර ලබා ගැනීමේ ක්‍රමයකි. මේසේ ආහාර ලබා ගැනීමේ ප්‍රභව තුනක් ඇතැයි අපට කිව හැකි ය. ඒවා නම් ගොවි බිම, සතුන් ඇති කරන බිම් හා මත්ස්‍ය බිම් ය. මේ තුන් ප්‍රභවයෙන් ලැබෙන ආහාර ප්‍රමාණය වැඩි කොට ගත් කල්හි ආහාර ප්‍රශ්නයට යම් තරමක විසඳුමක් ලැබේ. කඩිනම් මහවැලි ව්‍යාපාරය ආදී බහු කාර්ය යෝජනා ක්‍රම මඟින් නව ගොවි බිම් බිහි කිරීම නිසා ආහාර වගා කරන බිම් ප්‍රමාණය වැඩි වී ඇත. සෝයා බෝංචි, දඹල වැනි ප්‍රෝටීන් බහුල ආහාර බෝග වර්ග වැවීමට උනන්දු කිරීම, දියුණු නිල් වර්ග හාවිතය, බහුල වශයෙන් පොහොර යොදා ගැනීම, සතුන් ඇති කිරීම සඳහා දිරි ගැන්වීම ආදිය ද වැදගත් ය. තවද කිවිර කර්මාන්තය දියුණු කිරීම උදාහරණ වශයෙන් මිරිදිය මසුන් ඇති කිරීම යනාදී තොයෙකුත් දේ රජය මඟ පෙන්වීම් සටහන් ආහාර ප්‍රශ්නයට විසඳුම් සෙවීමක් ලෙස හැඳින්විය හැකි ය.

නිපදවිය ආහාර ප්‍රමාණය වැඩි කොට ගැනීම වෙනත් ම නිපදවා ගන්නා ආහාර ද්‍රව්‍ය නිසි ලෙස වෙළඳාම් දී ආහාර ප්‍රශ්නය යෙදිවිය සඳහා මැදියත් මෙයි. ආහාර ප්‍රශ්නය පිළිබඳව වැදගත් වන ජන සංඛ්‍යා ප්‍රශ්නය පිළිබඳ ව මී ළඟ විස්තරයෙන් ඔබට දැනගත හැකි ය.

22.2 ජන සංඛ්‍යා ප්‍රශ්නය

යම් රටක ඔවින ජනයන්ගේ ගණනය එම රටේ ජන සංඛ්‍යාව* සතුවෙන් හැඳින්වේ. සංගණනයකින් හෝ අනුමාන වෙනත් ක්‍රමයකින් හෝ ඒ ජනයන්ගේ සංඛ්‍යාව ගණනය කළ හැකි ය. මෙම ජන සංඛ්‍යාව නිර්ණය කිරීමේ දී කිසියම් නිසඳා ප්‍රදේශ සීමාවක් ගැනා සැලකිය යුතු වේ. මෙම ප්‍රදේශ සීමාව රටක්, නගරයක් ආදිය ලෙස දිය හැකි ය.



22.2 රූපය

* ඇතැම් පොත්වල ජන සංඛ්‍යාව යොදා ඇති අවස්ථාවේ දී ජනගහනය කියා යොදා ඇත

ජන සංඛ්‍යාව වෙනස් වන සුළුය. එය දිනෙන් දින වසරින් වසර වෙනස් වේ. එම නිසා ජන සංඛ්‍යාව නිශ්චය කිරීමේ දී විශේෂ කාල සීමාවක් සඳහන් කිරීම ද අවශ්‍ය වේ.

රටක මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා රටේ සම්පත් උපයෝගී කර ගත යුතු ය. සම්පත් සිදු ආහාර වේ.

1. ස්වාභාවික සම්පත්
2. නිෂ්පාදන සම්පත්
3. මූල්‍ය සම්පත් සහ
4. තාක්ෂණික්‍රම යනුයි.

ජන සංඛ්‍යාව ප්‍රශ්නයක් වන්නේ ඒ රටේ සංවර්ධනය මට්ටම, බිම් ප්‍රමාණය හා මූල්‍ය සම්පත්වලට සාපේක්ෂව ජන සංඛ්‍යාවක් සිටින විට ය. සම්පත් සීමාසහිත නිසා ඒවා පරිහරණය කරන ජන සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩෙන විට බොහෝ ජනතාවට ම උගස් ජීවන තත්ත්වයක් ලබා දීම දුෂ්කර වේ.

ශීඝ්‍රයෙන් වැඩි වන ජන සංඛ්‍යාවට ආහාර, ඇඳුම්, පැළඳුම්, නිවාස, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන පහසුකම් සහ රැකියා ආදිය ද ඉහළමණින් සැපයිය යුතු ය. මෙය ජන සංඛ්‍යාව වැඩි වන විට රටක් මුහුණ පාන බලවත් ප්‍රශ්නයකි.

අපි දැන් අප රට වන ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කරමු. කුඩා බිම් ප්‍රමාණයකින් සහ විශාල ජන සංඛ්‍යාවකින් යුත් මේ රටේ ජන සංඛ්‍යා ප්‍රශ්නය විමසා බලමු.

ශ්‍රී ලංකාවේ ජන සංගණනයක් මුලින් ම පවත්වන ලද්දේ 1871 දී ය. ඒ වර්ෂයේ සිට ජන සංඛ්‍යාව වැඩි වූ අයුරු පහත දක්වේ. ඒ සංඛ්‍යා දන්න ඇයුරෙන් ජන සංඛ්‍යාව වැඩි වීම පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට පුළුවන.

1871 වසරේ දී අප රටේ ජන සංඛ්‍යාව මිලියන 2.4 ක් විය.

1921 වසරේ දී එම සංඛ්‍යාව මිලියන 4.5 දක්වා වැඩි විය.

ඒ අනුව ජන සංඛ්‍යාව මිලියන 2.1 ක් වැඩි වීම සඳහා වසර 50 ක කාලයක් ගතවී තිබුණි.

1971 වසරේ දී අප රට ජන සංඛ්‍යාව මිලියන 12.7 ක් විය. 1981 වසරේ දී එම ජන සංඛ්‍යාව මිලියන 14.8 දක්වා වැඩි විය.

ඒ අනුව ජන සංඛ්‍යාව මිලියන 2.1 ක් වැඩි වීම සඳහා ගත වී තිබෙන්නේ වසර 10 කි. ඉහත සඳහන් කරුණුවලින් පෙනී යනුයේ ජන සංඛ්‍යාව වැඩි වීමේ වේගය ශීඝ්‍ර වී ඇති බව ය.

පහත දක්වා ඇති කරුණුවලින් මෙය තවදුරටත් පැහැදිලි වේ.

1900 වසරේ දී අප රට ජන සංඛ්‍යාව මිලියන 3.5 ක් විය.

1950 වසරේ දී එය මිලියන 7.0 ක් දක්වා වැඩි විය.

1980 වසරේ දී ජන සංඛ්‍යාව මිලියන 14.0 ඉක් ම විය.

1900 වසරේ සිට ජන සංඛ්‍යාව දෙගුණ වීමට අවුරුදු 50 ක් ගත වූ නමුත් 1950 වසරේ සිට ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගත වූයේ අවුරුදු 30 ක් පමණි. ඒ අනුව ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගත වූ කාලය අඩු වී ඇති බව පෙනේ.

පසුගිය අවුරුදු නිහ හතළිහ තුළ දී ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන වේගය ශීඝ්‍රවීමට බල පෑ ප්‍රධාන හේතුව මරණ අනුපාතිකය වර්ෂයක් තුළ දී (ජන සංඛ්‍යාවෙහි 1000 ට මරණ සංඛ්‍යාව) ශීඝ්‍රයෙන් අඩු වීම ය.

1940 වසරේ දී 20.6 වූ මරණ අනුපාතිකය 1960 වන විට 8.6 දක්වා ද, 1980 වන විට 6.1 දක්වා ද අඩුවිණි. මෙසේ මරණ අනුපාතිකය අඩු වීමට හේතු කිහිපයකි. එනම්

i. සෞඛ්‍ය අංශයේ දියුණුව – ප්‍රතිශක්තිකාරක ත්‍රිත්වය එන්නත වැනි එන්නත් සහ ප්‍රත්‍යක්ෂ ඖෂධ භාවිතය, හොඳ සෞඛ්‍ය සුරුබුදු ආදිය ප්‍රගුණ කිරීම.

ii. පෝෂ්‍ය ජනක ආහාර පිළිබඳ අවබෝධය පෝෂ්‍ය ජනක ආහාර පිළිබඳ දැනුම පෙරට වඩා පුළුල් වීම, සහ කෘෂිකර්මයේ දියුණුව සහ ආහාර සහනාධාර ආදිය ජනතාවට ලබා ගත හැකි වීම.

iii. අධ්‍යාපන පහසුකම් ලිවීමේ සහ සිසුවීමේ හැකියාව වැඩි දියුණු වීම නිසා ජනතාව ඉහත සඳහන් කරුණු ගැන ද තමන් ජීවත්වන පරිසරය ගැන ද වැඩි අවබෝධයක් ලබා ගැනීම ආදී වශයෙන් දක්වීමට පුළුවන.

(ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වැඩි වීම පිළිබඳ වැඩි දුර කරුණු දැන ගැනීම සඳහා "අප රටේ ජන ජීවිතය" "එදා සහ අදා" 7 වසර අතිරේක කියවීම් පොතේ 7 සිට 14 දක්වා පිටු කියවන්න.)

22.3 රැකී රක්ෂා ප්‍රශ්නය

අපේ වැඩිහිටියෝ නොයෙක් රැකියාවල යෙදී මුදල් උපයා ජීවත් වීමට අවශ්‍ය දෑ සපයා ගනිති. සෑම රටක රැකී රක්ෂා ප්‍රශ්නයක් ඇති වීමට හේතු කිහිපයක් තිබේ. රැකියා කළ හැකි වියෙයි සිටින සෑම කෙනෙකුට ම රැකියා නො ලැබී වීම, ලබා ඇති සුදුසු කටයුතුවලට සරිලන රැකියා නො ලැබී වීම, ඇතැම් රැකියාවලට අවශ්‍ය සුදුසුකම් රැකියා සොයන්නන්ට නො ලැබී වීම යනාදී වශයෙන් ඒ හේතු විවිධ වෙයි. රටක ජන සංඛ්‍යා වර්ධන වේගය අනු ව ආර්ථික අතින් දියුණු නො වීට මේ කරුණු සියල්ලට ම මුල් වෙයි.

අප රටේ ද ඉහත කී නොයෙකුත් හේතු නිසා රැකී රක්ෂා ප්‍රශ්නයක් පවතී. එහෙත් රැකී රක්ෂා ප්‍රශ්නය අප රට පමණක් මුහුණ පාන කැටළුවක් නො වේ. දියුණු හා දියුණු බොහෝ රටවල් එම ප්‍රශ්නයට මුහුණ පායි.

මෑතක සිට අප රටේ ජන සංඛ්‍යා වේගය අඩු වී ඇත. එසේ ම ආර්ථික අංශයන්ගේ ඊටිබද දියුණු වීම් ඇති වෙමින් පවතී. කඩිනම් මහවැලි ව්‍යාපාරය, වරාය කොමිසම මගින් සිදුකර වෙළෙඳ කලාප පිහිටුවීම, විදේශමල රැකියා අවස්ථා ලැබීම, ස්වයං රැකියා ක්‍රමය හා සංවර්ධන කර්මාන්තය යනාදී වශයෙන් ආර්ථික අංශයෙහි සිදු වන දියුණුව සමග රැකියා ඇති වී රැකියා ප්‍රශ්නය තරමක් දුරට වියදෙමින් පවතී.

22.4 ඉඩට ප්‍රශ්නය

අපේ රට කුඩා ය. එහි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 65,610 කි. කෑලෑ, තොඩනැඟිලි, මංමාවත්, වතු බිම්, වගු බිම්, ගංගා සහාදියෙන් මේ බිම් ප්‍රමාණය තුළ අති විශාල ජන සංඛ්‍යාවක් වෙසෙන බව ද අපි ඉහත ජේදවල දී උගත්තෙමු. එසේ ම ජන සංඛ්‍යාව අධික වේගයකින් වර්ධනය වන බව ද අපි අවධාරණය කෙළෙමු. ජන සංඛ්‍යාව වැඩෙන් ම ඉඩම් ප්‍රශ්නය උග්‍රවෙයි. ජන සංඛ්‍යාව වැඩි වුවත් ඉඩම් ප්‍රමාණය වැඩි නොවන හෙයිනි. පාරම්පරික ව ඉඩම් උරුම වීමේ ක්‍රමය යටතේ පුද්ගලයෙකුට සිය වන ඉඩම් කැබලි වී බෙදී යන නිසා එක් පුද්ගලයෙකුට ලැබෙන ඉඩම් ප්‍රමාණයෙන් අඩු වේ. උදාහරණ වශයෙන් 1901 දී එක් පුද්ගලයෙකුට දළ වශයෙන් හෙක්ටාර .78 ක් හිමි වී තිබුණි. 1946 දී මෙය හෙක්ටාර .39 දක්වා අඩු වූ අතර 1981 වන විට එක් පුද්ගලයෙකුට හෙක්ටාර .17 දක්වා තව දුරටත් අඩු විය. තව ද රටේ ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය ගොවි තැන හිසා මෙතෙක් ඉඩම් ප්‍රමාණය අඩු වීම විශාල ප්‍රශ්නයක් වෙයි. රටේ ජනසංඛ්‍යාව හා ඉඩම් ප්‍රමාණය සැලකීමේ දී පුද්ගලයෙකුට වෙන් කළ හැකි බිම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවනා අසුරින් අඩු වන විට ඉඩම් ප්‍රශ්නයක් ඇතැයි අපට කිව හැකි ය. තව ද සොයෙක් සංවර්ධන ක්‍රම මාර්ගයෙන් දියුණු කළ ද ශ්‍රී ලංකාවේ මුළු භූමියෙන් වගා කළ හැකි බිම් ප්‍රමාණය 40% ක් වීම වැදගත් කරුණකි. ජන සංඛ්‍යාව වැඩි වන විට එම ප්‍රමාණය පවා අඩු වීමට පුළුවන. හේතුව ගොඩනැඟිලි ආදිය තැනීමට ඉඩම් අවශ්‍ය වීමයි. එසේ ම අපේ රටෙයි පරිසරය රැකීමට නම් අඩු ම වශයෙන් මුළු භූමියෙන් 25% ක් වනාන්තර වශයෙන් පැවතිය යුතු බව පරිසර විද්‍යාඥයෝ කියති.

ජන සංඛ්‍යාව වැඩි වන විට වගා කළ හැකි බිම් මෙන් ම වනාන්තර වශයෙන් පැවතිය යුතු බිම් ද ගොඩනැඟිලි, මංමාවත් ජලාශ ආදී ජනයාට අවශ්‍ය දේ තැනීමට යට වෙයි. (මේ පිළිබඳ ම තව දුරටත් කරුණු දැනගැනීම ජනගහනය හා ස්වාභාවික සම්පත් නමින් යබට දී ඇති පොත කියවන්න.) එවිට ඉඩට ප්‍රශ්නය තවත් උග්‍ර වෙයි. පොහොර බහුල



22.1 රූපය

ටයෙන් යෙදීම්, පස රැක ගැනීම, එක ම ඉඩමේ දෙතුන් කන්නයක් වැවීම, යටි වගා කිරීම් ආදී ක්‍රම යොදා ඉඩකටවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමත්, ජන සංඛ්‍යා ප්‍රශ්නය විසඳා ගැනීමක් මගින් ඉඩම් ප්‍රශ්නය තරමක් දුරට විසඳා ගත හැකි මෙයි. තව ද ඔබ මතක තබා ගත යුතුය මෙට ප්‍රශ්නයක් අප රටට පමණක් සීමා නොවූ බව.

සාරාංශය

අප රට මුහුණ පාන ප්‍රධාන ප්‍රශ්න තුනක්. එනම් ආහාර ප්‍රශ්නය, ඉඩම් ප්‍රශ්නය, රැකී රක්ෂා ප්‍රශ්නය හා ජන සංඛ්‍යා ප්‍රශ්නය යි. සෑම රටක ම ආහාර ප්‍රශ්නය ඇති වන්නේ එහි වෙසෙන ජනතාවට අවශ්‍ය ආහාර එපා කා ඇති විට යි. ආහාර ප්‍රශ්නයට මූලික හේතුව ජනයා වැඩි වීම වේගයට අඩු වේගයකින් ආහාර නිපදවීම යි. ආහාර ප්‍රශ්නයට ප්‍රධානතම විසඳුම් වැඩි වැඩියෙන් ආහාර නිපදවීම යි. ආහාර ලබා ගැනීමේ ප්‍රභව තුනකි. ඒ ගොඩ බිම්, සතුන් ඇති කරන බිම් හා මත්ස්‍ය බිම් ය. රජය නොයෙකුත් අයුරින් ආහාර ප්‍රශ්නයට විසඳුම් සොයයි. රටක බිම් ප්‍රමාණය හා සංවර්ධන මට්ටම හා සමීපත් යනාදියට නො ගැලපෙන ජන සංඛ්‍යාවක් සිටින විට එරටෙහි ජන සංඛ්‍යා ප්‍රශ්නයක් ඇතැයි කිව හැකි ය. අප රටේ ජන සංඛ්‍යා ප්‍රශ්නයට කරුණු තුනක් මුල් වේ. උපදින සංඛ්‍යාව වැඩිවීම, ජන සංඛ්‍යාවෙන් විශාල කොටසක් සැපෙන්නන් වීම හා ජනාගහනය වැඩි වීම යි. රටක් ජනයංඛ්‍යා වර්ධන වේගය අනුව ආර්ථික අතින් දියුණු නොවුවහොත් රැකියා ප්‍රශ්නය පැන නගී. උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි ඉඩම් යොදා ගැනීම හා ජන සංඛ්‍යා ප්‍රශ්නය විසඳා ගැනීමට ඉඩම් ප්‍රශ්නය විසඳා ගැනීමට ආධාර වෙයි.

ක්‍රියාකාරකම්

1. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට උත්සාහ කරන්න. පොත පත කියවීම, ඔබේ ගුරුවරයා ඇතුළු වැඩිහිටි අයගෙන් අසා දැන ගැනීම යනාදී නොයෙකුත් ක්‍රම ඔබට මේ පිළිතුරු ලබා ගැනීමට උදවි වෙයි.

   i ආහාර ප්‍රශ්නයක් ඇති වීමට තුඩු දෙන කරුණු මොනවා ද? එවා විසඳීමට ගත හැකි පියවර මොනවා ද?

   ii පසු ගිය අවුරුදු හතළිහ තුළ දී අප රටේ ජනසංඛ්‍යා වර්ධන වේගය ශීඝ්‍රවීමට බල පෑ ප්‍රධාන හේතුව කුමක් ද?

2. මහවැලි ව්‍යාපාරයෙන්, නිදහස් වෙලෙඳ කලාපයෙන් සහ ස්වයං රැකියා ක්‍රමයෙන් රැකියා ප්‍රශ්න විසඳෙන ආකාරය පහත්තියේ සාකච්ඡා කරන්න.

3. ඉඩම් ප්‍රශ්නය පිළිබඳ ව පේළි 8 ක පමණ ඡේදයක් ලියන්න.

23

නිදහස් නිවහල් සමාජයක් කරා

පාඩමට යුදෙනම් වීම

මේ පරිච්ඡේදයේ සඳහන් වී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී රටක නිදහස් නිවහල් ජීවිතයක් ගත කිරීමට පහසු වන පරිසරයක් ඇති වීම පිළිබඳ කරුණු ය. මිනිසුන්ට ශිෂ්ටත්වය ලබා දෙන මූලික අයිතිවාසිකම් මේහි සඳහන් කර ඇත. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් මේ පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න:

1. සමාජයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
2. ඔබ අයත් වන කුඩා ම හා විශාල ම සමාජය කුමක් ද?
3. සටන් විරතියක් යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමන ප්‍රදේශයක් ද?
4. මිනිසාගේ මූලික අයිතිවාසිකම් මොනවා ද?
5. ආණ්ඩු ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමක් ද?

වාංමොලාව

සමානුපාතික නියෝජන ක්‍රමය, ජන මත විචාරණය, ඔම්බුඩ්ස්මන්, ව්‍යවස්ථාදායක, කටයුතු, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

23.1 නිදහස් සමාජයක්

මිනිසුන් සමූහ සෑදී ජීවත් වීම මිනිස් සංහතිය ආරම්භයේ සිටම දක්නට ඇති ලක්ෂණයකි. සජීවන අදහස් දරන පොදු පරමාර්ථ ඇති ව පොදු නීති රීති අනුගමනය කරමින් එකට වාසය කරන ජන සමූහයක් අපි සමාජයක් යැයි හඳුන්වමු.

බාල කාලයේ පටන් ඔබ ද කිසියම් මිනිස් කොටසකට අයත් ව ජීවත් වූ බව දන්නෙහි ද? පළමුවෙන් ම ඔබ ජීවත්වන කුඩා ම සමාජය පවුල ය. මී ළඟට අසල්වාසී ළමුන් හා ආශ්‍රය කිරීමෙන් සමාජය වඩාත් පුළුල් වේ. වැඩිහිටි පුද්ගලයෝ සමාජීක කණ්ඩායම් කිහිපයකට ම අයත් වෙති. ධර්ම පවුල, පාසල, පන්සල, පල්ලිය, කෝවිල සහ ක්‍රීඩා සමාජ යනාදී සංස්ථා කිහිපයකට ම අයත් නිසා වඩා විශාල සමාජයක කොටස් කරුවෙක් වේ.

හැම සමාජයකින්ම ප්‍රධාන පරමාර්ථයක් ඉටුවේ. එය නම් එකී සමාජයට අයත් වන සාමාජිකයන්ගේ යහපත හා සුභසිද්ධිය සඳහා කටයුතු කිරීම ය. මිනිසාගේ පෞරුෂ වර්ධනයටත් මානසික සුවයටත් සිතකර පරිසරයක් ඇතිවන්නේ ඔහුගේ හැකියාවන් දියුණු කර ගත හැකි ශිංසා පිඩා විදීමෙන් තොර වූ පරිසරයක ය. මෙ වැනි පරිසරයක් ඇති වන්නේ නිදහස් නිවහල් සමාජයක ය. එවැනි සමාජයක සෑම සාමාජිකයකුට ම මූලික අයිතිවාසිකම් තිබිය යුතු ය. මිනිසාට තමාගේ මිනිස් තත්ත්වය පවත්වා ගැනීමට අවශ්‍ය වශයෙන් හිමි විය යුතු අයිතීන් කිහිපයක් ඇත.

මෙම අයිතීන් මූලික අයිතිවාසිකම් වශයෙන් හැඳින්වේ. ජීවත්වීමේ අයිතිය, ආරක්ෂාව ඇති ව ජීවත් වීමේ අයිතිය සහ තමාගේ පුද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමේ අයිතිය, මූලික අයිතිවාසිකම් වේ. මීට අමතර ව වද විදීමෙන් නිදහස, වහල් බවෙන් නිදහස, වරදක් කරන අවස්ථාවේ දී නියම නොවූ දඩුවම්වලින් නිදහස, මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් වෙනස් නොකොට සැලකීමේ නිදහස සහ රටින් පිටුවහල් කිරීමෙන් නිදහස මැදගත් වේ. මෙ වැනි

අයිතිවාසිකම් පිළිගන්නා සමාජයක් බිහි වීමට ශතවර්ෂ ගණනාවක් ගත වී ඇත. ශ්‍රී ලංකාවේ මෙය සිදු වූ ආකාරය දැන් අපි විමසා බලමු.

23.2 පැරණි රජවරුන් යටතේ පැවති පාලන ක්‍රමය

පැරණි ශ්‍රී ලංකාවේ පැවතියේ රාජාණ්ඩු ක්‍රමයකි. රාජාණ්ඩු ක්‍රමය යටතේ සියලු ම අංගවල ප්‍රධාන බලධාරියා වූයේ රජතුමා ය. මේ අනුව පාලනය, සමාජ සංවිධානය, ආර්ථික කටයුතු යනාදී හැම අංශයක් ම රජුගේ අභිමතයට යටත් විය. රටේ ඉඩම් සියල්ලක් ම රජුට අයත් විය. රාජ සේවකයන්ට වැටුප් වෙනුවට ද, විහාර දේවාල නඩත්තුවට ද, රජුගේ ඉඩම් පවරා දී තිබුණි. රටේ බොහෝ කටයුතු පවුල් ක්‍රමය අනුව සකස් වී තිබිණ. තමා අයත් වූ කුලය අනුව ගෙවීමෙන් තොරව රජුට සේවය කිරීමට වැසියෝ බැඳී සිටියහ. රජුට පමණක් නොව ප්‍රභූවරුන්ට ද සේවය කිරීම වැසියන්ගේ යුතුකමක් විය. පැරණි පාලන ක්‍රමය යටතේ කුඩා ම පාලන ඒකකය වූයේ ගම ය. ගම් පාලනය ගම් සභා ක්‍රමය යටතේ සිදු විය. ගම් සභාවලට නිලධාරීන් පත් කෙරුණේ ගමේ ම ජ්‍යෙෂ්ඨයන් අතුරෙනි. ශ්‍රී ලංකාවේ පැරණි ම ඉතිහාස යුගය වන අනුරාධපුර යුගයේ ජීවත් වූ රජවරුන්ට අසීමිත බලතල හිමි වී තිබුණ ද ඔවුන්ගේ ඕනෑමතයට පාලනය ගෙන යාමට හෝ කෲර වන්නට හෝ එතරම් අවකාශයක් තිබුණේ නැත.

ආදර්ශමත් විශිෂ්ඨ ජීවිතයක් ගත කිරීමෙන් රජ කෙනෙකුට ප්‍රජා පතනය ඇති කිරීමටත් රටට සෞභාග්‍යය ලබා කරදීමටත් පිළිවනැයි යටත්වැසියන් තදින් ම විශ්වාස කළහ. විවිධ ඓතිහාසික වෙනස් වීම් සිදු වුව ද මේ තත්ත්වය ශ්‍රී ලංකාට බ්‍රිතාන්‍ය පාලනය යටතට පත් වීමෙන් පසුවත් පික කාලක් පැවතුණි. ක්‍රි. ව. 1833 දී ඇති වූ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා නිසා මේ පැවති තත්ත්වය වෙනස් වන්නට විය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක්ව තිබි ක්‍රි. ව. 1948 දී ශ්‍රී ලංකාව නිදහස ලබන විට ක්‍රමයෙන් රටේ දේශපාලන, ආර්ථික හා සමාජ ක්‍රමයේ පුළුල් වෙනස්කම් රැසක් සිදු වී තිබුණි. නිදහස් රාජ්‍යයක මැයියන් සතු විය යුතු අයිතිවාසිකම් ලබා දෙන වාතාවරණයක් ඇති කිරීමට මෙ තැන් සිට පාලනය ගෙන ගිය ආණ්ඩු ක්‍රියා කළ ආකාරය අපි දැන් විමසා බලමු.

23.3 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තහවුරු කිරීම

අපි එකිනෙකා අතර ඇති සම්බන්ධතාම් පිළිවෙලකට ගෙන යාමට උපකාරීවන්නක් ලෙස පාලන ක්‍රමය හැඳින් විය හැකිය. රජයේ පාලන කටයුතු තේරුම් ගැන්වීමට කිසියම් ක්‍රීඩා කණ්ඩායමක් කටයුතු කරන ආකාරය ගැන සිතමු. ඔබ ද මේ ක්‍රීඩාවක දී ඒට සහභාගී වන්නන් එකට බැඳ තබා ගැනීම සඳහා ඔවුන් කටයුතු කරන ආකාරය පෙන් වන නීති මාලාවක් නිසා ක්‍රීඩකයන් පාලනය වන අතර එක් එක් සාමාජිකයාට තමන් කැමති පරිදි කටයුතු කිරීම වැළැක්වීමට ද මෙය උපකාරී වේ. ක්‍රීඩාවට සම්බන්ධ වන්නන්ගෙන් බලාපොරොත්තු වනු ලබන්නේ ක්‍රීඩාවේ නීති රීති මාලාවට අවධානය යොමු කිරීම ය.

ක්‍රීඩා කරන අවස්ථාවේ දී නීති රීති අනුගමනය කිරීමේ වැදගත්කම කනුරුවන් විලිගනිති ක්‍රීඩා ජීවිතයේ මෙන් රටක ද යහපත් පාලනයක් ඇති කිරීමට නීති රීති ක්‍රියාත්මක කිරීම අවශ්‍ය ය. මහජනයා විසින් පත්කර ගනු ලබන ආයතනයක් වන ආණ්ඩුව පුරවැසියන්ගේ යහපත සඳහා ක්‍රියා කරයි. උදාහරණයක් වශයෙන් ආණ්ඩුව විසින් පනවා ඇති මාර්ග නීති දෙස බලන්න. මේවා සකස් වී ඇත්තේ රට වැසියන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා රථවාහන හැසිරවීමට ය. වැසියන් මේ නීතිවලට කීකරු වන්නේ ඒවා තමන්ගේ ම යහපත සඳහා සකස් කොට ඇති නියා ය. ඒට අමතර නොවුමහොත් පීඩා විඳීමට සිදුවන බව සාමාන්‍ය දැනීමෙන් ඔවුහු දනිති. ක්‍රි. ව. 1948 න් පසු ව ශ්‍රී ලංකාවේ බලයට පත් ආණ්ඩු ක්‍රියාකර ඇත්තේ මිනිසුන්ට අයිති ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් තහවුරු කිරීමට ය. ඊහපනතාවගේ කැමැත්තෙන් තෝරා පත් කර ගන්නා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු රටවැසියන්ගේ පොදු යහපත සඳහා ක්‍රියා කරයි. එ මැනි ආණ්ඩුවකින් ඉටු වන යුතුකම් සේවාවන් නම් මහා මාර්ග සැදීම හා නඩත්තුව, ජල පහසුකම් හා විදුලි බලය ලබා දීම, දේපල රැක දීම යනාදී යයි.

23.4 මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

මිනිසාගේ මූලික අයිතිවාසිකම් ගැන සැලකෙන්නේ ආහාර, නිවාස හා ඇඳුම් පැළඳුම් ය. මේවා හැම කෙනෙකුට ම උරුමයෙන් කොර ව ලැබිය යුතු ධර්ම පොදු පිළිගැනීමකි. මූලික අවශ්‍යතා හැරුණු විට අද සමාජයේ ජීවත් වෙන්නාට ඇති අවශ්‍යතාවන් විටින් ය. සංකීර්ණය. සමාජයේ උහු දෙවිදිම් ඇත්නම් සෑම කෙනෙකුට ම සමාන අයිතිවාසිකම් භුක්ති විඳිය නොහැකි ය. මේ නිසා අද ඇති යථාතත්වය පිළිබඳ ව විශ්වාස කාරමු. ලෝකයේ කුමන්නා මිනිසකු වුව ද තිබිය යුතු අතින් සමාන වේ. ස්වභාවයෙන් ම පිහිසුන් අතර වෙනසකුත් දෙනෙස්තම් ඇත. එහිදෙකෙනාට වෙනස් හැකියාවන්, අදහස් උදහස් මිනිස් සමාජයේ දක්නට ලැබේ. උදාහරණයකු තරුන් කෙනෙකුට වඩා ශක්තියින් හෝ බුද්ධිමත් හෝ විය හැකි ය. එහෙත් ජීව විද්‍යාත්මක අංගයෙන් බැලුවත් සංස්කෘතික අංගයෙන් බැලුවත් මිනිස් සංහතියේ සාමාජිකයන් එවැනි වෙනස්කම්වලට වඩා කැපී පෙනෙයි. විදහත වෙයි.

අප සමාජයේ සෑහුමෙන් දක්නට ලැබෙන්නේ කෙනෙකුට ඔම්පිය යුතු මූලික අයිතිවාසිකම් සමාජ බව ය. රටේ ජීවත් වන සෑම කෙනෙකුට ම, කුලය, ආගම් හෝ වර්ගය කෙසේ වෙතත් එසා ම නිතිය ක්‍රියාත්මක වේ. අධිකරණය ඉදිරියේ සෑම කෙනෙකු ම සමාන ලෙස සැලකේ. මෙම විශ්වාසය පදනම් වී ඇත්තේ සෑම පුද්ගලයකු ම සමාජයේ වැදගත් කොටසක් ලෙස පිළිගැනීම මත ය. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය මූලික අයිතිවාසිකම් තුක්ති විඳිය හැකි රටවලට ලැබුණි. එහෙත් මූලික අයිතිවාසිකම් සෙසු රටවැසියන්ට වඩා වැඩි වශයෙන් විඳිය හැකි විදිහට ලද්දේ ශ්‍රී ලංකාව ජනරජයක් වීමෙන් පසුව ය.

23.4 i ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

අප රටෙහි ක්‍රියාත්මක වන්නේ ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ය. එමිය ක්‍රියාත්මක වූයේ ශ්‍රී. ව. 1978 ජූනි 22 වනා දා සිට ය. එට දිනය ජනරජ දිනය ලෙස නම් කොට ඇත. සෑම රටවැසියෙක් ම එනම් ජනාධිපතිතුමාගේ සිට සාමාන්‍ය මැසියා දක්වා මෙම ව්‍යවස්ථාවට යටත් ය. අප රට පාලනය වන ආකාරය, ඡන්ද සමාජවාදී ක්‍රියා පිළිවෙල, විධායකතාවගේ අයිතිවාසිකම්, ව්‍යවස්ථාදායකයේ බලතල, අධිකරණය ආදිය සඳහන් ව ඇති ලියවිල්ල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යි. මහජනතාවගේ අයිතිවාසිකම් හා ඒවා ආරක්ෂා කිරීමට ආණ්ඩුව ක්‍රියා කරන ආකාරය එහි සඳහන් ව ඇත. ඒ නිසා කිසිවකුගේ අයිතිවාසිකම්වලට පටහැනිව කටයුතු කිරීමට වෙනත් කිසිවකුහට ඉඩක් නැත. අප රටෙහි අද ක්‍රියාත්මක වන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලාංකික වැසියන්ගේ අයිතිවාසිකම් ලබා දීම සඳහා පහත උපක්‍රම සොදු ඇත.

i මූලික අයිතිවාසිකම්

රට මැසියකු වශයෙන් මූලික අයිතිවාසිකම් ගැන වඩා බව කාලිව සඳහන් කිය. ඒ අයිතිවාසිකම් ඉතා විස්තර සහිත ව අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වේ.

(අ) සිතිමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස හා ආගමික නිදහස.

(ආ) වධ හිංසාවලින් නිදහස, අමානුෂික හා අවමන් සහගත දඩුවමකට කිසිවකු යටත් නොවීම.

(ඉ) ජාතිය ඉදිරියේ සියල්ලන් ම සාධාරණ ලෙස රැකවරණය ලැබීම, ආගම, භාෂාව, වර්ගය, කුලය, දේශපාලන මත, ස්ත්‍රී පුරුෂ භාවය ආදි කිසි ම හේතුවක් නිසා වෙනස්කමකට හෝ විශේෂත්වයකට භාජනය නොවීම ආදිය ඉන් කිහිපයකි.

මෙම අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ පුරවැසි සෑම පුද්ගලයකුට ම හිමි වේ. යමෙකුගේ කුලය, වර්ගය, ජාතිය, ආගම, රක්ෂාව හා ආර්ථික තත්ත්වය කුමක් වුව ද එම අයිතිවාසිකම් සම්බන්ධයෙන් වෙනසක් නැත. අද පවතින ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් පුරවැසියන්ට ලැබී ඇති විශේෂ තත්ත්වයක් නම් එහි සඳහන් මූලික අයිතිවාසිකම් නොලැබෙන අවස්ථාවක දී අධිකරණය ඉදිරියට ගොස් ඒවා ලබා ගැනීමේ හැකියා ව යි.

ii ඔම්බඩ්ස්මන් (පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා)

ඔම්බඩ්ස්මන් තනතුර මුලින් ම නිර්මාණය වූයේ ස්කැන්ඩිනේවියානු රටවල ය. රජයේ නිලධාරීන්, රාජ්‍ය සංස්ථාවල නිලධාරීන් හා පළාත් පාලන ආයතනවල නිලධාරීන් විසින් සිදු කරන ලද මූලික අයිතිවාසිකම් කඩ කිරීමේ හෝ අසාධාරණකම් ගැන පැමිණිලි පරීක්ෂා කොට වාර්තා කිරීමට මෙම නිලධාරියාට පුළුවන. මේ ක්‍රමය මඟින් රජය උත්සාහ ගෙන ඇත්තේ මහජනතාවගේ අයිතිවාසිකම් තව දුරටත් ආරක්ෂා කර දීමට ය. රටේ පාලකයන් අතින් වරදක් සිදු වී ඇත් නම් ඒ පිළිබඳ සෙයා බලා පිළියම් යෙදීමට ටෙ වැනි නිලධාරියකු සිටීම රජයට මෙන් ම මහජනතාවට ද පිහාල වාසියකි.

III. සමානුපාතික නියෝජන ක්‍රමය

අප රටෙහි ක්‍රියාත්මක වන නිති රීති සම්පාදනය කරන පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයන් තෝරා ගන්නා පිළිවෙල 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව හඳුන්වන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය යනුවෙනි. මෙම ක්‍රමය අනු ව මැතිවරණයක දී යම්කිසි දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ලැබී තිබෙන ජන්ද ප්‍රමාණයට බොහෝ දුරට සමානුපාතික ලෙස ව්‍යවස්ථා දායකයේ සිටිය යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව නිරණය වේ.

IV. ජනමත විචාරණය

රටේ පාලන කටයුතු මෙහෙය වන රජයට ජාතික වශයෙන් හෝ දේශපාලනමය වශයෙන් වැදගත් වන ප්‍රශ්නයක් පිළිබඳ ව තම මැසියන්ගේ අදහස් කෙළින් ම දැනගත හැකි ක්‍රමයක් ලෙස මෙය හැඳින් විය හැකි ය. නිති සකස් කිරීමේ දී මුළු රටේ ම අදහස් විමසා බලා දේශපාලන පක්ෂවල බලපෑමෙන් තොර ව රටට අවශ්‍ය නීතියක් පැනවීමට මේ මඟින් ඉඩ ප්‍රස්ථාව ලැබේ. මෙය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම ඇති සමහර රටවල ක්‍රියාත්මක වේ. මත භේදයට මුල් වී ඇති නීතියක් හෝ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ඇති කළ යුතු වෙනසක් හෝ ගැන පොළින් ම මහජනතාවගේ ජන්දය විවිසා කැමැත්ත හෝ අකමැත්ත දැන ගැනීමට මේ ක්‍රමයෙන් සිදු වේ.

යාරාංශය

සමාජය යනුවෙන් අදහස් කරන්නේ යම්කිසි නීති රීතිවලකට යටත් ව එකට ජීවත් වන ජන සමූහයක් ය. ලංකාවේ පැමති පැරණි සමාජ ක්‍රමය අනු ව මිනිසුන් අතර නා නා ප්‍රකාර බෙදීම් දක්නට ලැබුණි. වර්තමාන තත්ත්වය මීට වෙනස් ය. සමානත්වය ගරු කරන සමාජයක් බිහි වී ඇති අතර මූලික අයිතිවාසිකම් සෑමට ම ලබා ගත හැකි වාතාවරණයක් ද ඇත. ඔම්බඩ්ස්මන්, සමානුපාතික නියෝජන ක්‍රමය හා ජන මත විචාරණය මහජනතාවගේ අයිතිවාසිකම් ලබා දීමට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ යොදු ඇති විවිධ විධාන කිහිපයකි.

ක්‍රියාකාරකම්

(1) පැරණි රජවරුන්ගේ කාලයේ සමාජය හැඩ ගැසී තිබූ ආකාරය පන්තියේ සාකච්ඡා කරන්න.

(2) ඒ කාලයේ ප්‍රාදේශීය පාලනයේ දී දක්නට ලැබුණ කුඩා ම පාලන ඒකකය කුමක් ද?

(3) ඔනෑ ම මිනිසකුට හිමි විය යුතු මූලික අයිතිවාසිකම් හතරක් ලියන්න.

(4) පාසල නමැති සමාජයේ සාමාජිකයකු වශයෙන් ඔබට හිමි වී ඇති අයිතිවාසිකම් 3 ක් සහ යුතුකම් 3 ක් ලියන්න.

(5) ඔම්බඩ්ස්මන් තනතුර මුලින් ම පිහිටු වන ලද්දේ කුමන රටවල ද?

24

සමෘද්ධිමත් ජනතාවක්

පාඩමට යුදනම් වීම

මේ පාඩමේ ඇත්තේ මෙරට සමෘද්ධිමත් ජනතාවක් කිරීමට රජය ගෙන ඇති පියවර පිළිබඳ කරුණුය. පහත යඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයමින් මේ පාඩම අධ්‍යයනය කරන්න.

ප්‍රශ්න

1. **සමෘද්ධිමත් ජනතාවක් යනුවෙන් කුමක් අදහස් කැරේ ද?**
2. **ආණ්ඩුව මහජනයාගේ යහපත සඳහා ගෙන යන යේවාවන් මොනවා ද?**
3. **මහවැලි යෝජනා ක්‍රමය බහු කාර්ය යෝජනා ක්‍රමයක් වශයෙන් හඳුන්වන්නේ කවර හේතුවක් නිසා ද?**
4. **නිදහස් වෙළෙඳ කලාපයට අයත් වන භූමි ප්‍රදේශයේ විශාලත්වය කොපමණ ද?**
5. **නිදහස් වෙළෙඳ කලාපය හා සම්බන්ධ නගර මොනවා ද?**

වාංමාලාව

සමෘද්ධිමත් ජනකාය, බහු කාර්ය යෝජනා ක්‍රමය, තිරු බදු සහන, ආයෝජකයන්, මහ කොළඹ ආර්ථික කොමිසම

24.1 සමෘද්ධිමත් ජනතාවක්

ප්‍රජාතන්ත්‍රවාදී රටක ජීවත්වන ඩැනියන්ගේ යහපත සඳහා ආණ්ඩුවක් ක්‍රියා කරන බව අපි මීට ඉහත දී ඉගෙනා ගත්තෙමු. රට වැසියන් සමෘද්ධිමත් ජනතාවක් බවට පත් කිරීම සඳහා නොයෙකුත් ක්‍රියා මාර්ග දියත් කිරීමට ආණ්ඩුවකට සිදු වේ. අප රටෙහි ද රටවැසියාගේ මූලික අවශ්‍යතා ලබා දීම සඳහා රජය විසින් විවිධ පහසුකම් සලසා ඇත. සෞඛ්‍ය පහසුකම්, ප්‍රවාහන පහසුකම් සහ අධ්‍යාපන පහසුකම් ප්‍රධාන තැනක් ගනී. අධ්‍යාපනය රටේ සමෘද්ධියට බෙහෙවින් ඉවහල් වන හෙයින් පොත්පත් නොමිලේ සිසුන්ට බෙදා දීම පවා අද දක්නට ලැබේ. 1984 දී රුපියල් මිලියන 93 ක් නොමිලේ පොත් බෙදා දීම සඳහා පම්ණක් වැය කර ඇත. මේ හැර රටේ සමාජ ආර්ථික පාප්ත්වය නංවා ලීමට ව්‍යාපෘති රාශියක් ම ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කර ඇත. කඩිනම් මහවැලි ව්‍යාපාරය දියත් කිරීම, නිවාස දශලක්ෂයක් ඉදිකිරීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම හා නිදහස් වෙළෙඳ කලාපය ඉදි කිරීම මීට කිසිපයකි.

24.2 මහවැලි යෝජනා ක්‍රමය

අප රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීම සඳහා ආණ්ඩුව මඟින් ක්‍රියාත්මක කරන යෝධ ව්‍යාපාරයක් හැටියට කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය හැඳින්විය හැකි ය. ආහාර නිෂ්පාදනය සඳහා බෝග වගා කළ හැකි බිම් වැඩි වශයෙන් පිහිටා ඇත්තේ වියළි කලාපයේ ය. මෙහි ඇති වගා කළ හැකි බිම් ප්‍රමාණය හෙක්ටාර තුන්ලක්ෂ හැටදහසකි. මේ ප්‍රදේශ වගා කිරීම සඳහා ජල පහසුකම් සලසා දීම වැදගත් ය. රටේ භූමිය හා ජලය යොදා ගනිමින් වේගවත් සංවර්ධනයක් ඇති කිරීමට ක්‍රි. ව. 1977 දී බලයට පත් ආණ්ඩුව මහවැලි යෝජනා ක්‍රමය කඩිනම් කිරීමට කටයුතු සැලසී ය. මෙම ව්‍යාපාරය බහු කාර්ය යෝජනා ක්‍රමයක් ලෙස සැලකිය හැක්කේ ඒ මඟින් කටයුතු රාශියක් ඉටු කිරීමට අපේක්ෂා කරන නිසා ය.

(i) ගොවිතැන් කටයුතු දියුණු කිරීට සඳහා ජල පහසුකම් සැපයීම.

(ii) ජනාවාස ඉදි කිරීම.

(iii) රැකී රක්ෂා පහසුකම් ලබා දීම.

(iv) ජල විදුලි බලය නිපද වීට.

(v) කර්මාන්ත ආරම්භ කිරීම.

(vi) ජල ගැලීම් වළක්වාලීම.

මහවැලි කඩිනම් වැඩපිළිවෙල යටතේ වගා කටයුතු සඳහාත් ජනාවාස ඉදිකිරීම සඳහාත් ජල පහසුකම් සැපසේ. කට ද විශාල ඉඩම් ප්‍රමාණයක් සංවර්ධනය කිරීටට හා ජල විදුලි බල මධ්‍යස්ථාන සහිත ජලාශ රාශියක් ඉදි කිරීමට ද කටයුතු සොදු ඇත. මහවැලි ගංගාවේ ජලය යොදු ගෙන ක්‍රියාත්මක වන ජල යෝජනා ක්‍රම අනුරින් කොත්මලේ, ටාදුරු ඔය, වික්ටෝරියා හා රන්දෙණිගල ප්‍රධාන ඒවා ලෙස සැලකේ.

තව ද කඩිනම් මහවැලි වැඩ පිළිවෙල යටතේ සංවර්ධනය වන අලුත් ඉඩම් ප්‍රමාණය මෙම ආකාරයට බෙදු කිබේ.

"ඒ"	සංවර්ධන ප්‍රදේශය – හෙක්ටාර	36000
"බී"	සංවර්ධන ප්‍රදේශය – හෙක්ටාර	48000
"සී"	සංවර්ධන ප්‍රදේශය – හෙක්ටාර	24000
"ඩී"	සංවර්ධන ප්‍රදේශය – හෙක්ටාර	16000
"ඊ"	සංවර්ධන ප්‍රදේශය – හෙක්ටාර	2800

මේ තරම් විශාල සෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට විශාල සම්පත් ප්‍රමාණයක් වුවමනා වේ. අපේ රට සංවර්ධනය වෙමින් පවතින රටක් නිසා මේ සඳහා අවශ්‍ය සියලු ම සම්පත් මෙරටින් ම සොයා ගැනීම අසිරු කරුණකි. එම නිසා මෙම සෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අරටුදල්, කාර්මික ආධාර, විශේෂඥ දැනුම ආදිය අන්තර් ජාතික ආයතන හා රාජ්‍යයන් ගණනාවකින් ම ආධාර වශයෙන් ලබා ගෙන ඇත.



වික්ටෝරියා ජලාශය

24.1 රූපය

24.3 නිදහස් වෙළෙඳ කලාපය

කොළඹ නගරයට උතුරින් පිහිටි වර්ග කිලෝමීටර 406 ක පමණ භූමි ප්‍රදේශයක් නිදහස් වෙළෙඳ කලාපය නමින් හැඳින් වේ. මෙයට කටුනායක හා බියගම පෙදෙස් ඇතුළත් ය. මේ කලාපය පිහිටා ඇත්තේ කැලණි ගඟ සහ ඕක ඔය අතර ව්‍යාප්තවී ඇති බිම් තීරුවක ය. නිදහස් වෙළෙඳ කලාපය යනුවෙන් මේ ප්‍රදේශය හඳුන් වන්නේ එහි කර්මාන්ත කටයුතුවල යෙදී සිටින ව්‍යාපාරිකයින්ට මෙ රට ආණ්ඩුව මගින් යම් යම් පහසුකම් ලබා දී තිබෙන නිසා ය. තීරු බදු සහන, ලාභවලින් කොටසක් පිටරට ගෙන යාමට අවසර දීම යනාදිය උදාහරණ වේ. මෙ වැනි නිදහස් වෙළෙඳ කලාප පිහිටුවා ඇත්තේ දරව්‍යුණු හතරක් ඉටුකර ගැනීමට ය. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම, මෙ රට ස්වාභාවික සම්පත් වලින් ප්‍රයෝජන ගැනීම, විදේශ ආයෝජකයන් මෙ රටට ගෙන්වා ගැනීම, (ආයෝජකයන් යනු කිසියම් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා මුදල්, දැනුම හා ශ්‍රමය සොයවා පුද්ගලයන් ය.) සහ තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීම ඒ අරමුණු වේ. මසා නිම කළ ඇඳුම්, සපත්තු, ප්ලාස්ටික් භාණ්ඩ, විද්‍යුත් උපකරණ ආදිය නිදහස් වෙළෙඳ කලාපයේ නිෂ්පාදනය කරන සමහර භාණ්ඩ ය. මෙට කර්මාන්ත ශාලාවල නිපද වන භාණ්ඩවල "ශ්‍රී ලංකාවේ සාදන ලදී" යන ඉංග්‍රීසි වාක්‍යය මුද්‍රණය කර ලෝක වෙළෙඳ පොළට යැවීම අපේ ප්‍රාථමික රටට වහත් ආඩම්බරයකි. පිටරටවලට යවන භාණ්ඩ අතරින් වසා නිම කරන ලද ඇඳුම් ප්‍රධාන තැනක් ගනී. නිදහස් වෙළෙඳ කලාපයේ නිෂ්පාදනයන් වැඩි ප්‍රමාණයක් මිල දී ගන්නේ ඇමරිකා එක්සත් ජනපදය යි.

නිදහස් වෙළෙඳ කලාපය පාලනය කරනු ලබන්නේ මහ කොළඹ ආර්ථික කොමිසම යන ආයතනයෙනි. 26,000 කට අධික මිනිසුන් සංඛ්‍යාවකට නිදහස් වෙළෙඳ කලාපයේ දැනටමත් රැකීරක්ෂා සපයනු ලැබ ඇත.

24.4 නිවාස දශ ලක්ෂයේ යෝජනා ක්‍රම

වාසය කිරීමට නිවසක් නිබීම මිනිසාගේ මූලික අයිතිවාසිකමකි. ක්‍රි. ව. 1977 දී බලයට පත් ආණ්ඩුව ක්‍රියාත්මක කර ඇති සංවර්ධන කටයුතු අතර "නිවාස දශ ලක්ෂයක් ඉදි කිරීමේ වැඩ පිළිවෙල" නිවාස රහිත සමාජයක් බිහි නැතිමට ගෙන ඇති පියවරකි. මේ සඳහා දඟමැතිතුමාගේ විශේෂ අවධානය ද යොමු වී ඇත. නිවාස හා ගොඩනැගිලි ඉදි කිරීම වඩා ක්‍රමවත් ලෙස මේ යෝජනා ක්‍රමය යටතේ සිදු කෙරේ. ගම්බද ප්‍රදේශවලත් නගර බද ප්‍රදේශවලත් ඒ ඒ පරිසරයට සුදුසු ආකාරයට ගෙවල් හා ගොඩනැගිලි ඉදි කිරීම එ මගින් සිදු වේ. මේ යටතේ ඉදි කර ඇති හා ඉදිවෙමින් පවතින නිවාස ප්‍රධාන කොටස් හතරකි.

i නාගරික නිවාස.

ii රජයේ සේවකයන් සඳහා නිල නිවාස.

iii අත්තටම් නිවාස.

iv උදාගම් ව්‍යාපාරය යටතේ ඉදිවන නිවාස

නිවාස ඉදිකිරීමේ කටයුතුවල නව මගක් ගත් සාර්ථක වැඩ පිළිවෙලක් ලෙස උදාගම් ව්‍යාපාරය හැඳින්වීමට පුළුවන. මේ මට්ටමින් සංවර්ධනය ආරම්භ කිරීමේ මූලික පදනම් ඇති ව මෙම ව්‍යාපාරය අරඹා ක්‍රියාත්මක කොට ඇත. උදාගම් ව්‍යාපාරය ආරම්භ වූයේ සාපහුව මැතිවරණ කොට්ඨාශයේ බඩල්ගට සංවර්ධනය කිරීමෙන් ය.

සමෘද්ධිමත් ජනතාවක්, ඇති විමට නම් මූලික අයිතිකාසිකම් ලබා දීම ද, ඒවා සහතික කිරීම ද, රට වැසියන්ට යහපත් ආර්ථික තත්ත්වයක් ලබා දීම ද වැදගත් ය. ශ්‍රී ලංකා ආණ්ඩුව මේ අරමුණු ඉටු කර දීමට කටයුතු කරයි. එහෙත් එය සාර්ථක විමට නම් රට වැසියන්ගේ සහයෝගය ද ලැබිය යුතුය. එක එක පුද්ගලයා තමාගේ මූලික අයිතිවාසිකම් රැක ගත යුතු ය. එමෙන් ම මෙරට ජීවත් වන අනිකුත් පුද්ගලයන්ට ද එට අයිතිවාසිකම් ඇති බව පිළිගත යුතු ය. ඒ පිළිගැනීම මත අනිකුත් අයගේ අයිතිවාසිකම් ගරු කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතු ය. මුළු සමාජය ම එසේ කරන්නේ නම් නිදහස් නිවහල් සමාජයක් ඇති වේ. සමෘද්ධිමත් ජනතාවක් ඇති විමට එය පදනම වේ.



මහල් නිවාස
21.2 රූපය

සාරාංශය

මිනිසාගේ මූලික අයිතිවාසිකම් ආහාර, නිවාස හා ඇඳුම් පැළඳුම් ය. අද අප ජීවත් වන සමාජය සංකීර්ණ නිසා මෙම වුවමනාවලට අමතර ව තවත් අවශ්‍යතා රාශියක් ඇත. මේවා පිරිමසා ගැනීමට ආණ්ඩුව කටයුතු කරන්නේ සමෘද්ධිමත් ජනතාවක් ගොඩ නැඟීම සඳහා ය. මහවැලි කඩිනම් වැඩ පිළිවෙළ, නිවාස දශ ලක්ෂයේ යෝජනා ක්‍රමය සහ නිදහස් වෙළෙඳ කලාපය පිහිටුවීම මේ සඳහා ගෙන ඇති වැදගත් පියවර කිහිපයකි.

ක්‍රියාකාරකම්

1. මහවැලි කඩිනම් ව්‍යාපාරය සඳහා අපේ රටට ආධාර දුන් රටවල් 4 ක් නම් කරන්න. ඔන් දෙනෙක් කමර ව්‍යාපෘති යඳහා ආධාර සපයන්නේ දැයි ලියන්න.
2. මේ ව්‍යාපාරයට අයත් ප්‍රධාන ජලාශ තොනවා ද?
3. උදාගම් ව්‍යාපාරය යටතේ බිහිවූ උදාගම් 10 නම් කරන්න.
4. එට ව්‍යාපාරයෙන් ජීවත් වන ශිෂ්‍යයකු ධඩ පහත්තේ සිටී නව් එයි ඒ ජීවත්වන්නාට සැලසී ඇති සේවාවන් පිළිබඳ ව අසා දැන ගන්න.
5. මේ ඡේදයේ යිස් තැන් පුරවන්න.

.... යහත් .... අතර
වෙරළබඩ තීරුව. ....
කලාපය පිහිටි ප්‍රදේශයයි..... .....
සහ..... ..... යන නගර මේ
සම්බන්ධයෙන් වැදගත් වේ .....
... .
කොමිසම මගින් පාලනය කරනු ලබන නිදහස් වෙළෙඳ කලාපය පිහිටුවීමේ ප්‍රධාන අරමුණයි.... ..... ආයෝජකයන් දිරිගැන්වීම. මෙහි කෙරෙන නිෂ්පාදන අතර.. ....ප්‍රධාන වේ. මේ කලාපයෙන් ටිවරට යවන භාණ්ඩ වැඩියෙන් මිල දී ගන්නේ..... ..... ජනපදය යි. මෙහි නිපදවන භාණ්ඩ වල .. .. සාදන ලදී යනුවෙන් සඳහන් කර තිබීම ශ්‍රී ලංකාවට ආඩම්බරයකි.

ශ්‍රී ලංකාවේ ඇත අතීතයට සම්බන්ධ පුරාවෘත්ත තුනක් මෙහි දැන්වේ.

රාවණා කථාව

රාවණා රජු සූර්ය ඓතිහාසික යුගයේ ලංකා පූරයේ සිටි රජ කෙනකු බව අපේ පුරාවෘත්තවල සඳහන් වේ. මොහු ගැන විස්තර සහිතව තොරතුරු දක්වා ඇතැයේ වාල්මීකි විසින් ලියන ලද "රාමායණය" නම් මහා කාව්‍යයේය. එහි දැන්වෙන පරිදි ඔහු බල සම්පන්න **රාක්ෂස** රජකු විය. **පුරාවෘත්ත** අනුව ඔහු ප්‍රදේශ දහයක පාලකයා වූ අතර දක්ෂ වෛද්‍යවරයෙක් ද විය.

රාවණා රජුගේ **සොහොයුරියක** වූ 'ශූර්පනඛා' **කුමරිය ඉන්දියාවට** ගොස් සිටි අවස්ථා. එක දී ඇය එකල ඉන්දියාවේ අයෝධ්‍යාපුරයේ රජ කළ දශරථ රජුගේ පුත්‍රයකු වූ රාම කුමරුට අපහාස කරන ලදී. නිසා රාම කුමරුගේ ලක්ෂ්මණ සහ සීතා කප්පමා ඇසට උගුලම් කළේ ය. ඉන් කිපුණු රාවණා රජු රාම කුමරුගෙන් පළි ගැනීම සඳහා ඉන්දියාවට ගොස් රාම කුමරුගේ භාර්යාව වූ "සීතා" කුමරිය පැහැර ගෙන තමාගේ දඬු මොණරයෙන් ලංකාපුරයට ගෙනාවේ ය.

රාවණා රජු විසින් සීතා දේවිය පැහැර ගෙන ගොස් ඇති බව දැන ගත් රාම කුමරු ඒ ගැන තව දුරටත් හොරතුරු දැන ගැනීම විභීෂ හනුමාන් නම් වානරයා ලංකාපුරයට එවී ය. උඟ රාම කුමරුගේ ඔත්පලකරුවකු බව දැනගත් රාවණා රජු උඟ දල්ලා වලිගයේ ගරද්ද ඔහු ගිනි තබන ලෙස රාජ පුරුෂයන්ට අණ කළේ ය. මෙම අභවරයට ලක් වූ හනුමාන් සිය වලිගයේ ඇවිලුණු ගින්නෙන් ලංකා පුරය ගිනි තබා විනාශ කළේ ය. ඉන් අනතුරු ව වලිගය මුහුදේ ඔබා ගින්න නිවා ගෙන ආපසු ඉන්දියාවට ගොස් සියලු තොරතුරු රාම කුමරුට දැන්වීය. කෝපයට පත් රාම කුමරු රාවණා සමඟ යුද්ධ කොට සීතා කුමරිය බේරා ගැනීමට සටන් කිරීම සඳහා හනුමාන් ප්‍රමුඛ වානර සේනාවක් ද සමඟ යෙයි පැමිණියේ ය. ඔවුන් අතර සිදු වූ සිහිසුලු සටනේ දී රාවණා රජු මරුමුවට පත් විය. ඔහුගේ සේනාවෝ පලා ගිය හ. රාම කුමරුට ජය අත් විය. සීතා සුපිරිසිදු බිඳහෙළි තර ගත් රාම, රාවිණාගේ සොහොයුරු විභීෂණ හට ලංකාපුර රාජ්‍යය භාර දුන්නේය. විභීෂණ විසින් රාවණා යකුට තිබූ "පුෂ්පක" නම් ගුවන් යානය රාම කුමරුට පරිත්‍යාග කෙළේය. රාම සිය දේවිය සීතා ද කැටුව එයි නැති ආපසු ඉන්දියාවට යෙයේ ය.

සිංහබාහු කථාව

පුරාවෘත්ත අනුව සිංහලයන් පැවත එන්නේ **සිංහබාහු** නම් **රජකුගේ පරම්පරාවෙනි.** මහවංශයේ එන පරිදි සිංහබාහු රජුගේ කථාව මෙසේ ය. "ඉන්දියාවේ වංග දේශයේ සිටි රජුට "සුප්පා" නම් දියණියක් වූවා ය. ඇය දශකාර දූරියකි. දිනක් ඕ රහසේ ම රජ ලාලිහාවෙන් නික් ම යන්නී තවලම් පිරිසක් සමඟ එක් ව ගමන් ගත්තා ය. අතර මග ලාට රටේ ද ඔවුහාට සිංහයෙක් හමු විය. සිංහයා ද කුමරිය ද එකිනෙකා කෙරෙයි පිළිබඳ සිත් ඇති කර ගත් හ. එතැන් පටන් ඕ සිංහයාගේ ගිරිය වගයෙන් ඒවත් වූවා ය. ඔවුන් දෙදෙනාට සිංහබාහු නම් පුතකුද සිංහ සිවලී නම් දියණියක ද ලැබුණි. මොවුනට ආහාර සෙවීමට සිංහයා ගියේ ඔවුන් විසූ ගල් ලෙන වසා ගල් පුවරුවකින් වසා තබමින් ය.

කාරුණ පියට පත් සිංහබාහු සියලු තොරතුරු සිය මව්ගෙන් අසා දැන තම පියාගේ රටට, එ නම් වංග දේශයට යාමට සිර්රණය කෙළේ ය. සිංහයා සිටින ගොස් ගිරි අවස්ථාවක සිංහබාහු ලෙන් දොර ඉවත් කර මවත් සැගවීයත් බැවුම පිවත්ව යෙයේ ය. ආපසු පැමිණි සිංහයා ගිරිය සහ දරුවන් දකින්නට නොහැකි වීමෙන් මියරු වී ගම් දනවි වනයන්නට පටන් ගත්තේ ය. මේ නිසා සිංහබාහු විසින් ම සිංහයා මරා දමන ලදී. ඉන්පසු තොහු සිංහපුරය බිල් කර ගෙන රාජ්‍ය භාරයක් පිහිටුවා ගෙන සිංහ සිවලී කුමරිය බිහිමම කාන්තාරයෙයි තබා එයි රජ විය.

මේ දෙ දෙනාට ලැබුණු දරුවන් අතුරින් වැඩි මහල් කෑනැත්තා වූයේ විජය නැමැත්තෙකි. තරුණ වියට පත් විජය සිය මිතුරන් සමඟ එක් වී රට වැසියන්ට කරදර කරන්නට විය. විජයගේ මේ ක්‍රියා කලාපය නිසා සිංහබාහු විසින් විජය සහ ඔහුගේ පිරිස රටින් පිටුවහල් කරන ලදි. මොහු ඉන්දියාවේ භාරුකච්ච සහ සුප්පාරක යන ස්ථානවලට ද ගොඩ බැස අන්තිමේ දී ශ්‍රී ලංකාවට පැමිණ මෙහි රාජ්‍යයක් පිහිටුවා ගත්හ.

චූලෝදර - මහෝදර කථාව

පුරාණ ශ්‍රී ලංකාවේ ප්‍රදේශ තුනක නාග නමින් හඳුන්වන ලද පිරිසක් ජීවත් වූ බව අපේ පැරණි **ඉතිහාස** ග්‍රන්ථය වන "මහාවංශයේ" සඳහන් වෙයි.

මණිඅක්ඛික දිවයින හෙවත් නාගදීපය ඉන් එක් ප්‍රදේශයකි. එහි සිටි නාග පිරිසේ නායකයා "මහෝදර" නම් විය. චඩුන්නාගල නාග පිරිස් විසූ තවත් ප්‍රදේශයකි. කැලණියෙහි ද නාගයෝ ජීවත් වූහ. ඔවුන්ගේ නායකයා මණිඅක්ඛික නමින් හැඳින්විණි. ප්‍රදේශ තුනෙහි ම ජීවත් වූ නාග පිරිස් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා මෙන් ම ඥාති සම්බන්ධතා ද පැවතුණි.

නාගදීපයේ මහෝදර නා රජුගේ නැගණියක් වඩුන්නාගල නා රජුට සරණ කර දී තිබුණි. ඇයගේ පුතා චූලෝදර නම් විය. චූලෝදරගේ මැණියන් හට ඇගේ පියාගෙන් ඉතා අගනා මණිපළඟක් (මැණික් පුටුවක්) ලැබී තිබුණි. පසු කාලෙක ඇය මිය ගියා ය. ඉන් පසු ව එම මණිපලඟ සම්බන්ධයෙන් චූලෝදර සහ මහෝදර අතර මත භේදයක් හට ගති. එය උග්‍ර වී දෙ පිරිස අතර සටනක් ඇති වීම තත්ත්වයට පත් විය. මහෝදර නාගදීපයට ගොස් කදවුරු බැඳ ගත්තේ ය. මේ තොරතුරු ඇසූ මණිඅක්ඛික නා රජු ද නාගදීපයට පැමිණියේ ය.

දෙවරම් වෙහෙර වැඩ සිටි බුදුන් වහන්සේ නාගයන් මෙසේ **සටනට** සැරසී සිටි බව දිවැසින් දුටු සේක. සටනක් සිදු වුව හොත් විශාල සංඛ්‍යාවක් මැනවෙන බව දන් බුදු ඔබිමයෝ නාගයන් කෙරේ මෙත් උපදවා ආරවුල සංසිඳීම **සඳහා** නාගදීපයට වැඩිය හ. එදු උන්වහන්සේ බුද්ධත්වයට පත් වීමෙන් එලබී පස් වෙනි වසර විය. උන්වහන්සේ වැඩියේ ජේතවනාරාමය ඉදිරිපිට වූ කිරිපලු නුග රුක අරක් ගෙන ඊසු සුමන සමන් දිව්‍ය පුත්‍රයා ද **සමඟ** ය.

නාගදීපයෙහි කදවුරු බැඳ සිටි නා පිරිස් හමුවේ අහසේ වැඩ සිටි බුදුන් වහන්සේ පළමුවම මහා අඳුරක් විහා ඔවුන් බිය ගැන්වූ හ. **පසු** ව ආලෝකය විහා එම බිය දුරු කළ හ. ආලෝකය පැතුරුණු පසු ව බුදුන් වහන්සේ දුටු නාගයෝ අතිශයින් පහන් ව මණිපලඟ උන්වහන්සේ වෙත පිදූ හ. බුදුහු එහි වැඩ හිඳ නාගයන්ට දහම් දෙසූ සේක. පසු ව නාගයන් විසින් පිළි ගන්වා ලද දුනය ද එහි ම වැඩ ගිදී වැලඳූ බුදු ඔබිමයෝ අනු මෝදනා බණ වදුරා මණිපලඟ ද ආපසු නාගයනට ම භාර කළ හ. බණ අසා පැහැදුණු මණිඅක්ඛික නා රජු කැලණියට ද වඩින ලෙස බුදුන් වහන්සේට ආරාධනා කෙළේය. එවි මණිපලඟ තුබූ තැන එය නිදහස් කොට දගැබක් තනවා ලදී. එම දගැබ රාජායතනය නම් විය.

ඒට වසර තුනාහට පසු ව, එනම් මණිඅක්ඛික නා රජුගේ ආරාධනය සිහියෙන් කළ බුදුන් වහන්සේ කැලණියට ද වැඩිය හ. එයි වූ මාණිඛපයෙහා වැඩ සිදු දහම් දෙසූ සේක. පසු ව එතැන ද දගැබක් ඉදි කරවා ලදී. කැලණියෙන් ධර්මාකූරය වෙහා වැඩි උන් වහන්සේ එහි සිරිපා යටහන් පිහිටු වූහ. ඉන් පසු ව, දිගාමැවට, මහවෙවුනා උයනේ අද ශ්‍රී මහා බෝ සමිඳුන් රෝපණය කරවා ඇති ස්ථානයට සහ සේල වෛත්‍යය පිහිටා ඇති ස්ථානයට ද වැඩ ආපසු දෙවරම් වෙහෙරට වැඩි සේක.